# වාර්ෂික වාර්තාව
# 2016

ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 07.
ශ්‍රී ලංකාව
**www.nsf.ac.lk**

NATIONAL SCIENCE FOUNDATION

## සභාපතිතුමියගේ පණිවුඩය

දෙදහස් දහසය (2016) මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනමෙහි වාර්ෂික වාර්තාව මා ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි. ජාතික විද්‍යා සභාවෙහි (පිහිටුවීම - 1968) සහ ස්වභාවික සම්පත් බලශක්ති සහ විද්‍යා අධිකාරියෙහි (නරේසා - පිහිටුවීම - 1981) අඛණ්ඩතාවය ඉදිරියට ගෙනයෑමක් ලෙස, ජාතික විද්‍යා පදනම 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස 1998 දී ස්ථාපිත කරන ලදී, එහි මෙහෙවර වන්නේ මූල්‍යාධාර සැපයීම මගින් පර්යේෂණ සහ තාක්ෂණ සංවර්ධනය උදෙසා මූලාරම්භය සැපයීම, පහසුකම් ලබා දීම හා උපකාර කිරීම, දැනුම නිර්මාණය කිරීම, හැකියාවන් හා හවුල් සබඳතා වර්ධනය සිදු කිරීම, තොරතුරු ව්‍යාප්ත කිරීම සහ විද්‍යාව ප්‍රචලිත කිරීමයි. මෙම 2016 මූල්‍ය වර්ෂය සඳහා සකසන ලද කාර්යසාධන වාර්තාව මගින් අප ආයතනයෙහි පාර්ශවකරුවන් සහ ශ්‍රී ලංකාවේ මහජනතාව වෙත තිබෙන්නා වූ අපගේ වගවීම විදහා දැක්වීමට අපි ප්‍රයන්ත දරන්නෙමු.

පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ජාතික විද්‍යා පදනම සිදු කළ ආයෝජන ශ්‍රී ලංකාවේ මුඛ්‍ය සමාජයීය සහ ආර්ථික ප්‍රමුඛතාවලට යම් බලපෑමක් සිදු කිරීම පිණිස, සොයා ගැනීම් සහ පරිණාමනයට ලක් කළ හැකි තාක්ෂණයන් ශක්තිමත් කිරීම සිදු කොට ඇත. විද්‍යාව සහ තාක්ෂණය සඳහා ජාතික විද්‍යා පදනම සිදු කළ ආයෝජන අන්තර්ගත සහ සාකල්‍ය වන අතර ආර්ථිකයට, මනුෂ්‍ය වර්ගයාට සහ ලෝකයට අදාළ ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා නව දැනුම සහ තාක්ෂණය නිර්මාණය කිරීම සිදු කරන අතරතුර ජාතික පර්යේෂණ සහ නවෝත්පාදන පරිසර පද්ධතිය වැඩි දියුණු කිරීමට ප්‍රයන්තයක් දැරීමෙහිලා හැකියාවන් වර්ධනය සහ පර්යේෂණයන් එකිනෙක සම්බන්ධ කිරීම සිදු කරයි.

මූල්‍ය වර්ෂ 2016 තුළ දී ජාතික විද්‍යා පදනම එය සතු බොහොමයක් මූල්‍ය සම්පාදන වැඩසටහන්, යෝජනා ක්‍රම, උපකරණ සහ සම්මාන පිළිබඳව කටයුතු සිදු කිරීම මගින් එයට අදාළ පුළුල් විෂයපථය තුළ විද්‍යාත්මක කටයුතු සඳහා අරමුදල් සම්පාදනය කිරීම පිණිස ඒ වෙත පවරනු ලැබූ ප්‍රධාන කාර්යභාරය ඉටුකිරීමෙහි යෙදුනාය. විද්‍යාඥයින්ට සහ පාසල් හා විශ්ව විද්‍යාල ප්‍රජාවන්ට උපකාර කිරීම උදෙසා ජාතික විද්‍යා පදනම නව මූල්‍ය ප්‍රධාන යෝජනාක්‍රම දෙකක් ආරම්භ කළාය. විද්‍යාව උපුටා දැක්වීමේ දර්ශකය, පුළුල් කරන ලද විද්‍යාව උපුටා දැක්වීමේ දර්ශකය යන දර්ශකවල සුවිගත කරන ලද පිළිගත් වාරසඟරා මගින් ප්‍රකාශනය සඳහා ශ්‍රී ලාංකික විද්‍යාඥයින් විසින් භාර දෙන ලද ලිපි සඳහා එලෙස ප්‍රකාශනය කිරීමේදී වැය කිරීමට සිදු වූ පිරිවැය ඔවුන් වෙත ලබා දීම පිණිස "ලිපි පළ කිරීමේ ගාස්තු සඳහා ප්‍රදාන" නමැති නම යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. විදේශයන් හි පැවැත්වෙන විද්‍යා අධ්‍යාපන සහ ප්‍රචලිත කිරීමේ වැඩසටහන්වලට සහභාගී වීම සඳහා පාසල් සිසුන්ට, ගුරුවරුන්ට සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට මූල්‍යාධාර ලබා දීම පිණිස "විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන (OSEP)" ආරම්භ කරන ලදී.

රුපියල් මිලියන 101.7ක වටිනාකමක් සහිත, 2016 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද නව ප්‍රදාන 38ක් ඇතුළත් ජාතික විද්‍යා පදනම් ප්‍රදාන 106ක් ඔස්සේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල/ පර්යේෂණ ආයතන/ කර්මාන්ත 53ක කටයුතු කළ පර්යේෂකයින්/ ව්‍යවසායකයින්/ ඉංජිනේරුවන් 561 දෙනෙකු සඳහා විද්‍යා හා තාක්ෂණ සංවර්ධන කටයුතු අරබයා සහයෝගය ලබා දෙන ලදී. ජාතික විද්‍යා පදනම් ශිෂ්‍යත්වලාභීන් 13 දෙනෙකු, පර්යේෂණ ශිෂ්‍යයින් 59 දෙනෙකු සහ පර්යේෂණ විද්‍යාඥයින් දෙදෙනෙකු (02)ගේ වේතන ලෙස ලබා දෙන ජීවන වියදම් දීමනාවක් සඳහා ද මෙම මූල්‍ය ප්‍රදාන වගකීම දරයි. මෙකී මූල්‍ය වර්ෂය තුළ ආයතන සහ විශ්ව විද්‍යාල 09ක පර්යේෂණ ධාරිතාවය ඉහළ නැංවීමට රු. මිලියන 69.8ක වටිනාකමකින්යුත් උපකරණ ප්‍රදාන 27ක් ලබා දීම සිදු කෙරුණු අතර ආයතන 05කට රු. මිලියන 2.5ක වටිනාකමකින් යුත් අමතර කොටස් ප්‍රදාන 06ක් ලබා දීම ද සිදු කෙරුණි.

බලංගොඩ වී පර්යේෂණ ආයතනයෙහි කණ්ඩායමක් මගින් ලවණ තාවයට ඔරොත්තු දෙන (දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දිය හැකි) වී ප්‍රභේදවල අණුකමයි හඳුනාගැනීම, කාර්මික තාක්ෂණ ආයතනයෙහි කණ්ඩායමක් විසින් සිදු කරන ලද වී සහ එළවළු පළිබෝධවලට එරෙහිව ක්ෂුද්‍ර ජීවීමය පළිබෝධ නාශකවල ක්‍රියාව සොයා බැලීම, ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි කණ්ඩායමක් මගින් cds/cdTe සූර්යකෝෂවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කණ්ඩායමක් මගින් ශ්‍රී ලංකීය ඖෂධ පැළෑටිවල ප්‍රති-මධුමේහ සංයෝග තිබේදැයි සොයා බැලීම, කැලණිය විශ්ව විද්‍යාලයේ කණ්ඩායමක් මගින් ශාකවල දිලීර ආසාදනය පාලනය කිරීම, රබර් පර්යේෂණ ආයතනයේ කණ්ඩායමක් මගින් නැනෝද්‍රව්‍ය පාදක කර ගත් ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් සැහැල්ලු කෘත්‍රිම පාදයක් නිර්මාණය කිරීම, වාණිජකරණයට පෙර "යුරිනරි ග්ලූකෝස් පටි" දේශීයව සංවර්ධනය කිරීම සහ වලංගුකරණය, ස්වයංක්‍රීය පෑස්සුම් රොබෝ පද්ධතිය□ යනාදිය අන්තර්ගත ජාතික විද්‍යා පදනම් ප්‍රදාන (43ක්) ඔස්සේ 2016 මූල්‍ය වර්ෂය තුළ නව දැනුම උත්පාදනය කෙරුණි. දියවැඩියාව,

පිළිකා සහ ඩෙංගු සම්බන්ධව පර්යේෂණයන්හි නියැලීමට සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ විශේෂ වැඩසටහනක් දියත් කිරීම උදෙසා රු.මිලියන 250ක් සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙනුවෙන් කුරුඳු පිළිබඳව විශේෂ ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 50ක් ජාතික විද්‍යා පදනම වෙත වෙන් කෙරුණි. විශේෂ අය-වැය යෝජනා ද්විත්වයක් 2016 සඳහා පදනම වෙත ලැබුණු බැවින් ජාතික විද්‍යා පදනම සඳහා 2016 මූල්‍ය වර්ෂය අතිශයින් කාර්ය බහුල වසරක් විය.

ජාතික විද්‍යා පදනම මෙම තේමා මූලික පර්යේෂණ වැඩසටහන් ආරම්භ කළේ 2016 ජූලි මාසයේ කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ, ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගේ සහයෝගය ඇතිව පවත්වන්නට යෙදුණු "පර්යේෂණ සහ නවෝත්පාදන මගින් බලාත්මක - ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සම්මේලනය" වැඩසටහන සංවිධානය කිරීම මගින් උපදේශාත්මක ක්‍රියාවලියක් අනුගමනය කිරීම තුළිනි. මෙම වැඩසටහනට, විද්‍යාඥයින්, කර්මාන්තකරුවන්, උපාධි අපේක්ෂකයින් සහ 2015 අ.පො.ස. උ/පෙළ විභාගයෙන් ඉහළම දක්ෂතා දැක් වූ පාසල් ශිෂ්‍යයන් ඇතුළු 500කට අධික ප්‍රමාණයක් සහභාගී වීම සහ අදහස් හුවමාරු කර ගැනීම සිදුවිය. මෙමගින් සෞඛ්‍ය, විද්‍යා වැඩසටහන යටතේ මූල්‍යාධාර සැපයීමට (පළමු වසර තුළ පර්යේෂණ සඳහා රු. මිලියන 250ක් අවශ්‍ය කෙරෙන) ව්‍යාපෘති 24ක් සහ කුරුඳු පර්යේෂණ විශේෂි ව්‍යාපෘතිය යටතේ (පළමු වසර සඳහා රු. මිලියන 50ක් අවශ්‍ය කෙරෙන) ව්‍යාපෘති 7ක් හඳුනාගැනීමට ජාතික විද්‍යා පදනමට හැකි විය. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බහුපාර්ෂික ව්‍යාපෘති ලෙස මෙකී ව්‍යාපෘති උදෙසා අඛණ්ඩව මූල්‍ය සම්පාදනය කිරීම සඳහා ජාතික විද්‍යා පදනම බැඳී සිටී. පර්යේෂකයින් 302කට ප්‍රදාන 24ක් සඳහා රු. මිලියන 45.91ක් ප්‍රදානය කිරීමට සහ පර්යේෂකයින් 35 දෙනෙකුට ප්‍රතිලාභ සැපයෙන කුරුඳු ව්‍යාපෘති 05ක් සඳහා රු. මිලියන 33.4ක් ප්‍රදානය කිරීමට 2016 මූල්‍ය වර්ෂය තුළ සැලසුම් සකස් කෙරුණි.

පාකිස්තානයේ විද්‍යා පදනම සමග එක්ව 2016 ජනවාරි මාසයේ දී ද චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සමග 2016 අප්‍රේල් මාසයේදී ද ශ්‍රී ලාංකික විද්‍යාඥයින් සහ එකී රටවල විද්‍යාඥයින් සඳහා සහයෝගිතා පර්යේෂණ සිදු කිරීම පිණිස ආධාර මත අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම මගින් ජාතික විද්‍යා පදනම මගින් තම ජාත්‍යන්තර කටයුතු පුළුල් කිරීම සිදු කළාය. එක්සත් ජනපද ජාතික විද්‍යා පදනමෙහි, කැනඩාවේ ජාතික විද්‍යා හා ඉංජිනේරු පර්යේෂණ සභාවෙහි (NSER) ජර්මනියේ පර්යේෂණ පදනමෙහි (GRF), සහ ජගත් විද්‍යා හා තාක්ෂණ නියෝජිතායතනයෙහි (JST) ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ගේ සහභාගිත්වයෙන් කොළඹ දී පවත්වන්නට යෙදුන ජාතික විද්‍යා පදනම් ගෝලීය පාර්ශවකරුවන්ගේ සංසදය 2016 සැප්තැම්බරයේදී පවත්වන්නට යෙදුණු, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද "සමාජය සඳහා විද්‍යා හා තාක්ෂණ සංසදය" සමග එක්ව එකකට පසු එකක් ලෙස පැවැත් වූ වැඩසටහන්වලදී අනාගත ද්විපාර්ශ්වීය සහයෝගිතා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

ජාතික විද්‍යා පදනම දේශීය විද්‍යාඥයින්ට විදේශීය චාරිකා සඳහා මූල්‍යාධාර සම්පාදනය කරනු ලබන ප්‍රධාන ආයතනය වේ. විද්‍යාඥයින් සහ තාක්ෂණවේදීන් 111කට විදේශ චාරිකා සඳහා සහභාගි වීම පිණිස ආධාර කිරීම මගින් ජාතික විද්‍යා පදනම එහි චාරිකා ප්‍රදාන වැඩසටන සහ විදේශීය විද්‍යා හා තාක්ෂණ වැඩසටහන (OSTP) මගින් ඒකාබද්ධ පර්යේෂණ ධාරිතාවය, සහ ජාලකරණය සංවර්ධනය කිරීම පිණිස ජාත්‍යන්තර සහයෝගිතාවන් උදෙසා ලබා දෙන සහයෝගය දෙගුණයකටත් වඩා ඉහළ නැංවීමට කටයුතු කළාය. විද්‍යා හා තාක්ෂණ ජාත්‍යන්තර හවුල්කාරත්ව වැඩසටහන (IPSAT) මගින් විදේශීය විශේෂඥයින් 34 දෙනෙකු සම්පත්දායකයින් ලෙස ශ්‍රී ලංකාවේ චාරිකා කිරීම සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් හට ජාතික විද්‍යා පදනම තම සහයෝගය පළ කළාය.

ඉහත සඳහන් විදේශීය චාරිකාවන් ද ඇතුලත්ව ජාතික විද්‍යා පදනම 2016 මූල්‍ය වර්ෂය තුළ පර්යේෂකයින්/ තාක්ෂණවේදීන්/ ව්‍යවසායකයින්/ ඉංජිනේරුවන් 672ක් සඳහා සහයෝගය ලබා ඇත. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානයේ අධ්‍යක්ෂිකා, ඉරිනා බොකෝවා මහත්මිය ලංකාවට පැමිණි විට ඇය සමග අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමට ශ්‍රී ලාංකික විද්‍යාඥයින් 200කට පමණ අවස්ථාව ලබා දීමට, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමග "විද්‍යා සංවාදය" නම් වූ වැඩසටහන සංවිධානය කිරීමේ මහගු අවස්ථාව ජාතික විද්‍යා පදනමට ලැබුණි. එහිදී, ශ්‍රී ලංකාව තුළ ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා යුනෙස්කෝ සහයෝගය ලබා දෙන බවට අධ්‍යක්ෂවරිය පොරොන්දු වූ බව මෙහිලා සඳහන් කළ යුතුය.

පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම (SUSRED) සඳහා පිදෙන සම්මානයට පාත්‍ර වූ සහ TWAS/NSF තරුණ විද්‍යාඥයින්ගේ සම්මානයට පාත්‍ර වූ 24 දෙනාට මාගේ සුබ පැතුම් පිරිනමමි. මෙවැනි සම්මාන පර්යේෂකයින්ගේ ධෛර්යය වැඩි දියුණු කිරීමට ඉවහල් වන අතර ජාතික සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය ඉහළ නැංවීමට උපකාර වනු ඇත.

යුනෙස්කෝ මගින් වර්ෂ 2001 දී ප්‍රකාශයට පත් කරන ලද ජගත් විදු දිනය සැමරීම සඳහා කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස ජාතික විද්‍යා පදනම කටයුතු කරන බැවින්, 2016 නොවැම්බර් 10 වන දින "සුවපත් දිවියක් සඳහා විද්‍යාව" යන තේමාව යටතේ අප රටේ පළාත් නවයම නියෝජනය කෙරෙමින් පාසල් සිසුන්, ගුරුවරුන් සහ උපාධි අපේක්ෂකයින් 1500කට අධික සහභාගිත්වයක් සහිතව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ජගත් විදු දිනය පාසල් වැඩසටහන සාර්ථක ලෙස සංවිධානය කෙරුණි.

ජාතික විද්‍යා පදනමේ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟයෙන් (SRPC) පුහුණු කරන ලද සහ ජාතික විද්‍යා පදනම මගින් නාම යෝජනා කරන ලද ශිෂ්‍යයකු විසින් ඇමරිකාවේ, ඇරිසෝනා ප්‍රාන්තයේ ෆීනික් හි පවත්වන ලද ඉන්ටෙල් විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයේදී විශේෂ සම්මානයක් ජයග්‍රහණය කිරීමට සමත් වීම පිළිබඳව මම ප්‍රහර්ෂයට පත් වුනෙමි.

විමර්ශනයට ලක් කෙරෙන වසර තුළ, අනුමත කාර්යමණ්ඩලය වූ 144න් 23ක් පුරප්පාඩුව පැවතුණි. බඳවා ගැනීමේ පටිපාටිය (SoR) නිම කිරීමෙහිලා පැවති ප්‍රමාදය කරණ කොට ගෙන පුරප්පාඩු පිරවීම තාවකාලික පදනමක් මත සිදු කෙරුණි. අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී), අතිරේක අධ්‍යක්ෂ, සහ පරිපාලන සහ මූල්‍ය අංශ ප්‍රධාන, සහ ජ්‍යෙෂ්ඨ තත්වයෙන් ඉහළම තනතුරුවලට ආදාළ පුරප්පාඩු සඳහා තාවකාලික පත්වීම් සිදු කිරීමට සිදුවීම හේතු කොටගෙන විශේෂයෙන් 2016 වසර කළමනාකාරිත්වයට අභියෝගකාරී වසරක් විය.

වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට තදබල බලපෑමක් සිදු කරමින් සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ක්ෂණික තීරණ ගැනීම වළකාලමින් භාණ්ඩාගාරය මගින් පෙන්නුම් කරන ලද පුරෝකථනය කළ නොහැකි අර මුදල් නිකුත් කිරීමේ ප්‍රවණතාවය 2016 වර්ෂය තුළ දී ද අඛණ්ඩව සිදුවිය.

මෙම සියලු බාධා මධ්‍යයේ, 2016 සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල පරිභෝජනය කරමින් ජාතික විද්‍යා පදනම භෞතික සහ මූල්‍යමය දෙපාර්ශයෙන්ම සාර්ථක ලෙස කටයුතු කර ඇත.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමාගේ නිර්ලෝභී සහයෝගය සහ මගපෙනවීම කෘතඥතා පූර්වකව සිහි කරමි. විශේෂයෙන්, ජාතික විද්‍යා පදනමෙහි අභිමතාර්ථය කරා ළඟා වීම පිණිස කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරූ අධ්‍යක්ෂ ජනරාල්, එච්.ඒ.යූ. අමරසිංහ මහත්මිය, අධ්‍යක්ෂ ජනරාල් ධූරයෙහි වැඩ බලන ලද ආචාර්ය සීතා අයි. වික්‍රමසිංහ සහ අධ්‍යක්ෂ ජනරාල් ධූරයෙහි වැඩ කටයුතු ආවරණය කරන ලද ආචාර්ය තමාරා ඩයස් ඇතුළු, බොහොමයක් බාධක මාධ්‍යයේ මහත් කැපවීමෙන් කටයුතු කළ ජාතික විද්‍යා පදනමේ සමස්ත කාර්යමණ්ඩලයට මාගේ ප්‍රණාමය හිමිවේ. අප රටේ විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීමෙහිලා ගාමක බලවේගයක් බවට පත්වීමට 2016 වසර තුළ විද්‍යා පදනම මෙහෙයවන ලද කළමනාකරණ මණ්ඩලය, පර්යේෂණ ඇගයුම්කරුවන් කණ්ඩායම ඇතුළු ක්‍රියාකාරී කමිටු 15, පර්යේෂණ උපදේශක මණ්ඩලය, තේමා මූලික පර්යේෂණ වැඩසටහන්වල මෙහෙයුම් කමිටු සහ සංස්කාරක මණ්ඩල මෙම කර්තව්‍යයේදී කාර්යමණ්ඩලයට සහයෝගය දැක් වූ බව මෙහිලා සටහන් කරමි.

**මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු**
**සභාපතිනිය, ජාතික විද්‍යා පදනම**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව

මෙම විමර්ශනය 2016 (ජනවාරි 01 - දෙසැම්බර් 31) වර්ෂය සඳහා ජාතික විද්‍යා පදනමෙහි කාර්යසාධනය කෙරෙහි අවධානය යොමු කරයි.

***මූල්‍ය සමාලෝචනය***

වර්ෂ 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතින් නියම කර ඇති කාර්යයන්ට අනුව ප්‍රතිඵල ලබාදීම සඳහා ජාතික විද්‍යා පදනම වෙත ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 250ක මුදලක් වෙන් කර දෙන ලදී. ඒ අනුව, 2016 ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් සකසන ලද ඉලක්ක සපුරා ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලය දැඩි කැපවීමකින් කටයුතු කළාය. ක්‍රියාකාරකම් සඳහා වියදම් කරන ලද මුළු ප්‍රාග්ධන අය-වැය රු. මිලියන 243කි. සමහර කාර්යයන් නිම කර තිබුණු අතර 2016 වර්ෂය අවසාන වන විට රු.මිලියන 117.45කට අධික මූල්‍යමය බැඳීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වෙතත්, විවිධ කරුණු හේතු කොට ගෙන ජාතික විද්‍යා පදනම සඳහා අනුමත කරන ලද මුළු ප්‍රාග්ධන වියදම 2016 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.

පදනමෙහි 2016 සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම මඟින් නියම කරන ලද කාර්යයන් හැරුණු කොට, 2016 තුළ ජාතික විද්‍යා පදනම, විශේෂ ව්‍යාපෘතියක් ජාතික අය-වැයෙහි අනුමැතිය සහිතව සෞඛ්‍ය විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය - ආරම්භ කළාය. ජාතික අය-වැය මගින් අනුමත කරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීම උදෙසා මෙම ව්‍යාපෘතියට ජාතික අය-වැය මගින් රු.මිලියන 250ක් වෙන් කරන ලදී. කෙසේවෙතත්, මෙම වසර තුළ රු. මිලියන 50ක් පමණක් නිකුත් කරන ලද හෙයින්, ව්‍යාපෘතියෙහි සැලකිය යුතු කොටස් 2017 වර්ෂයට ගෙන යෑමට සිදු විය.

මෙයට, අමතරව කුරුඳු පර්යේෂණ සහ ඒ හා බැඳුණු ක්‍රියාකාරකම් පිළිබඳ විශේෂ ව්‍යාපෘතිය ජාතික විද්‍යා පදනම, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය (MPI) සමඟ එක්ව ක්‍රියාත්මක කළාය. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මගින් ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 40ක් ජාතික විද්‍යා පදනම වෙත ලබා දෙන ලද අතර එම අමාත්‍යාංශය සමඟ අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව ජාතික විද්‍යා පදනම මෙම ව්‍යාපෘතිය සාර්ථක ලෙස මෙහෙයවීය. මෙම ව්‍යාපෘතියෙහි කටයුතු 2017 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

***ක්‍රියාකාරී සැලැස්ම - 2016 තුළ අඩංගු කර ඇති ප්‍රතිඵල ලබා ගැනීම***

ජාතික විද්‍යා පදනම අභියෝගවලට මුහුණ දුන් අතර වසර ගණනාවක් මුළුල්ලේ අත් දකින්නට ලැබුණු, පදනම වෙතින් ඉවත් වී යෑම හේතු කොට ගෙන ඇති වූ කාර්යය මණ්ඩල සීමා කිරීම් මඟින් පදනම වෙත බලපෑමක් ඇති විය. කෙසේවෙතත්, නොයෙකුත් යාන්ත්‍රණ සහ ක්‍රමෝපාය යොදා ගැනීම මගින් වසර පුරා අඛණ්ඩ ප්‍රගතියක් පෙන්නුම් කිරීමට ජාතික විද්‍යා පදනමට හැකි විය. මෙම ප්‍රගතියේ විශේෂ අවස්ථා වෙනම කොටසක දක්වා ඇති අතර ජාතික විද්‍යා පදනම මඟින් ක්‍රියාත්මක කරන ලද සියලුම කාර්යයන්හි සම්පූර්ණ විමර්ශනයක්, විශ්ලේෂණයක් ද සහිතව මෙහි ප්‍රධාන කොටසෙහි දක්වා ඇත. එහි සංක්ෂිප්තය පහත දැක්වේ.

***මූලික සහ ව්‍යවහාරික පර්යේෂණවලට සහ විද්‍යාත්මක සම්මේලනවලට සහයෝගය දැක්වීම***

තරඟකාරී වාතාවරණයක් තුළ, අයදුම්පත් 129කින් පර්යේෂණ ප්‍රදාන 24ක් මේ වසර තුළ පිරිනමන ලද අතර තෝරා ගන්නා ලද සහ අනුමත කරන ලද ප්‍රදාන 11ක් පිරිනැමීම 2017 වර්ෂය තුළ සිදු කරනු ඇත. සෑම වසරකදීම සිදු කෙරෙන, ජාතික විද්‍යා පදනම් ක්‍රියාපටිපාටිය සහ ප්‍රදාන ආකර්ෂණය කෙරෙහි ඵලදායී ව්‍යාපෘති යෝජනා ලේඛනය පිළිබඳ ප්‍රදානලාභීන්ගේ දැනුම ඉහළ නැංවීම සිදු කෙරෙන ආකාරයට විද්‍යාත්මක ලේඛනය පිළිබඳ වැඩමුළු සහ ප්‍රදාන දිශාභිමුඛ සම්මන්ත්‍රණ පවත්වන ලදී. පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය වර්ෂය පුරා අධීක්ෂණයට ලක් කෙරුණි. පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිඵල කිහිපයක් පින්තූර සහිතව මෙම වාර්තාවේ අඩංගු කොට ඇත. තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යටතේ මෙම වසර සඳහා සිදු කරන ලද මූල්‍යමය සහයෝගය රු.මිලියන 68.87ක් විය. වර්ෂ 2012 දී හඳුන්වා දුන් ජාතික තේමාමූලික පර්යේෂණ වැඩසටහනට (NTRP) "ආහාර සුරක්ෂිතතාවය" සහ "දේශගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසන" යන තේමා යටතේ කාර්යක්ෂම ලෙස 2016 වසර තුළ දී ද අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබුණි. අනෙක්

උපකාරක වැඩසටහන්, පර්යේෂණ උපකරණ ප්‍රදාන වැඩසටහන, පර්යේෂණ උපකරණ සඳහා අමතර කොටස් වැඩසටහන, සහ "ලිපි පළකිරීමේ ගාස්තු සඳහා ප්‍රදාන" ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රු.මිලියන 72.06ක මූල්‍යමය දායකත්වයක් දක්වන ලදී.

***තාක්ෂණ සහාය***

"තාක්ෂණ සංවර්ධනය සඳහා ආධාර" සහ "නව තාක්ෂණ පදනම් කොටගත් මූලාරම්භය සපයන ලද ව්‍යාපාර සඳහා ආධාර" යන විසංයුක්ත ප්‍රදාන වැඩසටහන් දෙකක් යටතේ තාක්ෂණ සහාය සපයන ලදී. විවෘත වෙළඳ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවන ලද අතර රු.මිලියන 25.6ක් වටිනා ප්‍රදාන අටක් (08ක්) පිරිනමන ලදී. පින්තූර සහිතව සමහර ස්පර්ශනීය ප්‍රතිඵල සහිත ප්‍රදාන අදාළ අංශ යටතේ විස්තර කොට ඇත. ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම පිණිස නව දේශීය තාක්ෂණ දියුණුවීමේ සම්බන්ධ තොරතුරු ව්‍යාප්ත කිරීමේ අරමුණ සහිතව පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳ විමර්ශන පුවත්පත්වල පළ කිරීමට කටයුතු කරන ලදී. විශ්ව විද්‍යාල - ආයතන - කර්මාන්ත - හවුල් සබඳතා පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම හා සම්බන්ධ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලද අතර ඒ පිළිබඳ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

***පර්යේෂණ සහ තාක්ෂණ විශිෂ්ටත්වය සඳහා සම්මාන ලබා දීම***

තම ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වයක් දක්වන ලද විද්‍යාඥයින්ට සහ තාක්ෂණවේදීන්ට ජාතික වශයෙන් පිළිගැනීමක් ලබා දීම පිණිස වූ සම්මාන යෝජනා ක්‍රමය පිළිබඳ කටයුතු, අයදුම්පත් කැඳවීම සහ ඒවා ඇගයීමට ලක් කිරීම මඟින් නිම කරන ලදී. කෙසේ වෙතත්, එකදු අයඳුම්කරුවෙකුවත් ඒ සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රමිතියට ළඟාවීමට අපොහොසත් විය. එනිසා, 2016 තුළ ජාතික සම්මාන පිරිනැමීම සිදු නොකරන ලදී.

කෙසේවෙතත්. ජාතික විද්‍යා පදනම් සම්මාන සහ වෙනත් සම්මාන. ගරු විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යතුමාගේ සහභාගිත්වය සහිත උත්සවයක දී පිරිනැමීමට කටයුතු කරන ලදී.

***මහජනතාව සහ පරිසරය ආරක්ෂා කිරීම***

ශ්‍රී ලංකාවේ මිනිසා සහ ජෛවගෝල වැඩසටහන (MAB) 1968 දී පවත්වන ලද යුනෙස්කෝ ජෛවගෝල සංසදයෙහි සෘජු ප්‍රතිඵලයක් වන අතර 1971 දී එය ශ්‍රී ලංකාව තුළ දියත් කරන ලදී. මේ යටතේ 2016 වර්ෂයට අදාළ කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක කෙරුණි. ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂකවලට (IBR) අදාළ කටයුතු, එනම්, කාලාවර්තන විමර්ශනවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම වැදගත් ලෙස සලකනු ලබන අතර ඒ පිළිබඳව මෙම වාර්තාවේ අදාළ අංශ යටතේ සඳහන් කොට ඇත.

***විද්‍යාත්මක රැස්වීම් සඳහා අනුග්‍රහය දැක්වීම***

"විද්‍යාත්මක වැඩසටහන් සහ පුහුණු කිරීමේ වැඩසටහන්" සම්බන්ධ යෝජනා ක්‍රමයෙහි වැඩකටයුතු සිදු කෙරෙමින් පැවතුණි. සමාජ විද්‍යාවද ඇතුළත් මූලික සහ ව්‍යවහාරික විද්‍යා ක්ෂේත්‍ර තුළ රු.මිලියන 16.9ක් වූ අනුග්‍රාහකත්ව හතලිස් එකක් (41) ලබා දෙන ලදී. ආවරණය කරන ලද විෂය ක්ෂේත්‍ර සහ වෙන් කරන ලද මුදල පිළිබඳ තොරතුරු ප්‍රස්තාරික ඉදිරිපත් කිරීම් මඟින් පෙන්නුම් කර ඇත.

***විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ප්‍රභවයක් ලෙස ක්‍රියා කිරීම***

දත්ත එක් රැස් කිරීම සහ දත්ත විශ්ලේෂණය කිරීම සහිත ජාතික පර්යේෂණ සංවර්ධන සමීක්ෂණය 2014 අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කරන ලදී. විද්‍යා හා තාක්ෂණ දර්ශක පිළියෙළ කිරීම නිම කරන ලදී. "ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සංඛ්‍යාන විද්‍යාත්මක අත්පොත 2014", 2017 වර්ෂයේදී ප්‍රකාශනය කෙරෙනු ඇත.

සමාජ විද්‍යාවේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාත්මක පරීක්ෂණවලට බලපාන සාධක විමර්ශනය කිරීම පිණිස සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙහි දත්ත එකතු කිරීම නිම කෙරුණි.

ජාතික විද්‍යා පදනම මූල්‍ය සම්පාදනයෙහිලා ප්‍රධාන ආයතනය වන බැවින්, එහි ආරම්භයේ සිටම මූල්‍යාධාර සපයන ලද පර්යේෂණවලින් සිදු වූ බලපෑම තක්සේරු කිරීමක් සිදු කරන ලෙස යෝජනා කරන ලදී. කෙසේවෙතත්, වර්තමානය වන විට රටේ තිබෙන දත්ත සුලබතාවය සීමිත වීම කරණ කොට ගෙන, 1971 වර්ෂයේ සිට පිරිනමන ලද තරඟකාරී පර්යේෂණ ප්‍රදානවල බලපෑම සොයාබැලීම සඳහා ප්‍රවේශයක් ආරම්භ කරන ලදී. ජාතික විද්‍යා පදනම ප්‍රදාන 2,472ක් පිරිනමා ඇති අතර ඒ පිළිබඳව අධ්‍යයනය කෙරෙමින් පවතී.

විද්‍යා හා තාක්ෂණ කටයුතුවල නියැලෙන පුද්ගලයන්, ආයතන උපකරණ සහ අප රට තුළ පවතින සේවාවන් පිළිබඳ තොරතුරු සපයන STMIS දත්තපාදකය යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පැවති අතර මේ වන විට විද්‍යා හා තාක්ෂණ කටයුතුවල නියැලෙන පුද්ගලයින් 6131කට අධික ප්‍රමාණයක තොරතුරු මෙහි අන්තර්ගත කර තිබේ. වැඩිපුර විශේෂාංග සහිතව දත්තපාදකය යාවත්කාලීන කිරීමට සැලසුම් සකස් කරමින් පැවතුණි. ප්‍රතිපත්ති නිර්දේශ සකස් කිරීම පිණිස පහසුකම් සපයමින් සම්මන්ත්‍රණ සහ වැඩමුළු කිහිපයක් සංවිධානය කෙරුණි.

### *විද්‍යා හා තාක්ෂණික තොරතුරු ද්වාරය*

තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් ජාතික විද්‍යා පදනම විද්‍යාත්මක ප්‍රජාව වෙත කාර්යක්ෂම ලෙස තොරතුරු ව්‍යාප්ත කිරීමේ සේවය සැපයීම අඛණ්ඩව සිදු කළාය. විද්‍යා හා තාක්ෂණ ලිඛිතයෙහි ජාතික කෝෂ්ඨාගාරය ලෙස සේවය සැපයීම මගින් ශ්‍රී ලංකාවේ සහ විදෙස්ගතත විද්‍යාඥයින් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීම පිණිස උපකාර කිරීමේ අඛණ්ඩ උත්සහයක ජාතික විද්‍යා පදනම නිරත විය. විවිධ දත්තපාදක, ඉ - කෝෂ්ඨාගාරය යනාදිය ඔස්සේ සහ පුස්තකාල වෘත්තිකයින් හා තාක්ෂණ අංශයෙහි නිරත වූවන් පුහුණු කිරීම මගින් කාර්යක්ෂම විද්‍යා හා තාක්ෂණ සේවාවක් අඛණ්ඩව සැපයීමට ප්‍රයත්නයක් දරණ ලදී. විවිධ දත්තපාදකවල යාවත්කාලීනයන් සහ වැඩි දියුණු කිරීම් පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු අදාළ අංශය යටතේ සම්පාදනය කර තිබේ.

පළමු අවධිය ලෙස 2013 දී ඇරඹුණු ජාතික ඩිජිටල්කරණය ව්‍යාපෘතියෙහි දෙවන අවධිය 2015 දී ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතියෙහි තෙවන අවධිය ක්‍රියාත්මක කරනු පිණිස සුදුසු සේවාදායකයකු තෝරා ගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

වාරසඟරා ද්විත්වය ප්‍රකාශනය කිරීමේ වැඩකටයුතු සිදු කෙරෙමින් පැවතුණු අතර ඒ අනුව, ජාතික විද්‍යා පදනමේ වාරසඟරාවෙහි (JNSF) 44 වන වෙළුමට අයත් සම්පූර්ණ කලාප හතරම (04) ප්‍රකාශනය කරන ලදී. ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාවෙහි 2015ට අයත් එක් කලාපයක් (38 වෙළුම, අංක 01) සහ 2016ට අයත් එක් කලාපයක් (39 වෙළුම, අංක 01) ප්‍රකාශනය කෙරුණි. තිස් නමවෙනි (39) වෙළුමෙහි අංක 02, එනම්, 2016 දෙසැම්බර් කලාපයෙහි වැඩකටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

### *විද්‍යා ප්‍රචලිත කිරීම*

ජාතික විද්‍යා පදනම විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වූ තම සේවය වසර පුරා අඛණ්ඩව ලබා දුන්නාය. "සැමට විද්‍යාව" යන තේමාව යටතේ පාසල් ප්‍රජාව සහ මහජනතාව වෙත වැඩසටහන් මාලාවක් මේ යටතේ වසර තුළ ක්‍රියාත්මක කෙරුණි. "මිහිමඬල" වැඩසටහනෙහි දෙවන අවධියට අයත් වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කිරීම අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. ප්‍රධාන දායකත්වය පිළිබඳ විශේෂ හැඳින්වීමක් සහිතව විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා සිදු කරන ලද කටයුතු මෙම වාර්තාවේ අදාළ කොටස යටතේ විස්තර කර තිබේ.

### *ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා ද්වාරය*

අප රටේ විද්‍යාඥයින්ගේ හැකියාව සහ නිපුණතාව සංවර්ධනය කිරීමට මෙන්ම විදෙස් රටවල ඇති පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල සමග ජාතික විද්‍යා පදනම ජාත්‍යන්තර සබඳතාවය පවත්වා ගෙන යයි. ඒ අනුව, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතාවය ඔස්සේ විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය දෙසට ලබා දෙන්නා වූ දායකත්වය ඉහළ නැංවීම සහතික කිරීමට ජාත්‍යන්තර සහයෝගිතාවයට අදාළ වූ ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කිරීමට ජාතික විද්‍යා පදනම පියවර ගත්තාය. සහයෝගිතාවය සඳහා නව අදහස් ආකර්ෂණය කර ගනිමින් සහ නව සබඳතා ස්ථාපිත කර ගනිමින් විදේශීය සහ අදාළ දේශීය විශේෂඥයින්, සමග රැස්වීම් සහ වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලදී. අවබෝධතා ගිවිසුම් කිහිපයක් අත්සන් කරන ලද අතර නව අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම හා සම්බන්ධ වැඩ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

පෙර වසරවලදී සිදු කරන ලද ආකාරයට 2016 වර්ෂය තුළ ද ජාත්‍යන්තර සහයෝගිතාවය සහ ජාත්‍යන්තරයට විවෘතවීම සඳහා දේශීය විද්‍යාඥයින්ට උපකාර ලබා දීමට වැඩසටහන් සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලදී.

*ශ්‍රම බලකාය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම*

යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම උදෙසා සහ ආයතනික අභිමතාර්ථ ඉටු කර ගැනීම අරබයා පියවර වශයෙන් ආයතනයේ ඵලදායී කාර්යක්ෂමතාවයකට පදනම සපයන කාර්යක්ෂම මානව සම්පත් කණ්ඩායමක් නිර්මාණය කර ගැනීම උදෙසා ගතවුණු වසර පුරා ජාතික විද්‍යා පදනම අඛණ්ඩ උත්සාහයක නිරත විය. කාර්යමණ්ඩල සංවර්ධන කමිටුව මඟින් කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් බොහොමයක් සම්පාදනය කෙරුණි. කාර්යමණ්ඩලය උද්‍යෝගීමත් කිරීමට සහ ඔවුන් සතු ශක්තිය තමන් විසින්ම හඳුනා ගැනීමකට ලක් කිරීමට මෙන්ම ඔවුන්ගේ ශරීර සෞඛ්‍යය වැඩිදියුණු කිරීම පිණිස නව වැඩසටහන් දෙකක්, එනම්, කායික පුහුණුව සහ භාෂා (ඉංග්‍රීසි) පුහුණුව ආරම්භ කර පවත්වාගෙන යෑම සිදු කරන ලදී. මෙම වැඩසටහන් දෙක කාර්යයමණ්ඩලය විසින් ඉහළින් අගය කරන ලදී. සෞඛ්‍ය තත්වයේ වැඩි දියුණු වීම සහ භෞතික කාර්ය සාධනයෙහි වැඩි දියුණු වීම හේතු කොට ගෙන කාර්යමණ්ඩලය විසින් විශේෂයෙන් කායික පුහුණු වැඩසටහනට ඉහළ ඇගයීමක් ලබා දෙන ලදී.

*ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්*

"පර්යේෂණ සමුළුව 2016" සමග විශේෂ ව්‍යාපෘතිය සාර්ථක ලෙස ආරම්භ කරන ලදී. පිළිකා, ඩෙංගු, හේතුකාරකය නොදන්නා වකුගඩු රෝගය, සහ දියවැඩියාව ලෙස හඳුනාගන්නා ලද තේමා හතරක් යටතේ වූ අදාළ ක්ෂේත්‍රවල කටයුතු කරන විද්‍යාඥයින්ගෙන් "උනන්දුව ප්‍රකාශ කිරීම්" කැඳවන ලදී. මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ විසිරුණු පර්යේෂණ අරමුදල් වලින් සෑහෙන ප්‍රමාණයක් ජාතික වැදගත්කමකින් යුත් ක්ෂේත්‍ර කරා යොමුකිරීමේ සහ අවශ්‍යතා පාදක කොටගත් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම් අදහස ඇතිවය. කැමැත්ත ප්‍රකාශකිරීම් 38ක් ලැබුණු අතර සාකච්ඡා පදනම් කොටගෙන පූර්ණ ව්‍යාපෘති යෝජනා 24ක් සකසන ලද අතර ඒ සඳහා ප්‍රදාන පිරිනැමීම සිදු කරන ලදී.

ජාතික විද්‍යා පදනම සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය (ඵෂෂ) අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මත "කුරුඳු සහ කුරුඳුවලට අදාළ ක්‍රියාකාරකම්" පිළිබඳ ව්‍යාපෘතිය, ඊට වෙන් කරන ලද රු. මිලියන 50ක මුදල උපරිම වශයෙන් යොදා ගනිමින් කුරුඳු කර්මාන්තයට යම් බලපෑමක් සිදු කිරීමේ සහ ජගත් වෙළඳපොළ ග්‍රහණය කර ගැනීමේ අරමුණු සහිතව දියත් කරන ලදී. සාකච්ඡා පදනම් කොට ගෙන අයැදුම්පත්‍ර 22 ක් ඇගයීමට ලක් කළ අතර ප්‍රධාන යෝජනා පහක් (05) සකසන ලදුව අන්තර් - විෂයයික කණ්ඩායමක් මඟින් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ රාජකාරි ආවරණය කරන ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස 2017 අගෝස්තු 01 දින සිට ක්‍රියාකාරී සැලැස්ම 2016 හි සඳහන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා එය ක්‍රියාත්මක කිරීම පිණිස මවෙත ලබා දුන් සියලු සහයෝගයන්ට සමස්ත කාර්යමණ්ඩලයට සහ කළමනාකරණ මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙමි. වැඩකටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙහිලා නිසි නිර්දේශ ලබා දීමෙන් උපදේශක මණ්ඩල, පර්යේෂණ සහ අනෙකුත් ලබා දුන් දායකත්වය සහ ඉටුකළ කාර්යභාරය අතිමහත්ය. එහෙයින්, තම සේවය ජාතික විද්‍යා පදනම වෙත ලබා දීම වෙනුවෙන් උපදේශක මණ්ඩල සහ අනෙකුත් කමිටුවල සියලුම සාමාජිකයින්ට මාගේ කෘතඥතාවය හිමිවේ. සියලු බාධක මධ්‍යයේ දැඩි කැපවීමකින් කටයුතු කළ ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලයට ද උපදේශක මණ්ඩලවල සහ කමිටුවල සාමාජිකයින්ගේ දායකත්වයට මෙන්ම ඔවුන්ගේ වටිනා කාලය වැය කිරීම උදෙසා ද ජාතික විද්‍යා පදනමෙහි කාර්යමණ්ඩලය වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි. විද්‍යාත්මක ප්‍රජාවගේ සහයෝගය සහිත වූ ජාතික විද්‍යා පදනම වෙත පවරන ලද කාර්යභාරය ක්‍රියාත්මක කිරීමේදී 2017 වර්ෂය ආකර්ෂණීය වසරක් වේවා යැයි මා ප්‍රාර්ථනා කරන අතර විද්‍යාවේ සහ තාක්ෂණයේ සංවර්ධනය ඔස්සේ ජාතික විද්‍යා පදනම සමාජ-ආර්ථික වර්ධනයට ඉහළ දායකත්වයක් ලබා දෙනු ඇත.

**ආචාර්ය තමාරා එෆ්. ඩයස්**
**අධ්‍යක්ෂ ජනරාල් (ආවරණ)**

# පටුන

**සභාපතිතුමියගේ පණිවුඩය** I
**අධ්‍යක්ෂ ජනරාලගේ වාර්තාව** IV
**පටුන** IX

සමස්ත විග්‍රහය, සාරධර්ම, දැක්ම, මෙහෙවර හා පවරන ලද කාර්යභාරය 1
මුඛ්‍ය දර්ශනය 2
ජාතික විද්‍යා පදනමෙහි කළමනාකරණ මණ්ඩලය 3
ආයතනික ව්‍යුහය 5
ජාතික විද්‍යා පදනමේ ජාතික කමිටු 6

2016 විශේෂ අවස්ථා 7
මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ සහ විද්‍යාත්මක සමුළු සඳහා උපකාර කිරීම මගින් මහජනතාවගේ සුබසාධනය ඉහළ නැංවීම 11
විද්‍යාත්මක සහ තාක්ෂණික පුද්ගලයින්ගේ විධිමත් නාමලේඛනයක් පවත්වාගෙන යෑම 33
ශ්‍රී ලංකාව සහ විදේශයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා උපකාර කිරීම 37
පාසල් ළමුන් සහ මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම 47
විද්‍යා හා තාක්ෂණ ආයතනවල විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ඔස්සේ ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ හැකියාවන් ගොඩනැගීම, ප්‍රවර්ධනය කිරීම සහ ඉහළ නැංවීම 57
යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ රාජකාරි සිදුකරන වාතාවරණය වැඩි දියුණු කිරීම 63

**මූල්‍ය ප්‍රකාශන**
2016 කාර්යසාධනය පිළිබඳ ගිණුම්කරණ නිලධාරියාගේ නිරීක්ෂණ 68
2016 දෙසැම්බර් 31 වන විට මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය 71
මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය 72
ගිණුම් පිළිබඳ සටහන් 73

**2016 විගණන වාර්තාව**
විගණකාධිපති වාර්තාව 81
විගණන වාර්තාව පිළිබඳ ජාතික විද්‍යා පදනමේ අදහස් 89

**ඇමුණුම්**
ඇමුණුම 1 - 2016 තුළ පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන 120
ඇමුණුම 2 - 2016 තුළ නිම කරන ලද පර්යේෂණ ප්‍රදාන 124
ඇමුණුම 3 - පර්යේෂණ ප්‍රදාන වැඩසටහන - 2016 සාරාංශය 129
ඇමුණුම 4 - 2016 ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ජාතික තේමා මූලික වැඩසටහනෙහි ක්‍රියාත්මක තත්වයේ පවතින ව්‍යාපෘති 130
ඇමුණුම 5 - 2016 දී පිරිනමන ලද පර්යේෂණ උපකරණ ප්‍රදාන 131
ඇමුණුම 6 - 2016 වසරේ දී පිරිනමන ලද තාක්ෂණ ප්‍රදාන 135
ඇමුණුම 7 - ජාතික විද්‍යා පදනම් තාක්ෂණ සම්මාන/ඇගයීම් සහතික 2015 සඳහා තෝරා ගන්නා ලද ව්‍යාපෘති 136
ඇමුණුම 8 - සස්රෙඩ් (SUSRED) සම්මාන 137
ඇමුණුම 9 - විවිධ කාණ්ඩ යටතේ කුසලතාලභීන්ගේ (NASTA) සම්මාන/සහතික සහ එම ව්‍යාපෘති 140
ඇමුණුම 10 - විද්‍යාත්මක රැස්වීම් සහ පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රාකත්වය 141
ඇමුණුම 11 - 2016 දී පිරිනමන ලද පර්යේෂණ ශිෂ්‍යත්ව 144
ඇමුණුම 12 - 2016 දී නිම කරන ලද පර්යේෂණ ශිෂ්‍යත්ව 146
ඇමුණුම 13 - චාරිකා ප්‍රදාන පිරිනැමීමේ විස්තර 147
ඇමුණුම 14 - OSTP සම්මාන විස්තර 156
ඇමුණුම 15 - IPSAT සම්මාන විස්තර 162
ඇමුණුම 16 - විදේශීය සහ දේශීය සම්මේලන, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලයේ සහභාගීත්වය 166
ඇමුණුම 17 - ප්‍රධාන කාර්යමණ්ඩලය - 2016.12.31 වන විට 168

## සමස්ත විග්‍රහය

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙහි විෂයපථය යටතේ ක්‍රියාත්මක වන ජාතික විද්‍යා පදනම 2016 මැයි මාසයේදී ජාතිය වෙත කැපවුණු තම සේවාවේ 48 වන වසර සම්පූර්ණ කරයි. මෙම ආයතනය, ජාතික විද්‍යා සභාව (ජීක) ලෙස (1968 දී අංක 09 දරණ පනත මඟින්) ස්ථාපිත කෙරුණි. ජාතික විද්‍යා සභාව 1982 දී (1981 අංක 78 දරණ පනත මඟින්) ස්වභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය (නරේසා) ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඉන් වසර 16ක සේවා කාලයකින් අනතුරුව, 1998 දී (1994 අංක 11 දරණ පනත මඟින්) නරේසා, ජාතික විද්‍යා පදනම ලෙස ප්‍රතිසංවිධානය කරන ලදී.

## සාරධර්ම

විද්‍යාවේ සාර්විකතාවය සහ දැනුම පරිශීලනයේ නිදහස යන මූලධර්ම ද්විත්වය අනුමත කරන අතරම, තනි පුද්ගලයින් ලෙස, අනෙක් විද්‍යාඥයින් සමඟ සන්නිවේදනය කිරීමට, විද්‍යාත්මක යෝග්‍යතාව හැරුණු විට භූමිය අනුව සිදු කෙරෙන වෙනස්කම් නොසලකා තම විද්‍යාත්මක කටයුතු වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාඥයින් සතු නිදහස පිළිගැනීමට සහ අනුමත කිරීමට ජාතික විද්‍යා පදනම කැපවී කටයුතු කරයි. එපමණක් ද නොව විද්‍යාඥයින්ගේ අයිතීන් සහ වගකීම් සම්බන්ධයෙන් තම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ජාතික විද්‍යා පදනම වයස, ජනවාර්ගික සම්භවය, ලිංගභේදය, භාෂාව, භෞතික විකලාංග බව, දේශපාලන ස්ථාවරය සහ ආගම යන දෑ පදනම් කොටගත් වෙනස්කම් සඳහා එදිරිව කටයුතු කරයි.

## දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සෞභාග්‍යය උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනයන ප්‍රවර්ධනය කරන්නා වූ ජාතියේ ප්‍රමුඛතම ගාමක බලවේගය බවට පත් වීම.

## මෙහෙවර

විනිවිද පෙනෙන බව, වගකිව යුතු බව, සාධාරණත්වය, සමානාත්මතාවය සහ තිරසර බවෙහි මූලධර්ම සහතික කිරීමෙන් සහ ආයතනයෙහි කාර්යමණ්ඩලය සුරක්ෂිත කරමින්,

- ඵලදායක හා කාර්යක්ෂම දැනුම් සමාජයක් සහ ආර්ථිකයක් ගොඩනැගීමට සහ
- අප රටේ ජනතාවගේ ජීවිතයෙහි ගුණාත්මකභාවය සහ ජීවන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා දායක වීමට,

මූලාධාර සැපයීම, දැනුම් උත්පාදනය කිරීම, හැකියාවන් වර්ධනය කිරීම, සහ විද්‍යාව ප්‍රචලිත කිරීම ඔස්සේ, පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන මෙන්ම තාක්ෂණය ගෙනයෑම සඳහා මූලාරම්භය සැපයීම, පහසුකම් සැපයීම, සහ උපකාර කිරීම.

## පවරන ලද කාර්ය

එක් දහස් නවසිය අනූහතරෙහි (1994) අංක 11 දරණ පනත මඟින් පහත සඳහන් කාර්ය ජාතික විද්‍යා පදනම වෙත පවරනු ලැබ ඇත.

(අ) පහත සඳහන් දෑ සඳහා විශ්ව විද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන, සහ විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන මූලික සහ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ සඳහා මූලාරම්භය සැපයීම, පහසුකම් සැපයීම සහ උපකාර කිරීම.

- සමාජ විද්‍යාවෙහි පර්යේෂණ ද ඇතුළත් විද්‍යාත්මක පර්යේෂණ විභවය සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම.

- ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වැඩි දියුණු කිරීම.

- ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.

- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල පර්යේෂකයන් පුහුණු කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ සිටින සහ විදෙස්ගත විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කරගැනීම සඳහා උපකාර කිරීම.

(ඇ) පිළිගත් විද්‍යා හා තාක්ෂණ ආයතනයක දී සිදු කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයනය සහ විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව පිරිනැමීම.

(ඈ) විද්‍යාත්මක සහ තාක්ෂණික පුද්ගලයන් පිළිබඳ සහ විද්‍යාත්මක පර්යේෂණ සහ අභිවර්ධනය සඳහා මානව, භෞතික සහ මූල්‍යමය ප්‍රභව ප්‍රතිශිප්ත අවශ්‍යතා පිණිස දත්ත සහ ප්‍රතිපත්ති බැඳුණු තොරතුරු පිළිබඳ යාවත්කාලීන කරන ලද නාම ලේඛණයක් පවත්වාගෙන යෑම.

(ඉ) මූලාධාර සැපයීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් මහජනයා අතර විද්‍යාව ප්‍රචලිත කිරීම.

## මුඛ්‍ය දර්ශනය

ජාතික විද්‍යා පදනම මූලධර්ම දෙකකට බැඳී සිටී.

***විද්‍යාවේ සාර්විකතාවය***

විද්‍යාවේ සාර්විකතාවය සහ දැනුම පරිශීලනයේ නිදහස, ගෝලීය වශයෙන් අනෙකුත් විද්‍යාඥයින් ඇසුරු කිරීම හා ඔවුන් සමග සන්නිවේදනය කිරීම, විද්‍යාත්මක යෝග්‍යතාවය හැරුණු විට වෙනත් පදනම් මත වෙනස්කම් නොමැතිව තම විද්‍යාත්මක දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා විද්‍යාඥයින් සතු නිදහස ජාතික විද්‍යා පදනම පිළිගන්නා අතර අනුමත කිරීම සිදු කරයි. එපමණක් ද නොව, විද්‍යාඥයන්ගේ අයිතීන් සහ වගකීම් සම්බන්ධයෙන් තම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ජාතික විද්‍යා පදනම වයස, ජනවාර්ගික සම්භවය, ලිංග භේදය, භාෂාව, භෞතික විකලාංග බව, දේශපාලන ස්ථාවරය සහ ආගම යන දෑ පදනම් කොටගත් වෙනස්කම් සඳහා එදිරිව කටයුතු කරයි. සිතාමතාම සිදු කරන හෝ නොඑසේනම් මෙම මූලධර්මය වළකාලන කිසිම ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් මගින් තම කාර්යයන්ට බාධා කිරීම ජාතික විද්‍යා පදනම පිළිනොගනු ඇත.

***විද්‍යාව අන්වේෂණය කිරීමේ නිදහස***

පිළිගත් විද්‍යාත්මක ක්‍රියාවලීන්ට අනුව සහ ඒ පිළිබඳව වගකීම දරණු ඇතැයි යන කාරණාවලට යටත්ව, විද්‍යාව නිදහසේ අන්වේෂණය කිරීමට විද්‍යාඥයන් සතු අයිතීන් ජාතික විද්‍යා පදනම පිළිගැනීම සහ අනුමත කිරීම සිදු කරයි. සෑම විද්‍යාඥයකුම තම විද්‍යාත්මක කටයුතු අවංකව, ඍජුභාවයකින් යුක්තව, විවෘතව, සාරධර්මවලට අනුකූලව සහ ගරුත්වයකින් යුතුව සිදු කරනු ඇතැයි ද විද්‍යාවෙහි ප්‍රතිලාභ උපරිම කර ගැනීමට සහ සමාජය සඳහා සමස්තයක් ලෙස විද්‍යාව අවභාවිතය දුරු කිරීමට සාමූහික ප්‍රයත්නයක් දරණ බව ජාතික විද්‍යා පදනම පිළිගනී.

## ජාතික විද්‍යා පදනමෙහි කළමනාකරණ මණ්ඩලය

සභාපතිනිය, අධ්‍යක්ෂ ජනරාල්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC), ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL), ජාතික අධ්‍යාපන ආයතනය (NIE) සහ මුදල් අමාත්‍යාංශය යන ආයතන නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු බැගින් ද ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් ද සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් ජාතික විද්‍යා පදනම පාලනය කෙරේ.

**මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු** *(2015.06.08 දින සිට)*
සභාපතිනිය
ජාතික විද්‍යා පදනම,
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7
*chm@nsf.ac.lk*

**මහාචාර්ය ඩබ්.එම්. සුමතිපාල**
*(2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා)*
මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
500, ඩී.බී ජයා මාවත,
කොළඹ 10
*wlsumathipala@hotmail.com*

**එච්. සී. ඩී.එල්. සිල්වා**
*(2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා)*
අධ්‍යක්ෂ
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01
*dilipl@tod.treasury.gov.lk*

**මහාචාර්ය තක්ෂිලා සේරසිංහ**
*(2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා)*
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව,
කෘෂිකර්ම පීඨය,
රුහුණු විශ්ව විද්‍යාලය,
මාපලාන, කඹුරුපිටිය
*tseresinhe@gmail.com*

**මහාචාර්ය සී. දීපාල් මැතිව්**
*(2016.01.01 සිට 2016.07.07 දක්වා)*
මහා සභාපති
ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය,
120/10, විද්‍යා මන්දිරය,
විජේරාම මාවත, කොළඹ 07
*preethimathew@lycos.com*

**මහාචාර්ය මංජුලා විදානපතිරණ**
*(2016.07.20 සිට)*
ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය,
120/10, විද්‍යා මන්දිරය,
විජේරාම මාවත, කොළඹ 07
*mvibhasini@hotmail.com*

**ආචාර්ය ඩී.එම්. සුරතිස්ස**
*(2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා)*
*සත්ව විද්‍යා අංශය,*
*කොළඹ විශ්ව විද්‍යාලය,*
*කොළඹ 3*
*suratissa@yahoo.com*

**ජේ. යෝගරාජ් මහතා**
*(2016.01.01 සිට 2016.11.23 දක්වා)*
30/36D-1/1,
චාල්ස් මහල් නිවාස,
ද සිල්වා පාර,
කළුබෝවිල, දෙහිවල.
*yogaraj35@gmail.com*

**වෛද්‍ය ගෝඨාභය රණසිංහ**
*(2016.11.24 සිට)*
හෘද රෝග විශේෂඥ
හෘද වෛද්‍යවේද ආයතනය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ 10
*gotabhayar@gmail.com*

**එම්.එච්.එස්.පී. ජයවර්ධන මහතා**
*(2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විද්‍යා හා තාක්ෂණ)
ජාතික අධ්‍යාපන ආයතනය,
හයිලෙවල් පාර, මහරගම
*sjayawardene@hotmail.com*

**මහාචාර්ය හේමන්ත සේනානායක**
*(2016.01.01 සිට 2016.07.07 දක්වා)*
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම,
20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
*senanaykeh@gmail.com*

**මහාචාර්ය මොහාන් ද සිල්වා**
*(2016.08.29 සිට)*
සභාපති
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම,
20, වෝඩ් පෙදෙස, කොළඹ 07
*thathya.ds@gmail.com*

**ඉංජිනේරු (මහාචාර්ය) ටී.එම්. පැලවත්ත**
*(2016.01.01 සිට 2016.10.21 දක්වා)*
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය,
120/15, විජේරාම මාවත,
කොළඹ 07
*tmpal@ou.ac.lk*

**ඉංජිනේරු ජයවිලාල් මීගොඩ**
*(2016.10.22 සිට)*
සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය,
120/15, විජේරාම මාවත,
කොළඹ 07
*jmeegoda@gmail.com*

# ආයතනික ව්‍යුහය


සභාපති හා කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී)
අතිරේක අධ්‍යක්ෂ
පර්යේෂණ අංශය
විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය
විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය
ජාත්‍යන්තර සබඳතා අංශය
තාක්ෂණ අංශය
ජාතික විද්‍යා පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය
මූල්‍ය අංශය
පරිපාලන අංශය
වාරසඟරා ප්‍රකාශන ඒකකය
මුද්‍රණ ඒකකය
තොරතුරු තාක්ෂණ ඒකකය
අභ්‍යන්තර විගණන ඒකකය

# ජාතික විද්‍යා පදනම් කමිටු

- **ජාතික විද්‍යා පදනම් ක්‍රියාකාරී කමිටු**

ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා හා තාක්‍ෂණ ප්‍රතිපත්තිය හා සමගාමීව ගමන් කිරීමට හා එක් දහස් නවසිය අනූ හතර (1994) අංක 11 දරණ විද්‍යා තාක්‍ෂණ සංවර්ධන පනතේහි සඳහන් අවශ්‍යතා සපුරාලීමේ අදහස ඇතිව, සහ ශ්‍රී ලංකා ජාතික විද්‍යා හා තාක්‍ෂණ ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකිරීමට ජාතික විද්‍යා පදනම විශේෂඥ ක්‍රියාකාරී කමිටු පත් කරනු ලැබ ඇත. ජාතික සංවර්ධන අභිමතාර්ථයන් දෙසට නැඹුරුවක් සහිතව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්‍ෂණ ප්‍රතිපත්තිය සමග අනුකූලතාවය සහතික කරන අතරම ජාතික විද්‍යා පදනමට පවරන ලද කාර්ය මත පදනම්ව එහි සැලසුම් සහ වැඩසටහන් සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව කළමනාකරණ මණ්ඩලයට (BoM) උපදෙස් ලබා දීම ඉහත ක්‍රියාකාරී කමිටුවල වගකීමය.

විමර්ශනයට ලක් කෙරෙන වසර තුළ පහත සඳහන් ජාතික විද්‍යා පදනම් ක්‍රියාකාරී කමිටු පදනම වෙත තම සේවය සක්‍රිය ලෙස සපයා තිබේ.

ජාතික විද්‍යා පදනම් මූලික විද්‍යා ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් ජෛව තාක්‍ෂණ හා ජෛවාචාරධර්ම ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් කෘෂිකර්ම හා ආහාර විද්‍යා ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් සමුද්‍ර විද්‍යා හා මුහුදු සම්පත් ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් සෞඛ්‍ය විද්‍යා ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් පරිසරය හා ජෛව විවිධත්ව ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් ඉංජිනේරු විද්‍යා, වාස්තු විද්‍යා සහ තොරතුරු හා සන්නිවේදන ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් යුනෙස්කෝ සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් විද්‍යාව, ගණිතය හා ඉංජිනේරු විද්‍යා අධ්‍යාපනක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් පුස්තකාල හා තොරතුරු තාක්‍ෂණ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් සමාජ විද්‍යා ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් විද්‍යා හා තාක්‍ෂණ ප්‍රතිපත්ති අධ්‍යයන ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් දේශීය දැනුම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනම් ජාත්‍යන්තර සබඳතා ක්‍රියාකාරී කමිටුව

- **ජාතික කමිටු**:

මිනිසා හා ජෛවගෝල ජාතික කමිටුව

- **විශේෂ කමිටු**:

සංස්කාරක මණ්ඩලය - ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් වාරසඟරාව (JNSF)
සංස්කාරක මණ්ඩලය - ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාව (SLJSS)
Research Advisory Board (RAB)

- **මෙහෙයුම් කමිටු**:

දේශගුණික විපර්යාස සහ ස්වභාවික විපත් මෙහෙයුම් කමිටුව

# 2016 විශේෂ අවස්ථා

- ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම (NSF) සහ පාකිස්තාන විද්‍යා පදනම (PSF) අතර ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතා පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2016 ජනවාරි 18).

- ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම (NSF) සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම (NSFC) අතර ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතා පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2016 අප්‍රේල් 08).

- කොළඹ දී පවත්වන ලද (2016 සැප්තැම්බර් 06-07) "ශ්‍රී ලංකා සමාජය සඳහා විද්‍යා හා තාක්ෂණ (STS) සංසදය" සමග එකකට පසු එකක් ලෙස සූදානම් කරන ලද "ජාතික විද්‍යා පදනම් ජගත් හවුල්කාරිත්වය" යන තේමාව යටතේ ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය, චීනය හා ජපානය යන රටවල සුප්‍රකට විද්‍යාත්මක ආයතන සමග රැස්වීම් පැවැත්වීමෙන් ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතාවය ශක්තිමත් කිරීම.

- ජපාන විද්‍යා සභාවේ (JST) සක්‍රීය දායකත්වය සහිතව ආසියා විද්‍යා සභාවේ කේන්ද්‍රීය ලක්ෂ්‍යය වන ශ්‍රී ලංකා ජතික විද්‍යා ඇකඩමිය සමග සමසංවිධායකත්වයක් දරමින් ආසියා විද්‍යා සභාවේ 16 වන සම්මේලනය (තේමාව : ජනතාව සඳහා විද්‍යාව : ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා නවීන තාක්ෂණයන් මෙහෙයවීම) පැවැත්වීම (2016 මැයි 30 - ජූනි 01 : කොළඹ).

- ගරු විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම අනුව යුනෙස්කෝවේ විද්‍යා කටයුතුවලට සමගාමීව ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන විද්‍යාත්මක වැඩසටහන් පිළිබඳව යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් ඉරිනා බොකෝවා මහත්මිය දැනුවත් කිරීම පිණිස ශ්‍රී ලංකීය විද්‍යාඥයින්ගේ සහභාගිත්වයෙන් "විද්‍යා - සංවාදය" සංවිධානය කිරීම (2016 අගෝස්තු 16).

- තෙවැනි ලොව විද්‍යා ඇකඩමි සම්මානය සඳහා රසායන විද්‍යාව සහ ජෛව විද්‍යාව යන ක්ෂේත්‍රවලින් නාම යෝජනා 2ක් ඉදිරිපත් කිරීම සහ තෙවැනි ලොව විද්‍යා ඇකඩමි ලේකම් කාර්යාලයෙන් එකී නාමයෝජනා ද්විත්වය සඳහා අනුමැතිය ලබා දීම.

- ජාතික විද්‍යා පදනම් විදේශීය පුහුණු වැඩසටහන (OSTP) යටතේ ප්‍රදාන 48ක් පිරිනැමීම.

- විද්‍යාව සහ තාක්ෂණය සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වය (IPSAT) යටතේ ප්‍රදාන 15ක් පිරිනැමීම.

- තම පර්යේෂණ සොයා ගැනීම් අන් අය සමග බෙදාගැනීම, දැනුම ඉහළ නංවා ගැනීම, සහ අනාගත සහයෝගිතා කටයුතු සඳහා ලොව පුරා වෙසෙන සමාන ක්ෂේත්‍රවල කටයුතු කරන විද්‍යාඥයින් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම යනාදිය සඳහා ජාත්‍යන්තර සම්මේලනවලට සහභාගිවීම පිණිස චාරිකා ප්‍රදාන 63ක් පිරිනැමීම.

- ගරු විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමන්, විද්‍යාඥයින්, තොරතුරු වෘත්තිකයින් සහ දේශීය මාධ්‍යකරුවන් ඉදිරියේ ශ්‍රී ලංකා වාරසඟරා මාර්ගගතය (SLJOL) උසස් කරන ලද නවීනතම වේදිකාව මුදාහැරීම.

- ශ්‍රී ලංකා වාරසඟරා මාර්ගගතය (SLJOL) මගින් දේශීයව සම්භවය වූ වාරසඟරා 69ක් ප්‍රකාශනය කිරීම.

- ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියෙහි තෙවන අවධිය මගින් ශ්‍රී ලංකාවේ ආයතන 15ක තිබෙන්නාවූ දේශීය විද්‍යා හා තාක්ෂණ ලිඛිතයන් ඩිජිටල්කරණය ආරම්භ කිරීම.

- ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ඇති සියලුම මාර්ගගත දත්තපාදක JISIS නමින් හැඳින්වෙන අලුතෙන් සංවර්ධනය කරන ලද බහුවේදිකා නිදහස් විවෘත ප්‍රභව මෘදුකාංග වාතාවරණයකට එක් කිරීම.

- විද්‍යාඥයින්, කර්මාන්තකරුවන්, උපාධි අපේක්ෂකයින් සහ 2015 අපොස උ/පෙළ විශිෂ්ට දක්ෂතා දැක්වූවන් යනාදීන් 500කට අධික සහභාගිත්වයක් සහිතව "පර්යේෂණ සහ නවෝත්පාදන මගින් බලාත්මක කිරීම - ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සමුළුව" සාර්ථක ලෙස සංවිධානය කිරීම (2016 ජූලි 7 සහ 8, BMICH, කොළඹ).

- දියවැඩියාව, ඩෙංගු, CKDu සහ පිළිකා හා සම්බන්ධ පර්යේෂණවලට උපකාර කිරීම සහ සහයෝගය දැක්වීම පිණිස වූ සෞඛ්‍ය විද්‍යා පර්යේසණ වැඩසටහන (RPHS) යටතේ ප්‍රදාන 24ක් පිරිනැමීම.

- රජය සහ පුද්ගලික අංශය මගින් ජාතික තේමාමූලික පර්යේෂණ වැඩසටහන (NTRP) යටතේ වූ ආහාර සුරක්ෂිතතාව වැඩසටහනේ ප්‍රතිඵල භාවිතයට ගැනීම.

- අප රටේ පර්යේෂණ පදනම ශක්තිමත් කරමින් සහ පර්යේෂණයන්හි නියැලීමට විද්‍යාඥයින්ට පහසුකම් සපයමින් සහ එමගින් ජාතික සංවර්ධනයට දායකවෙමින් සිදු කෙරෙමින් පවතින පර්යේෂණ ප්‍රදාන 115ක් (නව ප්‍රදාන 24ක් ද ඇතුලත්ව) සඳහා මූල්‍යාධාර සම්පාදනය කිරීම.

- පහත දැක්වෙන පරිදි මානව සම්පත් හැකියාවන් ගොඩනැගීම ඔස්සේ ජාතික පර්යේෂණ සහ නවෝත්පාදන පද්ධතියක් (NRIS) සංවර්ධනය කිරීමෙහිලා සහයෝගය ලබා දීම.

  - ☆ පශ්චාත් උපාධි 15ක් නිම කිරීම
  - ☆ උපාධිධාරී පර්යේෂණ ශිෂ්‍යයින් 16ක් පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි කිරීම
  - ☆ දර්ශනශූරී (PhD) සහ දර්ශනපති (M.Phil) උපාධි අධීක්ෂණ කණ්ඩායම් 24ක් සඳහා සස්රෙඩ් (SUSRED) සම්මාන පිරිනමීම.
  - ☆ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ඉහළ දක්ෂතා දක්වන ලද උපාධිධාරීන් 06 දෙනෙකුට නව පර්යේෂණ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
  - ☆ ශිෂ්‍යත්ව 04ක් (දර්ශනශූරී - 01, දර්ශනපති - 03) නිම කිරීම.

- විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟ (SRPC) ඉතිහාසයේ ප්‍රථම වරට ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයෙන් (2016 මැයි 08-13 දක්වා ඇමරිකාවේ ඇරිසෝනා ප්‍රාන්තයේ ෆීනික්ස් හි පවත්වන ලද) ජාත්‍යන්තර ජයග්‍රාහකයකු බිහි කිරීම.

- විදේශීය රටවල පැවැත්වෙන විද්‍යා අධ්‍යාපන සහ ප්‍රචලිත කිරීමේ වැඩසටහන්වලට පාසල් සිසුන්ට, ගුරුවරුන්ට සහ විශ් විද්‍යාල ශිෂ්‍යයින්ට සහභාගිවීම සඳහා මූල්‍යාධාර සැපයීම පිණිස "විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන (OSEP)" නම් වූ ප්‍රදාන යෝජනා ක්‍රමය ආරම්භ කිරීම.

- "ජාතික ප්‍රතිපත්තිය තුළ මහා දත්තවල ප්‍රවණතා සහ ගම්‍යතා" යන මැයෙන් මහා දත්ත පිළිබඳ ප්‍රථම සම්මන්ත්‍රණය සංවිධානය කිරීම මගින් ජාතික ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා මහා දත්ත භාවිත කිරීම ප්‍රවර්ධනය පිණිස මූලාරම්භය සැපයීම.

- 2016 දෙසැම්බර් වන විට විද්‍යා සහ තාක්‍ෂණ කළමනාකරණ තොරතුරු පද්ධති (STMIS) දත්තපාදකයෙහි පුද්ගලයින් 6131ක තොරතුරු අන්තර්ගත කිරීම.

- ජාතික විද්‍යා පදනම් තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යටතේ ප්‍රදානය කරන ලද අරමුදල් භාවිතයෙන් බලංගොඩ ආශ්‍රිතව සිදු කරන ලද පර්යේෂණයකින් කාබන් දිනවලට අනුව ක්‍රි.පූ. 4350 දක්වා අතීතයේ දී භාවිත කරන ලද පැරණි ශාක බීජ, සමහර සත්ව සහ මිනිස් අස්ථි, වසර දහස් ගණනකට පෙර අප රටේ ජීවත් වූ මිනිසුන් භාවිත කළ ක්වෝට්ස්වලින් සෑදූ විචිත්‍ර අබරණ, සහ දඩයම් උපකරණ සොයා ගැනීම. මෙම සොයා ගැනීම් ශ්‍රී ලංකාවේ සංවර්ධිත හෙලෝසීන් සංස්කෘතියෙහි නොනැසී පැවැත්ම තහවුරු කර ඇත.

- පේරාදෙනිය විශ්ව විද්‍යාලය සහ අවිස්සාවේල්ල EPZහි ටෙක්ස්වර්ඩ් ජර්සි පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සමග සබුද්ධික රෙදි පිළි (පැල්ලම් ප්‍රතිරෝධී, ප්‍රති - ක්‍ෂුද්‍රජීවීමය, සුපිරි ජලභීතික රෙදිපිළි යනාදිය) සැපසීමේ තාක්‍ෂණ ප්‍රදාන යටතේ සිදු කරන ලද ව්‍යාපෘතියක ප්‍රතිඵල වාණිජකරණය කිරීම.

- ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන කර්මාන්තයේ වැඩි දියුණුව සඳහා තාක්‍ෂණ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වූ ස්වයංක්‍රීය කරන ලද ප්‍රකාශ පරීක්‍ෂාව (A01) සමග රොබෝ පද්ධතියක් නිර්මාණය කිරීම.

- ජාතික විද්‍යා පදනම ව්‍යාපෘති ඇගයුම සඳහා තාක්‍ෂණ සහයෝගය, අරමුදල් නිකුත් කිරීම, සහ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සමාලෝචනය කරන, රජය මගින් රු. මිලියන 50ක් වටිනා මුදල් වෙන්කිරීමක් සිදු කරන ලද කුරුඳු පිළිබඳ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය (MPI) සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම.

- හෘද්වාහිනී පද්ධතිය අධීක්‍ෂණය කිරීම සඳහා සහ එමගින් ඩෙංගු, CKDu වැනි රෝගවල තද බල භාවය හඳුනාගැනීමට උපකරණයක් සැකසීම පිළිබඳ කටයුතු සඳහා ජාතික විද්‍යා පදනම් තාක්‍ෂණ ප්‍රදාන

TG/2016/Tech-D/01ට අදාළ ප්‍රදානලාභියා ජෝන් කීල්ස් නවෝත්පාදන අභියෝග - 2016 තරඟයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීම. මෙම තරඟයට ප්‍රදානලාභියා විසින් එකී ව්‍යාපෘතිය ඔස්සේ මූලාකෘති දෙකක් ඉදිරිපත් කර ඇත.

- ❖ විශ්ව විද්‍යාල - ආයතන - කර්මාන්ත හවුල් සබඳතා ප්‍රවර්ධනය පිණිස ප්‍රතිපත්තියක් සකස් කිරීමේ මූලාරම්භය සැපයීම.

- ❖ ජාතික විද්‍යා පදනම් වාරසඟරාවේ 2016 සඳහා බලපෑම් සාධකය 0.277ක් වීම.

# මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ සහ විද්‍යාත්මක සමුළු සඳහා උපකාර කිරීම මගින් මහජනතාවගේ සුබ සාධනය ඉහළ නැංවීම

පවරන ලද කාර්යය :

විශ්ව විද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයින් විසින් සිදු කරන මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ සඳහා මූලාරම්භය සැපයීම, පහසුකම් සැපයීම සහ උපකාර කිරීම



# පර්යේෂණ ප්‍රදාන

## තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ආයතනවල තිබෙන්නා වූ මූල්‍ය, භෞතික සහ මිනිස්බල සම්පත් සඳහා අතිරේක සැපයීමට ජාතික විද්‍යා පදනම් තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන් කටයුතු කරයි. එය, විද්‍යාඥයින්ගේ ස්වාධීන, තනිපුද්ගල සහ බුද්ධිමය හැකියාව ගැනීමට සහ අප රටේ සමාජ-ආර්ථික සංවර්ධනය දෙසට දිශානත කරන ලද ඉහළ ප්‍රමිතියකින් යුත් පර්යේෂණ සිදු කරගෙන යෑම පිණිස විද්‍යාඥයින් දිරිමත් කිරීම සඳහා පහසුකම් සපයයි. විද්‍යා සහ තාක්ෂණයෙහි සියලුම ක්ෂේත්‍ර සඳහා තරඟකාරී පර්යේෂණ ප්‍රදාන පිරිනමනු ලබයි.

දෙදහස් දහසය (2016) වසර සඳහා අයදුම්පත් කැඳවමින් පළකරන ලද පුවත්පත් දැන්වීමට ප්‍රතිචාර ලෙස 2015 වර්ෂයේදී ලැබුණා වූ අයදුම්පත් 104 සකසන ලද අතර ඒ අතුරින් 24 ක් සඳහා 2016 වසර තුළ නව පර්යේෂණ ප්‍රදාන පිරිනැමීම සිදු කෙරුණි. දෙදහස් දහසය තුළ පිරිනමන ලද ප්‍රදාන පිළිබඳ තොරතුරු *ඇමුණුම 1* හි සඳහන් කර ඇත. කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරන ලද මඟපෙන්වීමට අනුව 2016 වසරේ දෙවන භාගය පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම්පත් වසරේ ඉතිරි අර්ධය පුරාම භාරදීමට කටයුතු සලසන ලදී. දෙවන වටය සඳහා නව අයදුම්පත් 25ක් සලකාබලන ලද අතර ජාතික විද්‍යා පදනම් ක්‍රියාපටිපාටියට අනුව එම අයදුම්පත්‍ර සැකසීම සිදු කරන ලදී. ඒ අතරින් අයදුම්පත් 11ක් අනුමත කරන ලදුව 2017 වර්ෂයේදී එම ප්‍රදාන පිරිනැමීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන ලදී.

ජාතික විද්‍යා පදනම මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳව සමීප දැනුවත්භාවයක් ලබා ගැනීම සඳහා නව ප්‍රදානලාභීන්ට අවස්ථාවක් ලබා දීම පිණිස අගෝස්තු 31 දින දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. නව ප්‍රදානලාභීන් 27 දෙනෙකු මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූහ.

ජාතික විද්‍යා පදනමේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යටතේ ඉහළ ප්‍රමිතියකින් යුත් පර්යේෂණ යෝජනා භාරදීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම පිණිස ඵලදායී පර්යේෂණ යෝජනා ලේඛනය පිළිබඳ වැඩමුළුවක්




2006-2016 කාලය තුළ පිරිනමන ලද තරඟකාරී ප්‍රදාන

අනාගත අයදුම්කරුවන් 104 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඔක්තෝම්බර් 07වන දින ජාතික විද්‍යා පදනමේදී පවත්වන ලදී. පර්යේෂණ යෝජනා සකස් කිරීමෙහිලා සැලකිය යුතු විවිධ අංශ පිළිබඳව ඉදිරිපත් කිරීම් තුනක් කෘතහස්ත විද්‍යාඥයන් විසින් සිදුකිරීමෙන් අනතුරුව සක්‍රීය සාකච්ඡාවක් පවත්වන ලදී.

ඉහළ ප්‍රගතියක් දක්වා තිබීම සහ මූල්‍යමය අවශ්‍යතා යන කාරණා පදනම් කරගෙන ව්‍යාපෘති 74ක් සඳහා අරමුදල් නිකුත් කරන ලදී. සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීම පිණිස, මෙම වසර තුළ ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණ හයක් (06) සංවිධානය කරන ලදී. දෙදහස් දහසය වසර තුළ ප්‍රදාන 33ක් නිම කර තිබුණි. ඒ පිළිබඳ විස්තර *ඇමුණුම 2*හි සඳහන් කර තිබේ. මෙම වසර තුළ පශ්චාත් උපාධි සඳහා පර්යේෂණ ශිෂ්‍යයින් 16ක් ලියාපදිංචි කෙරුණු අතර පශ්චාත් උපාධි 15ක් නිමකර තිබුණි. තරඟකාරී පර්යේෂණ ප්‍රදානවල 2016.12.31 වන විට කාර්යතත්වය *ඇමුණුම 3*හි ඉදිරිපත් කර ඇත.

## තරඟකාරී පර්යේෂණ ප්‍රදානවල විශේෂ අවස්ථා

***ව්‍යාපෘති මාතෘකාව*** : ශ්‍රී ලංකාවේ මිරිස්වල : (*Capsicum annum L.*) වයිරස් සහ වයිරඩ් සමාන රෝග පාලනය සඳහා අණුක තීරක හේතු කාරක නියෝජිත පද්ධතියක් සකස් කිරීම. **(RG/2011/BT/01)**

***විමර්ශක*** : **මහාචාර්ය දේවිකා එම්. ද කොස්තා,**
කෘෂි ජෛව විද්‍යා දෙපාර්තමේන්තුව,
කෘෂිකර්ම පීඨය,
පේරාදෙනිය විශ්ව විද්‍යාලය, පේරාදෙනිය



මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය

මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද සොයාගැනීම් බෝගයේ මූලික අවස්ථාවේදී සිදු කරන ලද නිවැරදි වූත් කාර්යක්ෂමවූත් අනාවරණ මගින් මිරිස් ශාකයට ප්‍රධාන ලෙස තර්ජනාත්මක වූ රෝගයක් පාලනය කිරීම සඳහා වැදගත් වනු ඇත. මෙම ප්‍රතිඵල, ජාතික ආර්ථික සංවර්ධනයට, දුගී බව තුරන් කිරීමට, මහජනතාවගේ සුබ සාධනය ඉහළ නැංවීමට සහ පරිසරයේ චිරස්තායීභාවය රැක ගැනීමට දායක වනු ඇත.

***ව්‍යාපෘති මාතෘකාව*** : වී වල දියුණු කරන ලක්ෂණයක් වූ ලවණතා දරා සිටීම උදෙසා සිතියම් පිළියෙල කිරීම **(RG/2011/BT/02)**.

***විමර්ශකයින්*** : **ආචාර්ය එන්.එස්. කෝට්ටෙආරච්චි**
ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය, වයඹ විශ්ව විද්‍යාලය, සහ

**අචාර්ය ගාමිණී සමරසිංහ**
ජෛව තාක්ෂණ ඒකකය, වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, බලංගොඩ.

වසරින් වසර වී සඳහා ඇති ඉල්ලුම ඉහළ යයි. වී නිෂ්පාදනයේදී ඇතිවන අභියෝගවලට මුහුණ දීම සඳහා ලවණතාවයේ බලපෑමට යටත් වූ ආන්තික භූමි භාවිතය සඳහා පියවර ගැනීම වැදගත් වේ. නෙමේරූ පැල අවධියේ සහ වර්ධනයේ මූලික අවධියේ දී බොහෝ වී ප්‍රභේද ලවණතාවයට සංවේදී වේ. ලවණතාවය නිසා ආන්තිකභාවයට පත් වූ බොහොමයක් ඉඩම්වලට යොදා ගත හැකි රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙහිදී ලවණතාවය දරා ගත හැකි මව් ශාකයක් වන AT 354 සහ ලවණතාවයට පාත්‍රී මව්ශාකයක් මත Bg 352 අතර දෙමුහුමක් සිදු කරන ලදී. At 354 x Bg 352 සිතියම්කරණ ගහනය තුළ ලවණතාවය දරාගැනීම සඳහා ප්‍රමාණාත්මක සලකුණු - පථ (QTL) හයක් සොයා ගන්නා ලදී. ලවණතා දරා ගැනීමේ තත්වයට පත් කිරීම පිණිස පිළිදෙමුහුම් අභිජනනය මගින් අනෙක් ප්‍රභේද තුළට ජාන තොරතුරු මාරු කිරීම සඳහා මෙය ප්‍රයෝජනවත් වනු ඇත. මෙම ව්‍යාපෘතිය ලවණතා දරා ගැනීමේ ප්‍රභේද සංවර්ධනය සඳහා මූලික පියවර දියත් කර තිබේ. තවදුරටත්, මෙම ව්‍යාපෘතිය QTL සිතියම්කරණය පිළිබඳ අතිවිශාල දැනුම් සම්භාරයක් උත්පාදනය කළ අතර එකී තොරතුරු දෙදින ජාතික සමුළුවක් ඔස්සේ ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් වෙත සන්නිවේදනය කරන ලදී.

**ව්‍යාපෘති මාතෘකාව** : වර්ධක හෝමෝන ඌනතාවයකින් යුත් ශ්‍රී ලාංකීය දරුවන් කැළක් තුළ වර්ධක හෝමෝනය (GH) සහ වර්ධක හෝමෝන නිකුත් කරන හෝමෝන ග්‍රාහකවල (GHRH-R) විකෘති සහ දම විචල්‍යතාව විස්තර කිරීම **(RG/2011/BT/03)**.

**විමර්ශකයින්** : **මහාචාර්ය කාමිනී මෙන්ඩිස්**
ජෛව රසායන අණුක ජීව විද්‍යා සහ ජෛවතාක්ෂ ආයතනය (IBMBB),

**අචාර්ය ශ්‍යාමා ද සිල්වා**, ළමා රෝග දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, සහ

**අචාර්ය ෆයිස් මරික්කාර්**, IBMBB, කොළඹ විශ්ව විද්‍යාලය.

වර්ධක හෝමෝන ඌනතාවය (GHD) සිරුරේ උස අඩුවීමට මඟ පාදයි. මෙයට පෙර ශ්‍රී ලාංකික දරුවන්ගේ වර්ධක හෝමෝන ඌනතාවයට ප්‍රවේණික හේතු අධ්‍යයනය කිරීමක් සිදු කොට නොමැත. වර්තමාන අධ්‍යයනයේදී, ජෛව රසායනිකව සහ සායනිකව වර්ධක හෝමෝන ඌනතාවය ඇති බවට තහවුරු කරන ලද ළමුන් කැළක *GH1,* සහ *GHRHR* (වර්ධක හෝමෝන නිකුත් කරන හෝමෝන ග්‍රාහකය) ජාන විස්තර කිරීම සිදු කරන ලදී.

මෙම ළමුන් කණ්ඩායම තුළ පහත සඳහන් දෑ නිරීක්ෂණය කරන ලදී. ළමුන් දෙදෙනෙකුගේ *GH1* ජාන මැකීයෑම, ළමුන් දෙදෙනෙකුගේ *GH1* ජානයේ ව්‍යාධිජනක විකෘති වාර්තා වීම, ළමුන් අට දෙනෙකුගේ *GHRHR* ජානයේ කෝඩෝන 72 විකෘතිය, සහ එක් ළමයෙකුගේ *GHRHR* ජානයේ කෝඩෝන 71 ව්‍යාධිජනක විකෘතිය. මෙයට අමතරව, *GH1* ජානයේ සහ *GHRHR* ජානයේ නොයෙක් දම විචල්‍යතා/ බහුරූපතා ද නිරීක්ෂණය කරන ලදී.

*GH1* සහ *GHRHR* ජාන සඳහා ප්‍රවේණි පිරික්සීම ස්ථාපිත කරනු ලැබීම බලපෑමට ලක් වූ ළමුන් හා දෙපවිපියන් පරීක්ෂාව සඳහා පහසුකම් සපයනු ඇත. අනාවරණය කරන ලද විකෘති ආවේණික වුවහොත්, බලපෑමට ලක්වෙන දරු උපත් අවමකරගැනීම සඳහා දෙමව්පියන්හට ප්‍රවේණි උපදේශනය ලබාදීමට එය පිටුවහලක් වනු ඇත.

වර්තමානයේ, *GH1* ජාන මැකීයාම, *GH* ජානයේ සහ *GHRHR* කෝඩෝන 72 විකෘතියේ විකෘතිතා, පිරිවැය මිල ගෙවීමෙන් IBMBB ආයතනය වෙතින් ලබා ගත හැකිය.

**ව්‍යාපෘති මාතෘකාව** : වී එළවළු පළිබෝධ පාලනයට උසස් කරන ලද සහ පුළුල් ක්‍රියාකාරිත්වයකින් හෙබි බැසිලස් තුරෙන්ජියෙන්සිස් (Bt) ක්ෂුද්‍රජීවීමය පළිබෝධනාශකය සංවර්ධනය කිරීම **(RG/2011/BT/05)**.

**විමර්ශක** : **ආචාර්ය රාධිකා සමරසේකර**, ශාක තාක්ෂණ අංශය,කාර්මික තාක්ෂණ ආයතනය.

බැසිලස් තුරෙන්ජියෙන්සිස් (*Bacillus thuringiensis*) (*Bt*) යනු විවිධ කෘමීන්ට විෂ සහිත කෘමිනාශක ස්ඵටික ප්‍රෝටීනයක් නිපදවන, ස්වභාවික ඇතිවන පාංශු ජනිත බැසිලයකි. එළවළු සහ වී පළිබෝධ පාලනය කරනු පිණිස ක්‍රියාකාරිත්වයක් සහිත *Bt* පළිබෝධනාශකයක් සකස් කිරීමේ අරමුණ සහිතව මෙම අධ්‍යනය සිදු කරන ලදී. මුල් පළිබෝධවලට එදිරිව ඉහළ කෘමිනාශක ක්‍රියාකාරිත්වයින් හෙබි තවත් *Bt* මාදිළි දෙකක් ද මෙහිදී හඳුනා ගන්නා ලදී. මෙම *Bt* කෘමිනාශකවල තාක්ෂණිකමය සාධ්‍ය තාක්ෂණය විශාල පරිමාණයේ ක්ෂේත්‍ර පිරික්සුම් සඳහා කර්මාන්තවලට ලබා දිය යුතු යැයි නිර්දේශ කෙරේ.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල පාදක කොටගෙන සංවර්ධනය කරන ලද ක්ෂුද්‍රජීවීමය පළිබෝධනාශක එළවළුවල මුල් පළිබෝධ සහ පළතුරු මෙන්ම වී සහ එළවළු ආක්‍රමණය කරන ලෙපිඩොප්ටෙරන් සහ කෝලියොප්ටෙරන් පළිබෝධ පාලනයට යොදා ගැනීම මගින් කෘෂිකර්මාන්තයේ දී පළිබෝධ හානි අවම කිරීම තුළින් බෝග නිෂ්පාදිතතාවය ඉහළ දැමීම සඳහා යොදගත හැකිවනු ඇත.

**ව්‍යාපෘති මාතෘකාව** : CdS/CdTe සූර්ය කෝෂවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා කැඩ්මියම් සල්ෆයිඩ් (CdS) අර්ධ සන්නායක තුනී පටලවල වර්ධන ක්‍රියාවලිය ප්‍රශස්තකරණය කිරීම **(RG/2012/BS/04)**.

**විමර්ශකයින්** : **මහාචාර්ය එම්.ඒ.කේ.එල්. දිසානායක**, ජාතික මූලික අධ්‍යයන ආයතනය, හන්තාන පාර, මහනුවර. සහ

**ආචාර්ය පී.කේ.ආර්. සේනාධීර**, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, පොල්ගොල්ල, මහනුවර.



විශේෂයෙන් සැලසුම් කරන ලද බහු සාම්පල හෝල්ඩරයක් භාවිත කොට FTO විදුරු උපස්තරයක් මත කැඩ්මියම් සල්ෆයිඩ් (CdS) තුනී පටල සකස් කිරීම.




FTO වීදුරු උපස්තරය මත සකසන ලද කැඩ්මියම් සල්ෆේට් (CdS) පටල පෘෂ්ඨිය රූපකාරයෙහි පරමාණුක බල අණ්වීක්ෂීය පිළිබිඹුව




CdS/CdTe තුනීපටල සූර්යකෝෂයක ක්‍රමානුරූප සටහන

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය ඉහළ නැගීමේ ජාතික ප්‍රතිපත්තියට අනුරූපව, අඩු පිරිවැය සහ ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් සූර්යකෝෂ පර්යේෂණ සහ සංවර්ධනය ඉතා වැදගත් වේ. කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම උදෙසා CdS/CdTe තුනීපටල සූර්යකෝෂ සඳහා කැඩ්මියම් සල්ෆයිඩ් (CdS) කවුළුස්තරය ප්‍රශස්තරිණය කිරීමට මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය යටතේ රසායනික තාපක තැන්පත් කිරීමේ ක්‍රමය මගින් වර්ධනය කරන ලද CdS කවුළුස්තරය, පටල ඝනකම, තාපජ මෘදුකරණ කාලය, ඉන්ඩියම් (In) සමග මාත්‍රණය මගින් පාලනය කිරීම ඔස්සේ සහ $TiO_2$ ස්වාරක්ෂක ස්තරයක් හඳුන්වාදීම මගින් ප්‍රශස්තකරණය කරන ලද කි ස්තරය සහ භෞතික වාෂ්ප තැන්පත් කිරීමේ ක්‍රමය මගින් තැන්පත් කරන ලද CdTe ස්තරය සහිත සහ $CdC_{12}$ ප්‍රතිකාරකයට යටත්ව, සම්පූර්ණ CdS/CdTe සූර්යකෝෂවලින් ඉහළම මට්ටමේ සූර්යකෝෂ 7% ක කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන ලදී.

මෙම ව්‍යාපෘතියෙන් ප්‍රතිඵලය වූ CdS කවුළුස්තරය ප්‍රශස්තකරණය පිළිබඳ පර්යේෂණ සොයා ගැනීම ශ්‍රී ලංකාවේ වාණිජ පරිමාණයේ සූර්යකෝෂ/ පැනල පිරිසැකසුම් කර්මාන්ත සඳහා මූලාකෘතියක් ලෙස භාවිත කිරීමට ප්‍රයෝජනවත් වනු ඇත.

| | | |
|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | : | ශ්‍රී ලාංකීය ඖෂධ ශාකවලින් විභවයක් සහිත ප්‍රතිමධුමේහ සංයෝග හඳුනාගැනීම සහ වෙන් කර ගැනීම **(RG/2012/BS/01)**. |
| **විමර්ශකයින්** | : | **වෛද්‍ය එම්.කේ.අයි. පෙරේරා**, ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය, සහ |
| | | **මහාචාර්ය යූ.එල්.බී. ජයසිංහ**, ස්වභාවික නිෂ්පාදන අංශය, ජාතික මූලික අධ්‍යයන ආයතනය, හන්තාන පාර, මහනුවර, සහ |
| | | **මහාචාර්ය ආර්. සිවකානේසන්**, ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය. |

ආශ්‍රිත සංකූලතාවල ප්‍රතිඵලයක් ලෙස සෑම වසරකම මධුමේහය මිලියන ගණනක මරණය සඳහා හේතුකාරකවේ. රුධිර ග්ලූකෝස්, ප්ලාස්මා ලිපිඩ සහ ප්‍රෝටීන් ග්ලයිකේෂන් සිදු කරනු ලබන ස්වභාවික ප්‍රතිකාරක අතුරු ආබාධ රහිතව අඩු පිරිවැයකට දියවැඩියා සංකූලතාවල පීඩාව අඩු කරනු ඇත.

මෙම අධ්‍යයනයේදී, α-ග්ලූකොසිඩේස්, ලයිපේස් සහ ප්‍රෝටීන ග්ලයිකේෂන් එතැන්හි නිශේධාත්මක ක්‍රියාවන් සිදු කිරීම පිළිබඳව සොයා බැලීම උදෙසා ශාක 20ක් පරීක්ෂා කරන ලදී. ද්‍රාවක භාගීකරණය සහ වර්ණලේඛශිල්පය භාවිත කිරීම මගින් නිශේධක වෙන් කර ගැනීම සිදු කෙරුණි. NRM දත්ත පාදක කරගෙන නිශේධකවල ව්‍යුහ පහදා දීම සිදු කරන ලදී.



*F. racemosa*

මෙම ශාක අතරින් ශාක 11ක් මන්දමධුරක්තික බලපෑම පෙන්නුම් කරන ලද අතර ඉන් හයක් ප්‍රතිමධුමේහ ක්‍රියාකාරීත්වය සහිත විය. ලිපිඩ අඩු කිරීමේ හැකියාව සහිත ශාක පහෙන් තුනක් ලයිපේස් නිශේධනයේ ඉහළ බලපෑමක් පෙන්නුම් කළේය. ශාක විස්සෙන් හයක් ප්‍රබල ලෙස ප්‍රෝටීන් ග්ලයිකේෂන් නිශේධකතාවයක් පෙන්නුම් කළේය. ප්‍රතිමධුමේහ ශාක පහක්; *F. racemosa*, *P. emblica* (එළ), *P. debilis* (ශාකය), *P. marsupium* (ක්ෂීරය) සහ *S. cumini* සහ විශේෂ දෙකවන *C. sativum* (බීජ) හා *S. aromaticus* (පුෂ්පය) එතැන්හි මධුමේහරක්තික සහ ප්‍රෝටීන ග්ලයිකේෂන් නිශේධන බලපෑම පිළබඳ අපේක්ෂා තැබිය හැකි ප්‍රතිඵල අනාවරණය කරගැනීම සිදු කෙරුණි.



*P. emblica*

ලයිපේස් නිශේධක ක්‍රියාකාරිත්වය සමග ඇපිජෙනික් සී-ග්ලයිකොසයිඩ ත්‍රිත්වය පවිත්‍ර කරන ලද අතර ඉන් දෙකක් *Trigonella foenum-graecum* බීජවලින් හඳුනා ගන්නා ලදී. යුර්සොලික් (ursolic) සහ ඔලෙනොලික් අම්ලය (oleanolic acid) නම් වූ ඇමයිලේස් නිශේධන බලපෑම සහිත පෙන්ටසයික්ලික් ට්‍රයිටර්පිනොයිඩ් සමාවයවික ද්විත්වයක් *Syzigium cumini* පත්‍රවලින් හඳුනාගෙන වෙන් කර ගන්නා ලදී. මධුමේහය සහිත පුද්ගලයින්ගේ නිදන්ගත මධුමේහ සංකූලතා අඩු කර ගැනීම සඳහා මෙම ශාක භාවිත කළ හැකි වනු ඇත.



*P. marsupium*



*P. debilis* plant



*S. cumini*

**ව්‍යාපෘති මාතෘකාව** : ශ්‍රී ලංකාවේ මිනිසුන් තුළ රිකෙට්සීය ආසාදනවල ප්‍රාථමික විමර්ශන: විශේෂ හඳුනාගැනීම, නිශ්චය කිරීම, සම්ප්‍රේෂණය සහ ජලාශ සත්ව අධ්‍යයනය **(RG/2009/HS/01)**.

**විමර්ශකයින්** : **මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ**, පශු විද්‍යා ව්‍යාධිජේව විද්‍යා දෙපාර්තමේන්තුව, පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව විද්‍යා පීඨය, සහ

**ආචාර්ය එස්.ඒ.එම්. කුලරත්න**, වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය.

ඇල්ෆා-ප්‍රෝටියෝ බැක්ටීරියා කාණ්ඩයක් වන රිකෙට්සියා, ඉයුකැරියෝටික සෛලවල අනිවාර්ය අන්තඃසෛලීය පරපෝෂිතයින් වේ. ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ විවිධ කලාපවල හඳුනාගන්නා ලස රිකට්සීය රෝග ආකාර තුනක්: පුල්ලි ගැසුණු උණ කාණ්ඩය (SFG), ටයිපස් උණ කාණ්ඩය සහ කැලෑ ටයිපස් උණ කාණ්ඩය පවතී. SFG හි විභව වාහකයා දුඹුරු සුනඛ කිනිතුල්ලා හෝ වල් ඌරා ද අන්තර්ගත කැලෑ සතුන්ගේ දක්නට ලැබෙන කිනිතුල්ලා විය හැකිය. වත්මන් සොයාගැනීම්, රෝගය චිකිස්තීයව නිශ්චය කිරීම, වළකා ගැනීම සහ පාලනය සඳහා සහාය වනු ඇත. අණුක වංශ ප්‍රවේණිය වටහා ගැනීම මගින් රිකට්සියාව පිළිබඳව ගෝලීය දැනුම සුපෝෂණය වේ.

**ව්‍යාපෘති මාතෘකාව** : එන්ඩොස්කොපික පටක පරීක්ෂණ නිදර්ශකවල පටකවිද්‍යාව මගින් හෙලියොබැක්ටර් පයිලොරි (*Helicobacter pylori*) අනාවරණය කර ගැනීම: අනාවරණ වේගය තක්සේරු කිරීම හා බැඳුණු ගැටලු විශ්ලේෂණය කිරීම **(RG/2011/HS/11)**.

**විමර්ශකයින්** : **ආචාර්ය සුලෝචනා විජේතුංග**, ව්‍යාධිවේදී දෙපාර්තමේන්තුව, සහ

**ආචාර්ය කේ.ඩී. ගල්කැටිය**, ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය.

ආමාශ ප්‍රදාහයේ සුලබ හේතුවක් ලෙස හෙලියෝබැක්ටර් පයිලොරි (*Helicobacter pylori*) සැලකේ. ශ්‍රී ලංකාවේ වඩාත් බහුල ලෙස භාවිත කෙරෙන *H. pylori* අනාවරණය ක්‍රමය වන්නේ පටක වේදයයි. කෙසේවෙතත්, සාමාන්‍ය අත්දැකීම වන්නේ පටක වේදය මගින් *H. pylori* අනාවරණය කෙරෙන වේගය අඩු බවයි. එනිසා, එන්ඩොස්කොපික ආමාශ ප්‍රදාහය සහිත ආමරෝගී ලෙඩුන් කැළක් තුළ *H. pylori* ආසාදනය ඇත්දැයි තීරණය කිරීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී. *H. pylori* අඩු අනාවරණ වේගය ක්‍රමවේදයේ දෝෂයක් නිසා සිදුවන දෙයක් නොවන බව ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරුණි. පටකවේද සේවාව නොමැති අවස්ථාවල සමූලෝත්පාදන චිකිස්තාව මගින් ප්‍රතිකාර කිරීමට රෝගීන් තේරීමේදී *H. pylori* ආසාදනය සඳහා සෑහෙන තරමේ සුදුසු පරීක්ෂාවක් ලෙස එක් දින ශීඝ්‍ර යුරියේස් පරීක්ෂාව නිර්දේශ කෙරේ.

**ව්‍යාපෘති මාතෘකාව** : ජනප්‍රිය ඛාද්‍ය පලතුරු සමහරක රසායන විද්‍යාව සහ ජෛව ක්‍රියාකාරීත්වය: සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සහ කෘෂිකර්මාන්තයේදී භව්‍ය සොයාගැනීම් පිළිබඳ අධ්‍යයනය **(RG/2012/AG/01)**.

**විමර්ශකයින්** : **මහාචාර්ය යූ.එල්.බී. ජයසිංහ** සහ

**මහාචාර්ය එන්.එස්. කුමාර්**, ජාතික මූලික අධ්‍යයන ආයතනය.

ස්වභාවික නිෂ්පාදන යනු, ශාක, දිලීර සහ වෙනත් ක්ෂුද්‍රජීවීන් මෙන්ම ලයිකන සහ සමුද්‍ර ජීවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන රසායනික සංයෝග වේ. මෙම සංයෝග නිරතුරුවම ජෛව විද්‍යාත්මක ක්‍රියාකාරකම් පරාසයක් පෙන්නුම් කරනවා මෙන්ම මිනිස් ජීවිතයේ තත්වය වැඩි දියුණු කිරීම සඳහා යොදා ගන්නවා ද විය හැකිය. මිනිසාගේ සහ ශාකවල රෝග කළමනාකරණයේදී සහ ප්‍රතිකාර කිරීමේදී ස්වභාවික නිෂ්පාදන භාවිත කිරීම වඩාත් පිළිගත හැකි වන අතර කෘත්‍රිම සංයෝග භාවිත කිරීමට වඩා එය අඩු අවදානමක් ලබාදේ. එනිසා,

ශාකප්‍රභවලින් පරිසර හිතකාමී, ජෛවක්‍රියාකාරී සංයෝග හඳුනාගැනීම වැදගත් වේ. ඒ අනුව, ප්‍රතිදිලීරමය, ප්‍රතිඔක්සිකාරක ශාක ධූලක, සහ එන්සයිම නිශේධන ලක්‍ෂණ කෙරෙහි විශේෂ සඳහනක් සහිතව ශ්‍රී ලාංකීය පලතුරුවලින් පරිසර හිතකාමී ජෛව රසායනික සංයෝග හඳුනාගැනීමේ සහ විස්තර කිරීමේ අරමුණ ඇතිව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ප්‍රතිදිලීරමය, සෛලධූලක සහ ශාකධූලක ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන ජෛවක්‍රියාකාරී සංයෝග කිහිපයක් මෙහි දී හඳුනා ගන්නා ලදී.

***ව්‍යාපෘති මාතෘකාව*** : ශ්‍රී ලංකාවේ ලොකුළූනුවල මුල් කුණුවීමේ රෝගය සහ ට්‍රයිකොඩර්මා විශේෂ (*Trichoderma* spp.) භාවිතයෙන් එහි ජෛවවිද්‍යාත්මක පාලනය **(RG/2011/AG/03)**.

***විමර්ශකයින්*** : **මහාචාර්ය නෙලුම් දේශප්‍රිය (මිය)**, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය.

**ආචාර්ය ආර්.ජී.ඒ.එස්. රාජපක්‍ෂ**, ශාක ව්‍යාධිවේදී අංශය, උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය (HORDI), ගන්නෝරුව, සහ

**ආචාර්ය ඩී.අයි. ජයරත්න**, ක්‍ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය.

ළූනු යනු ලෝකයේ බොහොමයක් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද රස පිරුණු බල්බ ලබා ගැනීම සඳහා වගා කෙරෙන කුළුබඩුවකි. ලොකුළූනු වගාවේ දක්නට ලැබෙන ගැටලු අතරින් එකක් වන්නේ, වර්ධනයේ විවිධ අවධි තුළ හටගන්නා ආසාදිත රෝග හේතු කොට ගෙන අස්වැන්න අඩුවීමයි. ආර්ථික වශයෙන් වැදගත් වන රෝග සමහරක් දිලීර මගින් ඇති කරන අතර එනිසා, මෙම රෝග පිළිබඳ අධ්‍යයනය, ඒවා කළමනාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම පිණිස හැකියාව ලබා දෙනු ඇත.

බොහොමයක් දිලීර ව්‍යාධිජනකයින් උදෙසා *Trichoderma* spp. විශේෂ පුළුල් ලෙස භාවිත කෙරෙන ජෛවපාලනකාරකයකු වන බැවින්, ළූනුවල වඩාත් වැදගත් දිලීර ව්‍යාධිජනකවල ජෛව විද්‍යාත්මක පාලනකාරක ලෙස වඩා කාර්යක්‍ෂම වෙන්කරගැනීමක් භාවිත කිරීමේ අදහස ඇතිව, *Trichoderma* spp. විශේෂ දේශීය ළූනු වගාකරන ප්‍රදේශවල පසෙන් වෙන්කරගෙන විස්තර කිරීම සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ ආකාරයට සකස්කරන ලද *Trichoderma* spp. අමුකුලන ක්‍ෂේත්‍රයේ ළූනු වගාවේ මුල් කුණුවීමේ රෝගයට එදිරිව කාර්යක්‍ෂමව භාවිත කළ හැකි බව පෙන්වා දෙමින් *Trichoderma* spp. ආමුකුලන හඳුන්වාදීම මගින් රෝගී තත්වය සහ මුල්කුණුවීමේ රෝගය ප්‍රබලතාවය කැපී පෙනෙන ලෙස අඩු වීම සිදුවිය.




හඳුනාගත් Trichoderma විශේෂ කිහිපයක් ආ) දින 10කට පසුව PDA මත කොලනියක් ආ) අතුබෙදී ඇත,

## ජාතික තේමාමූලික පරියේෂණ වැඩසටහන (NTRP)

ජාතික පර්යේෂණ ප්‍රමුඛතා ආමන්ත්‍රණය කිරීමට සහ අප රටේ සමාජ-ආර්ථික සංවර්ධනය උදෙසා ස්පර්ශනීය ප්‍රතිඵල ලබා ගැනීමට මෙම නව කොන්තරාත්තු පර්යේෂණ වැඩසටහන ජාතික විද්‍යා පදනම මගින් හඳුන්වා දෙන ලදී.

***තේමාව: ආහාර සුරක්ෂිතතාවය***

තේමාවට අදාළ ප්‍රධාන ගැටලු පර්යේෂණ මගින් ආමන්ත්‍රණය කිරීමට සහ එමගින්, ජාතියේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස ප්‍රයත්නයක් දැරීමට ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ තේමාමූලික පර්යේෂණ වැඩසහන ආරම්භ කරන ලදී. අප රටේ ආහාර සුරක්ෂිතතාවය සහතික කෙරෙනු ඇතැයි සැලකෙන ස්පර්ශනීය ධනාත්මක ප්‍රතිඵල සැපයීමට අපේක්ෂිත බහුවිෂයයික සහ සාමූහික ස්වභාවයෙන් යුත්, පර්යේෂණ වැඩසටහන් පහක් (05) ආරම්භ කෙරුණි.

මෙම වැඩසටහන් පහ (05) යටතේ ව්‍යාපෘති 09ක් පිරිනමන ලද අතර ඒවා 2016 වසර තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය.

මෙකී ව්‍යාපෘති, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ මෙහෙයුම් කමිටුවේ මගපෙන්වීම යටතේ ඉතා සමීපව පර්යේෂණ අංශය මගින් අධීක්ෂණය කරනු ලැබේ. ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස, ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් (03) සහ මෙහෙයුම් කමිටු රැස්වීම් හතක් (07) ඔස්සේ පර්යේෂණ කණ්ඩායම් සමග සාකච්ඡා පැවැත්වීම සිදු කිරීමට සහ ප්‍රගතිය අවහිර කෙරෙන බාධක පිළිබඳව ඉස්මතු කොට දැක්වීමට ඔවුන්ට ආරාධනා කරන ලදී.

පැහැදිලි කරගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපෝෂණ සැපයීම පිණිස යාපනය සහ කිලිනොච්චි ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කෙරුණි.

සපයන ලද ක්‍රියාකාරිත්ව සැලසුම්වලට අනුගතව ව්‍යාපෘති ඉදිරියට ගොස් ඇත්දැයි සොයා බැලීම සඳහා සිව්වන පර්යේෂණ සම්බන්ධීකරණ රැස්වීම (RCM) සංවිධානය කරන ලදී. මෙහිදී, ව්‍යාපෘති නියමුවන් සියලු දෙනා විසින් ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. ව්‍යාපෘති පහක් (05) තම ව්‍යාපාති කාලය නිම කරන ලදුව ඔවුන්ගේ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සිදු කළහ. ක්‍රියාත්මක තත්වයේ පැවතුණු ඉතිරි ව්‍යාපෘති සතර (04) සඳහා කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම මෙහි දී අනුමත විය.

මෙම ව්‍යාපෘති නමයෙහි (09) විස්තර *ඇමුණුම 4* හි සඳහන් කර තිබේ.







ව්‍යාපාති නියමුවා : මහාචාර්ය ජී. මිගුන්නක්, යාපනය විශ්ව විද්‍යාලය
ඡායාරූප ස්ථානය : කිලිනොච්චියට සහ යාපනයට සිදු කළ ක්ෂේත්‍ර ඇගයීමේ චාරිකාව

### *තේමාව: දේශගුනික විපර්යාස සහ ස්වභාවික විපත්*

අවමකරණය සහ අනුහුරුවීම ඔස්සේ දේශගුණ විපර්යාසවල විපත් සහ ස්වභාවික විපත් අඩුකර ගැනීමේ අදහස ඇතිව, පර්යේෂණ ඔස්සේ ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කිරීමට දේශගුණ විපර්යාස සහ ස්වභාවික විපත් පිළිබඳ තේමාමූලික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු කෙරිණ.

පරිසරය හා සම්බන්ධ වූ 2016 දී සිදු කෙරුණාවූ ප්‍රතිපත්තිමය වෙනස්කම් අඩංගු කිරීම උදෙසා, මෙම තේමා මූලික පර්යේෂණ වැඩසටහනෙහි කටයුතුවලට පහසුකම් සලසනු වස් සකස් කෙරුණු තේමා පත්‍රය තවදුරටත් වෙනස් කරන ලදී. බලශක්තිය සහ පරිසරය හා සම්බන්ධ පාර්ශවකරුවන් සමග ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සමුළුව - 2016 දී පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව පහත සඳහන් පරිදි ක්‍රමෝපායික ප්‍රක්ෂිප්ත ක්ෂේත්‍ර 7ක් යටතේ ව්‍යාපෘති 14ක් හඳුනා ගන්නා ලදී.

1. ජාතික සැලසුම් සහ සංවර්ධන ක්‍රියාවලිය තුළට දේශකුණික විපර්යාස පිළිබඳ සලකා බැලීම් අන්තර්ගත කිරීම
2. නැවත පදිංචි කිරීම්, මානව සෞඛ්‍යය සහ යටිතල පහසුකම් මත දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම.
3. ආහාර සුරක්ෂිතතාව මත දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම.
4. දේශගුණික විපර්යාසයන්හි බලපෑම්වලින් ස්වභාවික සම්පත් සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම.
5. අනාගත දේශගුණයට, දේශගුණ සෙනාරියෝවලට, සහ ස්වභාවික විපත් මෙන්ම පූර්ව අනතුරු ඇගවීම්වලට සූදානම්වීම.
6. බලපෑම අවම කිරීම සහ පරිසරික තිරසරභාවය මැනීමේ ක්‍රම සැකසීම.
7. දත්ත කළමනාකරණය.

ව්‍යාපෘති දාහතර පිළිබඳ අභිරුචිය ප්‍රකාශ කිරීම් (EsOI) කැඳවීම පුවත්පත් දැන්වීමක් මගින් සිදු කරන ලද අතර එයට ප්‍රතිචාර ලෙස අභිරුචිය ප්‍රකාශ කිරීම් 41ක් ලැබුණි. මෙහෙයුම් කමිටුවේ නිර්දේශ මත සිදු කරනු ලැබූ පිරික්සුම් අදියර දෙකකට පසුව 2017 ජනවාරි මාසයේ දී ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා සඳහා අභිරුචිය ප්‍රකාශ කිරීම් 13ක් තෝරා ගන්නා ලදී. තීරණ ගැනීමේදී තොරතුරු සහ දැනුම සමෝධානය කිරීම සඳහා පහසුකම් සලස්වන ජාත්‍යන්තර සහයෝගිතාවය, පර්යේෂණ ආයතනවල සහභාගිත්වය, රජයේ ආයතන සහ පුද්ගලික අංශය ඔස්සේ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ඇත.

### *පර්යේෂණ උපකරණ ප්‍රදාන වැඩසටහන සහ පර්යේෂණ උපකරණ සඳහා අමතර කොටස්*

ගෝලීය විද්‍යා සහ තාක්ෂණ පර්යේෂණවල ප්‍රමිතිය සමග සම සමව සිටීමට නම් පර්යේෂණ සඳහා නවීන යටිතල පහසුකම් සහිත පර්යේෂණාගාර අවශ්‍යවේ. පර්යේෂණ ආයතනවලට සහ විශ්ව විද්‍යාලවලට සාමාන්‍යයෙන් මිලදී ගැනීම සඳහා අධික පිරිවැයක් දැරිය යුතු වන්නා වූ පර්යේෂණ උපකරණ සහ ඒවාට අවශ්‍ය කෙරෙන අමතර කොටස් ලබා ගැනීම සඳහා සහයෝගය ලබා දීම මෙම වැඩසටහන්වලින් අදහස් කෙරේ. තවද, හිතකර පර්යේෂණ සංස්කෘතියක් ඇතිකිරීම පිණිස පර්යේෂණ විද්‍යාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැලසීම සහ උපකාර කිරීම මෙම වැඩසටහන් මගින් සිදු කෙරේ. වර්ෂ 2016 තුළ රු. මිලියන 69.81ක් වටිනා උපකරණ ප්‍රදාන 27ක් සහ රු. මිලියන 2.25ක් වටිනා අමතර කොටස් ප්‍රදාන හයක් (06) ප්‍රදානය කිරීම සිදු කෙරුණි. මෙම ප්‍රදාන පිළිබඳ විස්තර *ඇමුණුම 5* හි ලබා දී ඇත.

### *ලිපි පළ කිරීමේ ගාස්තු සඳහා ප්‍රදාන*

පර්යේෂණ ප්‍රකාශන අරබයා ලිපි පළ කිරීමේදී අය කෙරෙන ගාස්තු පියවීම සඳහා ලබා දෙන ප්‍රදාන, උත්පාදනය කරන ලද නව දැනුම වෙනත් අය සමග බෙදා හදා ගැනීම මගින් ඔවුනට ප්‍රතිලාභ ලබා දීමේ හැකියාව උදාකරයි. තවද, පර්යේෂණ සොයා ගැනීම් විවේචනාත්මකව ඇගයීමට ලක් කිරීමට ද නැවත පරීක්ෂාවට සහ තහවුරු කරනු ලැබීමට ද නව සොයාගැනීම් ප්‍රකාශනය කිරීම නව දැනුම පුළුල් ආකාරයකට ව්‍යාප්ත කරනු ලැබීම සහතික කරයි. කෙසේවෙතත්, සමහර වාරසඟරා ප්‍රකාශන ගාස්තු අය කිරීම හෝ ශිෂ්‍ය ප්‍රවේශයක් හෝ විවෘත ප්‍රවේශයක් (OAC) බවට එය පත් කිරීම සඳහා අයකිරීමක් සිදු කරයි. එනිසා, තම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා විශාලතර දෘශ්‍යතාවයක් සහතික කිරීම පිණිස දිරිදීමක් ලෙස, විද්‍යාව උපුටා දැක්වීමේ

දර්ශකයෙහි, උපුටා දැක්වීමේ පුළුල් කරන ලද දර්ශකයෙහි, සහ සමාජ විද්‍යාව විද්‍යාව උපුටා දැක්වීමේ දර්ශකයෙහි සුචිගත කරන ලද පිළිගත් වාරසඟරා මගින් ලිපි භාර ගන්නා ලද ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ ප්‍රකාශන පිරිවැය ඔවුනට ලබාදීමට ජාතික විද්‍යා පදනම මෙම නව ප්‍රදාන වැඩසටහන 2016 වර්ෂයේදී ආරම්භ කළාය.

විද්‍යාව උපුටා දැක්වීම් දර්ශකය, විද්‍යාව උපුටා දැක්වීමේ පුළුල් කරන ලද දර්ශකය, සහ සමාජ විද්‍යාව උපුටා දැක්වීමේ දර්ශකයෙහි උපුටා දක්වන ලද වාරසඟරාවල ප්‍රකාශනය කෙරුණු ලිපි සඳහා ප්‍රතිපූරණය කිරීම් පහසුකම හඳුන්වා දීම මගින් කළමනාකරණ මණ්ඩලය එවැනි මූල්‍යාධාර සැපයීමේ උපමාන ලිහිල් කළාය. වර්ෂ 2016 තුළ එක් අයදුම්පත්‍රයක් ලැබුණු අතර එය සැකසීම සිදු කෙරුණි.

## තාක්ෂණ ප්‍රදාන

පහත දැක්වෙන පරිදි වැඩසටහන් දෙකක් යටතේ තාක්ෂණ ප්‍රදාන පිරිනමනු ලැබේ.

(අ) තාක්ෂණ සංවර්ධනය සඳහා සහයෝගය ලබා දීම.

(ආ) නව තාක්ෂණයන් පාදක කරගත් ආරම්භය සපයන ලද ව්‍යාපාර සඳහා සහයෝගය ලබා දීම.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වූ 2016 මැයි 31 දිනට (පළමු කැඳවීම, 2016) ලැබී තිබුණු අයදුම්පත් 29 ඇගයීමට ලක් කරන ලද අතර ප්‍රදාන තුනක් (03) පිරිනැමීම සිදුකෙරුණි (*6 ඇමුණුම* බලන්න). මෙයට අමතරව 2015 දෙවන කැඳවුමෙන් තවත් ප්‍රදාන පහක් (05) පිරිනමන ලදී. ඒ අනුව, 2016 වසර තුළ සම්පූර්ණයෙන් ප්‍රදාන අටක් (08) පිරිනමනු ලැබ ඇත. අවසාන දිනය නොවැම්බර් 30වන දෙවන කැඳවුම 2016 දී අයදුම්පත් විස්සක් (20) ලැබුණි. එකී අයදුම්පත් ප්‍රාථමික පිරික්සීමට ලක්කරන ලද අතර අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

ක්‍රියාත්මක තත්වයේ පැවතුණු ව්‍යාපෘති 29ක් අධීක්ෂණය කිරීම සිදු කෙරමින් පැවතුණි. ස්ථාන බැලීමට යෑම් 32ක් සිදු කරන ලද අතර ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම පිණිස රැස්වීම් දෙකක් පවත්වන ලදී.

නිම කරන ලද තාක්ෂණ ප්‍රදාන පිළිබඳ ලිපි හතරක් (04ක්) 2016 වසරේ පෙබරවාරි 14, මාර්තු 06, අප්‍රේල් 17 සහ ජූනි 12 ප්‍රකාශනය කෙරුණු "සන්ඩේ ටයිම්ස්" පුවත්පතේ විභව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අදහස ඇතිව ප්‍රචාරයක් ලබා දෙමින් පළ කරනු ලැබුණි.

## ස්පර්ශනීය ප්‍රතිඵල සහිත නිම කරන ලද ව්‍යාපෘති

වර්ෂ 2016 තුළ ව්‍යාපෘති හයක් නිම කරන ලදී.

***ව්‍යාපෘති මාතෘකාව*** : සියල්ලම එකක වූ ගණිත පුවරුව නවීකරණය කිරීම. **(TG/2013/Tech-D/09)**

***ප්‍රදානලාභියා*** : **අස්මීර් අහමඩ් මයා**

***කාණ්ඩය*** : තනි පුද්ගල

***වෙන් කළ මුදල*** : රු. 307,375/-

ප්‍රදානලාභියා විසින් ගණිතමය සිද්ධාන්ත උගැන්වීමට ප්‍රායෝගික උපකරණයක් ලෙස භාවිත කළ හැකි ගණිත පුවරුවක් සංවර්ධනය කරන ලදී. මෙම පුවරුව 6-11 ශ්‍රේණි සඳහා උගන්වනු ලබන ගණිත සිද්ධාන්ත පැහැදිලි කිරීමට භාවිත කළ හැකි වනු ඇත. මෙහි විවිධ කලාප මගින් ගණිතමය සිද්ධාන්ත පැහැදිලි කෙරේ. සම්භාවිත කලාපය, ප්‍රස්ථාර කලාපය, ජ්‍යාමිතිය කලාපය, ත්‍රිකෝණමිතික කලාපය, වෘත්තාකාර ජ්‍යාමිතික කලාපය, වීජගණිත කලාපය යනාදිය ප්‍රධාන කලාපවලට අයත්ය. පාසල්වල ගණිතාගාර තුළ එය භාවිත කිරීම උදෙසා නිර්දේශ කරනු ලැබීම අරමුණු කර ගෙන මෙම ගණිත පුවරුව අධ්‍යාපන අමාත්‍යාංශයට හඳුන්වාදීමට නව නිපැයුම්කරු අදහස් කරයි.

**ව්‍යාපෘති මාතෘකාව** : වේගය සහ කාලය නියාමනය කිරීම හා සමෝධානික ඝන-තත්ව විදුලි පංකා පාලකය නිෂ්පාදනය සහ අලෙවිකරණය සඳහා ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම. **(TG/2012/Start-Up/01)**

**ප්‍රදානලාභියා** : **මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්. පෙරේරා**

**කාණ්ඩය** : තනි පුද්ගල

**වෙන් කළ මුදල** : රු. 2,891,000/-




ඝන-තත්ව විදුලි පංකා පාලකය

ව්‍යාපෘති ප්‍රතිඵලය වන්නේ බලශක්ති ඉතුරුම් නව විදුලි පංකා පාලකයකි. එය, ගුමු ගුමුවෙන් තොර, සිවිලිම් පංකා සඳහා අඛණ්ඩ විචල්‍ය වේගය සහ කාලය පාලකයකි. වේගය නියාමනය කිරීම සඳහා පාලකය භාවිත කළ හැකි වන අතර කලින් සැකසූ කාලසීමාවකට පසුව ස්විච්ජීය ඉබේම වැසීම සිදුවේ. මෙම නිපැයුම සංවර්ධනය කිරීමට පෙර, සම්ප්‍රදායික ලෙස එලන ලද විදුලි රැහැන් සහිත සිවිලිම් පංකාවලට සවිකළ හැකි ඝන-තත්ව ටයිමර් දක්නට නොලැබුණි. මෙම නව තාක්ෂණය ක්ෂුද්‍ර බලශක්ති තාක්ෂණය භාවිතයෙන් සංවර්ධනය කරනු ලැබ ඇති අතර සැලකිය යුතු ප්‍රමාණයක බලශක්ති ඉතිරියක් ප්‍රතිඵලය කරමින් ගෘහස්ත සහ ආයතනික යොදගැනීම් සඳහා භාවිත කිරීමට නියමිතය. භාවිත කරන්නන් සමග සිදු කරන ලද අධ්‍යයනයකට අනුව, දළ වශයෙන් 50%ක බලශක්ති ඉතිරියක් සාක්ෂාත් කරගෙන තිබේ. එකිනෙකට වෙනස් යාන්ත්‍රණ තුනක් ඔස්සේ බලශක්ති ඉතිරිය සාක්ෂාත් කරගෙන තිබේ. මෙම නිෂ්පාදනය වාණිජකරණය කිරීම සිදු කර ඇති අතර එය වර්තමාන වෙළෙඳපළෙන් මිල දී ගත හැකිය. වර්ෂ 2016 තුළ ඒකක 1,500ක් අලෙවි වී තිබේ.

සමාජ-ආර්ථික ප්‍රතිලාභ

- ස්වයංක්‍රීය නැවතුම මගින් බලශක්තිය ඉතිරිය සහ පාලකයෙහි අඩු- හානි ලක්ෂණ
- පරිභෝජනය කෙරෙන විද්‍යුත් ශක්තිය අඩු කිරීම ඔස්සේ භාවිත කරන්නන්ට පිරිවැය ඉතිරිය.
- ආන්තික ආකාරයකට වුවද හානිය අඩුවීමේ සමස්තය බලශක්ති සේවා ස්ථානවල පොසිල ඉන්ධන දහනය අඩු කිරීම සහ පරිසරය යහපැවැත්මට උපකාරී වීම.

**ව්‍යාපෘති මාතෘකාව** : නැනෝද්‍රව්‍ය පිරි ස්වභාවික රබර් නැනෝ සංයුතිය පාදක කරගෙන ඉහළ ක්‍රියාකාරීත්වයකින් යුත් සැහැල්ලු බරැති කෘත්‍රිම පාදය නිර්මාණය කිරීම. **(TG/2012/Tech-D/04)**

**ප්‍රදානලාභියා** : **ආචාර්ය උපුල් රත්නායක**, රබර් පර්යේෂණ ආයතනය.

**කාණ්ඩය** : රාජ්‍ය අංශය

**වෙන් කළ මුදල** : රු. 5,283,625/-



Prosthetic foot developed

මෙම ව්‍යාපෘතිය යටතේ වැඩි දියුණු කරන ලද ලක්ෂණ සහිත රබර් නැනෝ - සංයුක්ත ද්‍රව්‍ය මත පදනම් වූ නව කෘත්‍රිම පාදයක් නිර්මාණය කරන ලදී. නැනෝ-සංයුක්ත ද්‍රව්‍ය නිෂ්පාදනයට සහ කෘත්‍රිම පාදය නිර්මාණය කිරීමට නව ක්‍රියාවලින් සංවර්ධනය කරනු ලැබුණි. මේ සඳහා සහයෝගය දක්වන්නන්ගේ (රණවිරු සෙවන, රාගම) පරිශ්‍රයේදී අපේක්ෂා තැබිය හැකි ප්‍රතිඵල සහිතව අත්හද බැලීමේ පරීක්ෂා සිදු කරන ලදී. ව්‍යාපෘති ප්‍රතිඵලය වන්නේ වැඩි දියුණු කරන ලද ක්‍රියාකාරිත්වයකින් යුත්, අඩු- පිරිවැය සහිත, සහ ආනයනය කරනු ලබන කෘත්‍රිම පාද හා සසඳනවිට වැඩි දියුණු කරන ලද කල්පැවැත්ම හේතු කොට ගෙන රට තුළ විදේශ විනිමය ඉතිරි කෙරෙන, දේශීය නිෂ්පාදනය කරන ලද කෘත්‍රිම පාදයයි.

**ව්‍යාපෘති මාතෘකාව** : මුත්‍ර ග්ලූකෝස් පටිවල පරිමාණය, ස්ථායිතා පරීක්ෂාව, සහ නිෂ්පාදන පරීක්ෂාව **(TG/2013/Tech-D/01)**

**ප්‍රදානලාභියා** : **මහාචාර්ය සී.පී.ඩබ්: මැතිව්**, ජෛව රසායන විද්‍යා සහ අණුක ජෛව විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය.

**කාණ්ඩය** : රාජ්‍ය අංශය

**වෙන් කළ මුදල** : රු. 967,590/-



සකස් කරන ලද ග්ලූකෝස් පටි

වැදගත් ආදේශකයක් ලෙස මුත්‍ර ග්ලූකෝස් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව නිර්ණය කිරීම සඳහා වියළි ප්‍රතිකාරක මුලද්‍රව්‍ය සංවර්ධනය කිරීම. ග්ලූකෝස් පටි නිපදවීම, ස්ථායිතා පරීක්ෂාව, සහ ක්‍රියාකාරීත්ව හා නියම ජෛව විද්‍යාත්මක නියැදි සංවේදනීයතා විශ්ලේෂණය නිම කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වූයේ තම රුධිර ග්ලූකෝස් මට්ටම අධීක්ෂණය කිරීමට දියවැඩියා රෝගියාට දැරිය හැකි අඩු පිරිවැය මුත්‍ර ග්ලූකෝස් පටි නිෂ්පාදනය කිරීමයි. නිෂ්පාදනය සියුම්ව සකස් කිරීමට සහ වාණිජකරණයට විභවය පෞද්ගලික අංශ හවුල්කරුවන් සමග කතිකාවන් සිදු කෙරෙමින් පැවතුණි.

**ව්‍යාපෘති මාතෘකාව** : වියළි රබර් විවෘත කෝෂ නිෂ්පාදන අඛණ්ඩව නිපදවීම සඳහා නියමු- පරිමාණයේ වාත්තු යන්ත්‍රයක් සැලසුම් කිරීම හා සකස් කිරීම.**(TG/2013/Tech-D/05)**

**ප්‍රදානලාභියා** : **සැම්සන් ඉන්ටර්නැෂනල් පුද්. සමාගම**

**කාණ්ඩය** : රාජ්‍ය - නොවන අංශය

**වෙන් කළ මුදල** : රු, 1,703,320/-

යෝග පැදුරු වැනි වියළි රබර් විවෘත කෝෂ නිෂ්පාදනය සඳහා විශේෂයෙන් යුරෝපීය රටවල, ඕස්ට්‍රේලියාව, සහ ජපානය වැනි ජාත්‍යන්තර වෙළඳ පොළෙහි පවතින ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී, එහි ප්‍රතිඵලයක් ලෙස, විවෘත කෝෂ වියළි රබර් නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපළක් දේශීය වියළි රබර් කර්මාන්තය වෙත නිරන්තර ඉල්ලීම් ලැබෙමින් පවතී, ඉහළ ප්‍රමිතියකින් යුත් අමු ස්වභාවික රබර් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට මෙම ගෝලීය අවශ්‍යතාවය සපුරාලිය හැකි විභවයක් තිබෙන අතර විවෘත කෝෂ වියළි රබර් නිෂ්පාදන නිපදවීමේ ගෝලීය නියමුවා වීමටද හැකියාව තිබේ. මෙම අරමුණ සපුරා ගැනීමට, කාලය, ශ්‍රමය සහ බලශක්තිය වැය කිරීම වැඩිපුර සිදු කෙරෙන කාණ්ඩ වාත්තු කිරීමේ ක්‍රියාවලිය වෙනුවට අඛණ්ඩ වාත්තු කිරීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවය මතු වී තිබේ. ඉහත ව්‍යාපෘතිය යටතේ වියළි රබර් විවෘත කෝෂ නිෂ්පාදන නිපදවීමට නියමු පරිමාණයේ අඛණ්ඩ කාණ්ඩ වාත්තු කිරීමේ යන්ත්‍රය සැලසුම් කොට සංවර්ධනය කිරීම සිදු කෙරුණි. බලාපොරොත්තු තැබිය හැකි අත්හදාබැලීමේ පරීක්ෂා ප්‍රතිඵල සහිතව නියමු පරිමාණ අධ්‍යයනයක ප්‍රතිඵල පාදක කරගෙන වාණිජ පරිමාණයේ කර්මාන්තශාලාවක් සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.



ප්‍රදානලාභියාගේ කර්මාන්ත පරිශ්‍රය තුළ සංවර්ධනය කරන ලද අඛණ්ඩ කාණ්ඩ වාත්තු කිරීමේ යන්ත්‍රය

**ව්‍යාපෘති මාතෘකාව** : ස්වයංක්‍රීය ප්‍රකාශ පරීක්ෂාව (**AoI**) සහිත පෑස්සීමේ රොබෝ පද්ධතිය. **(TG/2013/Tech-D/07)**

**ප්‍රිනලාභියා** : **සී.එල්.එස්.සී. ෆොන්සේකා මයා**

**කාණ්ඩය** : තනි පුද්ගල

**වෙන් කළ මුදල** : රු, 358,400/-

අප රටට ආනයනය කෙරෙන පෑස්සුම් ප්‍රමිතිය පරීක්ෂා කිරීමට පෑස්සුම් යන්ත්‍ර තුළට ස්වයංක්‍රීය ප්‍රකාශ පරීක්ෂාව සිදු කිරීමේ ලක්ෂණය සමෝධානය කර නොමැත. AoI පද්ධතිය වෙනම මිලට ගෙන එකලස් රේඛාවට ස්ථානගත කර ගත යුතුය.

ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන කර්මාන්තයෙහි කාර්යක්ෂමතාවය සහ නිෂ්පාදිතතාවය වැඩි දියුණු කිරීම සඳහා ඉහත ව්‍යාපෘතිය යටතේ AoI සහිත පෑස්සුම් රොබෝ පද්ධතිය දේශීයව සංවර්ධනය කරන ලදී. සම්පූර්ණ පද්ධතිය සංවර්ධනය කිරීම සහ අත්හද බැලීමේ පරීක්ෂා සිදු කිරීම නිම කරන ලද අතර සියුම් සීරුමාරුවට යටත්ව නිෂ්පාදනය වාණිජ මෙහෙයුම් කටයුතු සඳහා එළදයී ලෙස මෙහෙයවීමට කටයුතු සූදනම් කර තිබුණි.



ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද AoI සහිත පෑස්සීමේ රොබෝ යන්ත්‍රය

ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන කර්මාන්තය තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට යොදගත හැකි මෙය සම්පූර්ණයෙන්ම නව සංවර්ධනයක් බව සඳහන් කළ යුතුය. ආනයනය කරන ලද (ප්‍රකාශ පරීක්ෂණ ලක්ෂණය නොමැති) පෑස්සීම් යන්ත්‍රයක මිල දළ වශයෙන් රු. මිලියන 10ක් පමණ වන නමුදු, මෙම යන්ත්‍රය ශ්‍රී ලංකාව තුළ රු.මිලියන පහකට (05) නිෂ්පාදනය කළ හැකිය.

## බුද්ධිමය දේපළ සහ කළමනාකරණය

### *විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන මගින් සිදු කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල පසුවිපරම් කිරීම*

ආර්ථික ශක්‍යතා අධ්‍යයන සිදු කිරීමට පමණක් නොව නියමු කර්මාන්තශාලා අධ්‍යයනයක හෝ ක්ෂේත්‍ර නිරූපණ හෝ ඔස්සේ තම යොමු පරිමාණ සොයා ගැනීම් වැඩි කිරීමට සහ නිරූපණයටත් ඔවුන්හට හැකියාව ලබා දෙනු පිණිස විභව වාණිජ ජීව්‍යතාවයක් සහ තාක්ෂණිකමය ශක්‍යතාවයක් සහ පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ ලිපි පළ කිරීම සඳහා භාර දුන් පර්යේෂණ විද්‍යාඥයින් සම්බන්ධ කර ගැනීම සහ තාක්ෂණ ප්‍රදන අයදුම්පත් භාර දීම සඳහා ඔවුන් දිරිමත් කිරීම සිදු කරන ලදී.

සහසක් නිමැවුම් ප්‍රදර්ශනයෙහි ජයග්‍රහකයින් සම්බන්ධ කර ගන්නා ලදුව ව්‍යාපාතිවලින් තාක්ෂණ ප්‍රදන අයදුම්පත් භාරදීම සඳහා ඉල්ලීමක් සිදු කරන ලදී. මෙරිල් ජේ. ප්‍රනාන්දු පරිසරික නවෝත්පාදන සම්මානයෙහි (දිල්මා කන්සර්වේෂන් සංවිධානය කරන ලද) ජයග්‍රාහකයින් සම්බන්ධ කර ගන්නා ලද අතර තාක්ෂණ ප්‍රදන යෝජනා ක්‍රමය පිළිබඳව ප්‍රසිද්ධියක් ලබා දෙන ලදී. ඒ අනුව, ප්‍රතිචාර පහක් (05) ලැබුණු අතර තාක්ෂණ ප්‍රදන අයදුම්පත් ලබා ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

### *2016 දී පවත්වන ලද කර්මාන්ත - අන්තර්කර්ෂණ සැසියේදී මතුව ආ නිර්දේශ සඳහා පසුවිපරම*

කර්මාන්ත - අන්තර්කර්ෂණ සැසියේදී හඳුනා ගන්නා ලද කර්මාන්ත අවශ්‍යතා ආමන්ත්‍රණය කරන තාක්ෂණ ප්‍රදන අයදුම්පත් යොමු කිරීමට අනාගත අයදුම්කරුවන් දිරිමත් කරන ලදී.

## රාජ්‍ය-පෞද්ගලික අංශ හවුල් සබඳතාවය (PPP) ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම - ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා පහසුකම් සැපයීම

### *පේටන්ට් කෙටුම්පත් කිරීමේ උපදේශනය සහ දැනුවත්භාවය ගොඩනැගීමේ කටයුතු*

තාක්ෂණ පැවරුම් පහසුකම් සලසන කුටිය තම කටයුතු අඛණ්ඩව සිදු කරගෙන ගියාය. නවෝත්පාදකයින්ගේ අවශ්‍යතා (පේටන්ට් තොරතුරු පිළිබඳව මඟපෙන්වීම සහ PCT යටතේ අයදුම් කිරීම) සඳහා උපකාර කිරීමට අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය කෙරුණි. දේශීය/ විදේශීය පේටන්ට් බලපත්‍රයක් ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ උපදේශන සැපයීම මගින් නවෝත්පාදකයින් 10 දෙනෙකුට සහයෝගය ලබා දුනි. ජගත් බුද්ධිමය දේපළ සංවිධානය යටතේ තාක්ෂණ හා නවෝත්පාදන උපකාරක මධ්‍යස්ථානය (TISC මධ්‍යස්ථානය) ලෙස ඉහත මධ්‍යස්ථානය තම කටයුතු අඛණ්ඩව සිදු කළාය. කාර්යමණ්ඩලය WIPO නියෝජිතයින් සමග පහත සඳහන් දෑ පිළිබඳව සාකච්ඡාවලට සහභාගි විය.

i. WIPO නියෝජිතයින් සමග IP මධ්‍යස්ථාන ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡාව - 2016 ජූනි 17, නිපෝන්හිදී
ii. IP මධ්‍යස්ථාන ව්‍යාපෘතිය පිළිබඳ පසු විපරම් වැඩසටහන - 2016 සැප්තැම්බර් 10
iii. TISC ව්‍යාපෘති ලේඛන පිළිබඳ සමාලෝචනය - වටමේස සාකච්ඡාව - 2016 සැප්තැම්බර් 15

## කර්මාන්ත අවශ්‍යතා ඇගයීම සහ දත්තපාදකය යාවත්කාලීන කිරීම

***හවුල් සබඳතා දිරිමත් කිරීම සඳහා උපකාරී වන ප්‍රතිපත්ති සහ නියාමන ප්‍රතිපත්ති පද්ධති සකස් කිරීම.***

විශ්ව විද්‍යාල - ආයතන - කර්මාන්ත හවුල් සබඳතාවය සඳහා ප්‍රතිපත්තියක් සැකසීම පිණිස උපදේශකයකුගේ සේවය ලබා දීම සඳහා GIZ තම සහයෝගිතාවය පළකර තිබේ. ඒ අනුව, GIZ උපදේශකයකු ද වන මහාචාර්ය ෆ්‍රැන්ක් එබින්ගර් 2016 ජූලි මාසයේදී කාර්ය වැඩසටහන් ආරම්භ කළේය. දෙදහස් දහසයේ සැප්තැම්බර් - දෙසැම්බර් කාලය තුළ රැස්වීම් හතරක් පවත්වන ලදී. එයට අමතරව ජාතික විද්‍යා පදනම් කළමනාකරණ මණ්ඩලයට කාර්ය ලේඛන ද්විත්වයක් ඉදිරිපත් කෙරුණි.

## විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ තාක්ෂණික පුද්ගලයින්ට ත්‍යාග පිරිනැමීම

අප රටේ විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා විශිෂ්ට දයකත්වයක් ලබා දෙන්නාවූ දේශීය විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ තාක්ෂණික පුද්ගලයින් ඔවුන්ගේ දායකත්වය සම්භාවනාවට පාත්‍ර කිරීමෙහිලා පහත සඳහන් විවිධ ජාතික විද්‍යා පදනම් සම්මාන ප්‍රදාන වැඩසටහන් යටතේ ත්‍යාග ලබාදීම සිදුකරයි.

***විද්‍යා හා තාක්ෂණ ජයග්‍රහණ සඳහා ජාතික සම්මාන (NASTA)***

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, තාක්ෂණවේදීන් සහ ව්‍යවසායකයින් විසින් සිදුකරන ලද සැලකිය යුතු දයකත්වය සම්භාවනාවට පාත්‍ර කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ජයග්‍රහණ සඳහා ජාතික සම්මාන පිරිනමනු ලැබේ. මෙම සම්මාන වැඩසටහනෙහි අරමුණ වන්නේ, නිෂ්පාදන, ක්‍රියාවලි හා සේවා සහ විද්‍යාව හා තාක්ෂණයෙහි පුළුල් පදනම යොද ගැනීම ඔස්සේ ආර්ථික ප්‍රගතිය සඳහා දියුණු කරන ලද නවෝත්පාදන ධාරිතාවය සහ හැකියාව බවට දැනුම පරිවර්තනය කිරීමයි. NASTA 2016 සම්මාන සඳහා 2016 ජූනි 30 අවසන් දිනය ලෙස සලකමින් අයදුම්පත් කැඳවීම සිදු කරන ලදී. අයදුම්පත් 28ක් ලැබුණු අතර විනිශ්චය මණ්ඩලයක් මගින් එම අයදුම්පත් ඇගයීම සිදු කෙරුණි. සමාලෝචන රැස්වීම් හතක් 2016 අගෝස්තු සහ සැප්තැම්බර් කාලය තුළ පවත්වන ලදී. අවසන් වටය සඳහා අයදුම්කරුවන් පස්දෙනෙකු නාම යෝජනා කළ ද, කුසලතා සම්මානයකට හිමිකම් කියනු ලැබුවේ එක් අයදුම්කරුවකු පමණි. එහෙයින්, NASTA සම්මාන ප්‍රදානෝත්සවය කල් දැමීම සිදු කෙරුණු නමුදු කුසලතා සම්මාන ජයග්‍රහකයා මතු දිනෙක සංවිධානය කරනු ලබන සම්මාන උළෙලකදී සම්භාවනාවට පාත්‍ර කිරීමට නියමිතය.

***ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සම්මාන***

ජාතික විද්‍යා පදනම මූල්‍යාධාර සපයනු ලබන පර්යේෂණ ව්‍යාපෘති මගින් විද්‍යාවේ අභිවර්ධනය සඳහා විශිෂ්ට දයකත්වයක් සැපයූ විද්‍යාඥයින්ට ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සම්මාන වාර්ෂිකව ලබා දෙනු ලැබේ. මෙම සම්මානයේ අරමුණ වන්නේ විද්‍යාවේ අභිවර්ධනය සඳහා සපයන ලද දයකත්වය උදෙසා ඔවුන්ට ලැබිය යුතු පිළිගැනීම සඳහා විද්‍යාඥයින්ට වටිනාකමක් ලබා දීම සහ එමගින් ජාතික විද්‍යා පදනමේ ප්‍රධාන අරමුණුවලින් එකක් සාක්ෂාත් කර ගැනීමට උපකාර කිරීමය. පිළිගැනීමට ලක් වූ විද්‍යාඥයින් හට තම වෘත්තීය අනාගතය වැඩි දියුණු කිරීමට උපකාර කරන අතරම විද්‍යාත්මක පර්යේෂණවල ඉහළ ප්‍රමිතිය සවිඥානිකව පවත්වා ගැනීමට තරඟකාරී පර්යේෂණ ප්‍රදානලාභීන් අභිප්‍රේරණය කිරීමද මෙම සම්මානය මගින් සිදු කෙරේ.

ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සම්මාන සඳහා 2016 වසර තුළ යෝග්‍යතා උපමාන සපුරන ලද එකදු අයදුම්කරුවක්වත් තෝරා ගැනීමට අපොහොසත් විය.

### *ජාතික විද්‍යා පදනම් තාක්ෂණ ප්‍රදාන*

මෙම සම්මාන වැඩසටහනේ අරමුණු වන්නේ, නවෝත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට දක්වන ලද දායකත්වයට ඔවුනට හිමි පිළිගැනීම ලබා දීම සහ එමගින් ජාතික විද්‍යා පදනමෙහි අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට ඍජුව හෝ වක්‍රව දායකවීම පිළිබඳව ඔවුනට නිසි ඇගයීමක් ලබා දීමත්, එමෙන්ම තාක්ෂණ ප්‍රදානලාභීන් රාජ්‍ය සහ පෞද්ගලික අංශ සමග සවිඥානකව ඉහළ ප්‍රමිතියක් සහිත හවුල් සබඳතාවයක් පවත්වා ගැනීම සඳහා ඔවුන් පෙළඹවීමත් වේ. ජාතික විද්‍යා පදනම් තාක්ෂණ සම්මාන සඳහා 2016 ජූනි මාසය වන තෙක් පදනම වෙත භාර දී තිබුණු අවසන් වාර්තා සැලකිල්ලට ගන්නා ලදී. එක් ව්‍යාපෘතියක් ඇගයීම් සහතිකයක් පිරිනැමීම සඳහා නිර්දේශ විය (*ඇමුණුම 07*). ජයග්‍රහකයින් 2017 ජනවාරි මාසයේ දී පැවැත්වීමට නියමිත උත්සවයකදී ඇගයීමට ලක් කෙරෙනු ඇත.

### *පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාරක වැඩසටහන (SUSRED)*

විද්‍යා හා තාක්ෂණ සියලු ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කරන පශ්චාත් උපාධි ශිෂ්‍යයින් අධීක්ෂණය කිරීමේ නියැලෙන විද්‍යාඥයින්/ ඉංජිනේරුවන් උනන්දු කරවීමට, උපකාර කිරීමට සහ පිළිගැනීමට ලක් කිරීමට "පර්යේෂණ උපාධි සමීක්ෂණය සඳහා උපකාරක වැඩසටහන" සඳහා සම්මාන ප්‍රදානය 2011 වර්ෂයේදී හඳුන්වාදෙනු ලැබුණි. මෙම වැඩසටහන මගින් පශ්චාත් උපාධි පර්යේෂණ පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ එයට පහසුකම් සැලසීම පිණිස විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන දිරිමත් කිරීම ද සිදු කෙරුණි.

"සස්රෙඩ්" සම්මාන ලබා ගැනීමේ දී අධීක්ෂණ කණ්ඩායම් 24ක්, 2014 සහ 2015 වර්ෂවල දී දර්ශනශූරී (*PhD*) උපාධි 15කට සහ දර්ශනපති උපාධි (M.Phil) උපාධි 09 ක් සඳහා සම්මානයට පාත්‍රවිය. නිර්දේශිත ජයග්‍රාහකයින් පිළිබඳ තොරතුරු *ඇමුණුම 8* හි දක්වා ඇත.

### *තෙවන ලොව විද්‍යා ඇකඩමිය/ ජාතික විද්‍යා පදනම් (TWAS/NSF) තරුණ විද්‍යාඥ සම්මාන*

පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් සිදුකරන ලද නිර්දේශය පදනම් කරගෙන රසායන විද්‍යාව සහ ජෛව විද්‍යාව යන ක්ෂේත්‍රවල ජයග්‍රාහකයින් දෙදෙනෙකුට TWAS/NSF තරුණ විද්‍යාඥ සම්මානය - 2016 පිරිනමනු ඇත. ජයග්‍රාහකයින් පිළිබඳ තොරතුරු *ඇමුණුම 9* හි සඳහන් කර ඇත.

### *තරුණ විද්‍යාඥයින් උදෙසා වාර්ෂික TWAS/NSF ත්‍යාගය*

ජෛව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යාව යන ක්ෂේත්‍රවල පර්යේෂණයන්හි විශිෂ්ටත්වයක් ළඟා කරගත් දක්ෂ, තරුණ විද්‍යාඥයින් සඳහා ත්‍යාග පිරිනැමීම පිණිස වැඩසටහනක් තෙවන ලොව විද්‍යා ඇකඩමිය සමග එක්ව ජාතික විද්‍යා පදනම ආරම්භ කොට තිබේ. මෙම ත්‍යාගය, තෙවැනි ලොව විද්‍යා ඇකඩමිය ප්‍රදානය කරන එක්සත් ජනපද ඩොලර් 2,000කට සමාන මුදල් ත්‍යාගයකින් සහ ජාතික විද්‍යා පදනම පිරිනමනු ලබන සහතිකයකින් සමන්විතවේ. උපරිම ලෙස ජයග්‍රායකයින් දෙදෙනෙකු අතර මුදල් ත්‍යාගය (ඩොලර් 2,000) සම සමව බෙදී යනු ඇත. තම පර්යේෂණ කටයුතුවල විශිෂ්ටත්වයක් ලබා ගත් දක්ෂ තරුණ විද්‍යාඥයින්ට දිරි දීමනාවක් සැපයීම සඳහා සහ එවැනි උසස් තත්වයකට පත්වීම පිළිබඳ සම්මානයට පාත්‍ර කිරීමද මෙම ත්‍යාග මගින් අදහස් කෙරේ. ජාතික විද්‍යා පදනම වෙත තරුණ විද්‍යාඥයින් උදෙසා TWAS/NSF ත්‍යාගය 2016 සඳහා සලකා බැලීමට අයදුම්පත් පහක් (05) ලැබුණි. මෙම අයදුම්පත් අතරින් ජාතික විද්‍යා පදනම අවසානයේදී රසායන විද්‍යාව සහ ජෛව විද්‍යාව යන ක්ෂේත්‍රවලින් නාමයෝජනා නිර්දේශ කළාය.

ජෛව විද්‍යාව සහ රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ පිළිවෙලින් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කේ.එම්.ජී. ගෙහාන් ජයසූරිය සහ මහනුවර, හන්තාන පාරේ, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධිශිෂ්‍ය, ආචාර්ය එම්.එස්. විතානගේ හට TWAS/NSF තරුණ විද්‍යාඥයින්ගේ සම්මානය - 2016 පිරිනමන ලදී.

### *ජාතික විද්‍යා පදනම් සම්මාන ප්‍රදානෝත්සවය - 2016*

ජාතික විද්‍යා පදනමේ පහත සඳහන් වැඩසටහන් යටතේ සම්මාන ප්‍රදානය කිරීම පිණිස 2017 ජනවාරි 31 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට නියමිත ජාතික විද්‍යා පදනම් සම්මාන ප්‍රදානෝත්සවයෙහි සංවිධාන කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

- පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාරක වැඩසටහන (SUSRED)
- තෙවැනි ලොව විද්‍යා ඇකඩමිය (TWAS)/ NSF)

## මිනිසා සහ ජෛවගෝලය වැඩසටහන (MAB) මගින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිත සමාලෝචනය

මිනිසා සහ ජෛවගෝලය (MAB) වැඩසටහන, මිනිසා සහ ඔහුගේ පරිසරය අතර ඇති බන්ධුතාවය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක පදනමක් ස්ථාපිත කිරීමේ අරමුණ සහිත වූ ජාත්‍යන්තර විද්‍යාත්මක වැඩසටහනකි. එය, මානව දිවිපෙවෙත ඉහළ නැංවීමේ සහ ස්වභාවික හා පාලිත පරිසර පද්ධති ආරක්ෂා කිරීමේ අදහස ඇතිව, එනිසාම සමාජමය සහ සංස්කෘතිකමය වශයෙන් සුදුසුවීම පමණක් නොව පරිසර වශයෙන් තිරසර බවද සහිත ආර්ථික සංවර්ධනය අරබයා තවත් ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වභාවික සහ සමාජ විද්‍යාඥයින් සමෝධානය කිරීම සිදු කරයි. එය, ජෛව විවිධත්ව හානියෙහි පරිතර විද්‍යාත්මක, සමාජයීය සහ ආර්ථික මාන මෙන්ම, මෙම හානි අඩු කිරීම සඳහා ඉලක්ක කෙරෙන අන්තර්විෂයයික පර්යේෂණ න්‍යායපත්‍රයක් සහ ධාරිතාව ගොඩනැංවීමක් යෝජනා කරයි. එය, හෙට ලෝකය කෙරෙහි අද සිදු කරන ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාක පුරෝකථනය කරන අතර එනිසාම, මානව ජනගහනය සහ පරිසරය යන ද්විත්වයෙහිම සුබසාධනය සඳහා ස්වභාවික සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම පිණිස මිනිසුන් සතු දැනුවත්භාවය ඉහළ නැංවීම සුදුසු යැයි යෝජනා කරයි.

ශ්‍රී ලංකාවේ මිනිසා සහ ජෛවගෝලය වැඩසටහන 1968 වර්ෂයේදී පවත්නා ලද යුනෙස්කෝ ජෛවගෝල සම්මේලනයෙහි සෘජු ප්‍රතිඵලයක් වන අතර 1971 දී දියත් කරන ලද්දකි. වර්ෂ 2016 සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

### *ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිතවල (IBR) කාලාවර්තක පසුවිපරම් ක්‍රියාකාරකම්*

ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිත (*IBR*) යුනෙස්කෝ උපමානවලට අනුව ක්‍රියාකරන්නේද යන බව සහ තවත් කාලපරිච්ඡේදයකට (වසර 10කට) එම පිළිගැනීම අඛණ්ඩව පවත්වාගෙන යනවාද යන්න තීරණය කිරීම සඳහා සෑම වසර 10කට වරක් කාලාවර්තක සමාලෝචන (PR) සිදු කළ යුතු බවට යුනෙස්කෝව නිර්දේශ කර ඇත.

ශ්‍රී ලංකාවේ තිබෙන ජෛවගෝල සංරක්ෂිත සතරෙහි, එනම්, සිංහරාජ, බුන්දල, හුරුළු සහ කන්නෙලිය-දැදියගල - නාකියාදෙනිය (KDN) සංකීර්ණය සම්බන්ධව කාලාවර්තක සමාලෝචන වැඩකටයුතු නිම කරන ලද අතර ඒවාට අදාළ වාර්තා 2015 වර්ෂයේදී යුනෙස්කෝව වෙත භාර දී ඇත. ඔවුන්ගේ ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිත තත්ව ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා 2016 දී යුනෙස්කෝ අනුමැතිය ලැබුණි. තවද හුරුළු කාලාවර්තික සමාලෝචන වාර්තාව, ජෛවගෝල සංරක්ෂිත ජගත් ජාලයෙහි (WNBR) සාමාජිකයින් විසින් භාවිත කරනු ලැබීම උදෙසා ආකෘතියක් ලෙස තෝරා ගැණුනු බව යුනෙස්කෝව වාර්තා කළාය. කාලාවර්තක සමාලෝචන ක්‍රියාවලිය තුළ පසු-විපරම් කටයුතු ලෙස පහත සඳහන් කර්තව්‍යයන් සිදු කරනු ලැබීය.

***බුන්දල ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිතය -*** යුනෙස්කෝව වෙත වාර්තාව භාරදී තිබුණු බැවින්, MAB කමිටුව ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලය හා එක්ව, නිසිකලට සහ කාර්යක්ෂම ලෙස බුන්දල ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිතය කළමනාකරණය කිරීම සඳහා පහසුකම් සැපයීමට සුදුසු ක්‍රමවේද හඳුනාගැනීමට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් සමග සාකච්ඡා වට කිහිපයක් පැවැත්විය. බුන්දල ජාත්‍යන්තර ජෛවගෝල සංරක්ෂිතයෙහි ස්ථාන පරීක්ෂා කිහිපයක් සිදු කිරීම සහ අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

### *මිනිස් - වානර ගැටුම විසඳීම සඳහා යාන්ත්‍රණයක් හඳුනාගැනීම*

විශිෂ්ට මට්ටමේ සම්බන්ධීකරණයක්, නවෝත්පාදනමය විසඳුම්, සහ හවුල්කරුවන් සමූහයකගේ විවිධ ප්‍රතිචාර අවශ්‍ය කෙරෙන මෙම බහු-මුහුණත් ගැටලුව පිළිබඳ ශ්‍රී ලංකා ජාතික රතුකුරුස කමිටුව සහ ජාතික විද්‍යා පදනමෙහි මිනිසා සහ ජෛවගෝලය ජාතික කමිටුව තම සැලකිල්ල යොමුකරන ලදී.

වසර ගණනාවක් තිස්සේ, දිගු කාලීන විසඳුමක් පෙනෙන තෙක් මානයක් නොතිබුණු, මිනිසුන් සහ වඳුරන් යන දෙකොට්ඨාසයම පීඩාවට පත් කළ මිනිස්-වඳුරු ගැටුම ශ්‍රී ලංකාව තුළ හුදෙක් "වඳුරු ව්‍යාපාරයක්ම" විය. මෙම ගැටුලුවේ විවිධ වූ දිශානති පිළිබඳ නොසලකා හරිමින්, මෙම තත්වය "වන ජීවී ගැටලුවකට" ලඝු කොට සලකන ලදී. සාර්ව ලෙස මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා කිරීමට සහ දිගුකාලීන විසඳුමක් සඳහා ඉදිරි කටයුතු සිදු කරන ආකාරය හඳුනා ගැනීමට 2014 අප්‍රේල් මාසයේදී පවත්වන ලද වැඩමුළුව පොදු වේදිකාවක් බවට පත් කර ගනිමින් ශ්‍රී ලංකා රතුකුරුස සමාජය (SLRC) සහ ජාතික විද්‍යා පදනම් මිනිසා සහ ජෛවගෝල කමිටුව අදාළ සියලුම පාර්ශවකරුවන් ගෙන ඒම මගින් මෙම තත්වය වෙනසකට ලක්විය.

මිනිසා සහ ජෛවගෝල ජාතික කමිටුව මගින් ඉහත වැඩමුළුවෙන් අනතුරුව 2016 අප්‍රේල් මාසයේදී සංවිධානය කරන ලද රැස්වීමක දී 2014 වැඩමුළුවෙහි වාර්තාව සහ නිර්දේශ සාකච්ඡාවට බඳුන් කරන ලදී. නිර්දේශ ඉදිරියට ගෙන යෑම පිණිස ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීමෙහි වගකීම දැරිය යුතු වූ ප්‍රධාන නියෝජිතායතන හඳුනා ගැනීමට මෙය උපකාර විය. මෙම ගැටලුව තනිකරම "වන ජීවී ගැටලුවක් " නොවන බව සහ ක්ෂණික විසඳුම් සාමාන්‍යයෙන් පිළිගත නොහැකි බවක් මෙහි දී ඒකඟතාවයකට පැමිණුනි. පොදු ඒකගකාවයක් සහිතව සුදුසු යාන්ත්‍රණයක් සකස් කර ගැනීම පිණිස මූලික කටයුතු මේ වන විට සිදු කොට තිබේ. යෝජිත බහු පාර්ශ්වික යාන්ත්‍රණය ආයතනගත කිරීම සහ චිරස්ථායී සහ දිගුකාලීන විසඳුම් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කරනු ලැබ තිබීම සඳහා විවිධ මාන සියල්ල ඔස්සේ "ශ්‍රී ලංකාවේ වඳුරු-ව්‍යාපාරය" ආමන්ත්‍රණය කිරීම පිණිස සම්බන්ධිකරණ කටයුතු සිදු වෙන බව සහතික කිරීම, හඳුනාගන්නා ලද අදළ රාජ්‍ය කාර්යාංශ වෙත පැවරේ.

***කසකස්තානයේ අල්මැට්වලදී 2016 ඔක්තෝම්බර් 24-25 දෙදින තුළ පවත්වන ලද අටවන (08) දකුණු සහ මධ්‍යම MAB ජාලය (SACAM)***

SACAM ලේකම් කාර්යාලය, යුනෙස්කෝ - නවදිල්ලිය, සහ ආර්ථික සහයෝගිතා සංවිධාන විද්‍යා පදනම (ECOSF) යන ආයතනවල සහයෝගය ඇතිව යුනෙස්කෝ සඳහා කසකස්තාන ජාතික කොමිසම, ඉස්ලාමීය අධ්‍යාපනික, විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධානය (ISESCO) සහ කසකස්තාන ජාතික MAB කමිටුව විසින් මෙම රැස්වීම සංවිධානය කරන ලදී, "ජෛවගෝල සංරක්ෂිත සහ තිරසර සංවර්ධනය" මෙම රැස්වීමේ තේමාව විය. මිනිසා සහ ජෛවගෝල ජාතික කමිටු ඇතුළත්ව දකුණු සහ මධ්‍යම ආසියානු කලාපයේ MAB වැඩසටහන් නියෝජිතයින්, ජෛවගෝල සංරක්ෂිත කළමනාකරුවන් සහ ජාතික හා ජාත්‍යන්තර සංවිධානවලින් විශේෂඥයින් මෙම රැස්වීමට සහභාගි වූහ.

ජාතික විද්‍යා පදනම මගින් නාමයෝජනා කරන ලද ශ්‍රී ලංකාවේ ද්විත්ව සාමාජික නියෝජිත මණ්ඩලය, MAB වැඩසටහනේ ජාතික කමිටුවේ ලේකම්, එම්.ඒ.යූ. අමරසිංහ මිය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කලාපීය වන නිලධාරී, බී.ඩී.සී.ජී. ප්‍රියන්ත මහතාගෙන් සමන්විත විය.

මිනිසා සහ ජෛවගෝල ක්‍රමෝපාය 2015-2025 හා සම්බන්ධව නම් ශ්‍රී ලංකාව ඉතාමත් සවිස්තරාත්මක වූ ලීමා ක්‍රියාකාරී සැලැස්ම (LAP) පිළිපැදීම අවශ්‍යයෙන්ම කළ යුතුය. මෙම රැස්වීමට සහභාගි වීමෙන් ලද දැනුම LAP උපකාරක ලේඛනයක් ලෙස භාවිත කරමින් ජාතික විද්‍යා පදනම MAB කමිටුවෙහි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිණිස යොදා ගැනෙනු ඇත.

***උස්සන්ගොඩ ජාතික උද්‍යානය භූ උද්‍යානයක් ලෙස නාමයෝජනා කිරීම***

භූ උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නියමිත උස්සන්ගොඩ ජාතික උද්‍යානයෙහි නාමකරණය පිළිබඳව කටයුතු කළ උප-කමිටුව, යුනෙස්කෝ වෙත එහි සලකාබැලීම සඳහා භාර දීමට නාමකරණ ඩොසියරයෙහි පළමු කෙටුම්පත නිමකරණ ලදී. යෝජිත භූ උද්‍යානයෙහි ක්‍රමාණුකූල සැලැස්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි සහ උස්සන්ගොඩ භූ උද්‍යාන උපකමිටුවේ සාමාජිකයින්ගේ සහයෝගය ඇතිව පත් කරන ලදී.

***වෙනස්වන දේශගුණයක් යටතේ ශ්‍රී ලංකාවේ ජෛව භූගෝලීය සහ ජෛව විවිධත්ව සංරක්ෂණ ජාතික ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය, 2015 නොවැම්බර් 12-13, ජාතික විද්‍යා පදනම - පසුවිපරම් කටයුතු***

ශ්‍රී ලංකාවේ ජෛව සමුදයෙහි ජෛවභූගෝලීය ගැටලු පුනර්-පරීක්ෂණයක් සඳහා වේදිකාවක් සැපයීමට ඇති අවශ්‍යතාවය MAB කමිටුව හඳුනාගෙන තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජෛවභූගෝලීය විද්‍යාව පිළිබඳ අපගේ වර්තමාන දැනුම පිළිබඳව පාද රේඛවක් සැපයීමට සහ වෙනස්වන දේශගුණයක් යටතේ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයෙහි පරිහානිය නොසලකා සංරක්ෂණය සැලසුම් කිරීම සඳහා ජෛව භූ විද්‍යා යටිතලවුරුව පිරිනැමීම

අනාගතයෙහි ආමන්ත්‍රණය කළ යුතු ආකාරය හඳුනාගැනීමට ඉහත ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය ජාතික විද්‍යා පදනම විසින් සවිධානය කරන ලදී.

ජෛව භූගෝලීය විද්‍යා ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයෙහි වාර්තා සටහන්වල සංස්කාරක මණ්ඩලය වෙත සම්මන්ත්‍රණයේදී තෝරා ගනු ලැබූ ඉදිරිපත්කිරීම්වල අත්පිටපත් ප්‍රකාශනය සඳහා ලංකා විද්‍යා වාරසඟරාවෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබුණි.

### "ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් - කොන්දේසි, ප්‍රවනතා සහ ආනයනයම නමැති ප්‍රකාශනය යාවත් කාලීන කිරීම

පසුගිය දශකය තුළ ස්වභාවික සම්පත්වලට බලපෑමක් සිදු කරමින් බොහෝ සංවර්ධන කටයුතු සිදු කෙරුණු නිසා ජාතික විද්‍යා පදනම "ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් - 2000" ප්‍රකාශනය යාවත්කාලීන කිරීමට තීරණය කළාය. සම්පත් කෙරෙහි බලපාන කොන්දේසි සහ ප්‍රවණතා, ආර්ථික සංවර්ධනය උදෙසා සම්පත් තිරසර ලෙස භාවිත කිරීම, විභව ආයෝජන අවස්ථාවන්, කර්මාන්ත සහ සංචාරක ව්‍යාපාරයෙහි අනාගතය, යනාදියට මෙම ප්‍රකාශනයෙහි අවධානය යොමු කර තිබේ.

මෙම ප්‍රකාශනය, අදාළ ක්ෂේත්‍රවල ඉහළ පිළිගැනීමකට ලක්වූ, සහ ජාතික වශයෙන් පිළිගත් විශේෂඥයින් විසින් රචිත පරිච්ඡේද 18කින් සමන්විතවේ. සමාලෝචන ක්‍රියාවලිය නිම කර තිබෙන අතර ප්‍රකාශනය සැලසුම් කිරීම හා මුද්‍රණය කිරීම 2017 වර්ෂය තුළ දී සිදු කිරීමට නියමිතය.

### ජගත් පරිසර දිනය සැමරීම - 2016

ජාතික විද්‍යා පදනමෙහි අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්යමණ්ඩලය සහ ජගත් පරිසර දිනය - 2016 සැමරීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලදී.

## දැනුම සහ කුසලතා ව්‍යාප්ත කිරීම

පහත සඳහන් වැඩසටහන් සාර්ථකව සංවිධානය කරන ලද අතර අදාළ පාර්ශවකරුවන් අතර දැනුම සහ කුසලතා ව්‍යාප්ත කිරීම පිණිස ජාතික විද්‍යා පදනම මගින් විද්‍යාත්මක රැස්වීම් සහ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රදාන ලබා දෙන ලදී.

- අපේක්ෂා තැබිය හැකි තාක්ෂණ ප්‍රදාන අයදුම්කරුවන් සඳහා "ඵලදායී යෝජනා ලේඛනය" පිළිබඳව සාර්ථක වැඩමුළු දෙකක් 2016 මැයි 17 සහ නොවැම්බර් 16 යන දිනවලදී පැවැත්වීම.
- ප්‍රදාන දිශාභිමුඛ සම්මන්ත්‍රණ දෙකක් 2016 මැයි 25 සහ දෙසැම්බර් 07 පැවැත්වීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් පවත්වන ලද අතර ප්‍රදානලාභීහු තාක්ෂණ ක්‍රියාකාරී කමිටුව වෙත තම සොයා ගැනීම් ඉදිරිපත් කළහ. එම ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීමට ප්‍රතිපෝෂණ තොරතුරු සැපයීම සිදු කරන ලදී.

## විද්‍යාත්මක රැස්වීම් සහ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රදාන

රාජ්‍ය සහ රාජ්‍ය නොවන පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, විශ්ව විද්‍යාල සහ සුපිනිටි විද්‍යා හා තාක්ෂණ සංගම් වෙත, විද්‍යාත්මක රැස්වීම්, පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මේලන සංවිධානය කිරීම සඳහා "විද්‍යාත්මක රැස්වීම් සහ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රදාන" වැඩසටහන කටයුතු කරයි. අප රටේ විද්‍යාව සහ තාක්ෂණය සංවර්ධනය කිරීමට අවස්ථාවක් උදාකරමින් තමන්ට අදාළ ක්ෂේත්‍රවල කීර්තිමත් විදේශීය විද්‍යාඥයින් මෙන්ම දේශීය විද්‍යාඥයින් සමග අන්තර්කර්ෂණ සිදු කිරීම සඳහා ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ට මෙමගින් වැඩි අවස්ථාවක් ලබා දේ. මූලික සහ ව්‍යවහාරික විද්‍යා මෙන්ම සමාජ විද්‍යාවේ විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙමින් 2016 වසර තුළ රු. 16,99,526/-ක් වටිනා ප්‍රදාන 41ක් ලබා දෙන ලදී. මේ අතරින්, සංවිධායක කමිටුවල ආරාධනයෙන් ජාතික විද්‍යා පදනම වැඩසටහන් අටක (08) සම-සංවිධායකත්වය දැරුවාය. මෙම ප්‍රදාන පිළිබඳ තොරතුරු *ඇමුණුම 10* යටතේ ලබා දී ඇත. පහත දක්වා ඇති රූ සටහන මගින් විවිධ විෂයයන් ඔස්සේ ලබා දුන් ප්‍රදානවල ව්‍යාප්තිය විස්තර වශයෙන් පෙන්නුම් කරයි.




## ජාතික විද්‍යා පදනම මගින් සම්බන්ධිකරණය සිදු කරන ලද ව්‍යාපෘති/ වැඩසටහන්

### *ජාතික විද්‍යා පදනමේ සෞඛ්‍ය විද්‍යා පර්යේෂණ වැඩසටහන*

රජය, සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සහ සංවර්ධනයන්ගේ වැදගත්කම වටහා ගනිමින් පිළිකා, ඩෙංගු, කණ්ණම සහ දියවැඩියාව පිළිබඳ පර්යේෂණ සිදු කරගෙන යෑමට 2016- අයවැය යෝජනා මගින් ජාතික විද්‍යා පදනම වෙත රු.මිලියන 250ක මුදලක් වෙන් කළාය. මෙම වැඩසටහන විසිරුණු පර්යේෂණ අරමුදල් ජාතික වැදගත්කමක් සහිත ක්ෂේත්‍ර වෙතට සැලකිය යුතු ප්‍රමාණයකින් හරවා යවන බවට සහතික කරනු ඇත. එමගින්, (මුල් අවස්ථාවේදී) අවශ්‍ය මූලික පර්යේෂණ සහ ශ්‍රී ලංකාව තුළ, ජගත් මට්ටමේ පර්යේෂණ හා සහයෝගිතාවයක් සහිත වඩාත් සඵල කරන ලද නිපුණතා මගින් සහයෝගය දක්වනු ලබන මනා පරිචයන් ස්ථාපිත කරමින් කැපවුණු පර්යේෂණ කණ්ඩායම් නිර්මාණය කිරීම ද ප්‍රවර්ධනය කරනු ඇත.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික විද්‍යා පදනම් සෞඛ්‍ය විද්‍යා පර්යේෂණ වැඩසටහනට (RPHS) අවශ්‍ය කෙරෙන මගපෙන්වීම/ උපදෙස් ලබා දීම සඳහා මෙහෙයුම් කමිටුවක්, ජාතික විද්‍යා පදනම් පර්යේෂණ ශිෂ්‍යයින් දෙදෙනෙක්, පශ්චාත් උපාධි පර්යේෂණ විද්‍යාඥයෙක් සහ පර්යේෂණ විද්‍යාඥයෙක් පත් කිරීම සිදු කෙරුණි.

දෙදහස් දහසයේ ජූලි මාසයේ පවත්වනු ලැබූ ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සමුළුව පාදක කරගෙන ක්ෂේත්‍ර හතරෙහි වූ ප්‍රමුඛතා පර්යේෂණ ගැටලු විශේෂඥයින් සමග සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද අතර "අභිරුචිය ප්‍රකාශ කිරීම්වල" සාරාංශ සැකසීම සිදු කරන ලදී. පුවත්පත් දැන්වීමට ප්‍රතිචාර ලෙස අභිරුචිය ප්‍රකාශ කිරීම් (EsOI) 38ක් (දියවැඩියාව- 06, ඩෙංගු - 06, CKDu - 15, පිළිකා - 11) ලැබුණි. මෙහෙයුම් කමිටුව ප්‍රථමයෙන් EsOI පිරික්සීම සිදු කළාය. තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම් මත සහ වෙනත් බොහෝ උපමාන මත පූර්ණ යෝජනා කැඳවීම උදෙසා EsOI, 27ක් තෝරා ගන්නා ලදී.

පූර්ණ යෝජනා සමාලෝචනය කිරීම පිණිස ඇගයීම් සහ අධීක්‍ෂණය කිරීමේ කමිටුවක් පත් කර ගන්නා ලදී. සමාලෝචනයට සහ සුසංගත කිරීමට පසුව යෝජනා 24ක් තෝරා ගැනුණි. කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ප්‍රදාන 24 පිරිනැමීම සිදු කෙරුණි. අරමුදල් ලබාදීමේ ලබා දීමේ වැඩකටයුතු සූදානම් කිරීම 2016 වර්ෂයේ අගභාගයේදී සිදු කෙරුණි.

### *ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සමග සහයෝගිතාවය ඇතිව සිදු කරන කුරුඳු පිළිබඳ ව්‍යාපෘතිය*

කුරුඳු සහ කුරුඳු හා බැඳුණු ක්‍රියාකාරකම් සම්බන්ධ පර්යේෂණ කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ජාතික විද්‍යා පදනම, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කළාය. ජාත්‍යන්තරව තරඟකාරී මට්ටමකට පත් වීමට හැකියාව ලබාදීම පිණිස කුරුඳු

නිෂ්පාදනය උසස් කිරීම සඳහා වෙන් කරන ලද මූල්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස පරිභෝජනය කිරීම සහතික කිරීම මෙම කටයුත්තෙහි අරමුණ විය.

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය පිළිබඳව පුවත්පත්වල දැන්වීම් පළ කළ අතර ඒ අනුව අයදුම්පත් 22ක් සලකා බැලීම පිණිස ලැබී තිබුණි. ජාතික විද්‍යා පදනම් කළමනාකරණ මණ්ඩලය, අයදුම්කරුවන් ඇගයීම සිදු කොට නිර්දේශ සිදු කිරීම උදෙසාත්, මූල්‍ය සම්පාදනය කරන ලද ව්‍යාපෘති ඒවායේ අවසානය වන තෙක් එකී ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහාත් සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත විමර්ශන මණ්ඩලයක් පත් කළාය. අධීක්ෂණ ක්‍රියාවලියට සහාය වීම පිණිස ව්‍යාපෘති සම්බන්ධකාරකවරයෙකු ද පත් කර ගැණුනි.



කුරුඳු ව්‍යාපෘතියෙහි සාර්ථක අයදුම්කරුවන් සඳහා බුද්ධි කලම්භන සැසිය.

විද්‍යාත්මක කුසලතාවය, ව්‍යාපෘතියෙහි බහුවිෂයයික ස්වභාවය, ව්‍යාපෘති කණ්ඩායමේ සංයුතිය, ව්‍යාපෘතියෙහි විෂයයට අදළ බව, සහ ප්‍රතිඵලවල අපේක්ෂිත ප්‍රමිතිය යන කරුණු පාදක කොටගෙන ව්‍යාපෘති පහක් (05) මූල්‍ය සම්පාදනය පිණිස නිර්දේශ කරනු ලැබුණි. ප්‍රදනලාභීන් විසින් ප්‍රදන එකඟතා ගිවිසුම් අත්සන් කිරීම සිදු කෙරුණි.

### *ජාතික විද්‍යා පර්යේෂණ සමුළුව - 2016*

*"පර්යේෂණ සහ නවෝත්පාදක මගින් බලාත්මක කිරීම"*

සමාජයේ වටිනාකම්, අවශ්‍යතා සහ බලාපොරොත්තු එක පෙළට ගන්නා සහ ආමන්ත්‍රණය කරනු ලබන ක්‍රියාත්මක තත්වයේ පවතින ක්‍රියාවලියක් වන්නේ පර්යේෂණ සහ නවෝත්පාදනයයි. එය, සමාජයීය වෙනස්කම්වලට කැපීපෙනෙන, අන්තර්ගත සහ තිරසර විසඳුම් ලබා දෙයි. එනිසා, මෙම ඉතා වැදගත් අවශ්‍යතාවය සපුරාලීමට ජාතික විද්‍යා පදනම "පර්යේෂණ සමුළුව - 2016 පර්යේෂණ සහ නවෝත්පාදන මගින් බලාත්මක වීම" සංවිධානය කරන ලද අතර එය, කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) 2016 ජූලි 07 සහ 08 දෙදින තුළ පවත්තන ලදී. මෙම සමුළුව, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙහි සහ ජාතික විද්‍යා පදනමෙහි ඒකාබද්ධ ප්‍රයත්නයකි.

පර්යේෂණ, නවෝත්පාදන සහ වාණිජකරණය සඳහා න්‍යායපත්‍රයක් සකස් කිරීම මෙන්ම අප රටේ සමාජ ආර්ථික සංවර්ධනය දෙසට නැඹුරුවූ ජාතික විද්‍යා පදනම් අනාගත ක්‍රමෝපාය සිතියම් ගත කිරීම මෙම සමුළුවේ අරමුණු විය. තවද, හඳුනාගන්නා ලද ක්ෂේත්‍රවල මෑත කාලීන දියුණුවීම් පිළිබඳව සාකච්ඡා කිරීමට සහ අත් දැකීම් හුවමාරු කර ගැනීමට, වෘත්තිකයන්ට, විද්‍යාඥයින්ට, ප්‍රතිපත්ති සකස් කරන්නන්ට, සහ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් පැමිණි නියෝජිතයින්ට පොදු වේදිකාවක් සැපයීම ද මෙහිදී අපේක්ෂා කෙරුණි. ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, පහත සඳහන් පරිදි තේමා ත්‍රිත්වයක් (03) සහ උප තේමා 12ක් යටතේ සමුළුව පවත්වන ලදී.

| | |
|---|---|
| අ. ආහාර සහ කෘෂිකර්මය | - ආහාර සුරක්ෂිතතාවය<br>- කුරුඳු පිළිබඳව ජාතික විද්‍යා පදනම් වැඩසටහන<br>- ස්වභාවික නිෂ්පාදන<br>- කෘෂි-තාක්ෂණවේදය |
| ආ. බලශක්තිය සහ පරිසරය | - තිරසර බලශක්තිය<br>- දේශගුණික විපර්යාස සහ ස්වභාවික ව්‍යසන<br>- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය<br>- ජල සුරක්ෂිතතාවය |
| ඇ. සෞඛ්‍ය | - දියවැඩියාව<br>- ඩෙංගු<br>- හේතුකාරක නොදන්නා නිදන්ගත වකුගඩු රෝගය (CKDu)<br>- පිළිකා |

සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ ජාතික විද්‍යා පදනම් වැඩසටහන සහ කුරුළු පර්යේෂණ වැඩසටහන 2016 අය-වැය යෝජනා මගින් ජාතික විද්‍යා පදනමට පවරන ලද විශේෂ පර්යේෂණ කටයුතු වීම හේතු කොට ගෙන මෙන්ම ජාතික විද්‍යා පදනම් ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන මගින් හඳුනාගන්නා ලද ප්‍රමුඛතා ක්ෂේත්‍ර වූ අතර සුරක්ෂිතතාවය, සහ දේශගුණ විපර්යාස, හා ස්වභාවික ව්‍යවසන මෙහිදී විශේෂ අවධානයක් දිනා ගැනීමට සමත් විය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ පැමිණීම කරණ කොටගෙන සමුළුවේ සමාරම්භක උළෙල වර්ණවත් විය. සමාරම්භක උළෙළ සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍ය, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, ආර්. විජයලඩ්වුමී මහත්මිය, සහ අනෙකුත් සම්භාවනීය අමුත්තෝ සහභාගි වූහ. ඇමරිකාවේ, කැලිෆෝර්නියා ප්‍රාන්තයේ, සාන්තකෲස්හි ට්‍රාන්ස්ඩර්ම් ආයතනයේ, පරිවර්තනීය පර්යේෂණ, හිටපු උප සභාපති, ආචාර්ය සුමේධ ජයසේන, ජෛව තාක්ෂණය පිළිබඳ ප්‍රධාන දේශනය පැවැත්වීය.

මෙහිදී, විවෘතව සාරසංග්‍රහ කැඳවන ලද අතර පුළුල් තේමා ත්‍රිත්වය යටතේ සාරසංග්‍රහ 52ක් ලැබුණි. සමාලෝචන ක්‍රියාවලියෙන් අනතුරුව, පෝස්ටර් ඉදිරිපත් කිරීම් සඳහා සාරසංග්‍රහ 32ක් තෝරා ගන්නා ලදී.

අප රටේ ප්‍රධාන පෙළේ විද්‍යාඥයින්, පර්යේෂකයින්, කර්මාන්තකරුවන්, ප්‍රතිපත්ති සකස්කරන්නන්, පර්යේෂණ ප්‍රතිඵල භුක්ති විඳින්නන්, මෙන්ම අ.පො.ස. උසස් පෙළ විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් ශිෂ්‍යයින්, සහ උපාධි අපේක්ෂකයින් 500කට අධික පිරිසක් එක් ස්ථානයකට ගෙන ඒමට මෙම සමුළුව සමත් විය. පසුව සඳහන් කරන ලද කණ්ඩායම් ද්විත්වය සඳහා විද්‍යාව පිළිබඳව නව දැනුම ඉහළ නංවා ගැනීමට ශ්‍රී ලංකාවේ ඉහළම තලයේ විද්‍යාඥයින් හමුවීමේ අවස්ථාව මෙහිදී ඔවුනට උදාකර දීම සිදු කෙරුණි.

සමුළුවේ සාර්ථක නිමාවත් සමග ලබා දුන් නිර්දේශ, ජාතික විද්‍යා පදනම සඳහා තම පසුවිපරම් කටයුතු සිදු කිරීමට මඟ පාද දුනි. වර්තමාන සෙනාරිය, ඉතා ඉක්මණින් අවධානය යොමුවිය යුතු ඉතා වැදගත් ගැටලු, අනාගත පර්යේෂණ අවශ්‍යතා, ආයෝජනයේදී ජාතියට ප්‍රායෝගික ප්‍රතිලාභ ලබා දෙන බහුවිෂයයික සහ සහයෝගිතා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපාය සැකසීම පිළිබඳ ආරාධිත දේශන 44ක් එක පෙළට ගෙන ඒමට මෙම සමුළුව සමත් විය.

# විද්‍යාත්මක සහ තාක්ෂණික පුද්ගලයින්ගේ විධිමත් නාමලේඛනයක් පවත්වාගෙන යෑම

පවරන ලද කාර්යය:

විද්‍යා හා තාක්ෂණික පුද්ගලයින් පිළිබඳ විධිමත් නාමලේඛනයක් පවත්වාගෙන යෑම, සහ වෙනත් ආකාරවලින් සංචිතය සඳහා මධ්‍යම නිෂ්කාශන මධ්‍යස්ථානයක් සැපයීම, ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක සහ තාක්ෂණික සම්පත් වර්තමාන සහ ප්‍රක්ෂිප්ත අවශ්‍යතා සඳහා සුලබතාවය මත දත්ත විශ්ලේෂණය සහ විවරණ කිරීම, සහ විද්‍යාව, තාක්ෂණය හා වෙනත් ක්ෂේත්‍ර පිළිබඳව ප්‍රතිපත්ති සැකසීමේදී තොරතුරු ප්‍රභවයක් ලෙස ක්‍රියා කිරීම



## ජාතික විද්‍යා පදනම් ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ කොන්තරාත්තු පර්යේෂණ ඇතුළත් ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය සහ වෙනත් විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති අධ්‍යයන

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය ඔස්සේ අප රටේ ශීඝ්‍ර සමාජ-ආර්ථික සංවර්ධනය දෙසට යොමුවූ ප්‍රතිපත්ති සැකසීම සහ ජාතික ප්‍රතිපත්තිවල තිබෙන අන්තරය ආමන්ත්‍රණය කිරීම සඳහා සාක්ෂි පාදක කරගත් ප්‍රතිපත්ති නිර්දේශ සැපයීම මගින් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ක්ෂේත්‍රය තුළ පර්යේෂණ හස්තය ලෙස ජාතික විද්‍යා පදනම ක්‍රියා කරයි.

එසේ කිරීමෙන්, ප්‍රතිපත්ති සකස් කිරීම උදෙසා නිර්දේශ සිදු කිරීම පිණිස වැදගත් වූ ක්ෂේත්‍රවල විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය (STI) ප්‍රතිපත්ති පර්යේෂණ පහත සඳහන් පරිදි ජාතික විද්‍යා පදනම විසින් සිදු කරනු ලැබේ.

1. තීරණ ගැනීමෙහිලා වැදගත් විය හැකි විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන සියලුම අංශවලට අදාළ විවිධ දත්තපාදක සංවර්ධනය කිරීම.
2. විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රවලට සම්බන්ධ ජාතික වශයෙන් වැදගත් වන ගැටලු පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රසිද්ධ දේශන භාර ගැනීම.
3. සංරක්ෂණය කරනු ලැබීමට, තිරසර ලෙස භාවිත කිරීමට, සහ හැකි සෑම අවස්ථාවකදීම ජාතික සැලසුම් ක්‍රියාවලියෙහි ප්‍රධාන ධාරාවට එක් කිරීමට අවශ්‍ය වන්නා වූ දේශීය දැනුම සොයා බලා ලබා ගැනීම, එකතු කිරීම, පර්යේෂණ කිරීම සහ සංඝටක වලංගු කිරීම.
4. විශේෂයෙන් සමාජ විද්‍යාව සහ දේශීය දැනුම යන ක්ෂේත්‍රවල මානව සම්පත්වල හැකියාවන් ඉහළ නැංවීම සඳහා භාරගැනීම.

### *ජාතික පර්යේෂණ සංවර්ධනය සහ නවෝත්පාදන (RDI) සමීක්ෂණය*

පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන (RDI) සඳහා ආයෝජන අවශ්‍යතා, විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (STI) අංශවල මානව සම්පත් යොදා ගැනීම, සහ ප්‍රකාශන, පේටන්ට්, තාක්ෂණයත්, නවෝත්පාදන යනාදියට අනුව STI ප්‍රතිඵල මැනීම යනාදිය මත විද්‍යා හා තක්ෂණ අංශයෙහි තත්වය මැනීම සහ වාර්තා කිරීමේ අරමුණ සහිතව 2004 සිට වසර දෙකකට වරක් ජාතික විද්‍යා පදනම් ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන (RDI) සමීක්ෂණ පැවත්වා තිබේ.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සහ ආර්ථික සහයෝගිතා සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) විසින් ස්ථාපිත කරන ලද ජාත්‍යන්තර ප්‍රමිති අනුගමනය කරමින් මෙම සමීක්ෂණය සිදු කරනු ලැබේ. මෙම සමීක්ෂණයෙහි විෂයපථයට උසස් අධ්‍යාපන අංශය, විද්‍යා හා තාක්ෂණ ආයතන, පර්යේෂණ සහ සංවර්ධන ආයතන, කර්මාන්ත අංශය, සහ දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන (NGO) අන්තර්ගත වේ.

වසර 2015 අවසාන භාගයේදී ආරම්භ කරන ලද ජාතික RDI සමීක්ෂණය 2014 අඛණ්ඩව 2016 වර්ෂය මුල්භාගය තුළ ද ක්‍රියාත්මක විය. දත්ත විශ්ලේෂණය කිරීම සහ විද්‍යා හා තාක්ෂණ දර්ශක සකස් කිරීම 2016 තුළ දී නිම කෙරුණි. ඒ අනුව, "ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සංඛ්‍යාන විද්‍යාත්මක අධ්‍යයන 2014", 2017 වර්ෂයේ මුල් භාගයේ දී ප්‍රකාශනය කෙරෙනු ඇත.

### ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා පර්යේෂණ පිළිබඳ සමීක්ෂණ

ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා පර්යේෂණවලට බලපාන සාධක විමර්ශනය කිරීමට සහ පර්යේෂණ අධ්‍යයනවලින් ප්‍රතිඵලය වූ සාක්ෂ්‍ය මත පදනම්ව ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීමේ ඉඩ ප්‍රස්තාව සහිත සංස්කෘතියක් නිර්මාණය කිරීම උදෙසා අප රටේ සමාජ විද්‍යා පර්යේෂණ ඉහළ නැංවීමට නිර්දේශ යෝජනා කිරීමට මෙම සමීක්ෂණය පවත්වන ලදී. මෙහි දත්ත එකතු කිරීම 2016 වර්ෂය තුළ නිම කරන ලදී.

### 1971-2012 කාලය තුළ පිරිනමන ලද ජාතික විද්‍යා පදනම් පර්යේෂණ ප්‍රදානවල බලපෑම තක්සේරු කිරීම

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ 1971-2012 කාලය තුළ දී පිරිනමන ලද තරඟකාරී පර්යේෂණ ප්‍රදානවලින් ඇති කෙරුණු බලපෑම තක්සේරු කිරීමට අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ජාතික විද්‍යා පදනම සහ එහි පූර්වපජයින් විසින් තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යටතේ ප්‍රදාන 2,472ක් පිරිනමනු ලැබ ඇති අතර ජාතික විද්‍යා පදනම මගින් සිදු කරන ලද යෙදවුම්වලට අදාළ නිමැවුම්, ප්‍රතිඵල සහ බලපෑම් ග්‍රහණය කර ගැනීමට අධ්‍යයනයක් සකස් කරන ලදී.

### දේශීය විශ්ව විද්‍යාලවලින් පිට වන පශ්චාත් උපාධිධරයින්ගේ තත්වය පිළිබඳ අධ්‍යයනය

දේශීය විශ්ව විද්‍යාලවලින් සමත් වන පශ්චාත් උපාධිධරයන් සහ උපාධිය ලබාගැනීමෙන් අනතුරුව ඔවුන් යෙදෙන රැකියා පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම පිණිස අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. දේශීය විශ්ව විද්‍යාලවලින් බිහිකෙරෙන පශ්චාත් උපාධිදරයින්ගේ රැකියා, එකී රැකියාවලදී තමන් ලබාගත් දැනුම උපයෝගී කිරීම, සහ රට තුළ ශ්‍රම වෙළඳපොළට අදාළ දැනුම් පරතරය සොයා ගැනීම, මෙම අධ්‍යයනයේ අරමුණු විය. දැනුම් ආර්ථිකය වැඩි දියුණු කිරීමටත්, එමගින් ජාතික සැලසුම්කරණය සිදු කිරීම සඳහාත් මෙම අධ්‍යයනය මත පාදක වූ සොයාගැනීම් සහ නිගමන භාවිත කළ හැකි වනු ඇත.

## STMIS මගින් විද්‍යාත්මක සහ තාක්ෂණ පුද්ගලයන් පිළිබඳව විධිමත් දත්ත ලැයිස්තුවක් සහ ධාරිතාවය පවත්වා ගැනීම

තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන සියලුම අංශවලට අදළ විවිධ දත්තපාදක සංවර්ධනය කිරීම සහ පවත්වා ගැනීම ජාතික විද්‍යා පදනම සිදු කරයි.

### ජාතික විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS)

ජාතික විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS) යනු ජාතික විද්‍යා පදනම විසින් 2004 වර්ෂයේ සිට සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබන පරිගණකගත තොරතුරු පද්ධතියකි. මාර්ගගත යොමුව සහ ලියාපදිංචිවීමේ කටයුතු එහි වෙබ් අඩවියෙහි (http://mis.nsf.gov.lk) අඩංගු කොට ඇත. මෙම දත්තපාදකයෙහි, විද්‍යාඥයන් පිළිබඳ, විද්‍යා හා තාක්ෂණයට අදළ ආයතන, ආයතනවල තිබෙන දියුණු කරන ලද විද්‍යාත්මක උපකරණ, විද්‍යා හා තාක්ෂණ ආයතන මගින් පිරිනමනු ලබන සේවා සහ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු, පර්යේෂණ ප්‍රකාශන යනාදිය පිළිබඳ තොරතුරු මෙන්ම රට තුළ ක්‍රියාත්මක තත්වයේ පවතින පර්යේෂණ පිළිබඳව තොරතුරු අන්තර්ගතවේ. මෙම දත්තපාදකය නිතිපතා යාවත්කාලීන කෙරෙන අතර 2016 දෙසැම්බර් වන විට පුද්ගලයින් 6131කට අධික සංඛ්‍යාවක තොරතුරු එහි STMIS හි ව්‍යුවහමය සහ කාර්යාත්මක සීමා කිරීම් සැලකිල්ලට ගෙන වසර 2016 තුළ එය වැඩිදියුණු කිරීමට සහ පද්ධතිය පුළුල් කිරීමට සැලසුම් කර තිබුණි.

### සමාජ විද්‍යාඥයින්ගේ නාමාවලිය

අප රටේ සමාජ විද්‍යාඥයින්ගේ නාමාවලියක් සකස් කිරීමට මූලාරම්භයක් ගනු ලැබුණි. සමාජ විද්‍යා ක්ෂේත්‍රයන් තුළ සලකා බැලෙන ජාතික මට්ටමේ සහ ජාත්‍යන්තර මට්ටමේ විවිධ වැඩසටහන් සහ කාර්යයන් සඳහා ඔවුන්ගේ සේවාව සහ විශේෂඥ දැනුම ලබා ගැනීමේ අදහස ඇතිව සමාජ විද්‍යාවට අයත් විවිධ ක්ෂේත්‍ර තුළ කටයුතු කරන සමාජ විද්‍යාඥයින් පිළිබඳ වාර්තා තබා ගැනීම මෙම නාමාවලිය සකස් කිරීමේ ප්‍රධාන අරමුණ විය.

## විද්‍යාව, තාක්ෂණය සහ අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ප්‍රභවයක් සැපයීම

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදනයට අදාළ ජාතික වැදගත්කමකින් යුත් ගැටලු පිළිබඳ ප්‍රසිද්ධ දේශන, ශ්‍රී ලංකාව තුළ පවතින සහ ක්‍රියාවට නැංවෙන දේශීය දැනුම (IK) විමර්ශනයට, එකතු කිරීමට, සහ සංරක්ෂණය කිරීමට අදාළ වැඩසටහන් ජාතික විද්‍යා පදනම සංවිධානය කරයි.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ පහත සඳහන් වැඩසටහන් සංවිධානය කරන ලදී.

### ජාතික ප්‍රතිපත්තීන් තුළ මහා දත්තවල ප්‍රවණතා සහ අනාගතයම පිළිබඳ සම්මන්ත්‍රණය

මහා දත්ත භාවිතය පිළිබඳව උනන්දුවක් දැක්වූ රජයේ ආයතන, පුද්ගලික අංශයේ සංවිධාන, ආණ්ඩුවේ නොවන සංවිධාන, සහ විද්‍යාඥයන් 120ක පමණ සහභාගිත්වයෙන්, ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයේ (SLIDA) සංකතානි ශාලාවේදී 2016 දෙසැම්බර් 20 දින සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මහා දත්ත භාවිත කළ හැකි ආකාර, ඒ සඳහා පවතින අවස්ථා, මහා දත්ත ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීම පිණිස අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්තිමය මැදිහත් වීම සහ සාක්ෂ්‍ය පදනම් වූ ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා ඒවා භාවිත කිරීම පිළිබඳව දෙබසක් නිර්මාණය කිරීම මෙම සම්මන්ත්‍රණයෙහි ඉලක්කය විය.

### තිරසර සංවර්ධනය සඳහා දේශීය දැනුම භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය

ජෛව විවිධත්වය, දේශීය දැනුම සහ තිරසර සංවර්ධනය ඉතා සමීපව බැඳී පවතී. ලෝකයේ මිනිසුන් සතු දේශීය දැනුම් පද්ධතියට විවිධ ශාක විශේෂ, සතුන් සහ මිහිමත ජීවය පිළිබඳ දැනුම අන්තර්ගතවේ. තිරසර සංවර්ධනය සඳහා දේශීය දැනුම සහ විද්‍යාව අතර සහක්‍රියාවන් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ සපයමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානය පිණිස ප්‍රතිපත්ති ලසුවක් සකස් කිරීමට අධ්‍යක්ෂ ජනරාල් සඳහා වූ විද්‍යාත්මක උපදේශක මණ්ඩලය 2015 මැයි මාසයේ පැවති එහි තෙවැනි සැසියේදී තීරණය කළාය (යුනෙස්කෝ වාර්තාව, 2015).

ඒ අනුව, තිරසර සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ පවතින දේශීය දැනුම භාවිත කළ හැකි ආකාරය පිළිබඳව විද්‍යාත්මක ප්‍රජාව, ප්‍රතිපත්ති බලධාරීන්, පරිපාලකයින් සහ මහජනතාව අතර සංවාදයක් ආරම්භ කිරීමට ජාතික විද්‍යා පදනම සැලසුම් කළාය. මේ පිළිබඳ පළමු වැඩසටහන "තිරසර සංවර්ධනය සඳහා දේශීය දැනුම" යන මැයෙන් 2016 ජූලි 22 දින ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

### දේශීය දැනුම පිළිබඳ බුද්ධිමය දේපළ අයිතිය (IP)

දේශීය දැනුම පිළිබඳ බුද්ධිමය දේපළ අයිතිය රැක ගන්නේ කෙසේද යන්න පිළිබඳව නීතිඥයින් සහ විශේෂයෙන් දේශීය දැනුම පිළිබඳ විශේෂ දැනුමක් සහිත දේශීය දැනුම් ක්ෂේත්‍රයේ කටයුතු කරන ප්‍රතිපත්ති බලධාරීන් සමග සාකච්ඡා කිරීමේ අරමුණ ඇතිව රැස්වීම් මාලාවක් පවත්වන ලදී.

සලකා බැලිය යුතු අරමුණු, දේශීය දැනුම ආරක්ෂා කිරීමේදී ඒ සඳහා ගත යුතු පියවර, පවතින රෙගුලාසිවල දක්නට ලැබෙන අඩුපාඩු, සහ දේශීය දැනුම ආරක්ෂා කිරීමට අදාළ ව්‍යවස්ථාව පිළිබඳ මෙම සාකච්ඡාවේදී විශේෂඥ කණ්ඩායම මගින් හඳුනාගන්නා ලදී. විශේෂඥ කමිටු රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ පිළිබඳව අවසන් නිගමනයකට පැමිණීම පිණිස පාර්ශවකරුවන් විශාල කණ්ඩායමකගේ සහභාගිත්වයෙන් බුද්ධි කලම්භන සැසියක් සහ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට ජාතික විද්‍යා පදනම තීරණය කළ අතර 2017 මැද භාගය තෙක් ඉදිරියට ගෙන යෑමට ද තීරණය කෙරුණි.

# ශ්‍රී ලංකාව සහ විදේශයන් අතර තොරතුරු හුවමාරු කිරීම සඳහා උපකාර කිරීම

පවරන ලද කාර්යය:

ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල සිටින විද්‍යාඥයින් අතර තොරතුරු හුවමාරු කිරීම සඳහා උපකාර කිරීම



## පුස්තකාල සම්පත් ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින් සහ විදේශ රටවල් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීම පිණිස උපකාර කිරීමට අවශ්‍ය කෙරෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සම්බන්ධතා සහ ජාල ශක්තිමත් කිරීම ඔස්සේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය භාවිත කරමින් විද්‍යාත්මක ප්‍රජාව වෙත කාර්යක්‍ෂම තොරතුරු ව්‍යාප්ත කිරීමේ සේවාව සැපයීම ජාතික විද්‍යා පදනම අඛණ්ඩව සිදු කළාය. පුස්තකාල වෘත්තිකයින් පුහුණු කිරීම සහ තාක්‍ෂණ සහයෝගය සැපයීම ඔස්සේ කාර්යක්‍ෂමව විද්‍යා හා තාක්‍ෂණ තොරතුරු සේවාවන්ට පහසුකම් සැපයීම මගින් ජාතික විද්‍යා පදනම විද්‍යා හා තාක්‍ෂණ ලිඛිතයන් සඳහා ජාතික කෝෂ්ඨාගාරය ලෙස සේවය කළාය. ඉහත අවශ්‍යතා සපුරාලීම සඳහා 2016 වසර තුළ පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කරන ලදී.



## පුස්තකාල මෘදුකාංග පවත්වා ගැනීම සහ යාවත්කාලීන කිරීම

***ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයෙහි තිබෙන ජාතික මට්ටමේ දත්තපාදක***

රටතුළ වර්තමානයේ සිදු කරනු ලබන සහ අතීතයේ සිදු කළ පර්යේෂණ පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකීය පර්යේෂකයින්ට සහ ශාස්ත්‍රඥන්ට උපකාර කිරීම සඳහා ජාතික මට්ටමේ දත්තපාදක බොහොමයක්, ජාතික විද්‍යා පදනමට පවරනු ලැබූ කාර්යයන්ට අනුකූලව පවත්වාගෙන යනු ලැබේ. සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ, මෙම දත්තපාදකවල ප්‍රගතිය පහත විස්තර කෙරේ.

- ***ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය දත්තපාදකය (SLSI)***

  ප්‍රලේඛන අයිතමවලින් 60%කට අධික ප්‍රමාණයක් සඳහා පූර්ණ පාඨවලට ප්‍රවේශය සපයා ඇති ප්‍රලේඛන 52,226ක් මෙම ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය දත්තපාදනය තුළ වර්තමානයේ අඩංගු කොට ඇත. වාර්තා 3,026ක් එකතු කිරීම මගින් මෙම දත්තපාදකය වසර තුළ කැපීපෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කර තිබේ.

පූර්ණපාඨ සංචිත කර තිබුණු සේවාදායකය ප්‍රතිස්ථාපනය කිරීම හේතු කොට ගෙන මාර්ගගත ප්‍රවේශය සපයා තිබුණු ප්‍රලේඛන (90%) තද බල හානියකට ලක් විය. මෙය නිවැරදි කර ගැනීම සඳහා පූර්ණපාඨ ක්ෂේත්‍රයේ සම්බන්ධතා සංස්කරණය කිරීම කඩිනම් කරන ලද අතර වාර්තා 15,422ක සම්බන්ධතා සංස්කරණයට ලක් කරන ලදී.



- ***පර්යේෂණ ප්‍රදාන දත්තපාදකය (RGRA)***

  ජාතික විද්‍යා පදනම මගින් මූල්‍ය සම්පාදන ව්‍යාපෘතිවලින් ප්‍රතිඵලය වූ, 2016 වසර තුළ ලැබුණු අවසන් වාර්තා සහ පශ්චාත් උපාධි නිබන්ධන 43ක් පිළිබඳ තොරතුරු සංස්ථාගත කිරීමත් සමග මෙම දත්තපාදනය යාවත්කාලීන කරන ලදී.

- ***SLAAS දත්තපාදකය***

  වර්ෂ 1976-2015 අතර කාලපරිච්ඡේදය තුළ SLAAS වාර්ෂික සැසිවලදී ඉදිරිපත් කරනු ලැබූ සියලුම ලිපි සඳහා ආශ්‍රේය ග්‍රන්ථ සහ සාරසංග්‍රහ SLAAS දත්තපාදකයෙහි අන්තර්ගත කර තිබේ. දත්තපාදකය වාර්තා 276ක වර්ධනයක් පෙන්වූවාය. මෙම වාර්තා ද JISIS සේවාදායකයෙහි වූ SLAAS දත්තපාදකය වෙත මාරු කරගැනීම සිදු කර තිබුණි. දත්තපාදකය සෙවුම් කිරීමට ලක් කළ හැකි අතර සාරසංග්‍රහ බාගත කිරීම හෝ මාර්ගගතව මුද්‍රණය කිරීම හෝ සිදු කළ හැකිය.

***එකතුව සංවර්ධනය කිරීම: ජාතික ඉ-කෝෂ්ඨාගාරය***

නවතම තොරතුරු ව්‍යාප්ත කිරීමේ තාක්‍ෂණයක් මගින් දේශීය විද්‍යාත්මක ප්‍රජාවට හැකි ඉහළම සේවයක් ලබා දීම ඉතාමත් වැදගත් වේ. ඒ අනුව, ඩී-ස්පේස් මෘදුකාංගයෙහි 2009 වසරේ දී දියත් කරන ලද ජාතික ඉ-කෝෂ්ඨාගාරය වෙත සාම්ප්‍රදායක SLSI දත්තපාදකයෙහි වූ අන්තර්ගතය මාරු කිරීමේ කටයුතු තවදුරටත් අඛණ්ඩව සිදු කෙරුණි. ජාතික ඉ-කෝෂ්ඨාගාරය වෙත SLSI වෙතින් වසර තුළ මාරු කරන ලද සම්පූර්ණ අයිතම සංඛ්‍යාව 3,101 ක් වූ අතර ජාතික ඉ-කෝෂ්ඨාගාරය ඔස්සේ පූර්ණ පාඨවලට පිවිසිය හැකි විද්වත් වාරසඟරා සංඛ්‍යාව 26ක් විය. ජාතික විද්‍යා පදනම මගින් මූල්‍යාධාර සැපයූ පර්යේෂණ ප්‍රදානවලින් ඉදිරිපත් කෙරුණු පර්යේෂණ ප්‍රකාශන සමූහය පර්යේෂණ නිමැවුම මත පදනම් වූ ප්‍රකාශන ද්‍රව්‍ය 379ක් සමගින් යාවත්කාලීන කරන ලදී. ජාතික ඉ-කෝෂ්ඨාගාරයෙහි වාර්තා ගත කරන ලද අයිතම සංඛ්‍යාව 2016 දෙසැම්බර් 31 වන විට 14,244ක් විය.

***එකතුව සංවර්ධනය, ආශ්‍රේය ග්‍රන්ථ එකතුව, විශේෂ විෂය එකතුව***

විද්වත් ප්‍රජාවේ ආශ්‍රේය ග්‍රන්ථ පරිශීලන අවශ්‍යතාවය සපුරාලීමට එකතුව වෙත නව ග්‍රන්ථ නවයක් (09) එක් කරන ලදී. අප රට තුළ ප්‍රකාශනය කෙරෙන විද්වත් වාරසඟරා (නාම 20කට අධික) නව නිකුතුවල පිටපත් සහ විදේශීය වාරසඟරාවල (නාම 20කට අධික) නව නිකුතුවල පිටපත් පදනම වෙත අඛණ්ඩව ලැබුණි. දායකත්වය ලබා ගත් විදේශීය වාරසඟරා නාම සංඛ්‍යාව 8කි.




www.dl.nsf.ac.lk

***එකතුව සංවර්ධනය කිරීම: ජගත් ලිඛිතයන් වෙත ප්‍රවේශය ශක්තිමත් කිරීම***

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ, පර්යේෂණ ප්‍රජාවේ මූලික අවශ්‍යතාවයක් වූ, පහත සඳහන් දත්තපාදකවලට ප්‍රවේශවීම සඳහා ජාතික විද්‍යා පදනම් පරිශ්‍රය තුළ ඉඩප්‍රස්ථා සපයනු ලැබුණි. ලිඛිතයන් සෙවුම් කිරීම සඳහා සහ තම ප්‍රකාශනවලට උපුටා දැක්වීමේ තොරතුරු ලබා ගැනීම සඳහා ශාස්ත්‍රඥයින් සහ පර්යේෂණයන් විසින් මෙම දත්තපාදකය පරිශීලනය කරන ලදී.

- *SCOPUS* ***උපුටා දැක්වීම් සහ සාරසංග්‍රහකරණ දත්තපාදකය*** **:** ස්මාර්ට් උපාංග සහ පර්යේෂණ සොයායෑම, විශ්ලේෂණය කිරීම සහ දෘශ්‍යකරණය සිදු කරන ප්‍රකාශකයින් 5,000කට අධික සංඛ්‍යාවකින් වාරසඟරා 21,500කට වැඩි ප්‍රමාණයක් තුළ සම-සමාලෝචන ලිඛිතයන් ආවරණය කෙරෙන ලිඛිත සෙවුම් සඳහා සවිස්තරාත්මක තොරතුරු ප්‍රභවයක් ලෙස SCOPUS දත්තපාදනය හඳුන්වා දිය හැකිය.

- *TEEAL* ***(අත්‍යවශ්‍ය කෘෂිකර්ම දත්තපාදකය)*** **:** ප්‍රමුඛ පෙළේ ප්‍රකාශකයින් විසින් ප්‍රකාශනය කරනු ලබන කෘෂිකර්ම වාරසඟරා 425කට අධික සංඛ්‍යාත්වක වූ පූර්ණපාඨ ලිපි සඳහා TEEAL දත්තපාදකය ප්‍රවේශය සපයයි.

- ***කුඩා පරිගණකය*** **:** කෝර්නෙල් විශ්ව විද්‍යාලය මගින් ත්‍යාග කරනු ලැබූ, 1993-2013 දක්වා කාලය තුළ ප්‍රකාශනය කෙරුණු කෘෂිකර්මය සහ ඒ ආශ්‍රිත විද්‍යාවන් හා සම්බන්ධ ඉහළ ප්‍රමිතියකින් යුත් පර්යේෂණ වාරසඟරා 325කින් පූර්ණපාඨ සහ සෙවුම් කළ හැකි දත්තපාදක සහිත කුඩා පරිගණකයක් සේවාදයකයෙහි සාර්ථක ලෙස ස්ථාපනය කරන ලද අතර සම්පත් එකතුවට පත් කරන ලදී.

- *HINARI* ***(සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා ප්‍රවේශය) පූර්ණපාඨ වාරසඟරා දත්තපාදකය*** **:** ජෛව විද්‍යා සහ ඒ ආශ්‍රිත සමාජ විද්‍යා ක්ෂේත්‍ර තුළ ප්‍රධාන වාරසඟරා (නාම 15,000ක් සහ ඉ-ග්‍රන්ථ 47,000ක්) සඳහා ප්‍රධාන පෙළේ ප්‍රකාශකයින් සමග එක්ව HINARI, මාර්ගගත ප්‍රවේශය සපයයි.

- *AGORA* ***(කෘෂිකර්මයෙහි ජගත් මාර්ගගත පර්යේෂණ සඳහා ප්‍රවේශය)*** **:** ප්‍රධාන පෙළේ ප්‍රකාශකයින් සමග එක්ව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ස්ථාපිත කරන ලද AGORA වැඩසටහන ආහාර, කෘෂිකර්මය, පරිසර විද්‍යාව, සහ ඒ ආශ්‍රිත සමාජ විද්‍යා යන ක්ෂේත්‍රවල කැපීපෙනෙන ඩිජිටල් පුස්තකාල එකතුවකට ප්‍රවේශවීමේ හැකියාව ලබා දෙයි. එය, ප්‍රධාන වාරසඟරා 5,900ක සහ ග්‍රන්ථ 21,000ක අන්තර්ගතයක් ආවරණය කරයි.

- *ARDI* ***(පර්යේෂණ සහ සංවර්ධන තොරතුරුවලට ප්‍රවේශය) දත්තපාදකය*** **:** විද්‍යාව හා තාක්ෂණයෙහි විවිධාංගීකරණය වූ ක්ෂේත්‍රවලින්, නිදහස් හා මාර්ගගත ප්‍රවේශය ශ්‍රී ලංකාවට සපයන විදිමත් වාර සඟරාවල දත්තපාදකය ලෙස ARDI හැඳින්විය හැකිය.

- *NSLRC* ***වෙබ් අඩවිය*** **:** දේශීය හා ජාත්‍යන්තර සම්පත් ද්විත්වයටම ප්‍රයෝජනවත් සම්බන්ධතා 30ක් සමග NSLRC වෙබ් අඩවිය සංස්ථාගත කර තිබේ. රට තුළ, දායකත්වය පදනම් වූ ජාත්‍යන්තර වාරසඟරා සහ දත්තපාදකවල ඉතාමත් සීමිත වූ ප්‍රගතිය පිළිබඳව ඇති අඩුපාඩුව මගහරවා ගැනීමට විවෘත වාරසඟරා, ජාත්‍යන්තර කෝෂ්ඨාගාර සහ වෙනත් නිදහස් සම්පත් වෙත විශේෂ අවධානයක් මෙහි දී යොමු කර ඇත.

## ජාතික ඩිජිටල්කරණ වැඩසටහන

***ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය*** *(NDP)*

ආයතනික කෝෂ්ඨාගාරවල ජාතික ජාලයක් ඔස්සේ පූර්ණපාඨ වෙත පහසු සහ කඩිනම් මාර්ගගත ප්‍රවේශයක් සඳහා පහසුකම් සැපයීමට රට තුළ තිබෙන පර්යේෂණ සහ ශාස්ත්‍රීය පුස්තකාලවල ඇති දේශීය විද්‍යා හා තාක්ෂණ ලිඛිතයන් ඩිජිටල්කරණය කිරීම ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය අරමුණවේ.

මෙහි පළමු අවධිය තුළ, 2013 වසරේ දී ආයතන නවයක (09) ඩිජිටල්කරණය නිම කරන ලදී. තවත් ආයතන නවයක (ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, ගිනිකොණදිග විශ්ව විද්‍යාලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි

අධිකාරිය, සංඛ්‍යාන විද්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, භූ සමීක්ෂණ සහ පතල් කාර්යාංශය, ජාතික මූලික අධ්‍යයන ආයතනය, ජාතික විද්‍යා පදනම සහ තේ පර්යේෂණ ආයතනය) තොරතුරු එකතුව ඩිජිටල්කරණය සිදු කිරීම 2015 දෙවන අවධිය මගින් සිදු කෙරුණි. ව්‍යාපෘතියේ තෙවන අවධිය 2016 දී ආරම්භ කෙරුණු අතර එමගින්, පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- එකතුව අධීක්ෂණය කිරීම සහ ඩිජිටල්කරණය සිදු කිරීම පිණිස ප්‍රලේඛන පිළියෙල කිරීම (සලකුණු යෙදීම) පිළිබඳව පුස්තකාල කාර්යමණ්ඩලයවලට මඟ පෙන්වීම සඳහා පුස්තකාලවලට චාරිකා කිරීම.
- ටෙන්ඩර් පටිපාටිය මගින් සුදුසු සැපයුම්කරුවකු සොයා ගැනීම.
- ඩිජිටල්කරණය සඳහා ප්‍රලේඛන සූදානම් කිරීම සහ දත්ත ඇතුළත් කිරීම උදෙසා සහභාගිත්ව පුස්තකාලවලට පහසුකම් සැපයීමට උපකාරක කාර්යමණ්ඩලය (පුද්ගලයින් 05ක්) පත් කිරීම.
- ජාතික විද්‍යා පදනම සහ සහභාගිත්ව ආයතන අතර අත්සන් තැබිය යුතු ගිවිසුම සහ ජාතික විද්‍යා පදනම සහ සේවා සපයන්නා අතර අත්සන් තැබිය යුතු එකඟතා ගිවිසුම සූදානම් කිරීම.
- විශ්ව විද්‍යාලවල ආයතනික ඉ-කෝෂ්ඨාගාර සංවර්ධනය කිරීම සහ විද්‍යා හා තාක්ෂණ පුස්තකාල මගින් කාර්යක්ෂම ලෙස සම්පත් හවුලේ භාවිතය ප්‍රවර්ධනය සහ ඊට සහයෝගය දැක්වීම.

ආයතනික කෝෂ්ඨාගාර නඩත්තුව පිළිබඳව අවශ්‍ය කෙරෙන දැනුම සහ පුහුණුව සපයනු වස්, ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සහභාගි වන ආයතනවල පුස්තකාල වෘත්තිකයින්ට පහත සඳහන් සේවා සපයන ලදී.

අදාළ සේවාදායකවල ආයතනික කෝෂ්ඨාගාර ස්ථාපිත කරනු ලැබ ඇති මධ්‍යම පරිසර අධිකරියෙහි (අථත්‍ය කෝෂ්ඨාගාරයක් ලෙස ජාතික විද්‍යා පදනම් සේවාදයකයෙහි සත්කාරකත්වය සපයා ඇති) සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි සේවාදයකය තුළ ඩී-ස්පේස් මෘදුකාංගය ස්ථාපිත කරන ලදී. දත්ත ඇතුළත් කිරීම සහ තමන්ට අදාළ ආයතනික කෝෂ්ඨාගාරවලට ප්‍රලේඛන උඩුගත කිරීම පිළිබඳ ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සම්බන්ධ පුස්තකාලවල කාර්යමණඩලවලට අවශ්‍ය කෙරෙන මඟපෙන්වීම සහ උපදෙස් ලබා දෙන ලදී.

ආයතනික කෝෂ්ඨාගාරවල අන්තර්ගතයෙහි වර්ධනය සැලකිය යුතු තරම් වේ. ජාතික විද්‍යා පදනම මගින් ආයතනික කෝෂ්ඨාගාරවලට එක් කරන ලද පූර්ණපාඨ ප්‍රලේඛන සංඛ්‍යාව, 4,832ක් විය.

## ශ්‍රී ලංකා මාර්ගගත වාරසඟරා දත්තපාදකය (SLJOL) - ශ්‍රී ලාංකික විද්‍යා වාරසඟරා මාර්ගගත ප්‍රකාශනය සඳහා මාර්ගගත වේදිකාව

### ♦ ශ්‍රී ලංකා මාර්ගගත වාරසඟරා (SLJOL)

දේශීය සම්භවයක් සහිත වාරසඟරා 71ක් ප්‍රකාශනය කරමින් ජාතික විද්‍යා පදනම් SLJOL දත්තපාදකය සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ. නව වාරසඟරා 8ක් ස්ථාපිත කරන ලද අතර 2016 වර්ෂය තුළ වාරසඟරා 168ක් SLJOL හි ප්‍රකාශනය කරන ලදී. සෑම ලිපියක් සඳහාම ඩිජිටල් වස්තු හඳුනනයක් (DOI) ලියාපදිංචි කිරීම උදෙසා crossref.org වෙත ලිපි 1,305ක මෙම දත්ත සහිත කාණ්ඩ ගොනු භාර දෙන ලදී. සංස්කරණ මණ්ඩල 8ක් සහ ලේඛක මාර්ගෝපදේශ හතරක් දත්තපාදකයට එක් කෙරුණි. විද්‍යාත්මක ප්‍රකාශන සුලබතාවය සඳහා ජාත්‍යන්තර ජාලයෙහි (INASP) කළමනාකරුවන්ගේ (මාර්ගගත වාරසඟරා) සහයෝගය සහිතව වාරසඟරා 22 ක ගැටලුකාරී තත්ව 57ක් සාර්ථක ලෙස හසුරුවන ලදී.

එක්සත් රාජධානිය විසින් පවත්වාගෙන යනු ලබන සංඛ්‍යාලේඛනවලට අනුව SLJOL පර්ශීලනය ප්‍රබල ලෙස ඉහළ ගොස් තිබේ. පූර්ණපාඨ බාගත කිරීම්වල සම්පූර්ණ සංඛ්‍යාව 64,826ක් මාසික සාමාන්‍ය නැරඹීම් 18,000ක් 2016 වසර තුළ වාර්තා වී තිබුණි.

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්, වාරසඟරා කතුවරුන්, දේශීය ජනමාධ්‍ය, ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලය, සියොක්ස් කුමිං මහත්මිය (ව්‍යාපෘති කළමනාකරු, SLJOL ව්‍යාපෘතිය), බ්‍රයන් හෝල් මයා (පර්යේෂක සහ ප්‍රකාශක, උබික්විටි මුද්‍රණාලය, එක්සත් රාජධානිය), යනාදීන්ගෙන් සමන්විත වූ රැස්ව සිටි පිරිස මාධ්‍යයේ විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විසින් අලුතින් යාවත්කාලීන කරන ලද SLJOL වෙබ් අඩවිය සාර්ථක ලෙස දියත් කරන ලදී. විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශයේ සහයෝගය ඇතිව දේශීය ජනමාධ්‍ය ඔස්සේ මේ සඳහා පුළුල් මාධ්‍ය ආවරණයක් සපයන ලදී.



2016 දී වැඩමුළුවට සහභාගි වූ වාරසඟරා සංස්කාරකවරු

මෙම වේදිකාවට නව වාරසඟරාවල අන්තර්ගතය උඩුගත කිරීමේ වගකීම භාර දීමේ මූලික අරමුණ සහිතව SLJOL වාරසඟරාවල සංස්කාරකවරුන් සඳහා ජාතික විද්‍යා පදනම සහ INASP එක්ව දෙදින වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවට 55 දෙනෙක් සහභාගි වූහ. වාරසඟරා උඩුගත කිරීම හා සම්බන්ධව සංස්කාරක කණ්ඩායම් හතරකට සිදුකර පෙන්වීම් ද පවත්වන ලදී.

ශ්‍රී ලංකා වාරසඟරා මාර්ගගත දත්තපාදකයෙහි (SLJOL) ප්‍රවර්ධනාත්මක ක්‍රමෝපායයක් ලෙස, ශ්‍රී ලංකාවේ සියලු රාජ්‍ය විශ්ව විද්‍යාලවලට සහ පර්යේෂණ ආයතන 14ක සිටින පර්යේෂණ සහ ශාස්ත්‍රීය ප්‍රජාය අතර ප්‍රවර්ධනාත්මක උපකරණ බෙද දෙන ලදී.

SLJOL හි ප්‍රගතිය සමාලෝචනය කිරීමට INASP විසින් සංවිධානය කරන ලද වාරසඟරා කළමනාකරුවන්ගේ දෙවන රැස්වීම 2016 අගෝස්තු දක්වා කොළඹ දී පවත්වන ලදී. ජාතික විද්‍යා පදනම නියෝජනය කරමින් දෙදෙනෙක් ඊට සහභාගි වූහ. මෙම රැස්වීමේදී SLJOL හි වර්ධනය සහ සංවර්ධනය සඳහා නව ක්‍රමෝපාය හඳුනාගන්නා ලදී,




SLJOL පිළිබඳ වැඩමුළුව, 2016 - *www.sljol.info*

## විද්‍යාත්මක ප්‍රජාවට, උපාධි අපේක්ෂකයින්ට, ශිෂ්‍යයින්ට සහ මහජනතාවට විද්‍යාත්මක තොරතුරු සැපයීම

විද්වත් ප්‍රජාවට අවශ්‍ය කෙරෙන තොරතුරු ලබා ගැනීම සඳහා උපකාර කිරීම ජාතික විද්‍යා පදනම අඛණ්ඩව සිදු කළාය. ලිඛිතයන් සෙවුම, ප්‍රලේඛන පිටපත් සැපයීම, සහ වාරසඟරා ලිපි සඳහා ලැබුණු ඉල්ලීම් සාර්ථකව සපුරාලන ලදී.

ස්කෝපස් දත්තපාදකය සහ සාරසංග්‍රහකරණ දත්තපාදකවල තොරතුරු විද්‍යාත්මක පරිශීලනය 15,037ක් වූ අතර, ස්කෝපස් වෙතින් බාගත කරන ලද සාරසංග්‍රහ මුළු සංඛ්‍යාව, 8,617ක් විය. NSLRC මගින් පවත්වා

ගෙන යනු ලබන දත්තපාදකවලින් සිදු කරන ලද සෙවුම් සංඛ්‍යාව 203 කි. HINARI, TEEAL, AGORA, Bio-Mod Central සහ ARDI යනාදී ජාත්‍යන්තර පූර්ණපාඨ දත්තපාදකවලින් සිදු කරන ලද සම්පූර්ණ සෙවුම් සංඛ්‍යාව 295ක් වූ අතර, පරිශීලකයින්ට සපයන ලද පූර්ණපාඨ ලිපි සංඛ්‍යාව 1,196කි. NSLRC වෙත පැමිණි පරිශීලකයින් 267 දෙනෙකුට වසර තුළ සාර්ථක ලෙස උපකාර කරන ලදී. මෙයට අමතරව, දුරකථන මගින් සහ විද්‍යුත් තැපෑල මගින් සිදු කරන ලද විමසීම් 535කට ද සාර්ථක පිළිතුරු සපයන ලදී.

## වෙනත් විද්‍යා හා තාක්ෂණ ආයතනවල පුස්තකාල වෘත්තිකයින්ගේ / ශාස්ත්‍රඥයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම

වෙනත් පුස්තකාලවල තොරතුරු තාක්ෂණ (IT) පාදක සේවා සඳහා තාක්ෂණික සහයෝගය සැපයීම සහ පුස්තාකල වෘත්තිකයින් පුහුණු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම වගකිව යුතුවේ. සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ NSLRC සහ වෙනත් පුස්තකාලවල කාර්යමණ්ඩල සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සිදු කෙරුණි.

- ***තාක්ෂණික සහයෝගය***

  - JISIS නමින් හැඳින්වෙන, මෑතකදී සංවර්ධනය කරන ලද බහුවේදිකා නිදහස් විවෘත ප්‍රභව මෘදුකාංග යෙහි පරිසරයට NSLRC හි අන්තර්ගත සියලුම දත්තපාදක නියමිත ලෙස ස්ථානගත කරන ලදී. JISIS පිළිබඳ පැයක පුහුණු වැඩසටහනක් NSLRC කාර්යමණ්ඩලයට 2016 නොවැම්බර් 11-25 දක්වා පවත්වන ලදී.

  - ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සහභාගිවීම ආයතනවල පුස්තකාලවලට සහ පුස්තකාල ස්වයංක්‍රියකරණය සිදු කිරීම සඳහා මෘදුකාංගය ලෙස WINISIS භාවිත කරන පුස්තකාල සඳහා අවස්ථා 69ක දී තාක්ෂණික සහයෝගය සපයන ලදී.

- ***ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය (SLSTINET) සම්මන්ත්‍රණය***

විද්‍යාඥයින්, ශාස්ත්‍රඥයින්, පුස්තකාල සහ තොරතුරු වෘත්තිකයින් තොරතුරු ව්‍යාප්ත කිරීමේ ක්ෂේත්‍රය තුළ සිදු කරන නව සංවර්ධනයන් සමග සම මට්ටමේ තබා ගැනීමේ අරමුණ සහිතව පහත සඳහන් සම්මන්ත්‍රණය 2016 වසර තුළ සංවිධානය කරන ලදී.

  - විද්‍යාත්මක දර්ශක පිළිබඳ සම්මන්ත්‍රණය: ස්කෝපස් මගින් පර්යේෂණ ප්‍රකාශන, තනි විද්‍යාඥයින්, සහ පර්යේෂණ ආයතන ඇගයීම 2016 ඔක්තෝම්බර් 06 (ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරය). මේ සඳහා සහභාගි වූ සංඛ්‍යාව 57ක් විය.

- ***NSLRC ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන්***

  - ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පවත්වනු ලැබූ "තොරතුරු ජාල" පිළිබඳ සම්මන්ත්‍රණයෙහි NSLRC කාර්යමණ්ඩල සාමාජිකයකු විසින් SLISTINET පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

  - කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් 58 දෙනෙකු සඳහා "NSLRC හි ක්‍රියාකාරකම් සහ සේවා" සම්බන්ධව දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වන ලදී.

  - NSLRC ක්‍රියාකාරකම් සහ සේවා පිළිබඳව කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු සඳහා අභ්‍යන්තර පුහුණුවක් ලබා දෙන ලදී.

  - හොරයිසන් විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් අට දෙනෙකුට "NSLRC හි පවත්වාගෙන යනු ලබන දත්තපාදක" පිළබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

## ජාතික විද්‍යා පදනම් වාරසඟරාව (JNSF) ප්‍රකාශනය කිරීම

ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම් වාරසඟරාව, විද්‍යාව හා තාක්ෂණයට අදාළ සියලුම අංශවල පර්යේෂණ ප්‍රතිඵල, 1973 වසරේ සිට ප්‍රකාශනය කරමින් සිටී. වසරේ මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවල වාරසඟරාවේ නිකුතු හතරක් ප්‍රකාශනය කෙරේ. වාරසඟරාවේ අන්තර්ගතය සහ - සමාලෝචනයකට ලක් කෙරෙන අතර, තොම්සන් රොයිටර්ස් විද්‍යා පුළුල් කරන ලද උපුටා දැක්වීමේ දර්ශකය, රසායන විද්‍යා සහ ජීව විද්‍යා සාරසංග්‍රහ, BIOSI Previews, සත්ව විද්‍යාත්මක වාර්තා, SCOPUS, TEEAL, උල්රිච් සහ ඇග්‍රිකෝලා යනාදියෙහි සුචිගත කරනු ලැබ තිබේ. මෙම වාරසඟරාව, මුද්‍රිත සහ මාර්ගගත යන දෙආකාරයටම ප්‍රකාශනය කෙරේ. ජාතික විද්‍යා පදනම් වාරසඟරාවේ 44 වන වෙළුමේ නිකුතු 4ම (නිකුතු 1,2,3 සහ 4) නිසි කලට 2016 වසර තුළ ප්‍රකාශනය කෙරුණි. මෙම වාරසඟරාව සඳහා දේශීය මෙන්ම විදේශීයව ද පුළුල් සංසරණයක් පවතින අතර වාරසඟරාවේ පූර්ණපාඨවලට ප්‍රවේශ වීම ශ්‍රී ලංකා වාරසඟරා මාර්ගගතය ඔස්සේ සිදු කළ හැකි අතර, එහි වෙබ් අඩවිය http://jnsfsl.sljol.info/ වේ. මේ සඳහා අය කිරීමක් සිදු නොකෙරේ.




## ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාව (SLJSS) ප්‍රකාශනය කිරීම

ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාව SLJSS, ජූනි සහ දෙසැම්බර් ලෙස වසරකට දෙවරක් ප්‍රකාශනය කෙරේ. ශ්‍රී ලංකාව සහ වෙනත් දකුණු ආසියාතික රටවල් පිළිබඳව අවධානය යොමු කරමින්, සමාජ විද්‍යාවේ සම්පූර්ණ පරාසයම ආවරණය කරමින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලිපි පළ කරයි.

සියලුම ලිපි පූර්ව සමාලෝචනයකට ලක් කෙරේ. වාරසඟරා ලිපිවල පූර්ණපාඨවලට ශ්‍රී ලංකා වාරසඟරා මාර්ගගතය (SLJOL) ඔස්සේ ප්‍රවේශ විය හැකිය. වෙබ් අඩවිය http://www.sljol.info/index.php/SLJSS වේ. මෙම වාරසඟරා ප්‍රකාශනයෙහි 2016 වසර තුළ තත්වය පහත සඳහන් වේ.

- 38 වෙළුම, අංක 2 (2015, දෙසැම්බර්) - ප්‍රකාශනය කර ඇත.
- 38 වෙළුම, අංක 1 (2016, ජූනි) - ප්‍රකාශනය කර ඇත.
- 38 වෙළුම, අංක 2 (2016, දෙසැම්බර්) - 2017 ජනවාරි මාසයේදී ප්‍රකාශනය කෙරෙනු ඇත.






# පාසල් ළමුන් සහ මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම

පවරන ලද කාර්යය ෘ

වැඩසටහන්වලට මූලපාධාර සැපයීම මගින් ජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම



## විද්‍යාව හා තාක්ෂණය මහජනතාව වෙත ගෙන යෑම සඳහා වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කිරීම සහ ජනමාධ්‍ය (මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික) භාවිත කිරීම

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ ජාතික විද්‍යා පදනම "සැමට විද්‍යාව" යන තේමාව යටතේ පාසල් ප්‍රජාවට සහ මහජනතාවට වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කළාය. "මිහිමඬල II අවධිය" ලෙස වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කිරීම අඛණ්ඩව සිදු කෙරුණි. මෙම වැඩසටහනේ "I අවධිය" 2011 වසරේදී ජාතික සහ ජාත්‍යන්තර සම්මානවලින් පිදුන් ලද අතර එමගින් ජාතික විද්‍යා පදනමට ගෞරවයක් ගෙන දුනි.

### *"මිහිමඬලම වීඩියෝ වැඩසටහන් සහ රූපවාහිනී නාළිකා ඔස්සේ ප්‍රචාරය කිරීම - II අවධිය*

"මිහිමඬල" ජාතික විද්‍යා පදනම් විද්‍යා සඟරාව යනු, ජාතික නාළිකා ඔස්සේ ප්‍රචාරය වීමට නියමිත, විද්‍යාව හා තාක්ෂණයට අදාළ, වර්තමානයට වැදගත් මාතෘකා පිළිබඳ ඩොකියු ඩ්‍රාමා ආකෘතිය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලැබූ වීඩියෝ වැඩසටහන් මාලාවකි. විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ මහජනතාව අතර දැනුවත් භාවයක් ඇති කිරීමට සහ ජීවන කුසලතා ගොඩනැගීමේ දී ජීවන මට්ටම උසස් කිරීමේදී සහ සමාජ-ආර්ථික සංවර්ධනයේදී ප්‍රායෝගිකව යොදාගැනීම මෙම වැඩසටහනෙහි අරමුණ විය.




"මිහිමඬල" වැඩසටහනෙහි I අවධිය යටතේ මහජනතාවට වැදගත් වන විද්‍යාත්මක ගැටලු පිළිබඳ වීඩියෝ වැඩසටහන් 12ක් භාෂා ත්‍රිත්වයෙන්ම 2016/17 කාලය තුළ නිෂ්පාදනය කළ අතර එම වැඩසටහන් ජාතික රූපවාහිනී නාළිකා ඔස්සේ ප්‍රචාරය කරන ලදී. Iවන අවධියෙහි දිගුවක් ලෙස තවත් විද්‍යා වීඩියෝ වැඩසටහන් 15ක් (විනාඩි 20-25ක් දිග, ඩොකියුට් ඩ්‍රාමා ආකෘතියට) භාෂා ත්‍රිත්වයෙන්ම නිෂ්පාදනය කිරීමට "මිහිමඬල" II වන අවධිය යටතේ සැලසුම් කරන ලදී.

දෙවන අවධිය යටතේ පහත සඳහන් මාතෘකා ඔස්සේ වීඩියෝ වැඩසටහන් සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම නිෂ්පාදනය කරන ලදී.

- භූගත ජලය (මහාචාර්ය පද්මලාල් මානගේ)
- තාරකා විද්‍යාවේ විකාශය (ජෝ ප්‍රනාන්දු මයා)

- නූතන විද්‍යාවේ බලය (ආචාර්ය ජයන්ත වත්තවිදනගේ)
- දියවැඩියාව (වෛද්‍ය ප්‍රසාද් කටුලන්ද)
- ආතතිය (වෛද්‍ය නීල් ප්‍රනාන්දු)
- කෝපය පාලනය කිරීම (වෛද්‍ය නීල් ප්‍රනාන්දු)

මිහිමඬල II වන අවධිය යටතේ 2015 වර්ෂය තුළ වැඩසටහන් නමයක (09) (ජීවන රටාව සහ සෞඛ්‍යය - වෛද්‍ය ප්‍රසාද් කටුලන්ද, රොබෝ විද්‍යාව සහ එහි අනාගතය - මහාචාර්ය රොහාන් මුණසිංහ, ජෛවානුකරණය - ආචාර්ය කුමාරි තිලකරත්න, දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම - මහාචාර්ය ඩබ්. එල්. සුමතිපාල, මුඛ සෞඛ්‍ය - වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර, නුවණැති ඖෂධ භාවිතය - වෛද්‍ය චමරි ලෝචනා වීරරත්න, ගෘහස්ත බලශක්ති පරිභෝජනය - ආචාර්ය ඒ.පී.ටී. සුගතපාල, ප්‍රවේණිගත රෝග - මහාචාර්ය වජිර දිසානායක, සහ පුනර්ජනනීය බලශක්තිය - අසෝක අබේගුණවර්ධන මයා) නිෂ්පාදන කටයුත නිම කරනු ලැබුණි. සුදුසු රූපවාහිනී නාළිකාවක් තෝරා ගැනීම පිළිබඳ කටයුතු 2016 අගභාගය වන විට සිදු කෙරෙමින් පැවතුණි.

## ප්‍රකාශන ඔස්සේ විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීම: විදුරාව, විද්‍යා ග්‍රන්ථ සහ ග්‍රන්ථික

### *විදුරාව විද්‍යා සඟරාව*

විදුරාව විද්‍යා සඟරාව යනු ජාතික විද්‍යා පදනමෙහි විද්‍යා සඟරාව වේ. එය ආරම්භ කෙරුණු 1976 වර්ෂයේ සිට විද්‍යා බුලටිනය ලෙස ප්‍රකාශනය කෙරුණු අතර, ප්‍රකාශන ක්ෂේත්‍රය තුළ පැරණිතම විද්‍යා සඟරා අතරින් එකක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. වර්තමානයේ භාෂා මාධ්‍ය තුනෙන්ම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි), ජනවාරි, ජූනි සහ නොවැම්බර් (විශේෂ නිකුතුව) ලෙස විශේෂිත වූ තේමා යටතේ නිකුතු තුනක් ප්‍රකාහනය කෙරේ.




මෙම සියලුම නිකුතු, ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි පාසල්, විද්‍යා මධ්‍යස්ථාන, විශ්ව විද්‍යාලයීය විද්‍යා පුස්තකාල, පළාත් විද්‍යා සම්බන්ධිකාරකවරුන්, සහ කලාප විද්‍යා අධ්‍යක්ෂකවරුන් අතර නොමිලයේ බෙදා දෙනු ලැබේ. ජගත් විදු දිනය පාසල් වැඩසටහනට සහභාගි වන්නන් අතර විශේෂ නිකුතුව නොමිලයේ බෙදා හැරීම සිදු කෙරේ.

2016 වසර තුළ පහත සඳහන් නිකුතු ප්‍රකාශනය කරන ලදී.

- 2016 ජනවාරි නිකුතුව, 33 කලාපය, අංක 01
  තේමාව: අන්තර්ජාලිතාංග (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි සංස්කරණ)
- 2016 ජූනි නිකුතුව, 33 කලාපය, අංක 02
  තේමාව: ආලේපන සහ සුවඳ විලවුන් (සිංහල සහ ඉංග්‍රීසි සංස්කරණ)
- 2016 නොවැම්බර් නිකුතුව, 33 කලාපය, විශේෂ නිකුතුව (සිංහල සහ දෙමළ සංස්කරණ)
  ඉංග්‍රීසි සංස්කරණය 2017 ජනවාරි මාසයේදී මුද්‍රණය කෙරෙනු ඇත.
  තේමාව: සුවපත් දිවියක් සඳහා විද්‍යාව

## ජාතික විද්‍යා පදනමෙහි වැඩ කටයුතු සඳහා ප්‍රචාරය ලබාදීම

### *"විද්‍යා" ප්‍රවෘත්ති පත්‍රිකාව*

"විද්‍යා" ප්‍රවෘත්ති පත්‍රිකාව, ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන වැනි විවිධ කටයුතු පිළිබඳව තොරතුරු වාර්තා කරයි. එනිසා, ජාතික විද්‍යා පදනම මගින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ ප්‍රදාන හා චාරිකා ප්‍රදාන පිළිබඳ තොරතුරුද සපයයි. මෙම ප්‍රවෘත්ති පත්‍රිකාව, ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් නිකුතු ලෙස ප්‍රකාශනය කෙරෙන කාර්තුමය ප්‍රකාශනයකි.

සමාලෝචනය කෙරෙන වසර තුළ 2015 ඔක්තෝම්බර්, 2016 ජනවාරි සහ අප්‍රේල් නිකුතු ප්‍රකාශනය කරන ලද අතර ජාතික විද්‍යා පදනමේ කමිටු සාමාජිකයින්, පර්යේෂණ සහ සංවර්ධන ආයතන, සහ විශ්ව විද්‍යාලයීය පුස්තකාල අතර බෙදා හරින ලදී.

## ජාතික ප්‍රකාශන ඔස්සේ විද්‍යාව සහ තාක්ෂණය ප්‍රචලිත කිරීම - විද්‍යා ග්‍රන්ථක

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ පාඨක සමූහය ඉහළ නැංවීමටත්, පාසල් දරුවන් සහ මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීමටත් විද්‍යා ග්‍රන්ථ සහ ග්‍රන්ථක ප්‍රකාශනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී,

විද්‍යාත්මක ග්‍රන්ථක යනු පාසල් ළමුන්ට පහසුවෙන් වැටහෙන පරිදි දේශීය භාෂාවන්ගෙන් (සිංහල සහ දෙමළ) විද්‍යාත්මක සංකල්ප සරල ලෙස පැහැදිලි කරමින් මුද්‍රණය කෙරෙන ප්‍රකාශන වේ. මේ යටතේ ප්‍රකාශනය කෙරෙන ග්‍රන්ථක, අඩු පහසුකම් සහිත පාසල්වලට බෙදා හැරීම සිදු කෙරේ.

"බාහිර සහ ගෘහස්ථ වාතයේ ගුණාත්මක බව" (මහාචාර්ය රංජිත් මහානාම) සහ ආක්‍රමණශීලී ශාක (ආචාර්ය සුධීරා රංවල) යන ග්‍රන්ථකවලින් පිටපත් 5000 බැගින් 2016 වසර තුළ මුද්‍රණය කරන ලදී.

"න්‍යෂ්ටික තාක්ෂණය සහ විදුලිබලය" නමැති ග්‍රන්ථකයේ මුද්‍රණය කිරීමට නියමිතව තිබූ පිටපත් 2500ක් ද 2016 වසර තුළ දී මුද්‍රණය කරන ලදී. පළමු සහ අවසාන ග්‍රන්ථක ද්විත්වය පාඨශාලීය විද්‍යා සමාජවලට සහ අඩු පහසුකම් සහිත පාසල්වලට බෙදා හරින ලදී.









## විද්‍යා ග්‍රන්ථ - විද්‍යා හා තාක්ෂණ ප්‍රකාශන ප්‍රවර්ධනය සඳහා ප්‍රදාන යෝජනා ක්‍රමය

විද්‍යා හා තාක්ෂණ ප්‍රකාශන ප්‍රවර්ධනය සඳහා ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශනය කිරීම සිදු කෙරේ. ග්‍රන්ථ මුද්‍රණය සඳහා මූල්‍යමය ආධාර ලබා දීමෙන් වර්තමානයට ගැළපෙන මාතෘකා යටතේ විද්‍යාත්මක ග්‍රන්ථ රචනා කිරීම සඳහා මෙමගින් ලේඛකයින් උනන්දු කෙරේ. සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා කතුවරුන්ගෙන් අයදුම්පත් නොලැබුණි.

## විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා පාසල් ප්‍රජාව සමග ජාතික වේදිකාවක් ස්ථාපිත කිරීම: පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන

විද්‍යාත්මක සාක්ෂරතාවය සහ නූතන විද්‍යාව පිළිබඳ දැනුම වැඩි දියුණු කරගැනීමේ සහ දෛනික වැඩකටයුතුවලදී විද්‍යාත්මක දැනුම යොදගැනීමේ විද්‍යාත්මක සංස්කෘතියක් බිහිකිරීමට පාසල් දරුවන්ට උපකාර කිරීමේ අරමුණු සහිතව ජාතික විද්‍යා පදනම 2005 වර්ෂයේදී පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන ස්ථාපිත කිරීම සිදුවිය.

දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින්, 2016 දෙසැම්බර් 31 වන විට පාසල් 814ක් ජාතික විද්‍යා පදනම් පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන යටතේ ලියාපදිංචි කරනු ලැබ තිබුණි. මෙම වැඩසටහනේ අරමුණ කරා ළඟා වීමට ජාතික විද්‍යා පදනම පහත සඳහන් පරිදි විද්‍යා සමාජවලට උපකාර කළාය.

- **ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජ වෙත ජාතික විද්‍යා පදනම් ප්‍රකාශන නොමිලයේ බෙදා හැරීම**

විදුරාව විද්‍යා සඟරාව සහ විද්‍යා ග්‍රන්ථක ඇතුළත් ජාතික විද්‍යා පදනම් ප්‍රකාශන අයකිරීමකින් තොරව පාඨශාලීය විද්‍යා සමාජවලට බෙදාහැරීම සිදු කෙරුණි.

සෑම විද්‍යා සමාජයකටම දේශීය භාෂා සංස්කරණයෙන් පිටපත් දෙක බැගින් ද ඉංග්‍රීසි භාෂා සංස්කරණයෙන් එක් පිටපත බැගින් ද විදුරාව සඟරාව වසරකට තෙවරක් පාඨශාලීය විද්‍යා සමාජ වෙතට බෙද හරින ලදී.

- **පාඨශාලීය විද්‍යා සමාජ මගින් සංවිධානය කරනු ලබන විද්‍යා දින වැඩසටහන් සඳහා සම්පත්දායකයින්ගේ සේවය ලබා දීම**

පාඨශාලීය විද්‍යා සමාජ මගින් සිදු කරනු ලැබූ ඉල්ලීම් මත පදනම් වෙමින්, ඒවා මගින් සංවිධානය කෙරුණු විද්‍යා දින වැඩසටහන්වල ආරම්භක දේශනය පැවැත්වීම සඳහා සම්පත් දායකයින්/ දේශීය විද්‍යාඥයින්ගේ සේවය පහත දැක්වෙන පරිදි 2016 වසර තුළ දී ජාතික විද්‍යා පදනම මගින් නොමිලයේ සපයනු ලැබුණි.

| පාසල | දිනය | සම්පත්දායකයාගේ නම සහ ආයතනය |
|---|---|---|
| 1. යසෝදරා දේවී බාලිකා විදුහල, ගම්පහ | 2016.02.19 | ආචාර්ය ජයන්ත වත්තවිදනගේ,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය |
| 2. ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය, පැල්මඩුල්ල | 2016.04.06 | ආචාර්ය ප්‍රදීපිකා සපුතන්ත්‍රී,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>කොළඹ විශ්ව විද්‍යාලය |
| 3. ශාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය, කැලණිය | 2016.05.13 | ආචාර්ය ප්‍රියන්ත ඈපා,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>කැලණිය විශ්ව විද්‍යාලය |
| 4. තෝලන්ගමුව මධ්‍ය මහා විද්‍යාලය, තෝලන්ගමුව | 2016.06.06 | මහාචාර්ය හිරාන් අමරසේකර,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 5. කරන්දෙනිය මධ්‍ය විද්‍යාලය, කරන්දෙනිය | 2016.07.08 | මහාචාර්ය චන්දන ජයරත්න,<br>භෞතික විද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,<br>කොළඹ විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| 6. ගුරුකුළ විද්‍යාලය, කැලණිය | 2016.10.20 | ආචාර්ය ජයන්ත වත්තවිදනගේ,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය |
| 7. ලක්දාස් ද මෙල් විද්‍යාලය, කුරුණෑගල | 2016.10.27 | මහාචාර්ය උපාලි චන්ද්‍රසේකර,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>කැලණිය විශ්ව විද්‍යාලය |

***අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟය (ISCSC)***

තරඟවලට සහභාගිවීමට සහ එමගින් තම විද්‍යාත්මක දැනුම වැඩි දියුණු කර ගැනීමට පාසල් දරුවන් උනන්දු කරවීම උදෙසා 2006 වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනම වාර්ෂිකව අන්තර් පාඨශාලීය තරඟය සංවිධානය කරයි. මෙම තරඟය, ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරනු ලබන ජගත් විදු දිනය පාසල් වැඩසටහන ඉලක්ක කරගෙන සංවිධානය කරනු ලබයි. කෙටි විද්‍යා නාට්‍ය, විරිදු, භූමිකා රංගන, හස්තමය පෝස්ටර්, හා ඩිජිටල් කතාන්දරකරණය යනාදි තරඟ අංශවලින් සමන්විත මෙම තරඟයේ ජයග්‍රහණයන් ජගත් විදු දිනය පාසල් වැඩසටහනේදී ඇගයීමට ලක් කෙරේ.

අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟය - 2016 එම වසරේ සැප්තැම්බර් සිට ඔක්තෝම්බර් දක්වා සංවිධානය කෙරුණි.

හස්තමය පෝස්ටර් තරඟයට නිර්මාණ 200ක් පමණ ලැබුණු අතර ඩිජිටල් කතාන්දරකරණ තරඟය සඳහා නිර්මාණ 22ක් ලැබුණි.

කෙටි විද්‍යා නාට්‍ය, විරිදු සහ භූමිකා රංගන තරඟ පැවැත්වීම වට දෙකකින් යුක්ත විය. පළමු වටය, මහනුවරදී සහ කොළඹ දී සංවිධානය කෙරුණි. ඒ සඳහා 400ක පමණ සහභාගිත්වයක් වාර්තා විය.

අවසන් තරඟවටය, පළමුවටයේ තරඟවල ජයග්‍රාහකයින් 241ක් දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2016.10.12 දින, කොළඹ 10, ශ්‍රී ලංකා මහා බෝධි ශාලාවේදී පවත්වන ලදී. මෙම සියලු තරඟ, ජාතික විද්‍යා පදනම් කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලද විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය කෙරුණි. මෙම තරඟයේ සියලුම ජයග්‍රාහකයින් 2016 ජගත් විදු දිනය පාසල් වැඩසටහනේ දී ඇගයීමට ලක් කෙරුණි.





***ජගත් විදු දිනය - පාසල් වැඩසටහන***

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය (UNESCO), නොවැම්බර් 10 දිනය සාමය සහ සංවර්ධනය සඳහා වූ ජගත් විදු දිනය ලෙස 2001 වර්ෂයේදී ප්‍රකාශයට පත් කළාය. අනතුරුව, 2002 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව ජගත් විදු දිනය සැමරීම ආරම්භ කරන ලද අතර, ජගත් විදු දිනය සැමරීමේ කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස ජාතික විද්‍යා පදනම තෝරා ගන්නා ලදී.

මෙම වැඩසටහන 2014 වර්ෂයේ සිට පාසල් ළමුන්ට විවෘත කරන ලද අතර, "ජගත් විදු දිනය - පාසල් වැඩසටහන" ලෙස එය නම් කරනු ලැබීය. විවිධ තේමා යටතේ, සෑම වසරකම නොවැම්බර් මාසයේදී මෙම වැඩසටහන සංවිධානය කරනු ලබයි.

“සුවපත් දිවියක් උදෙසා විද්‍යාව” යන තේමාව යටතේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2016.11.10 දින ජගත් විදු දිනය පාසල් වැඩසටහන - 2016 සංවිධානය කෙරුණි. ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වී තිබෙන පාඨශාලීය විද්‍යා සමාජවල පාසල් දරුවන්ට සහ ගුරුවරුන්ට, විද්‍යාඥයින්ට, ශාස්ත්‍රඥයින්ට, සහ ජනමාධ්‍යකරුවන්ට මෙම වැඩසටහන සඳහා ආරාධනා කරන ලදුව, 1400ක පමණ සංඛ්‍යාවක් ඒ සඳහා සහභාගි විය. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යතුමා ප්‍රධාන ආරාධිතයා වශයෙන් ද විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ගරු රාජ්‍ය අමාත්‍යතුමා විශේෂ ආරාධිතයා වශයෙන් ද මෙයට සහභාගි වූ අතර ජනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මහාචාර්ය නාරද වර්ණසූරිය මැතිතුමා ප්‍රධාන දේශනය පැවැත්වීය.

ජගත් විදු දිනය පාසල් වැඩසටහනේ දී පහත සඳහන් තරඟවල ජයග්‍රාහකයින් අභිනන්දනයට ලක් කෙරුණි.

- අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟය
- විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා ගුරුවරුන්ට පිදෙන ජාතික විද්‍යා පදනම් සම්මානය
- විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා පිරිනැමෙන මහාචාර්ය එම්.ටී.එම්.ජීෆ්රි සම්මානය
- තරු සම්මාන (ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වී තිබෙන පාඨශාලීය විද්‍යා සමාජ අතරින් විශිෂ්ටතම කාර්යසාධනය පෙන්වන ලද විද්‍යා සමාජ සඳහා)
- විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය (SRPC) සහ ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය
- Award winners of the Intel International Science and Engineering Fair
- ජාතික විද්‍යා පදනමේ විශ්ව විද්‍යාලයීය විද්‍යා සමාජ වැඩසටහන යටතේ ලියාපදිංචි උපාධි අපේක්ෂකයින් සඳහා වූ ඩිජිටල් කතාන්දරකරණය තරඟය

### *විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය (SRPC)*

අප රටේ පාසල් දරුවන් අතර නවෝත්පාදන චින්තනය, නිර්මාණාත්මක භාවය, සහ ගවේෂණාත්මක හැකියාව ඉහළ නැංවීමේ අරමුණ සහිතව 2008 වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනම, විද්‍යා පර්යේෂණ තරඟය සංවිධානය කරයි.

ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වී සිටින පාසල් මෙම තරඟයට සහභාගි වීම සඳහා හිමිකම් ලබයි. විද්‍යා පදර්යේෂණ ව්‍යාපෘති තරඟයට සහභාගි වීම සඳහා සුදුසුකම් ලබන්නේ 9-12 ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන පාසල් ළමුන් සඳහා පමණි.

තරඟය ආරම්භ කිරීමට ප්‍රථම, ඒ පිළිබඳව හඳුන්වාදීමේ වැඩමුළු සංවිධානය කරනු ලබයි. විද්‍යා ව්‍යාපෘති සඳහා විද්‍යාත්මක ක්‍රමය යොදා ගන්නා ආකාරය පිළිබඳව සහභාගිවන්නන් අතර දැනුම හා පළපුරුද්ද ඇති කිරීම මෙම හඳුන්වා දීමේ වැඩමුළුවලදී සිදු කෙරේ. තරඟය ආරම්භ කිරීමෙන් අනතුරුව, ප්‍රගති සමාලෝචන වැඩමුළු දෙකක් සංවිධානය කෙරෙන අතර, එහිදී විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනයට ලක් කෙරෙන අතර එම ව්‍යාපෘතිවල තිබෙන අඩුපාඩු මඟහරවා ඒවා වැඩි දියුණු කිරීමට උපදෙස් ලබා දෙනු ලැබේ.





වර්ෂ 2016 දී ජාතික විද්‍යා පදනම මේ යටතේ හඳුන්වාදීමේ වැඩමුළු හතරක්, කොළඹ, මහනුවර, මාතර සහ මඩකලපුව යන ස්ථානවලදී සංවිධානය කළාය.

හඳුන්වාදීමේ වැඩමුළුවලින් අනතුරුව තරඟය සඳහා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සිදු කළ යුතුවේ. ජාතික විද්‍යා පදනම මගින් තෝරාපත් කර ගන්නා ලද විද්වත් මණ්ඩලයක් මගින් 2016 වසරේ තරඟය සඳහා ව්‍යාපෘති 55ක් තෝරා ගැනුණි. සෑම ව්‍යාපෘතියක් සඳහාම ශාස්ත්‍රීය අධීක්ෂකයකු එක් කරනු ලැබුණි. මෙම පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය කොළඹ දී සහ මඩකලපුවේදී පවත්වනු ලැබූ අතර ප්‍රගති සමාලෝචන වැඩමුළු දෙකකදී ඒවා ඇගයීමට ලක් කිරීම සිදු කෙරුණි.

### *ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය (SLSEF)*

අප රටේ පාසල් දරුවන් අතර නවෝත්පාදන චින්තනය, නිර්මාණාත්මක භාවය, සහ ගවේෂණාත්මක හැකියාව ඉහළ නැංවීමේ අරමුණ සහිතව, අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සහ ඉන්ටෙල් සමාගම සමග එක්ව ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය සංවිධානය කරයි.

මෙම තරඟය 2008 වර්ෂයේ සිට පවත්වන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ අවස්ථාව ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයේ ජයග්‍රාහකයින්ට හිමිවේ.

ජාතික විද්‍යා පදනම මගින් 2015 දී සංවිධානය කරන ලද විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟයේ ජයග්‍රාහකයින් (විද්‍යා ව්‍යාපෘති 10ක්) සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය 2015 දී සංවිධානය කරන ලද වසරේ කනිෂ්ඨ නිර්මාණකරු තරඟයේ ජයග්‍රාහකයින් (නවෝත්පාද 10ක්) 2016 ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයේදී තරඟ වැදුනි.

ඇමරිකා එක්සත් ජනපදයේ, ඇරිසෝනා ප්‍රාන්තයේ, ෆීනික්ස් හි 2016 මැයි 08-13 දක්වා පවත්වන ලද ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා 2010 ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයේ ජයග්‍රහකයින් ලෙස පහත සඳහන් සිසුන් තෝරාපත් කර ගැනුණි.

- අභිෂේක් ස්ටෙනුස් ගෝමස්, බෙල්වෝ ජාත්‍යන්තර පාසල, කොළඹ 04
- ටී.ඩී.ඔවිඳු ජයසංඛ, රාජසිංහ මධ්‍ය විද්‍යාලය, හංවැල්ල
- පී.එම්. ලෝචන පියුමන්ත ප්‍රනාන්දු, සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, මාදම්පේ

විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟ ඉතිහාසයේ ප්‍රථම වරට, මාදම්පේ, සේනානායක මධ්‍ය මහා විද්‍යාලයේ, පී.එම්. ලෝචන පියුමන්ත ප්‍රනාන්දු, ඔහුගේ විද්‍යා ව්‍යාපෘතිය "ගර්භාෂයික ශ්ලේෂමල පටක පිළිකා සෛල (AN3CA) මත එලැගික් අම්ලයෙන් කාර්යබද්ධ කරන ලද අයන් ඔක්සයිඩ් නැනෝ අංශුවල ප්‍රතිගුණන සහ සෛල නාශක බලපෑම්" සඳහා කටාර් පදනමෙන් පිරිනමන ලද එක්සත් ජනපද ඩොලර් 1,000ක් වටිනා විශේෂ ත්‍යාගයක් ජයග්‍රහණය කිරීමට සමත් විය.









## විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා විශ්ව විද්‍යාලයීය ප්‍රජාව සමග ජාතික වේදිකාවක් ස්ථාපිත කිරීම: විශ්ව විද්‍යාලයීය විද්‍යා සමාජ වැඩසටහන

ජාතික කටයුතු අරබයා තම දැනුම සහ නිපුණතා සංවර්ධනය කර ගැනීමට, විද්‍යාත්මක සන්නිවේදනය හා ලේඛන කුසලතා වැඩි දියුණු කර ගැනීමට විද්‍යා උපාධිධාරීන්ට සුදුසු වේදිකාවක් නිර්මාණය කිරීමට සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සුබසාධනය සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීමට විද්‍යා උපාධිදරයින්ගේ දැනුම යොදාගැනීම පිණිස විශ්ව විද්‍යාලයීය විද්‍යා සමාජ වැඩසටහන 2014 වර්ෂයේදී ජාතික විද්‍යා පදනමෙහි ස්ථාපිත කිරීම සිදුවිය. විවිධ විශ්ව විද්‍යාලවල විද්‍යා සමාජ මෙහිදී ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි කරන ලදී. විශ්ව විද්‍යාල 11ක් නියෝජනය කරමින්, 2016 දෙසැම්බර් 31 වන විට විද්‍යා සමාජ 47ක් ජාතික විද්‍යා පනමෙහි ලියාපදිංචි වී තිබුණි.



විශ්ව විද්‍යාල පහකින් (05) උපාධි අපේක්ෂකයින් 40 දෙනෙකු සඳහා 2016 අගෝස්තු 24 දින ඩිජිටල් කතාන්දරකරණ වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවෙන් අනතුරුව උපාධි අපේක්ෂකයන් සඳහා ඩිජිටල් කතාන්දරකරණය තරඟයක් සංවිධානය කෙරුණි. මෙම තරඟයේ ජයග්‍රාහකයන් 2016 ජගත් විදු දිනය පාසල් වැඩසටහනේදී අභිනන්දනයට ලක් කෙරුණි.

## පාසල් හා විශ්ව විද්‍යාල මගින් සංවිධානය කරනු ලබන විද්‍යා හා අධ්‍යාපන සහ ප්‍රචලිතකරණ වැඩසටහන් සඳහා ආධාර කිරීමේ මූල්‍ය ප්‍රින යෝජනා ක්‍රමය

පාසල් සහ විශ්ව විද්‍යාල මගින් සංවිධානය කරනු ලබන විද්‍යා හා අධ්‍යාපන සහ ප්‍රචලිතකරණ වැඩසටහන් සඳහා මූල්‍යමය සහයෝගය ලබා දීම පිණිස ජාතික විද්‍යා පදනම මූල්‍ය ප්‍රදාන යෝජනා ක්‍රමයක් ස්ථාපිත කළාය. ග්‍රාමීය ප්‍රදේශවල පාසල් අධ්‍යාපනයේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් කරන ලද්දක් වූ ඔවුන්ගේ වාර්ෂික "සහස් ප්‍රජා ව්‍යාපෘතිය" සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ "රසායන විද්‍යා සමාජයට" රු. 125,000/- ප්‍රදානය කරන ලදී. මෙම වැඩසටහන 2016 ඔක්තෝම්බර් 08-09 දෙදින තුළ මිහින්තලේ මහ විදුහලේ දී පවත්වා තිබුණි.

## විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන (OSEP) යටතේ මූල්‍ය ප්‍රදාන

විදේශීය රටවල පැවැත්වෙන විද්‍යා අධ්‍යාපන හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන්වලට පාසල් ළමුන්ට, ගුරුවරුන්ට සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට මූල්‍යමය සහයෝගය සැපයීමට "විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන (OSEP)" නම් වූ ප්‍රදාන යෝජනා ක්‍රමයක් ජාතික විද්‍යා පදනම 2016 වර්ෂයේදී ස්ථාපිත කළාය. නූතන ලෝකයේ අභියෝගවලට මුහුණු දීමට විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ නව දැනුම ඉහළ නංවා ගැනීමට සහ වැඩි දියුණු කර ගැනීමට ශ්‍රී ලාංකීය පාසල් දරුවන්, ගුරුවරුන් (විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත: STEM) සහ විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින්ට නූතන විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවණතා පිළිබඳව ජාත්‍යන්තර අත්දැකීමක් ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ විය.

මේ යටතේ අයදුම් කිරීමට ඉඩප්‍රස්තා ලැබෙන්නේ ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වූ පාසල් සහ විශ්ව විද්‍යාලයීය විද්‍යා සමාජවලට පමණි. විද්‍යාව ප්‍රචලිත කිරීම සහ විද්‍යා අධ්‍යාපනයට අදාළ ජාත්‍යන්තරව සංවිධානය කෙරෙන තරඟ (ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය - ISEF, ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරඟ), සම්මන්ත්‍රණ, සම්මේලන සහ පුහුණු වැඩසටහන් සඳහා පාසල් සිසුන්, ගුරුවරුන් සහ විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂක්යින් හට පහසුකම් සැපයීමට සහ මූල්‍යාධාර සැපයීම මෙහිදී සිදු කෙරන අතර මෙම වැඩසටහන්වලට සහභාගිවීමෙන් ලබා ගන්නා දැනුම ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණයේ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා දායක කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම මූල්‍ය සම්පාදන යෝජනා ක්‍රමය යටතේ, 2016 වසර තුළ පහත සඳහන් ආයෝජනවලට මූල්‍යාධාර ලබා දෙන ලදී.

- ❖ ජෛව විද්‍යා ආයතනය - ජාත්‍යන්තර ජෛව විද්‍යා ඔලිම්පියාඩ් 2016
- ❖ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල - ජාත්‍යන්තර තොරතුරු විද්‍යා ඔලිම්පියාඩ් 2016
- ❖ භෞතික විද්‍යා ආයතනය - ජාත්‍යන්තර තාරකා විද්‍යා සහ තාරකා භෞතික විද්‍යා ඔලිම්පියාඩ් 2016

ජාත්‍යන්තර භෞතික විද්‍යා ඔලිම්පියාඩ් 2016 සඳහා සහභාගි වීමට කොළඹ විශ්ව විද්‍යාලයට මූල්‍යාධාර සැපයීමේ කටයුතු සකස් කෙරෙමින් පැවතුණි.

## අධ්‍යාපන අමාත්‍යාංශය සහ වෙනත් අමාත්‍යාංශ සමග විද්‍යා. තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත අධ්‍යාපනය (STEM) ශක්තිමත් කිරීම.

අප රටේ විද්‍යා. තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත (STEM) අධ්‍යාපනය ශක්තිමත් කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමග සහයෝගිතාවයෙන් වැඩසටහන් සංවිධානය කරයි. සමාලෝචනයට ලක් කෙනෙ වසර තුළ පහත සඳහන් කර්තව්‍යයන් ක්‍රියාත්මක කරන ලදී.

### *මනා විද්‍යාගාර පුරුදු පිළිබඳ ගුරුවරුන්ගේ හැකියාව වර්ධනය කිරීම*

තම ප්‍රධාන පුහුණුකරුවන් 450 දෙනෙකු පුහුණු කිරීමේ අදහස ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාව මගින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව සහ උද්භිද විද්‍යාව සඳහා "විද්‍යා ගුරුවරුන්ට පුහුණු අත්පොත" ජාතික විද්‍යා පදනම කටයුතු කළාය.

මෙහි වැදගත්කම සලකා බලමින්, 2015 වර්ෂයේදී මෙම අත්පොත් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට කොන්තරාත්තුවක් පිරිනමන ලදී. අත් පොත පිළියෙළ කිරීමේ සහ මුද්‍රණය කිරීමේ පිරිවැය ජාතික විද්‍යා පදනම විසින් දරණ ලදී. මෙම අත්පොත 2016 දී (එක් විෂයකින් පිටපත් 450 බැගින්) මුද්‍රණය කර අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාව වෙත භාර දෙන ලදී.

# ශ්‍රී ලංකා විද්‍යාඥයින්ගේ හැකියාවන් වර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම

පවරන ලද කාර්යය :

විද්‍යා හා තාක්ෂණ ආයතනවල විද්‍යාත්මක අධ්‍යයනය හෝ විද්‍යාත්මක කටයුතු හෝ සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම



# දේශීය විද්‍යාඥයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා ප්‍රදාන යෝජනා ක්‍රම

***පර්යේෂණ ශිෂ්‍යත්ව***

වර්තමානයේ, ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාල මගින් පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි නිපදවෙන සංඛ්‍යාව ඉතා අඩු මට්ටමක පවතී. පර්යේෂණ උපාධි කරා යොමු කෙරෙන පූර්ණ කාලීන පර්යේෂණ සිදු කිරීමට විද්‍යා/ ඉංජිනේරු උපාධිධරයන් ආකර්ෂණය කිරීම සහ දිරිමත් කිරීම ඉතාමත් වැදගත්ය. මෙම වැඩසටහන දර්ශනපති (M.Phil) සහ දර්ශන ශූරි (PhD) උපාධි කරා යොමු කෙරෙන පූර්ණ කාලීන පර්යේෂණ (ශ්‍රී ලංකාව තුළ) සිදු කිරීම පිණිස විද්‍යා හා ඉංජිනේරු උපාධිදරයින්ට මූල්‍යාධාර සපයයි. නව පර්යේෂණ ශිෂ්‍යත්ව හයක් (06), 2016 වසර තුළ සපයන ලදී (*ඇමුණුම 11*). ක්‍රියාත්මක තත්වයේ පැවති පර්යේෂණ ශිෂ්‍යත්ව 16ක් අධීක්ෂණය කරන ලද අතර ශිෂ්‍යත්ව හතරක් (04) නිමකර නිබන්ධන (දර්ශන ශූරි - 01, දර්ශනපති - 03යි) භාර දී තිබුණි (*ඇමුණුම 12*).

***ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර චාරිකා ප්‍රදාන***

තම පර්යේෂණ සොයා ගැනීම් ජාත්‍යන්තර සංසදවලදී ඉදිරිපත් කිරීමට සහ ජගත් ප්‍රයත්නයන් අත් දැකීම උදෙසා නව සොයා ගැනීම්, ජයග්‍රාහණයන් සහ සංවර්ධනයන් පිළිබඳ විද්‍යාත්මක දැනුම ලබා ගැනීමට ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ට සහ තාක්ෂණවේදීන්ට අවස්ථාව සැපයීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ. තම පර්යේෂණ සොයා ගැනීම් බෙදා හදා ගැනීමට, දැනුම ඉහළ නංවා ගැනීමට, අනාගත සහයෝගිතා කටයුතු සඳහා සමාන ක්ෂේත්‍රවල කටයුතු කරන විද්‍යාඥයින් සමග සම්බන්ධතා ගොඩනැගීමට ජාත්‍යන්තර සම්මානවලට සහභාගිවීමේ අවස්ථාව ප්‍රදානලාභීන්ට හිමිවේ.

ජාතික විද්‍යා පදනම 2016 තුළ චාරිකා ප්‍රදාන 63ක් ප්‍රදානය කර ඇති අතර ඒ පිළිබඳ විස්තර *ඇමුණුම 13* හි සාරාංශගත කර තිබේ.

***විදේශීය විශේෂ පුහුණු වැඩසටහන (OSTP)***

විදේශයන් හි විශිෂ්ට මට්ටමේ ආයතනවල පුහුණු අවස්ථාවක් සැපයීම මගින් ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ ජාතික හැකියාවන් ඉහළ නැංවීමට විදේශීය විශේෂ පුහුණු වැඩසටහනෙහි (OSTP) අරමුණ වේ. මෙම වැඩසටහන යටතේ, පූර්ණ කාලීන පර්යේෂණ ශිෂ්‍යයින්, විද්‍යා පරිපාලකයින්, විද්‍යා අධ්‍යාපනඥයින්, විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ විද්‍යා සන්නිවේදකයින් වැනි විද්‍යා හා තාක්ෂණ පුද්ගලයන් සඳහා විදේශ පුහුණුවක් OSTP යටතේ ලබා දේ. නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාව තුළ දී ලබා ගත නොහැකි වන උසස්

විද්‍යාගාර සහ පර්යේෂණ නිපුණතා, කාර්මික සහ තාක්ෂණික අත්දැකීම්, විද්‍යා සන්නිවේදන හා ඉගැන්වීමේ කුශලතා ලබා ගැනීමේ අවස්ථාව ප්‍රතිලාභීන්ට හිමිවේ.

විදේශීය පුහුණු වැඩසටහන් සඳහා (*OSTP*) ප්‍රදාන 48ක් 2016 වසර තුළ ප්‍රදානය කෙරුණි (*ඇමුණුම 14*).

### *විද්‍යාව සහ තාක්ෂණය සඳහා ජාත්‍යන්තර හවුල් සබඳතා (IPSAT)*

IPSAT යනු විදේශීය රටවල කටයුතු කරන ඉහළම මට්ටමේ විද්‍යාඥයින්ගේ සහ තාක්ෂණඥයින්ගේ සේවය ලබා ගැනීම සඳහා සකසන ලද වැඩසටහනකි. ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමට, තාක්ෂණය පැවරීමට, සහ ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ගේ සහ තාක්ෂණවේදීන්ගේ ලොව පුරා - නියැලුණු ප්‍රජාවක් ගොඩනගාගැනීම උදෙසා විශේෂඥ උපදෙස් ලබා ගැනීමට මෙම වැඩසටහන මඟ පෙන්වයි. IPSAT වැඩසටහන ආරම්භ කර ඇත්තේ 2012 වර්ෂයේදීය.

IPSAT ප්‍රදාන 15ක්, 2016 වසර තුළ දී පිරිනමනු ලැබ ඇති අතර ඒ පිළිබඳ විස්තර *ඇමුණුම 15* හි සඳහන් වේ.

## ශ්‍රී ලාංකීය ආයතන සහ විදේශීය ආයතන අතර විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සහ පර්යේෂණ සහයෝගිතාවයක් ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල වෙසෙන විද්‍යාඥයින් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා උපකාර කිරීමේ අරමුණ සහිතව ජාතික විද්‍යා පදනම ජාත්‍යන්තර සබඳතාවය පවත්වාගෙන යයි. ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගිතාවය ඔස්සේ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ කටයුතු අරබයා ශ්‍රී ලංකාවේ දයකත්වය සහතික කිරීමට, වෙනත් රටවල තනි පුද්ගල, සංගම් හෝ ආයතන හෝ සමග සබඳතාවය සහතික කිරීමට හා පවත්වාගෙන යෑමට, සහ ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ ජාත්‍යන්තර දෘශ්‍යමානභාවය ප්‍රවර්ධනය කිරීමට ජාතික විද්‍යා පදනම තම කටයුතු අඛණ්ඩව සිදු කළාය.

### *පාකිස්තාන් විද්‍යා පදනම සමග සහයෝගිතාවය*

පාකිස්තාන් අග්‍රාමාත්‍ය, අතිගරු නවාස් ශරීෆ් මැතිතුමා ශ්‍රී ලංකාවේ සිදු කළ චාරිකාව අතරතුර 2016 ජනවාරි 05 දින ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම සහ පාකිස්තාන් විද්‍යා පදනම අතර ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කිරීම සිදු කෙරුණි. පාකිස්තානයේ ආරක්ෂක හා නිෂ්පාදන අමාත්‍ය සහ විද්‍යා තාක්ෂණ අමාත්‍ය, ගරු රානා තන්වීර් හා ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා මෙම අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම සිදු කළහ.

පාකිස්තාන විද්‍යා පදනම සහ ජාතික විද්‍යා පදනම යන ආයතන ද්විත්වයම නියෝජනය වන පරිදි සාමාජිකත්වය සහිතව, අවබෝධතා ගිවිසුම යටතේ සහයෝගිතා විද්‍යාත්මක කටයුතු ආරම්භ කිරීම පිණිස, ඒකාබද්ධ කමිටුවක් ද පත් කර ගන්නා ලදී. මෙම අවබෝධතා ගිවිසුමට අනුව, ඒකාබද්ධ කමිටුවේ ප්‍රථම රැස්වීම 2016 නොවැම්බර් 18 වන දින ජාතික විද්‍යා පදනමේ දී පවත්වන ලදී. මෙම සාකච්ඡාවේ ප්‍රමුඛ ප්‍රතිඵලය වූයේ රටවල් දෙකෙහිම විද්‍යාඥයින්ට සම්බන්ධ විය හැකි සහයෝගිතා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනක් ආරම්භ කිරීම සහ ඒකාබද්ධ පර්යේෂණ කණ්ඩායම් සෑදීම හා සහයෝගිතා පර්යේෂණ පැවැත්වීම පිළිබඳව තීරණයකට එළැඹීමයි. මේ සම්බන්ධයෙන් සාර්ථක දේශීය අනුපිටපත සඳහා මූල්‍යාධාර සැපයීමට ජාතික විද්‍යා පදනම සහ පාකිස්තාන් විද්‍යා පදනම අදහස් කරයි. මෙම වැඩසටහන 2017 පළමු කාර්තුව තුළ ආරම්භ කිරීමට නියමිතය.

### *චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සමග සහයෝගිතාවය*

චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනමෙහි නියෝජිතයින් කිහිප දෙනෙකු ද ඇතුළත්ව චීන විද්‍යාඥ නියෝජිත පිරිසක් 2016 මාර්තු 14 වැනි දින ජාතික විද්‍යා පදනමට පැමිණි අතර ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමත් චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනමත් අතර ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සහ ඉන් අනතුරුව විද්‍යාත්මක සහයේගිතා කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා සිදු කරන ලදී. ශ්‍රී ලාංකීය නිල නියෝජිත පිරිස චීනයට චාරිකා කළ අවස්ථාවේදී, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් සභාපති, මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනමේ සභාපති, මහාචාර්ය යැන් වෙයි මහතා 2016 අප්‍රේල් 08 වන දින අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

ඉදිරි සහයෝගිතාවය සඳහා අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුව ඇති ක්ෂේත්‍ර හඳුනා ගැනීමට 2017 වර්ෂය පළමු අර්ධය තුළ චීනය සහ ශ්‍රී ලංකාව යන රටවල් දෙකම ඒකාබද්ධ වැඩමුළු සඳහා සත්කාරකත්වය සැපයීමට තීරණය කරන ලදී.

***ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතාවය පිළිබඳ රැස්වීම් මාලාව : 2016 සැප්තැම්බර් 06-07 කොළඹ දී පැවැත් වූ ජාතික විද්‍යා පදනම් ජගත් සම්බන්ධතා***

ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය, චීනය සහ ජපානය යන රටවල විශිෂ්ට ආයතන කිහිපයක් සමග ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතාවය ශක්තිමත් කර ගැනීම සඳහා එම රටවල විද්‍යාඥයින්ගේ සහභාගිත්වය ඇතිව "ජාතික විද්‍යා පදනම් ජගත් සම්බන්ධතා" යන තේමාව යටතේ රැස්වීම් මාලාවක් පවත්වන ලදී. ඉහත රටවල් සමග පර්යේෂණ පද්ධති සහ සහයෝගිතාවය සඳහා තිබෙන අවස්ථා පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීමේ අරමුණ සහිතව "ශ්‍රී ලංකා සමාජය වෙත විද්‍යාව හා තාක්ෂණ සංසදය" සම්මේලනයන් සමග එකකට පසු එකක් වශයෙන් මෙම රැස්වීම් සූදානම් කරන ලදී.

ඉහත සම්මේලනය සඳහා අදාළ රටවලින් පැමිණි සමහර ශ්‍රී ලාංකීය විදෙස්ගත විද්‍යාඥයෝ මෙන්ම මෙම රටවල් සමග දැනටමත් අවබෝධතා ගොඩනඟාගෙන ඇති දේශීය විද්‍යාඥයෝ ද මෙම රැස්වීම්වලට සහභාගි වූහ. මෙම රැස්වීම්වලට සහභාගි වූ ආරාධිත විද්‍යාඥයෝ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම (NSFC) මෙන්ම ජර්මන් පර්යේෂණ පදනම (DFG), කැනඩාවේ ස්වභාවික විද්‍යා සහ ඉංජිනේරු පර්යේෂණ සභාව (NSERC), ඇමරිකා එක්සත් ජනපද ජාතික විද්‍යා පදනම, සහ ජපාන විද්‍යා සහ තාක්ෂණ නියෝජිතායතනය (JST) යන ආයතන නියෝජනය කළහ. අතිගරු ෂෙලී වයිටින් (ශ්‍රී ලංකාවේ කැනඩා මහ කොමසාරිස්), ආචාර්ය මයිකල් දෝ මෙන් (ශ්‍රී ලංකාවේ ජර්මන් නියෝජ්‍ය තානාපති) වැනි විශේෂ අමුත්තන් මෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව පවත්වන ලද මෙම රැස්වීම ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ (විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය) සහභාගිත්වයෙන් වර්ණවත් විය.

ඉතාමත් ඵලදායක වූ සහ ආරාධිතයින්ගේ පැමිණීම ඉහළ මට්ටමක වූ මෙම රැස්වීම, අවබෝධතා ගිවිසුම් අත්සන් තැබීම, විද්‍යාත්මක සහයෝගිතා ක්ෂේත්‍ර හඳුනාගැනීමට, සහයෝගිතා වැඩමුළු සංවිධානය කිරීම සහ පර්යේෂණ කළමනාකරණය පිළබඳව මනා පුරුදු හවුලේ භාවිත කිරීම යනාදිය මගින් ඉහත සඳහන් ආයතන සමග ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගිතා වැඩසටහන් පිළිබඳව මූලික සාකච්ඡා ප්‍රතිඵල බවට පත් කිරීමට සමත් විය.

***ගෝලීය පර්යේෂණ සභාව සමග සහයෝගිතාවය (GRC)***

ගෝලීය පර්යේෂණ සභාව (GRC) යනු, ලොව පුරා තිබෙන පර්යේෂණ මූල්‍යාධාර සපයන නියෝජිතායතන අතර ඉහළ ප්‍රමිතියකින් යුත් සහයෝගිතාවයන් සඳහා දත්ත බෙදා හදා ගැනීම සහ මනා පුරුදු ප්‍රවර්ධනය කිරීමෙහිලා කැපවුණු, ලෝකයේ විද්‍යා හා ඉංජිනේරු මූල්‍යාධාර සපයන නියෝජිතායතනවල ප්‍රධානීන්ගෙන් සමන්විත වන අථත්‍ය සංවිධානයකි. ඉන්දියාවේ විද්‍යා හා ඉංජිනේරු පර්යේෂණ මණ්ඩලය (SERB) සහ එක්සත් රාජධානියේ පර්යේෂණ සභාව (RCUK) මගින් සත්කාරකත්වය සපයන ලද ගෝලීය පර්යේෂණ සභාවේ පස්වන වාර්ෂික රැස්වීම - 2016, මැයි 25-27 දිනවල ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පවත්වන ලදී. පර්යේෂණ මූල්‍යාධාර සපයන ආයතනවල ප්‍රධානීන් සහ ලොව පුරා රටවල් 52කින් පැමිණි විශේෂ අමුත්තන්ගෙන් සමන්විත වූ සියයකට අධික පිරිසක් මෙම රැස්වීමට සහභාගි වූහ. ජාතික විද්‍යා පදනම් සභාපතිනිය, මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු සහ ජාත්‍යන්තර සබඳතා අංශයෙහි විද්‍යාත්මක නිලධාරිනි තිළිණා කඳනමුල්ල මහත්මිය මෙම රැස්වීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළහ. මෙලෙස සහභාගිවීමේ ප්‍රතිඵලයක් ලෙස, පසු අවස්ථාව "ජාතික විද්‍යා පදනම් ගෝලීය සම්බන්ධතා" යන මැයෙන් රැස්වීම් මාලාවක් සඳහා මඟ පෑදූ, ජර්මන් පර්යේෂණ සභාව (DFG), කැනඩා ස්වභාවික විද්‍යා හා ඉංජිනේරු පර්යේෂණ සභාව (NSERC), විද්‍යා හා තාක්ෂණ නියෝජිතායතනය යන ආයතනවල ප්‍රධානීන් සමග ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගීතා ඇති කර ගැනීම පිණිස සාකච්ඡා ආරම්භ කිරීමට ඉඩ ප්‍රස්තා ලැබුණි. එමෙන්ම, එම රැස්වීමේ එක්තරා තේමාවකට අනුව, "විද්‍යා ක්ෂේත්‍රයේ කාන්තාවෝ" නමැති වැඩසටහන ජාතික විද්‍යා පදනමෙහි ආරම්භ කිරීමට යෝජනා කෙරුණි. ගෝලීය පර්යේෂණ සභාවේ මීළඟ ආසියා ශාන්තිකර කලාපීය රැස්වීම, 2017 වසරේ දී ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කිරීමට නියමිතය.

***ජාන ඉංජිනේරු විද්‍යාව සහ ජෛවතාක්ෂණය සඳහා ජාත්‍යන්තර (ICGEB) සමග සහයෝගිතාවය***

ICGEB CRP ප්‍රදාන වැඩසටහනට ලැබුණු අයදුම්පත් 11කින් තුනක් ජාතික විද්‍යා පදනම මගින් නිර්දේශ කරනු ලැබුණි. මෑත කාලය තුළ දී ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් විසින් CRP ප්‍රදාන ලබා ගන්නා ශිෂ්‍යතාවයෙහි අඩු බවක් නිරීක්ෂණය වූ හෙයින්, දේශීය විද්‍යාඥයින්ට සහ පර්යේෂණකයින්ට "ව්‍යාපෘති යෝජනා ලේඛනය" පිළිබඳ

වැඩමුළුවක් ICGEB විශේෂඥයින්ගේ සහභාගිත්වය සහිතව සංවිධානය කිරීම සඳහා කටයුතු යොදන ලදී. දකුණු අප්‍රිකාවේ කේප් ටවුන්හි 2016 මැයි 25 දින ICGEB පාලකයින්ගේ මණ්ඩල රැස්වීම සඳහා ජාත්‍යන්තර සබඳතා අංශයෙහි අංශ ප්‍රධානී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඊට සහභාගි විය. ඉහත සඳහන් "ව්‍යාපෘති යෝජනා ලේඛනය" පිළිබඳ වැඩමුළුව මෙම රැස්වීමේදී මතුවුණු යෝජනාවකි.

## දේශීය සහ විදෙස්ගත විද්‍යාඥයින් අතර දැනුම බෙදාගැනීමේ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මේලන

සමාලෝචනය සිදු කෙරෙන වසර තුළ දේශීය සහ විදෙස්ගත විද්‍යාඥයින් අතර පහත සඳහන් වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කරන ලදී.

### *ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම සඳහා ආන්ත්‍රික පැසීම අඩු කිරීම පිළිබඳ සම-සමාලෝචන වැඩමුළුව*

මෙය, 2015 අගෝස්තු මස පවත්වන ලද "කෘෂිකාර්මික හරිතාගාර වායු" පිළිබඳ ගෝලීය පර්යේෂණ පෙරමුණ සමග එක්ව සංවිධානය කරන ලද කලාපීය වැඩමුළුව වන, "දකුණු ආසියාවේ ආන්ත්‍රික පැසීම ආමන්ත්‍රණය කිරීම සඳහා අවස්ථාවන් සහ මැදිහත්වීම් හඳුනා ගැනීමට තාක්ෂණික වැඩමුළුව" යන්නෙහි පසුවිපරම් වැඩමුළුවකි.

මෙම වැඩසටහන, රුහුණ විශ්ව විද්‍යාලය සහ කේන්ද්‍රීය ලක්ෂ්‍යය ජාතික විද්‍යා පදනම වන, කෘෂිකර්ම හරිතාගාර වායු පිළිබඳ ගෝලීය පර්යේෂණ අරමුණෙහි සත්ව විද්‍යා පර්යේෂණ කණ්ඩායම සමග සහයෝගිතාවයෙන් පවත්වන ලදී.

විද්‍යාඥයින්, කර්මාන්තකරුවන්, ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ පේරාදෙනිය, රුහුණ, සහ සබරගමුව විශ්ව විද්‍යාලවල කෘෂිකර්ම පීඨවලින්, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයෙන්, විද්‍යා තාක්ෂණ නවෝත්පාදන සම්බන්ධිකරණ ලේකම් කාර්යාංශයෙන් (COSTI) පශුවෛද්‍ය පර්යේෂණ ආයතනය (VRI), සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන්, ජාතික සත්ව සංවර්ධන මණ්ඩලයෙන් (NLDB), මිල්කෝ පුද්ගලික සමාග මෙන්, සහ සී අයි සී කිරි ගොවිපළ සමාගමෙන් ශාස්ත්‍රඥයෝ මෙම වැඩමුළුවට සහභාගි වූහ.

මෙම වැඩමුළුවෙහි ප්‍රධාන සම්පත්දායක ලෙස ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ (FAO), සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අංශයේ, ආචාර්ය හරින්ද්‍රා මක්කාර් සහභාගි විය. කෘෂිකර්ම හරිතාගාර වයු පිළිබඳ ගෝලීය පර්යේෂණ පෙරමුණෙහි සත්ව විද්‍යා පර්යේෂණ කණ්ඩායමේ සම්බන්ධක විද්‍යාඥ මහාචාර්ය තක්සලා සේරසිංහ මෙම වැඩමුළුව සඳහා දායකත්වය ලබා දුන්නාය.

ශ්‍රී ලංකාවට අදාළ සත්ව නිෂ්පාදන පද්ධති දත්ත නිම කිරීම සහ දේශීය නිෂ්පාදන පද්ධතිවලින් මීතේන් වායුව විමෝචනය වීම අඩු කිරීමට යෝග්‍ය මැදිහත්වීම් හඳුනාගැනීමට මෙන්ම කිසියම් වූ දත්ත පරතරයක් හඳුනාගැනීම මෙහිදී සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධාන කරුණුවේ. තව දුරටත්, මෙම ක්ෂේත්‍රවල පර්යේෂණ සහයෝගිතාවය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ද මෙහි දී තීරණය විය.

### *ආසියාතික ජෛව තාක්ෂණ සංගම්වල ෆෙඩරේෂණයෙහි 13 වන ජාත්‍යන්තර සම්මුතිය (FABA) : ජෛව ආසියාව 2016 : 2016 පෙබරවාරි 08-10*

විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා සහ නිල නියෝජිත පිරිස වන කාර්මික තාක්ෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය සිසිර ප්‍රේමකුමාර, සහ ජාත්‍යන්තර සබඳතා අංශයෙහි අංශ ප්‍රධානී, වසන්ත අනුරුද්ධ මයා ආසියාතික ජෛව තාක්ෂණ සංගම්වල ෆෙඩරේෂණයෙහි (FABA) "ජෛව ආසියාව 2016" සම්මේලනයට සහභාගි වූහ.

මෙම චාරිකාවේ ප්‍රතිඵලයක් ලෙස විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා හයිද්‍රාබාත් විශ්ව විද්‍යාලයේ - ජෛවීය විද්‍යා පීඨයට සමානව, ජෛවීය විද්‍යා පාසලක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කළ යුතු යැයි යෝජනා කළේය. මේ පිළිබඳ වැඩිපුර අධ්‍යයනයක් සිදු කිරීම සඳහා විද්‍යාඥයින්, ශාස්ත්‍රඥයින් සහ සෞඛ්‍ය/වෛද්‍ය සැපයුම් දෙපාර්තමේන්තුව යන ආයතනවල නියෝජිතයින් හයිද්‍රාබාත් විශ්ව විද්‍යාලයට අධ්‍යයන චාරිකාවක නිරත විය.

### ආසියාවේ විද්‍යා සභාවේ දහසය වැනි සම්මේලනය, 2016 මැයි 30 - ජුනි 01, කොළඹ

ජපාන විද්‍යා සභාවේ (JST) සක්‍රිය සහයෝගය සහිතව ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යය වන ශ්‍රී ලංකා විද්‍යා ජාතික ඇකඩමිය (NASSL) සමග ජාතික විද්‍යා පදනම ඉහත සම්මේලනයෙහි සම-සංවිධායකත්වය දැරුවාය. "මිනිසුන් සඳහා විද්‍යාව: ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා නූතන තාක්ෂණයන් සේවයෙහි යෙදවීම", මෙම සම්මේලනයෙහි තේමාව විය. නූතන තාක්ෂණයන්: ජෛව තාක්ෂණය, තොරතුරු තාක්ෂණය, නැනෝ තාක්ෂණය සහ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය සහ එවැනි නව තාක්ෂණයන් සේවයෙහි යෙදවීමේදී ආසියාතික රටවල් මුහුණ දෙන අභියෝග අන්තර්ගත සමාජ විද්‍යාත්මක අංශ, සම්මේලනයේ උප-තේමාවලට අන්තර්ගත විය. මෙම සම්මේලනය, දේශගුණික විපර්යාස, සහ ස්වභාවික ව්‍යසනවලින් වැළකීම වැනි ආසියාවේ විද්‍යා සභාවේ සම්මේලනයෙහි පුනරාවර්තන තේමා සමග ද කටයුතු කළාය.

මෙම සම්මේලනයෙහි සමාරම්භය සිදු කරනු ලැබුවේ, විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමන් විසිනි. මහාචාර්ය යසුහිරෝ කොයිකේ විසින් සමාරම්භක උළෙලේදී "ෆෝටොනික්ස් බහු අවයවික" පිළිබඳ ප්‍රධාන දේශනය පැවැත්වීය. මෙයට අමතරව, ආසියාවේ විද්‍යා සභාව, අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අතර සංවාදයක් මෙම සම්මේලනයෙහි දෙවෙනි දිනයේදී සංවිධානය කෙරුණි. සමස්ත සාමාජිකයින්ගෙන් සමන්විත රැස්වීමේදී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් (ශ්‍රී ලංකාවෙන් නමයක්), වාචික ඉදිරිපත් කිරීම් (සියයක් පමණ) සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් (ශ්‍රී ලංකාවෙන් දොළහක්) යනාදියෙන් මෙම සම්මේලනය සමන්විත විය. විදේශයන්ගෙන් 79 දෙනෙක් සහ දේශීයව 73 දෙනෙක් මෙම සම්මේලනයට සහභාගි වූහ.

### යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් සමග සංවාදය, 2016 අගෝස්තු 16, කොළඹ

ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගේ මඟපෙන්වීම අනුව යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්, ඉරිනා බොකෝවා මහත්මිය සමග විද්‍යා සංවාදයක් ශ්‍රී ලංකා විද්‍යාඥයන් සඳහා 2016 අගෝස්තු 16 දින කොළඹ දී සංවිධානය කෙරුණි. මෙහි අරමුණ වූයේ, යුනෙස්කෝ විද්‍යා වැඩසටහන්වලට අනුකූලව ශ්‍රී ලංකාව තුළ පවත්වනු ලබන විද්‍යා වැඩසටහන් පිළිබඳව යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීම සහ යුනෙස්කෝ විද්‍යා වැඩසටහන්වලට සහයෝගය දැක්වීමට සහ සහභාගිවීමට ශ්‍රී ලාංකීය විද්‍යාත්මක ප්‍රජාවට තිබෙන්නා වූ අවස්ථාවන් හඳුනාගැනීමයි.

මෙම වැඩසටහනෙහි මූලාසනය විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය+, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විසින් දරණ ලද අතර, යුනෙස්කෝ සඳහා ශ්‍රී ලංකා ජාතික කොමිසමෙහි ලේකම් ජනරාල්, එස්.එල්.ඩී.කේ. විජයසිංහ මිය, සහ ජාතික විද්‍යා පදනමෙහි සභාපතිනිය, මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මෙම විද්‍යා සංවාද මඩුල්ලෙහි සාමාජිකයින් ලෙස කටයුතු කළහ. ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර සබඳතා ක්‍රියාකාරී කමිටුවේ සාමාජික, මහාචාර්ය සමන්ත හෙට්ටිආරච්චි විසින් මෙම සාකච්ඡා මෙහෙයවන ලදී. විද්‍යා තාක්ෂණ සහ පවර්යේෂණ අමාත්‍යාංශ නිලධාරීන්, ජාතික විද්‍යා පදනම් කළමනාකරණ මණ්ඩලය, ජාතික විද්‍යා පදනමෙහි විවිධ ක්‍රියාකාරී කමිටුවල සාමාජිකයන්, විද්‍යාඥයින්, ශාස්ත්‍රඥයින් සහ ජාතික විද්‍යා පදනමෙහි කාර්ය මණ්ඩලය ඇතුළු 194 දෙනෙකුගේ සහභාගිත්වයක් මෙහිදී දක්නට ලැබුණි.

ජාතික විද්‍යා පදනමෙහි නාම යෝජනාවලට අනුව දේශීය විද්‍යාඥයින් විසින් ජාත්‍යන්තර සංසදවල ශ්‍රී ලාංකීය නියෝජනය

- o මහාචාර්ය අනෝජා ප්‍රනාන්දු - යුනෙස්කෝ ජාත්‍යන්තර ජෛවාචාර්ය ධර්ම කමිටුව (IBC) සඳහා ජාතික විද්‍යා පදනම් නාම යෝජනාව: එහි සාමාජිකත්වයෙන් පිදුම් ලැබුවාය.

- o මහාචාර්ය සරෝජා රණසිංහ - සායනික වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය- ICSU වෙනස්වන නාගරික පරිසරය තුළ සෞඛ්‍ය සහ සුබසාධනය සඳහා විද්‍යාත්මක කමිටුව "පද්ධති විශ්ලේෂණයට ප්‍රවේශයක්" සඳහා තෙවසරකට දීර්ඝ කරන ලද සාමාජිකත්වය - ජාතික විද්‍යා පදනම් නාම යෝජනාව: එහි සාමාජිකත්වයෙන් පිදුම් ලැබුවාය.

ජපානයෙහි 2016 ඔක්තෝම්බර් 04-07 දක්වා පැවැත්වුණු සමාජය සඳහා විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සංසදයෙහි (STS Form) "අනාගත නායකයින්" වැඩ සටහනට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාතික විද්‍යා පදනම මගින් නාම යෝජනා සිදු කරන ලද, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධිශිෂ්‍ය, ආචාර්ය මෙත්තිකා විතානගේ සහභාගි වූවාය.

# යටිතලපහසුකම්
# ඉහළ නැංවීම
# සහ රාජකාරී පරිසරය
# වැඩි දියුණු කිරීම



## යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ රාජකාරී පරිසරය වැඩි දියුණු කිරීම

බාහිර පරිසරය තුළ වූ අදාළ රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සමග සම්බන්ධතාවය සහ සන්නිවේදනය ශක්තිමත් කර ගැනීම පිණිස ජාතික විද්‍යා පදනම ඉමහත් පරිශ්‍රමයක් දැරුවාය. ජාතික විද්‍යා පදනමෙහි මෙහෙවර සාක්ෂාත් කර ගැනීම පිණිස රැකියාලාභීන්ගේ දයකත්වය කාර්යක්ෂම ආකාරයට ඉහළ නැංවීමට උපකාරවන ප්‍රතිඵලාභිමුඛ විවෘත සංස්කෘතියක් පවත්වා ගැනීමට අපගේ කාර්යමණ්ඩලයෙහි නිපුණතා සහ නිෂ්පාදිතතාවය සංවර්ධනය කිරීමට 2016 වසර තුළ ප්‍රයත්න දරණ ලදී. ආයතනයේ තිරසර පැවැත්මට අදාළවන තම ප්‍රධාන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී උපකාරක අංශ විද්‍යාත්මක අංශ සමග සහයෝගයෙන් කටයුතු කිරීම දක්නට ලැබුණි.

### *පරිපාලන අංශය*

ජාතික විද්‍යා පදනමෙහි ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය කෙරෙන සේවාවන් ප්‍රශස්ත මට්ටමකින් සැපයීම උදෙසා, සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ පරිපාලන අංශය මගින් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කරන ලදී.

- ❖ සාමාන්‍ය පරිපාලනය
- ❖ මානව සම්පත් කළමනාකරණය
- ❖ වත්කම් කළමනාකරණය
- ❖ ජාතික විද්‍යා පදනමෙහි සැපයුම් අවශ්‍යතා

ජාතික විද්‍යා පදනම විද්‍යාත්මක නිලධාරීන් 24 දෙනෙකු ඇතුළත්ව සාමාජිකයින් 121 දෙනෙකුගෙන් සමන්විත කාර්යමණ්ඩල ශක්තියකින් යුක්ත වේ. 2016.12.31 වන විට සේවයේ යෙදී සිටි ප්‍රධාන කාර්යමණ්ඩලයේ සාමාජික නාම ලැයිස්තුව *ඇමුණුම 16* හි දක්වා ඇත.

කාර්යමණ්ඩලයට එක් නව සාමාජිකයකු බඳවා ගන්නා ලද අතර සාමාජිකයින් සිව් දෙනෙකු (04) සේවයෙන් ඉල්ලා අස්වීම සහ සාමාජිකයින් දෙදෙනෙකු සේවයෙන් විශ්‍රාම ගැනීම ද 2016 වසර තුළ දී සිදුවිය.

### *මූල්‍ය අංශය*

පවතින මූල්‍යමය රෙගුලාසි තුළ, ආයතනයේ සියලු මූල්‍යමය කටයුතුවලට අදාළව ක්ෂණික සහ කාලීන පියවර සහතික කරමින් කාර්යක්ෂම මූල්‍යමය සේවාවක් සැපයීමට අදාළ සියලුම මූල්‍ය කටයුතු සිදු කිරීමට මූල්‍ය අංශය කටයුතු කරන ලදී.

- ➢ ගිණුම් පොත්, ස්ථාවර වත්කම් නාමාවලිය, පොදු ලෙජරය, ප්‍රදාන පිළිබඳ ලෙජරය, තොග පොත් පවත්වාගෙන යෑම
- ➢ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ඇස්තමේන්තු ඇතුළත් සියලු මූල්‍ය වාර්තා සකස් කිරීම සහ නියමිත දිනවල අදාළ අධිකාරිය වෙත එම වාර්තා භාර දීම

- ආයතනයේ විවිධ අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලු කටයුතුවලට අදාල ගෙවීම් සිදු කිරීම
- වැටුප්, අතිකාල යනාදී පොදු ගෙවීම් සිදු කිරීම
- ගබඩාව නඩත්තු කිරීම

***මුද්‍රණ අංශය***

ජාතික විද්‍යා පදනමෙහි සියලුම අංශවලට අදළ මුද්‍රණ අවශ්‍යතාවලට සහයෝගය දැක්වීම මුද්‍රණ අංශය අඛණ්ඩව සිදු කළාය. වසර තුළ ග්‍රන්ථ සහ සඟරා ප්‍රකාශන 28ක්, සහ පොත් මුද්‍රණ වැඩ 67ක් මුද්‍රණය කිරීම සිදු කෙරුණි.

## තොරතුරු තාක්ෂණ පහසුකම වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම

***තොරතුරු තාක්ෂණ ඒකකය***

ආයතනික තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලයට ආන්ත-පරිශීලන තොරතුරු තාක්ෂණ සහයෝගය සැපයීම, තොරතුරු තාක්ෂණ ඒකකයේ වගකීම වේ.

දේශීය ක්ෂේත්‍රජාල අබිලි උපකරණ ප්‍රතිස්ථාපනය කිරීම, කාර්යමණ්ඩලයට පරිගණක පහසුකම් සැපයීම, සහ අන්තර්ජාල කළාප පළළ ඉහළ නැංවීම, 2016 වසර තුළ සාර්ථකව නිම කරන ලද ප්‍රධාන කටයුතු ලෙස දැක්විය හැකිය. යල්පැන ගිය හඬ සන්නිවේදන වේදිකාව නවීන තාක්ෂණයෙන් ප්‍රතිස්ථාපනය කිරීම ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය තුළ දී එය නිම කිරීමට අපේක්ෂා කරයි.

## පද්ධතියේ උසස් කිරීම සඳහා සහයෝගිතා සන්නිවේදනය/ ක්‍රියාපටිපාටි, නෛතික කෙටුම්පත්කරණය, ඉලක්ක සැකසීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම

ජාතික විද්‍යා පදනම් මූල්‍ය සහ භෞතික ප්‍රගතිය මාසිකව, කාර්තුමය ආකාරයට, සහ වාර්ෂිකව වාර්තා කරනු ලැබේ. විද්‍යාත්මක කටයුතු ඇගයීම සහ නියාමනය කිරීම සඳහා සෑම මසකම ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සංවිධානය කරනු ලැබේ.

වර්ෂය ආරම්භයේදී සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්ය සංවිධානය කරනු ලැබුණු අතර, පවරනු ලැබූ විවිධ කටයුතුවලට ප්‍රගතිය මත පදනම්ව ප්‍රාග්ධන අය-වැය නැවත වෙන් කිරීම පිණිස අර්ධ-වාර්ෂික ප්‍රතිශෝධන සිදු කරනු ලැබේ.

## "විද්‍යා ක්ෂේත්‍රයේ කාන්තාවෝ" වැඩසටහන

පහත සඳහන් අරමුණු සහිතව, 2016 වර්ෂයේ අග භාගයේදී ජාතික විද්‍යා පදනම මගින් "විද්‍යා ක්ෂේත්‍රයේ කාන්තාවෝ" යන මැයෙන් වැඩසටහනක් ආරම්භ කළාය.

1. ජාතික විද්‍යා පදනම් විවිධ කටයුතුවල ස්ත්‍රී-පුරුෂ සහභාගිත්වය හඳුනා ගැනීම.
2. දැනුවත්භාවය සහ විද්‍යාවේ විවිධ කටයුතුවල කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීමට කාන්තා කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක වන දේශීය රාජ්‍ය ආයතන සමග සහයෝගිතා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
3. දැනුවත්භාවය සහ විද්‍යාවේ විවිධ කටයුතුවල කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීමට ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගිතා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.

4. ගෝලීය පර්යේෂණ සභාවේ වෙනත් සාමාජිකයින්ට සමානව ශ්‍රී ලංකාවේ විද්‍යා ක්ෂේත්‍රයේ නියැලි කාන්තාවන් පිළිබඳ ජාතික විද්‍යා පදනම් ස්ථාවරය සකස් කිරීම.

5. විද්‍යා ක්ෂේත්‍රයේ කාන්තාවන් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීමට යෙදවුම් සැපයීම.

මෙය, ජාතික විද්‍යා පදනම කේන්ද්‍රීය ලක්ෂ්‍යය වන, ගෝලීය පර්යේෂණ සභාව මගින් "පර්යේෂණවල යෙදෙන කාන්තාවන්ගේ සමතාවය සහ තත්වය ප්‍රවර්ධනය කෙරෙන මූලධර්ම හා ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශන" සමග එක පෙළට සිදුවේ. ජාතික විද්‍යා පදනමෙහි "විද්‍යා ක්ෂේත්‍රයේ කාන්තාවෝ" කණ්ඩායම මගින්, ස්ත්‍රී-පුරුෂ බවට අනුව අයදුම් කිරීම සහ ජාතික විද්‍යා පදනම් ප්‍රදාන යෝජනාක්‍රමවල අයදුම්කරුවන්ගේ සාර්ථකත්ව-අනුපාතිකය සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කළමනාකරණ මණ්ඩලවල ස්ත්‍රී-පුරුෂ සංයුතිය යනාදිය පිළිබඳ සමීක්ෂණ කිහිපයක් ද සිදු කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශන



## 2016 කාර්යසාධනය පිළිබඳ ගණකාධිකරණ නිලධාරියාගේ නිරීක්ෂණ

ජාතික විද්‍යා පදනම තනිකරම රජයේ අරමුදල් මත යැපෙන, මූලාධාර සම්පාදනය කරන ආයතනයකි. ජාතික අය-වැය දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂය සඳහා ජාතික විද්‍යා පදනමට "පුනරාවර්තන" සහ "ප්‍රාග්ධන" වියදම් සඳහා නිකුත් කිරීමට නිර්දේශ කරනු ලැබූ ප්‍රමාණය පිළිවෙළින් රු.මිලියන 113.2ක් සහ රු.මිලියන 236ක් විය. ඒ අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා පිළිවෙළින් රු.මිලියන 113.2ක් සහ රු.මිලියන 231.8ක් මුදාහරින ලදී.

රු. 000

| | *ඇස්තමේන්තුව* | *වියදම* |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පුද්ගලික වේතන | 83,450 | 82,958 |
| වෙනත් පුනරාවර්තන | 52,550 | 47,708 |
| **එකතුව** | **136,000** | **130,666** |

රු. 000

| | *ඇස්තමේන්තුව* | *වියදම* |
|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | | |
| විෂය කේතය - 133-02-05-3-2201 | 250,000 | 239,393 |

2012-2016 කාලය තුළ ප්‍රාග්ධන අරමුදලට එදිරිව වාර්ෂික වියදම පිළිබඳ තොරතුරු පහත සඳහන් ප්‍රස්තාරය මගින් පෙන්නුම් කෙරේ.



## වසර තුළ ලැබුණු අරමුදල්වලට එදිරිව ප්‍රාග්ධන වියදමෙහි විස්තර

| | විස්තරය | රු.000<br>2016 වියදම |
|---|---|---|
| 1. | පර්යේෂණ සහ වෙනත් විද්‍යාත්මක කටයුතු සඳහා ප්‍රදාන | 121,209 |
| 2. | විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය | 5,050 |
| 3. | තාක්ෂණ අංශය | 26,913 |
| 4. | ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය | 4,984 |
| 5. | විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය | 17,828 |
| 6. | ජාත්‍යන්තර සම්බන්ධතා අංශය | 24,889 |
| 7. | තොරතුරු තාක්ෂණ ඒකකය | 9,927 |
| 8. | කාර්යාල ගෘහ භාණ්ඩ සවිකුරු සහ උපකරණ | 1,913 |
| 9. | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය | - |
| 10. | අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලයේ වැය ශීර්ෂය | 14,337 |
| 11. | විදේශීය විශේෂ පුහුණු වැඩසටහන | 12,343 |
| | එකතුව | **239,393** |

### කළමනාකරණ ගැටලු

වසරේ පළමු කාර්තුව සඳහා සැලසුම් කරන ලද කටයුතු සිදු කළ නොහැකි බවට පත් කරවමින් සහ වසර සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 23ක් මුදා නොහැරීම සිදු කෙරුණු අතර, වසර සඳහා වෙන් කරන ලද ප්‍රාග්ධන අරමුදල්වල පළමු වාරිකය මුදාහරින ලද්දේ මාර්තු මාසයේදීය. ප්‍රමාදය සහ වසර සඳහා වෙන් කරන ලද අරමුදල් මුදා නොහැරීම, වාර්ෂිකව සැලසුම් කරන ලද කටයුතු සාක්ෂාත් කර ගැනීමේදී අහිතකර ලෙස බලපෑ නමුදු, විද්‍යාත්මක පර්යේෂණ ප්‍රදාන සඳහා මුදාහරින ලද මුළු ප්‍රාග්ධනය 100%ක් වියදම් කිරීමට ජාතික විද්‍යා පදනමට හැකිවිය.

පර්යේෂණ ආයතනවල අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ සිදු කෙරේ. ප්‍රබල - කොන්දේසි බලපැවැත්වෙමින් තිබිය දී පවා, ප්‍රදානලාභීන්ගේ ආයතන තුළ පවතින ක්‍රියාපටිපාටි සහ සම්ප්‍රදාය කරණ කොටගෙන යම්තාක් දුරට කාලානුරූපව ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අහිතකර බලපෑමක් ඇති කෙරේ. කෙසේ වෙතත්, සුදුසු කළමනාකරණ ප්‍රවේශ අනුගමනය කිරීම මගින්, පෙර වසරට සකස් කරන ලද වැඩසටහන් සඳහා වඩා කැපීපෙනෙන සාර්ථකත්වයක් සාක්ෂාත් කර ගැනීමට ජාතික විද්‍යා පදනමට හැකි විය.

## 2016 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.000

| **අයභාරය** | **2016** | | **2015** | |
|---|---|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන | 113,250 | | 106,032 | |
| **වෙනත් ආදායම්** | | | | |
| ලැබුණු පොලී | 227 | | 238 | |
| අනියම් අයභාරය | 36 | | 115 | |
| ප්‍රකාශන අලෙවියෙන් ලද ලාභය/අලාභය | 326 | | 377 | |
| ඡායා පිටපත් ලදුපත් | 3 | | 2 | |
| NSLRC ආදායම | 1 | | 5 | |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභය/අලාභය | - | | (28) | |
| හුවමාරු ලැබීම්/ අලාභය | 94 | | 243 | |
| වෙනත් ආදායම් | 237,966 | | 228,474 | |
| අසමාන අයභාරය | 13,255 | | 10,622 | |
| | | 365,159 | | 346,080 |
| **වියදම** | | | | |
| **පුද්ගල වේතන** | | | | |
| වැටුප් හා දීමනා | 66,830 | | 68,196 | |
| සේවක අර්ථසාධක අරමුදල | 7,771 | | 7,086 | |
| සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | 1,551 | | 1,415 | |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම | 5,774 | | 2,143 | |
| අතිකාල | 958 | | 1,033 | |
| නිවාඩු දින ගෙවීම් | 73 | | 45 | |
| නිල ඇඳුම් | 304 | | 247 | |
| කාර්යමණ්ඩල පුහුණුව | 629 | | 768 | |
| | **83,890** | | **80,933** | |
| ප්‍රවාහනය | 766 | | 483 | |
| සැපයුම් | 3,714 | | 3,923 | |
| නඩත්තු කටයුතු | 3,361 | | 2,736 | |
| කොන්තරාත් සේවා | 10,219 | | 8,634 | |
| වෙනත් | 12,925 | | 10,321 | |
| ක්ෂයවීම් | 15,791 | | 14,608 | |
| ප්‍රාග්ධන වියදම් | 237,481 | | 245,914 | |
| | **284,257** | 368,147 | **286,619** | 367,552 |
| සැපයුමට එදිරිව අතිරික්තයේ හිඟය | | | | |
| සුවිශේෂ අයිතමයන්ට පෙරාතුව | | (2,988) | | (21,472) |
| සුවිශේෂ අයිතම (ශුද්ධ ලාභය හෝ අලාභය) | | - | | - |
| **කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)** | | **(2,988)** | | **(21,472)** |

## 2016 දෙසැම්බර් 31 වන විට මූල්‍ය තත්ව ප්‍රකාශය

රු.000

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමක | 22,680 | 13,495 | 17,929 |
| අයවිය යුතු | 5,905 | 9,703 | 11,884 |
| තොග | 2,217 | 1,521 | 1,509 |
| පූර්ව ගෙවීම් | 1,492 | 4,726 | 3,450 |
| වෙනත් ජංගම වත්කම් | 3,408 | 3,408 | 3,408 |
| මුළු ජංගම වත්කම් | 35,702 | 32,853 | 38,180 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| අයවිය යුතු | 3,507 | 3,464 | 3,415 |
| දේපළ - යන්ත්‍ර සහ උපකරණ | 450,592 | 446,993 | 447,157 |
| ආයෝජන | 560,975 | 560,975 | 560,975 |
| මුළු ජංගම නොවන වත්කම් | 1,015,074 | 1,011,432 | 1,011,547 |
| **මුළු වත්කම්** | 1,050,776 | 1,044,285 | 1,049,727 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත අය | 6,091 | 4,443 | 10,286 |
| ණය හිමියෝ | 7,274 | 3,933 | 2,097 |
| | 13,365 | 8,376 | 12,383 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම | 25,405 | 22,533 | 21,413 |
| අසමාන අය භාරය | 44,078 | 37,944 | 34,083 |
| | 69,483 | 60,477 | 55,496 |
| **මුළු වගකීම්** | 82,848 | 68,853 | 67,879 |
| **ශුද්ධ වත්කම්** | **967,928** | **975,432** | **981,848** |
| **සමකොටස් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | (13,896) | (8,092) | (1,676) |
| සංචිත ප්‍රතිප්‍රමාණනය | 420,849 | 422,549 | 422,549 |
| රජයේ ප්‍රදානය | 560,975 | 560,975 | 560,975 |
| **මුළු සමකොටස්** | **967,928** | **975,432** | **981,848** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.000

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| **<u>මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ</u>** | | | | |
| ආදායමය වැඩි වියදම් ශුද්ධ අධිකය | (2,988) | | (21,472) | |
| එකතු කළා; ජා.වි.ප අරමුදල් පූර්ව වසර සැකසීම් | (2,816) | | 15,019 | |
| | **(5,804)** | | **(6,453)** | |
| **<u>ගැලපුම්</u>** | | | | |
| ක්ෂයවීම් | 15,790 | | 14,608 | |
| වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය | (2,903) | | (1,023) | |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් | 5,774 | | 2,143 | |
| හුවමාරුව ලාභය/(අලාභය) | (94) | | (243) | |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභය/(අලාභය) | - | | 28 | |
| අවිනිශ්චිත ණය කරුවන්ගේ අධිසැපයුම | (87) | | - | |
| බැහැර කරන ලද වාහනවල සංචිතය ප්‍රතිප්‍රමාණනය | (1,700) | | - | |
| එකග නොවූ ආදායම | (13,255) | | (10,622) | |
| අත්හැර දමන ලද ණයකරුවන් | 10 | | - | |
| අත්හැර දමන ලද සඟරා සහ වාරසඟරා තොගය | 94 | | 173 | |
| ප්‍රාග්ධන වෙනස්කම් සිදු කිරීමට ප්‍රථම මෙහෙයුම් ලාභය/(අලාභය) | **(2,175)** | | **(1,390)** | |
| වෙනත් ලැබීම් වෙළෙඳපොළ ශුද්ධ වැඩි වීම/අඩු වීම | 6,988 | | 856 | |
| භාණ්ඩ ලේඛනවල ශුද්ධ වැඩි වීම/අඩුවීම | (695) | | (12) | |
| ගෙවිය යුතු වෙළඳ ශුද්ධ වැඩි වීම/අඩු වීම | 4,989 | | (4,007) | |
| මෙහෙයුම් කටයුතුවලින් ජනිත මුදල් | 11,282 | | (3,163) | |
| මෙහෙයුම් කටයුතුවලින් උපයන ශුද්ධ මුදල් | | **9,107** | | **(4,553)** |
| **<u>ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ</u>** | | | | |
| කටයුතුවලින් බැහැරට ගලායෑම් | - | | - | |
| වත්කම් මිලට ගැනීම | (11,999) | | (8,093) | |
| ග්‍රන්ථ අලෙවියෙන් ලද මුදල | 78 | | 119 | |
| ආයෝජන කටයුතුවල භාවිත කළ ශුද්ධ මුදල් | | **(11,921)** | | **(7,974)** |
| **<u>මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ</u>** | | | | |
| රජයේ දායකත්වය | 11,999 | | 8,093 | |
| විදේශ ආධාර | - | | - | |
| | | **11,999** | | **8,093** |
| මූල්‍ය කටයුතුවලින් ශුද්ධ ලාභය | | 9,185 | | (4,434) |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමක** | | 13,495 | | 17,929 |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමක** | | **22,680** | | **13,495** |

## ගිණුම් පිළිබඳ සටහන්

1. **සාකල්‍ය ගිණුම්කරණය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකසනු ලැබ ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති SLPSAS 01 ට අනුකූලව ඉදිරිපත් කෙරුණි. - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2. **පර්යේෂණ හා වෙනත් විද්‍යාත්මක කටයුතු සඳහා ප්‍රදාන**

පර්යේෂණ ප්‍රදාන ගිවිසුමෙහි පැහැදිලිව දක්වා ඇති පරිදි පර්යේෂණ ප්‍රදානවලට මූල්‍යාධාර සම්පාදනය කිරීමේදී අපගේ ප්‍රතිපත්තිය වන්නේ ප්‍රදානලාභියා සේවයේ යොදවා ඇති ආයතනය වෙත වාරික ලෙස අරමුදල් සැපයීමයි. අදාළ ආයතනයේ භාවිතයට නොගත් මුරමුදල් ඉතිරිවේ නම්, ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුව, ඉතිරි මුදල ජාතික විද්‍යා පදනම වෙත ආපසු භාරදිය යුතුය. එහෙයින්, ආයතනය වෙත මාරු කරන ලද අරමුදල්, අපි වියදමක් ලෙස සලකන්නෙමු. ව්‍යාපෘතිය අවසානයේ දී භාවිත නොකරන ලද ඉතිරි වූ අරමුදල් තිබේ නම්, අපි ණයකරුවකු නිර්මාණය කරන්නෙමු.

3. **වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම**

**ක්ෂයවිය හැකි වත්කම් හා ක්ෂයවීම**

මුල් පිරිවැය මත හෝ වත්කම් මිලට ගත් දින සිට සෘජු රේඛා පදනමක් මත තක්සේරු කිරීමෙන් හෝ ක්ෂයවීම් සපයනු ලැබ ඇති අතර, ඒවායේ තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවන කාලය මත වත්කම් ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා ගණනය කිරීම සිදු කරයි.

ක්ෂයවීම් අනුපාතිකය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිල්ල | 5% |
| කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ | 20% |
| මෝටර් රථ | 20% |
| උපාංග හා විවිධ දෑ | 20% |
| පුස්තකාල ග්‍රන්ථ | 5% |
| ණයට ලබාදුන් විද්‍යාත්මක හා විද්‍යාගාර උපකරණ | 10% |
| ප්‍රලේඛන උපකරණ | 10% |

4. **ප්‍රකාශන**

විද්‍යාත්මක ප්‍රජාව, ප්‍රතිපත්ති සකස් කරන්නන්, මූල්‍යාධාර ලබාදෙන නියෝජිතායතන යනාදියට දැනුම බෙදා දීමට මෙන්ම විශේෂයෙන් පාසල් දරුවන් අතර හා සාමාන්‍ය සමාජය වෙත විද්‍යාත්මක දැනුම ව්‍යාප්ත කිරීම සඳහා මේවා ප්‍රධාන වශයෙන් ප්‍රකාශනය කරනු ලැබේ.

එහෙයින්, බොහෝ අවස්ථාවලදී විද්‍යාත්මක කටයුතු සඳහා විශේෂයෙන් ත්‍යාග/සම්මාන වශයෙන් පාසල් සහ වෙනත් අදළ විවිධ සංවිධානවලට මෙම ප්‍රකාශන නොමිලයේ ලබාදේ. *උදා:* තරඟ ජයග්‍රාහකයින්; එවැනි නිකුත් කිරීම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව සිදු කෙරේ.

කළමනාකරණ මණ්ඩලය විසින් 2010 නොවැම්බර් මස 15 දින ගනු ලැබූ තීරණයකට අනුව මාස හයකට වඩා පැරණි වාරසඟරා හා සඟරාවල වටිනාකම 50% කින් සහ වසරකට වඩා පැරණි වාරසඟරා සහ සඟරාවල වටිනාකම ශූන්‍ය දක්වා ද අඩු කෙරෙන බව සටහන් කෙරේ.

කළමනාකරණ මණ්ඩලය විසින් 2011 අගෝස්තු 12 දින ගනු ලැබූ තීරණයකට අනුව, වාරසඟරා සහ සඟරා හැර ග්‍රන්ථ/වෙනත් ඕනෑම ප්‍රකාශනයක වටිනාකම මුද්‍රණයෙන් වසර පහකට (05) පසුව ශූන්‍ය බව සටහන් කෙරේ.

කළමනාකරණ මණ්ඩලය 2015 අගෝස්තු 13 දින ගනු ලැබූ තීරණයකට අනුව, ප්‍රකාශන සඳහා පිරිවැය අදාළ අංශයේ වියදමක් ලෙස සලකනු ලැබේ.

5. **වත්කම්වලට සහ අයභාරයට අදාළ ප්‍රදාන ඉදිරිපත් කිරීම.**

**වත්කම්වලට අදාළ ප්‍රදාන**

සලකනු ලබන වත්කම්වලට අදාළව ක්ෂයවීම, LKAS 20ට අනුකූලව වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය මත ක්‍රමානුකූල සහ තාර්කික පදනමක් මත ආදායමක් ලෙස හඳුනාගන්නා ලද අසමාන අයභාරයට පවරනු ලැබ තිබේ.

**අයභාරයට අදාළ ප්‍රදාන**

අයභාරයට අදාළ ප්‍රදාන සවිස්තරාත්මක අයභාර ප්‍රකාශයේ බැර කිරීමක් ලෙස ඉදිරිපත් කරනු ලබන අතර විකල්පමය ලෙස අදාළ වියදම් වාර්තා කිරීමේදී ඒවා අඩු කිරීම සිදු කරයි.

6. **ආයෝජනය**

රු. 560,974,852ක ආයෝජනය ජාතික විද්‍යා පදනම SLINTECහි සිදු කරන ලද ආයෝජනය නියෝජනය කරයි.

7. **ණයගැතියෝ**

වසර 3 කට අධික කාලයක් තුළ නොගෙවා පවතින ණය සඳහා ජාතික විද්‍යා පදනම අනුමාන ණය සපයයි.

8. **රැකියාභී ප්‍රතිලාභ**

සියලුම රැකියාලාභීන් EPF හා ETF මගින් ආවරණය කරනු ලැබ ඇත. පවතින සුබසාධන පහසුකම්වලට අමතරව අනුමත වෛද්‍ය යෝජනා ක්‍රමයක් සපයනු ලැබ තිබේ.

9. **විශ්‍රාමික පාරිතෝෂිකය**

එක් වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද රැකියාලාභීන් උදෙසා විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා වගකීමට අදාළව ගිණුම්වල මුදල් වෙන් කොට තිබේ.

| | රු ශත |
|---|---:|
| වසර සඳහා ගෙවන ලද ප්‍රමාණය | 2,902,580.50 |
| වසර සඳහා වෙන් කරන ලද ප්‍රමාණය | 5,774,458.00 |

10. 2016.12.31 වන විට ජාතික විද්‍යා පදනමට වාහන 7ක් හිමිව පැවතුණි.
**2016 වසර තුළ මෝටර් රථ දෙකක් විකුණන ලදි.**

| | | |
|---|---|---|
| 1. | මෝටර් කාරය | 19-6809 |
| 2. | ඩබල් කැබ් රථය | 50-8507 |

**2016 වසර තුළ භාණ්ඩාගාරයෙන් ලබා ගත් අරමුදල්**

| | | |
|---|---|---|
| සමුච්ඡිත අරමුදල් | රු. | 231,815,425.00 |
| පුනරාවර්තන අරමුදල් | රු. | 113,249,500.00 |

**"අ" සටහන**

**අදාළ ඒකක සඳහා ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම**

| | | රු. |
|---|---|---|
| 1. | පර්යේෂණ ප්‍රදාන | 114,000,000.00 |
| 2. | විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍ය | 3,000,000.00 |
| 3. | විවිධ වියදම් - වෙනත් අංශ | 102,815,865.55 |
| 4. | වත්කම් පවරා ගැනීම | 11,999,559.45 |
| | | **231,815,425.00** |

**1968 සිට 2015 දක්වා භාණ්ඩාගාරයෙන් ලබාගත් අරමුදල්**

| | | රු. |
|---|---|---|
| සමුච්ඡිත අරමුදල් | රු | 1,985,112,551.45 |
| විදේශ ආධාර | රු | 338,908,549.60 |

**සටහන අංක 12**

**12.1 ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය**

| | | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| 1. | NSLRC ග්‍රන්ථ | 6,450.00 | 39,300.25 |
| 2. | ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය | 672,220.49 | 2,179,612.29 |
| 3. | ජාත්‍යන්තර දත්තපාදක | 4,797,776.40 | 3,197,122.96 |
| 4. | NSLRC වැඩමුළු හා සම්මන්ත්‍රණ | (574,716.00) | 132,410.97 |
| 5. | විද්‍යා හා තාක්ෂණ ලිඛිතයන්ගේ | 45,241.00 | 12,064.42 |
| 6. | සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාලයට වෙනත් උපකාර | 37,083.00 | 98,599.00 |
| 7. | කම්ටු සාමාජිකයන්ට දිරිදීමනා ගෙවීම් | - | 36,004.00 |
| 8. | SLSI දත්තපාදක | - | 11,774.30 |
| 9. | පර්යේෂණ තොරතුරු වෙත විවෘත ප්‍රවේශය | - | 2,640.00 |
| | | **4,984,054.89** | **5,709,528.19** |

### 12.2 පර්යේෂණ ප්‍රදාන වියදම්

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. පර්යේෂණ ප්‍රදාන හා වෙනත් විද්‍යාත්මක කටයුතු වියදම් | 115,056,022.94 | 144,848,405.93 |
| 2. පර්යේෂණ ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව | 5,902,257.16 | 8,115,905.00 |
| 3. වසර සඳහා සත්‍ය වියදම | 120,958,280.10 | 152,964,310.93 |
| 4. උපචිත වියදම | 251,000.00 | 41,550.00 |
| | **121,209,280.10** | **153,005,860.93** |

### 12.3 වෙනත් ප්‍රාග්ධන ඒකක වියදම්

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. ජාත්‍යන්තර සම්බන්ධතා | 20,466,293.87 | 11,744,239.53 |
| 2. විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය | 17,828,081.98 | 18,271,609.47 |
| 3. තොරතුරු තාක්‍ෂණ ඒකකය | 9,927,207.59 | 1,672,614.26 |
| 4. වත්කම් සඳහා ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම | - | 46,061.10 |
| 5. අධ්‍යක්‍ෂ ජනරාල්ගේ කාර්යාලයේ වැය ශීර්ෂය | 14,336,966.15 | 5,423,856.00 |
| 6. විද්‍යා හා තාක්‍ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය | 5,049,906.74 | 6,918,041.51 |
| 7. තාක්‍ෂණික අංශය | 26,913,239.22 | 37,235,708.87 |
| 8. ජාත්‍යන්තර සබඳතා අංශය | 4,422,937.79 | 2,217,602.10 |
| 9. ජාත්‍යන්තර සබඳතා **OSTP** | 12,343,163.80 | 3,669,002.69 |
| | **111,287,797.14** | **87,198,735.53** |

## සටහන අංක 11

**11.1 ප්‍රකාශන අලෙවියේ දළ ශුද්ධ ලාභය/(පාඩුව)**

| | 2016 |
|---|---|
| | රු. |
| 1. වෙනත් ප්‍රකාශන | 1,895.00 |
| 2. ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාව වෙළුම 37 | (200.00) |
| 3. ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාව වෙළුම 38 | 8,900.00 |
| 4. ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාරසඟරාව වෙළුම 39 | 3,900.00 |
| 5. විදුරාව | 100.00 |
| 6. MAB ප්‍රකාශන | 50.00 |
| 7. MAB පිරික්සුම් ලැයිස්තුව | (180.46) |
| 8. ශ්‍රී ලංකාවේ භාවිත ඖෂධීය ශාක | 7,500.00 |
| 9. ශ්‍රී ලංකාවේ භූ ගත ජල තත්ව | 1,500.00 |
| 10. JNSF වෙළුම 38 | 2,500.00 |
| 11. JNSF වෙළුම 42 | (1,500.00) |
| 12. JNSF වෙළුම 43 | 28,892.50 |
| 13. JNSF වෙළුම 44 | 84,861.25 |
| 14. විදුරාව වෙළුම 31-1 (ඉ) | 100.00 |
| 15. විදුරාව වෙළුම 31-2 (දෙ) | 100.00 |
| 16. විදුරාව වෙළුම 31 - විශේෂ (සි) | (5,250.00) |
| 17. විදුරාව වෙළුම 31 - විශේෂ (ඉ) | 950.00 |
| 18. විදුරාව වෙළුම 32-1 (සි) | (1,650.00) |
| 19. විදුරාව වෙළුම 32-1 (ඉ) | 100.00 |
| 20. විදුරාව වෙළුම 32-1 (දෙ) | (500.00) |
| 21. විදුරාව වෙළුම 32-2 (සි) | (164,900.00) |
| 22. විදුරාව වෙළුම 32-2 (ඉ) | (125,800.00) |
| 23. විදුරාව වෙළුම 32-2 (දෙ) | 24,800.00 |
| 24. විදුරාව වෙළුම 32 - විශේෂ (ඉ) | 5,950.00 |
| 25. විදුරාව වෙළුම 32 - විශේෂ (සි) | 58,050.00 |
| 26. විදුරාව වෙළුම 31 - විශේෂ (දෙ) | 100.00 |
| 27. විදුරාව වෙළුම 33-1 (ඉ) | 15,750.00 |
| 28. විදුරාව වෙළුම 33-1 (සි) | 14,700.00 |
| 29. විදුරාව වෙළුම 33-1 (දෙ) | 69,900.00 |
| 30. විදුරාව වෙළුම 33-2 (ඉ) | 129,700.00 |
| 31. විදුරාව වෙළුම 33-2 (සි) | 166,100.00 |
| | **326,418.29** |

### 11.2 ජාතික කමිටු වියදම්

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. MAB වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව | 152,500.00 | 171,500.00 |
| 2. සමාජ විද්‍යා ජාතික කමිටුව | 55,000.00 | 93,070.00 |
| 3. JNSF සංස්කරණ මණ්ඩලය | 244,405.00 | 269,817.35 |
| | **451,905.00** | **534,387.35** |

### 11.3 ජාතික විද්‍යා පුස්තකාලය හා සම්පත් මධ්‍යස්ථානය

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. නඩත්තු හා අලුත්වැඩියා | 35,365.16 | 7,356.90 |
| 2. දේශීය හා විදේශීය වාරසඟරා | 302,848.59 | 911,195.35 |
| 3. පරිභෝජ්‍ය | 33,257.00 | 56,122.82 |
| | **371,470.75** | **974,675.07** |

### 11.4 මුද්‍රණ ඒකකය

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. පාරිභෝජ්‍ය හා රසායන ද්‍රව්‍ය | 927,871.45 | 707,072.84 |
| 2. කඩදාසි කොළ සහ ඝන කඩදසි | (41,354.66) | (47,710.36) |
| 3. නඩත්තුව සහ අලුත්වැඩියා | 94,389.85 | 291,538.34 |
| | **980,906.64** | **950,900.82** |

### සටහන අංක 01 මුදල් හා මුදල් සමක

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| **බැංකු ගිණුම්** | | |
| 1. ලංකා බැංකුව 0002323269 | 10,466,195.60 | 4,110,525.92 |
| 2. ලංකා බැංකුව 0002323270 | 2,084,869.10 | 146,623.26 |
| 3. ලංකා බැංකුව 0002322471 | 2,910,025.37 | 2,849,489.12 |
| 4. ලංකා බැංකුව 0002323376 | - | 5,110.55 |
| 5. ලංකා බැංකුව RFC/USD 2872719 | - | 15,646.05 |
| 6. ලංකා බැංකුව RFC/USD LOICZ 2872732 | - | 3,242,430.52 |
| 7. විශේෂ මුදල් ඇගිමය | 50,000.00 | 50,000.00 |
| 8. සුළු මුදල් | 5,000.00 | 5,000.00 |
| 9. අතැති මුදල් සහ චෙක් පත් | 7,164,301.97 | 3,069,945.87 |
| | **22,680,392.04** | **13,494,771.29** |

**සටහන අංක 02- අයවිය යුතු**

**මුදල් අත්තිකාරම්**

| | | | |
|---|---|---|---|
| 1. විවිධ | **උපලේඛනය** 1 | 3,446,192.33 | 759,860.00 |
| 2. පර්යේෂණ | **උපලේඛනය** 1 | 100,000.00 | 100,000.00 |
| 3. **කාර්යමණ්ඩලය සඳහා ණය** | | | |
| i. ආපදා ණය | **උපලේඛනය** 2 | 5,062,875.00 | 4,959,964.00 |
| ii. යතුරු පැදි ණය | **උපලේඛනය** 3 | - | 833.00 |
| iii. ඒකාබද්ධ ණය | **උපලේඛනය** 4 | 123,008.00 | 189,251.00 |
| iv. පාපැදි ණය | **උපලේඛනය** 5 | - | - |
| 4. උත්සව අත්තිකාරම් | **උපලේඛනය** 6 | 22,500.00 | 36,250.00 |
| 5. කාර්යමණ්ඩල ණය ගැතියෝ | **උපලේඛනය** 7 | 73,921.83 | 63,013.08 |
| 6. සුළු ණය ගැතියෝ | **උපලේඛනය** 8 | 584,202.31 | 7,146,132.76 |
| **අඩු කළා:** අනුමත ණය සඳහා වෙන් කරන ලද මුදල් | | - | (87,399.42) |
| | | **9,412,699.47** | **13,167,904.42** |

**සටහන 02.1**

| **කාර්යමණ්ඩල ණය ගෙවීම්** | **ප්‍රමාණය** | **වසරක් තුළ** | **වසරකට පසු** |
|---|---|---|---|
| ඒකාබද්ධ ණය | 123,008.00 | 46,128.00 | 76,880.00 |
| ආපදා ණය | 5,062,875.00 | 1,632,384.00 | 3,430,491.00 |
| යතුරු පැදි ණය | - | - | - |
| | **5,185,883.00** | **1,678,512.00** | **3,507,371.00** |

**සටහන අංක 03 - තොග**

| | | | |
|---|---|---|---|
| 1. ලිපිද්‍රව්‍ය හා පරිභෝජ්‍ය | **උපලේඛනය** 9 | 1,524,614.43 | 982,850.11 |
| 2. ප්‍රකාශන | **උපලේඛනය** 9 | 692,114.38 | 538,467.24 |
| | | **2,216,728.81** | **1,521,317.35** |

**සටහන අංක 04 - වෙනත් ජංගම වත්කම්**

| | | |
|---|---|---|
| 1. භාණ්ඩාගාර තැන්පතු | 3,298,965.20 | 3,299,030.09 |
| 2. ආපසු ගෙවිය හැකි තැන්පතු | 108,650.00 | 108,650.00 |
| | **3,407,615.20** | **3,407,680.09** |

**සටහන අංක 06 - ආයෝජන**

| | | |
|---|---|---|
| 1. SLINTEC | 560,974,852.00 | 560,974,852.00 |
| | **560,974,852.00** | **560,974,852.00** |

**සටහන අංක 07 - සැබෑ වියදම්**

| | | | |
|---|---|---|---|
| 1. සැබෑ වියදම් | **උපලේඛනය 10** | 6,091,227.02 | 4,443,574.93 |
| | | **6,091,227.02** | **4,443,574.93** |

**සටහන අංක 08 - ණයහිමියෝ**

පහත සඳහන් කර ඇති පරිදි ජාතික විද්‍යා පදනම මගින් රඳවා ගනු ලැබ ඇති මුදල් රු. 7,294,437.84 ණයහිමියන් නියෝජනය කරයි.

| | | | |
|---|---|---|---|
| 1. කාර්යමණ්ඩල ණයහිමියෝ | **උපලේඛනය 11** | 54,405.00 | 50.00 |
| 2. ස්ටෙපාන් වැඩමුළුව | | - | 1,436,573.03 |
| 3. ජාතික විද්‍යා මධ්‍යස්ථානය | | 1,968,000.00 | 2,496,000.00 |
| 4. සෞඛ්‍ය විද්‍යා ව්‍යාපෘතිය | | 4,066,155.54 | - |
| 5. කුරුළු ව්‍යාපෘතිය | | 1,185,877.30 | - |
| | | **7,274,437.84** | **3,932,623.03** |

**සටහන අංක 09 - විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා වෙන් කළ මුදල්**

| | | |
|---|---|---|
| **2016.01.01 වන විට ශේෂය** | 22,533,284.50 | 21,413,460.08 |
| (+) වසර සඳහා වෙන් කළ මුදල් | 5,774,458.00 | 2,143,414.42 |
| | 28,307,742.50 | 23,556,874.50 |
| (-) වසර තුළ ගෙවූ මුදල් | (2,902,580.50) | (1,023,590.00) |
| **2016.12.31 වන විට ශේෂය** | **25,405,162.00** | **22,533,284.50** |

**සටහන අංක 10 - අසමාන අයහාර**

| | | | |
|---|---|---|---|
| 1. අසමාන අයහාරය - වත්කම් | **"අ" සටහන** | 44,078,213.07 | 37,943,804.12 |
| | | **44,078,213.07** | **37,943,804.12** |

**"අ" සටහන - අසමාන අයහාරය - වත්කම්**

| | | |
|---|---|---|
| **2016.01.01 දිනට ශේෂය** | 37,943,804.12 | 34,082,742.40 |
| (+) ප්‍රාග්ධනීකරණය කරන ලද වත්කම් | 19,389,559.45 | 14,483,007.61 |
| | 57,333,363.57 | 48,565,750.01 |
| (-) අසමාන ක්ෂයවීම් | (13,255,150.50) | (10,621,945.89) |
| **2016.12.31 දිනට ශේෂය** | **44,078,213.07** | **37,943,804.12** |

# විගණකාධිපතිතුමාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ඩීආර්සී/බී/එන්එස්එෆ්/1/16/44 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ජූලි [illegible] දින

සභාපතිනි,

ජාතික විද්‍යා පදනම

**ජාතික විද්‍යා පදනමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික විද්‍යා පදනමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ)වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් පදනමේ සභාපතිනිය වෙත 2017 ජූනි 02 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්කර්ෂතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබා දෙන ලද තාක්ෂණ ප්‍රදාන ව්‍යාපෘති 02ක් සමාලෝචිත වර්ෂයේ දී අවසන් වී තිබුණු නමුත් එම ව්‍යාපෘතිවල ඉතිරි මුදල්වල එකතුව රු.840,089 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,988,509ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.21,472,454 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,483,945ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන හා රු.7,217,500 කින් හා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය රු.3,621,777 කින් හා වෙනත් ආදායම් රු.8,416,573 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 හා 2014 වර්ෂවලදී හැර අනෙකුත් වර්ෂවලදී හැර අනෙකුත් වර්ෂවලදී ඌනතාවයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු පදනමේ දායකත්වය 2012 වර්ෂයේ දී රු. 60,737,204ක් වූ අතර 2016 වර්ෂය වන විට එය රු. 96,693,217ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 10 වගන්තිය ප්‍රකාරව ජාතික විද්‍යා පදනමේ කර්තව්‍යයන් ලෙස,

- විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් පර්යේෂණ පුහුණු කිරීමේ අදහසින් විශ්වවිද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන හා විද්‍යාඥයන්ට පර්යේෂණ ආරම්භ කිරීම පහසු කිරීම සඳහා සහාය වීම
- දේශීය හා විදේශීය විද්‍යාඥයින් අතර තොරතුරු හුවමාරු කර ගැනීම ධෛර්යමත් කිරීම.
- විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව පිරිනැමීම.
- විද්‍යා හා කාර්මික පිරිස් පිළිබඳ ප්‍රවර්තන ලේඛනයක් පවත්වාගෙන යාම හා,
- ජනතාව අතර විද්‍යාව ජනප්‍රිය කිරීමේ කාර්ය සඳහා වැඩසටහන්වලට අරමුදල් යෙදවීමෙන් විද්‍යාව ජනප්‍රිය කිරීම දක්වා තිබුණි.

ඉහත කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වටිනාකම රු.මිලියන 111.29 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 64 ක් අවසන් කර තිබුණු අතර එම ව්‍යාපෘතිවල අවසාන ප්‍රතිඵල ලෙස දේශීය හා විදේශීය විද්‍යාත්මක ප්‍රකාශන පල කිරීම, පශ්චාත් දර්ශනපති, දර්ශනශූරි උපාධි සඳහා යොදා ගැනීම හා ජනාධිපති සම්මාන සඳහා නිර්දේශ වීම යන අරමුණු ඉටුවී තිබුණ ද, එම ව්‍යාපෘති 64 න් කිසිදු ව්‍යාපෘතියක් සඳහා තාක්ෂණ පැවරුම් (වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කිරීම) ලබා දීම හෝ කිසිදු ව්‍යාපෘතියක් සඳහා පේටන්ට් ලබා ගැනීම සිදු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ නිම කරන ලද රු.මිලියන 27.53 ක් වටිනා පර්යේෂණ ව්‍යාපෘති 21 ක් අතුරින් එකම පර්යේෂණ ව්‍යාපෘතියක්වත් 2016 වර්ෂයේදී වාර්ෂික පර්යේෂණ සම්මාන හිමිකර ගැනීම සඳහා සුදුසුකම් ලබාගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ ව්‍යාපෘතිවල අවසන් වාර්තා ලබා ගැනීම හා ඇගයීම් සිදු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පර්යේෂණ ප්‍රදාන ලබා දීමට අදාළ ගිවිසුමේ 5.1 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතිය නිම කර මාස 3 ක් ඇතුළත වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් රු.18,714,921 ක් වැයකර නිම කළ පර්යේෂණ ව්‍යාපෘති 10 ක් සඳහා අවසාන වාර්තා නිකුත් කර තිබුණේ මාස 3ක සිට වර්ෂ 02ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පසුව බව විගණනයේදී අනාවරණය විය.

(ii) 2014 හා 2016 වර්ෂවලදී අවසන් වූ රු.2,649,000 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 02 ක අවසන් වාර්තා ලබා දිය යුතු කාලය පිළිවෙලින් මාස 29 ක් හා මාස 10 ක් ප්‍රමාද වී තිබුණ ද, අවසන් වාර්තා ලබා ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) උපකරණ ප්‍රදාන ලබා දීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4(b) වගන්තිය ප්‍රකාරව මුදල් ලබා දී මාස 5 ක් ඇතුළත උපකරණ මිලදී නොගතහොත් ප්‍රදාන මුදල් නැවත අයකර ගත යුතු වුවත්, ප්‍රදානයන් 07 කට අදාළව වටිනාකම රු.4,727,219 ක් වූ උපකරණ මිලදී ගැනීමේදී මාස 03 ක සිට මාස 10 ක් දක්වා පරාසයක ප්‍රමාදයන් සිදු වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරගෙන තිබූ අයවැය ලේඛනය අවස්ථා 02 කදී සංශෝධනය කරගෙන තිබුණ අතර, අවසන් වරට ඉදිරිපත් කළ සංශෝධිත අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සැසඳීමේදී සියයට 20 සිට සියයට 92 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මානව සම්පත් කළමනාකරණය | සුදුසුකම් හා පළ පුරුද්ද තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වන සහතිකපත්වල සහතික කළ පිටපත්, දිවුරුම් හෝ ප්‍රතිඥාව හා වෛද්‍ය වාර්තා පෞද්ගලික ලිපිගොනු තුළ ඇතුළත් නොවීම. |
| (ආ) පර්යේෂණ ප්‍රදාන ලබාදීම හා අධීක්ෂණය පාලනය | (i) ප්‍රදානවලට අදාළ මූල්‍ය වාර්තා නිසි වේලාවට ලබාගෙන ප්‍රදාන ලෙජරය යාවත්කාලීන නොකිරීම.<br>(ii) අවසන් වූ පර්යේෂණ ව්‍යාපෘතිවල ඉතිරි මුදල් කඩිනමින් පවරා නොගැනීම හා ඇගැයීම් කටයුතු කඩිනමින් සිදු නොකිරීම. |
| (ඇ) උපකරණ ප්‍රදාන ලබා දීම පාලනය | (i) උපකරණ මිලදී ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වීම.<br>(ii) උපකරණ ප්‍රදානය කළ ආයතනයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ, භාණ්ඩ ලැබීම් පත්‍රයේ සහ වසර දෙකක නඩත්තු ගිවිසුමේ පිටපතක් ලබාගෙන පැවැත්ම තහවුරු කර නොගැනීම හා අදාල පිටපත් කඩිනමින් ලබානොගැනීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විගණන වාර්තා පිළිබඳව ජාතික විද්‍යා පදනමේ අදහස්

ජාතික විද්‍යා පදනමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත හා බැඳේ. ඒ සඳහා ආයතනයේ නිරීක්ෂණ පහත දැක්වේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** මතය

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** ගිණුම්කරණ අඩුපාඩු

විගණන වර්තාවෙන් ඉල්ලා ඇති පරිදි ආදායම් වියදම් වෙන් වෙන්ව දක්වා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය නිවැරදි කර නැවත දින 03ක් ඇතුළත ලබා දෙන ලදී. (*ඇමුණුම 01*)

**2.3** ලැබිය යුතු ගිණුම්

පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් වී, විගණන දිනය වන විට පියවා නොතිබුණ ව්‍යාපෘති 6 කට අදාලව ලැබිය යුතු රු. 452,360/-. ක් වූ ශේෂය දැනට රු. 65,377/- ක් වේ. ඒ අනුව RG/2012/ESA/01 රු. 48,837/- හා RG/2014/SS/01 රු. 16,540/- යන ව්‍යාපෘති 2 කට අදාළ ශේෂයන් හැර අනෙකුත් ප්‍රදානයන්ට අදාල ශේෂයන් පියවා අවසන් කර ඇත.

**2.4** නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

අ) මෙම පරීක්ෂණය සඳහා ඒක පුද්ගල විනිශ්චය සභාවක් 2015 නොවැම්බර් 13 දින පත්කර තිබුන ද පැමිණිල්ල මෙහෙයවන නිලධාරියකු පත්කරන ලද්දේ 2016.01.28 දිනය. විධිමත් විනය පරීක්ෂණයේ පළමු සැසි වාරය 2016.02.11 දින පැවැත්වීමට කටයුතු කර ඇත.

2016.02.11 ආරම්භක දින සිට 2017.06.01 වන දිනට 33 ක් සැලසුම් කරන ලද අතර දෙපාර්ශ්වයේම විවිධ ඉල්ලීම් මත පරීක්ෂණ සැසිවාර 10ක් ම කල් දැමීමට සහ නොපැවැත්වීමට සිදු වී ඇත. මූලික විමර්ශන වාර්තාව පිටු 200 කින් පමණ සමන්විත විස්තරාත්මක මූලික පරීක්ෂණ වාර්තාවක් වන අතර විධිමත් විනය පරීක්ෂණයේදී රැකවරණ නිලධාරි විසින් මූලික විරෝධතා 11ක් දීර්ඝ ලෙස ඉදිරිපත් කිරීමටත්, නැවත විරෝධතා ඉදිරිපත් කිරීමටත් සහ මූලික පරීක්ෂණ නිලධාරි වරයාගේ දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න විමසීමටත් සැලකිය යුතු කාලයක් ගතවිය. මූලික පරීක්ෂණ වාර්තාව සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ නිලධාරි වරයාගෙන් විමසීම, හරස් ප්‍රශ්න විමසීම සහ නැවත ප්‍රශ්න විමසීම 2017 අප්‍රේල් දී අවසන් කර ඇත.

එමෙන්ම අනෙකුත් සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විමසීම ද සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් අතුරු වාර්තාවක් 2017.06.01 දින ලැබී ඇති අතර එය 2017.06.20 දින කළමණාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර කළමණාකරණ මණ්ඩලයේ තීරණ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්ය සාධනය

අ) i) ජාතික විද්‍යා පදනමට පනත අනුව පවරන ලද කාර්යයන් (Mandate) අනුව මූලික (Basic) හා ව්‍යවහාරික (Applied) යන පර්යේෂණ ප්‍රදානයන් වර්ග දෙකම සඳහා ප්‍රතිපාදන ලබාදිය යුතු වේ.

එසේ ප්‍රතිපාදන ලබාදෙන පර්යේෂණ සියල්ල වාණිජකරණය කිරීම සඳහා වැඩි දියුණු කිරීමට යොමුකල හැකි නොවන අතර අවසන් වාර්තාවන්හි section 4 මගින් පර්යේෂණ සොයාගැනීම් වාණිජකරණය කිරීම සඳහා කල හැකි වැඩි දියුණු කිරීම් ඇතුලත් කරන ලෙස ද ප්‍රදානලාභීන් දැනුවත් කර ඇත.

සියලුම පර්යේෂණ ප්‍රදානයන් පේටන්ට් ලබා ගැනීමට ඉදිරිපත් කල හැකි අවසන් ප්‍රතිඵලයක් නොලබන අතර, එසේ පේටන්ට් ලබා ගැනීමට ඉදිරිපත් කළ හැකි පර්යේෂණ ප්‍රදාන අතරින් ඒ සඳහා කැමැත්ත දක්වන ප්‍රදානලාභීන්ට පමණක් ජාතික විද්‍යා පදනමෙහි තාක්ෂණ අංශය හරහා ඊට ඉල්ලුම් කල හැක.

පර්යේෂණ ප්‍රදානයන් පේටන්ට් ලබා ගැනීමට දිරිමත් කිරීම සඳහා අදාල පර්යේෂණය ප්‍රදානය කිරීමට පෙර පර්යේෂණ අයදුම් පත මගින් ද , ප්‍රදානය කල පසු අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා මගින් ද පේටන්ට් ලබාගැනීම පිළිබඳ සියළු විස්තර පර්යේෂණ අංශය මගින් ලබා ගැනීමට කටයුතු කර ඇත. ඉදිරියේ දී පර්යේෂණ ප්‍රදානයන් සඳහා අයදුම් පත් ඇගයීමේ දී පේටන්ට් ලබාගැනීමට හැකියාව ඇති පර්යේෂණ පිලිබඳ ව විශේෂ අවධානය යොමු කරනු ඇත.

ඊට අමතරව පේටන්ට් ලබා ගැනීම සඳහා කැමැත්ත දක්වන්නන්ට ඒ සඳහා උදව් කිරීම සඳහා පේටන්ට් ලබා ගැනීමේ උපදේශක සේවාවක් (Patent Help Desk) ද තාක්ෂණ අංශය ආරම්භ කළ දින සිට තාක්ෂණ අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ.

එසේම ජාතික විද්‍යා පදනමෙහි තාක්ෂණ අංශය මගින් වාණිජකරණය කිරීම සඳහා හැකියාව ඇති නව තාක්ෂණික වැඩි දියුණු කිරීම් හා නව තාක්ෂණය පදනම් කර ගත් නව ව්‍යාපාර වෙනුවෙන් වෙනම ප්‍රදානයන් ලබාදෙන අතර ඒවායින් අවසන් ප්‍රතිඵලයන් ලබා ගෙන ඇත. (*ඇමුණුම 02*)

ජාතික තේමා මූලික පර්යේෂණ (National Thematic Research Program) ප්‍රදාන ලබාදීමේ වැඩසටහන අනුව ද 2012 සිට ජාතික විද්‍යා පදනම විසින් අවසන් ප්‍රතිඵලයක් ලැබිය හැකි පර්යේෂණ ව්‍යාපෘතීන් හඳුන්වා දී ඇත. එම ප්‍රදානයන් මඟින් ලබාගත් අවසන් ප්‍රතිඵලයන් *ඇමුණුම 03* හි දක්වා ඇත.

ජාතික විද්‍යා පදනම විසින් වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කළ හැකි හා පේටන්ට් ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමටත් හැකි වන අවසන් ප්‍රතිඵලයක් සහිත ප්‍රදානයන් හි අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර ඒ සඳහා ක්‍රමිකව යොමු වෙමින් සිටී.

ii) ඇතැම් මූලික පර්යේෂණ ප්‍රදාන (fundamental projects) වැදගත් සොයා ගැනීම් සමග සාර්ථකව නිමකල ද ඒවායේ ප්‍රායෝගික යොදා ගැනීම් වල යම් යම් සීමාවන් ඇත. කෙසේ වෙතත්, එම පර්යේෂණ ප්‍රදානයන්වල ප්‍රතිඵල ලෙස ප්‍රකාශන එල කිරීම, පශ්චාත්, දර්ශනපති, දර්ශනශූරී වැනි උපාධි හා සම්මාන සඳහා නිර්දේශ වීම මගින් මානව සම්පත් සංවර්ධනය ඔස්සේ රටේ ආර්ථික සංවර්ධනයේ ඉලක්කයන් ලඟා කර ගැනීමේ දී දිගු කාලීන ආයෝජනයන් ලෙස දායක වේ.

ආ) **2012, 2013,2014 වර්ෂ වලදී පර්යේෂණ සම්මාන 01 බැගින් හා 2013 වසරේ දී ඇගයීම් සහතිකපත් 03ක් පිරිනමා ඇත.**

මෙම සම්මානය ප්‍රදානය කිරීමේ අරමුණ වනුයේ විද්‍යාව වැඩි දියුණු කිරීමට කළ දායකතත්වය ඇගයීම සඳහා පර්යේෂකයන් වෙත නිසි පිළිගැනීමක් ලබා දීමය. මෙම සම්මාන යෝජනා මඟින්, ජාතික විද්‍යා පදනමෙන් පර්යේෂණ ප්‍රදාන ලබා ගත් පර්යේෂකයින් ඇගයීමට ලක් කෙරෙන අතර ඔවුන් විසින් කරන ලද විද්‍යාත්මක පර්යේෂණ උසස් ප්‍රමිතියකින් පවත්වා ගැනීම වෙනුවෙන් ප්‍රදානලාභීන් දිරිමත් කිරීමටද අදහස් කර ඇත.

එම නිසා මෙම සම්මාන ප්‍රදානයේ උසස් ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් පහත සඳහන් පරිදි නිර්ණායක පවත්වාගෙන යයි.

සම්මාන සඳහා මූලික තෝරා ගැනීමටඅවසන් වාර්තා,

- "ඉතා හොඳයි" හෝ "හොඳයි" ශ්‍රේණිගතව පිළිගත යුතුය.
- අනුමත දිගු කාලය සහිතව ව්‍යාපෘති කාලය සම්පූර්ණ වී මාස 03ක් ඇතුළත (හෝ ගිවිසුමට අනුකූලව) ඉදිරිපත් කළ යුතුය.
- අදාල කමිටුවේ නිර්දේශය තිබීම සපුරාලිය යුතුය.

විවිධ කමිටු මඟින් ගන්නා ලද තීරණ එකඟ කිරීම සඳහාත්, නම් කරන ලද විචාරකයින් තව දුරටත් විචාරණය සඳහා තෝරා ගැනීමේඅවසන් තීරණය සඳහාත්, සම්මානයට සුදුසුකම්ලත් අවසන් වාර්තා පර්යේෂණ උපදේශක මණ්ඩලය (Research Advisory Board) වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පර්යේෂණ උපදේශක මණ්ඩලය මඟින් <u>දේශීය විචාරකයින් දෙදෙනෙකු සහ විදේශීය විචාරකයකු</u> නිර්දේශ කළ පසු එය ජාතික විද්‍යා පදනමේ කළමණාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අතර කළමණාකරණ මණ්ඩලයේ නිර්දේශය ලබා දුන් පසු අවසන් වාර්තාව *ඇමුණුම 04* හි ඇති නිර්ණායක වලට අනුකූලව විචාරණය කිරීම සඳහා යවනු ලැබේ.

අවසාන වශයෙන්, සමාලෝචන වාර්තා ලැබුනු පසු තෝරා ගත් අවසන් වාර්තා වල ප්‍රදාන ලාභීන් පර්යේෂණ උපදේශක මණ්ඩලය සමඟ සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සමාලෝචන වාර්තා සහ ඉදිරිපත් කිරීම මත, පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් සුදුසු අවසන් වාර්තා පිළිබඳව නිර්දේශය තීරණය කරනු ලැබේ.

සම්මාන සඳහා තෝරා ගනුයේ ඉහත සඳහන් කළ නිර්ණායක මත වන බැවින් ඇතැම් අවුරුදු වල සම්මාන සඳහා සුදුසුකම් ලබන අවසන් වාර්තා නොමැති වේ. මින් තහවුරු වන්නේ සම්පූර්ණ කරන ලද ප්‍රදානයන්ගෙන් සමාජීය හෝ ආර්ථික ප්‍රතිලාභ නොමැති බව නොව,මෙම අවසන් කරන ලද ව්‍යාපෘති වාර්තා සම්මාන සඳහා සුදුසුකම් ලැබීමට නියමිත නිර්ණායක එකක් හෝ කිහිපයක් සපුරාලීම අසමත් වූ බවයි.

කෙසේ වුවද විගණන වාර්තාව මඟින් පෙන්වා දී ඇති කරුණු අනුව වාර්ෂික සම්මාන සඳහා පර්යේෂකයන් සුදුසුකම් ලබා නොතිබීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී කමිටු (Working Committee) වල වැඩි අවධානය යොමුකිරීමටත් ජාතික විද්‍යා පදනම මේ පර්යේෂනයන්හි ප්‍රමිතිය පවත්වා ගනිමින් ඒ සම්බන්ධ වැඩිදියුණු කිරීම් කිරීමටද අවධානය යොමුකරනු ඇත.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

අ)

**(i)** නියමිත දිනයන් සිට සති 03ක් ඇතුලත හෝ ප්‍රමාදයකින් තොරව ලබා දුන් අවසන් වාර්තා

| ප්‍රදාන අංකය | අවසන් වාර්තාව ලබා දීමට නියමිත වූ දිනය | ලබා දුන් දිනය |
|---|---|---|
| RG/2012/BS/02 | **10/02/2016** | 18/12/2015 |
| RG/2012/BS/03 | 15/02/2017 ( **15/11/2015** දක්වා කාලය දිගු කර ඇත) | 05/12/2016 |
| RG/2011/ES/04 | **21**/**05**/2015 | 18/12/2014 |
| RG/2011/BT/09 | 19/10/2016 | 19/10/2016 |
| RG/2012/AG/03 | 08/11/2015 | 11/11/2015 (දින **03** ප්‍රමාදයි) |
| RG/2012/BT/01 | 08/**08**/2015 | 26/08/2015 (දින **17** ප්‍රමාදයි) |

පහත අවසන් වාර්තා ප්‍රමාද වන ලද්දේ ප්‍රදානලාභීන්ට මුහුණපෑමට සිදු වූ ගැටළුකාරී තත්වයන්ය. පෙර නිගමනයට කළ නොහැකි මූල්‍ය සීමාවන්, ආයතනයන්හි ප්‍රසම්පාදන ගැටළු සහ ඇතැම් තාක්ෂණික ගැටළු මෙයට හේතු විය. ඇතැම් ප්‍රදානලාභීන් අරමුදල් නොමැතිව පර්යේෂණ සඳහා දිගුවක් ඉල්ලා සිටියේ අවසන් වාර්තාව ලබා දීමට නියමිත දිනයට ද පසුවයි. ජාතික විද්‍යා පදනමේ නීතී රෙගුලාසි වලට අනුව මෙම ඉල්ලීම අනුමත කළ නොහැකි වූ අතර ඒ බව ප්‍රදානලාභීන් හට දැනුම්දුන් අතර අනතුරුව ඔවුන් අවසන් වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදි.

අවසන් වාර්තා ප්‍රමාදයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| ප්‍රදාන අංකය | අවසන් වාර්තාව ලබා දීමට නියමිත වූ දිනය | ලබා දුන් දිනය | හේතු දැක්වීම |
|---|---|---|---|
| RG/2011/NRB/01 | 28/**07**/2014 | **31**/12./2015 | ප්‍රදානලාභියා **2015/12/31** වන දින අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. මෙහි පර්යේෂණ සහකරු පරිවාස කතිකාචාර්යවරයෙකු වන අතර ඔහුට වසර **02**ක් සඳහා පමණක් නිවාඩු අනුමත වී ඇත. තවද ප්‍රදාන ලාභියා ද මෙම කාලය තුල ශිෂ්‍යත්වයක් ලබා දිවයිනෙන් බැහැරව සිට ඇත. ප්‍රදාන ලාභියාගේ නැවත පැමිණීමෙන් පසු තම වියදමෙන් තාක්ෂණික සහකාර නිලධාරියෙකු පත් කරගෙන ඇති අතර ඉතුරු ව්‍යාපෘති වැඩ හා අවසාන වාර්තාව එමගින් නිම කර **15/2/2016** ලබා දී ඇත. |
| RG/2011/ES/03 | 29/**0**5/2015 | **15**/**02**/2016 | ප්‍රදාන ලාභියා **2016/02/15** වන දින අවසාන වාර්තාව ඉදිරිපත් කර ඇති අතර ක්‍රියාකාරී කමිටුවේ තීරණය අනුව මෙම වාර්තාව සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට (විචාරකයාගේ අදහස් පරිදි) තීරණය කරන ලදි. |
| RG/2012/EB/02 | 16/**03**/2016 | 19/**09**/2016 | මෙම ව්‍යාපෘතිය **2015/12/16** වන දින අවසන් වී ඇති අතර අවසන් වාර්තාව **2016/03/16** වන දින ලබා දීමට නියමිත වූ අතර සිහිකැඳවීම් වලින් පසුව ප්‍රදාන ලාභියා විසින් **2016/09/19** දින ලබා දෙන ලදි. |
| RG/2011/AG/03 | **30/07/2015** | **20/09/2016** | අවසන් වාර්තාව යොමු කල යුතු දිනට පසුව ප්‍රදානලාභියා විසින් ප්‍රදානය සඳහා දිගුවක් ඉල්ලා සිටින ලදි. මෙම ඉල්ලීම ජාතික විද්‍යා පදනමේ නීතී හා රෙගුලාසි වලට අනුව සපුරාලිය නොහැකි වූ අතර එය ප්‍රදානලාභියා හට දැනුම් දෙන ලදි. අවසාන වාර්තාව **2016/09/20** දින ඉදිරිපත් කර ඇත. |
| RG/2011/AG/04 | **01/02/2015** | **04/11/2015** | ප්‍රදානලාභියාට නැවත වරක් පර්යේෂණ ක්ෂේත්‍ර ස්ථාපිත කිරීමට සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| RG/2011/AG/07 | **30/07/2016** | **30/11/2016** | සැබෑ ප්‍රමාදය මාසයකි. සිහිකැඳවීම් 02 ට පසු අවසන් වාර්තාව ලැබුණි. |
| RG/2011/AG/08 | **30/06/2015** | **11/08/**2015 | සැබෑ ප්‍රමාදය මාසයකුත් දින 11කි. අවසන් වාර්තාව 2015/08/11 එවන ලද අතර ඇගයීම සඳහා 2015/08/ 25 දින යවන ලදි. |
| RG/2011/AG/11 | **04/08/**2014 | **26/10/**2016 | අවසන් වාර්තාව ලැබිය යුතු දිනය 04/08/2014 වන දිනය. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් අත්සන යටතේ සිහිකැඳවීමක් ඇතුළු සිහිකැඳවීම් 04ක් යවන ලදි. අවසන් වාර්තාව ලබාදීමට මසක කාලයක් ලබා දුන් අතර (08th June 2016) තවත් සිහිකැඳවීම් 02කට පසු 26/10/2016 දින අවසන් වාර්තාව ලබා දෙන ලදි. |
| RG/2012/AG/05 | **01/05/2015** | **11/03/2016** | පර්යේෂණ සහකාර වෙනුවට කාර්මික සහකාර වරයෙකු භාවිතා කිරීමට සිදුවීම නිසා ප්‍රදාන ලාභියාට පර්යේෂණ කටයුතු නිසිකලට ඉටු කර ගැනීමට නොහැකි විය. මෙම ප්‍රදානලාභියා පළමුවර අයදුම්කරුවකු වූ අතර ආචාර්ය උපාධිය නිම කිරීමෙන් පසු ගත වී තිබුණේ වසර 02ක් වැනි කෙටි කාලයක් නිසාත් ජාතික විද්‍යා පදනමේ නීති හා රෙගුලාසි වලට අනුව පර්යේෂණ සහායකයෙකු සඳහා ප්‍රතිපාදන ලබාදීමට නොහැකි විය. කෙසේ වුවද 11/03/2016 දින අවසන් වාර්තාව ලබා දෙන ලදි. |
| RG/2011/BS/05 | 21/**08/**2015 | 10/**10/**2016 | ප්‍රදානලාභියා වෙත සිහි කැඳවීම් කිහිපයක් යවන ලද අතර 2015/11/09 දින නිල ලිපියක් යවන ලදි. අධ්‍යනයේ දත්ත සතු වූ උපාධිධාරී ශිෂ්‍යයා අසාධ්‍ය ලෙස රෝගාතුරු වීම හේතුවෙන් අවසන් වාර්තාව සම්පූර්ණ කිරීම ප්‍රමාද වූ බව ප්‍රදානලාභියා විසින් දන්වන ලදි. අවසන් වාර්තාව 2016/10/10 දින ලබාදුන් අතර ඇගයීමට ලක් කර ක්‍රියාකාරී කමිටුව විසින් අනුමත කරන ලදි. |
| RG/2012/ ESA/01 | 09/**07/**2016 | 15/**11/**2016 | සැබෑ ප්‍රමාදය මාසයකි. අවසන් වාර්තාව යොමු කළ යුතු දිනට පසුව ප්‍රදානලාභියා විසින් ප්‍රදානය සඳහා දිගුවක් ඉල්ලා සිටින ලදි. මෙම ඉල්ලීම ජාතික විද්‍යා පදනමේ නීති හා රෙගුලාසි වලට අනුව සපුරාලිය නොහැකි අතර එය ප්‍රදානලාභියා හට දැනුම් දෙන ලදි. අවසන් වාර්තාව 2016/11/15 දින ලබාදුන් අතර එය ඇගයීමට ලක් කරන ලදි. |
| RG/2011/BT/11 | **30/09/2015** | 04/**01/**2016 | සිහි කැඳවුම් 04 ක් සහ ඇමතුම් කීපයක් ලබාදුන් පසු අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එය ඇගයීමට ලක් කර ව්‍යාපෘතිය නිම කර ඇත. |

කෙසේ වුවත් මෙසේ ප්‍රමාද වූ අවසන් වාර්තා ලබා ගැනීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් ක්‍රමානුකූලව සිහිකැඳවීම් යවන ලදි. මෙසේ අවසන් වාර්තා ලබාදීම සම්බන්ධයෙන් වන ප්‍රමාද අවම කිරීම සඳහා නව ක්‍රමවේදයක් (ඇමුණුම 06) ජාතික විද්‍යා පදනම විසින් ක්‍රියාත්මක කරමින් පවතී.

(ii) **RG/2011/AG/06, RG/2011/AG/10, RG/2011/NRB/02, RG/2012/CSIT/01** ප්‍රදානයන්හි අවසන් වාර්තාවන් **2017.06.14** දින විට ලබා දී අතර **RG/2011/NRB/08** හා **RG/2011/ES/01** ප්‍රදානයන්හි අවසන් වාර්තා වල මෘදු පිටපත් **2017.06.14** දින වන විට ලැබී ඇත.

**RG/2011/NRB/04** හා **RG/2012/AG/08** යන ප්‍රදානයන්හි අවසන් වාර්තා දෙක ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තා **2017.06.30** දිනට පෙර ලබා දීමට සිහි කැඳවීම් යවා ඇත.

(iii) පහත අවසන් වාර්තාවල ඇගයීම් වාර්තා ප්‍රමාද නැත.

| ප්‍රදාන අංකය | අවසන් වාර්තාව ලබා දුන් දිනය | ඇගයීම් වාර්තා ලබා දුන් දිනය |
|---|---|---|
| RG/2011/NRB/06 | **03/12**/2014 | **29/01/2015** |
| RG/2011/ES/03 | 15/02/2016 | **22/04/2016** |
| RG/2012/EB/02 | 19/09/2016 | 18/11/2016 |

එසේම RG/2012/EB/03
RG/2011/AG/09
RG/2012/AG/07
RG/2011/AG/08
RG/2012/AG/04 යන ප්‍රදානයන්හි අවසාන වාර්තා ඇගයීම **2017.06.14** වන විට අවසන් කර ඇත.

**RG/2012/AG/02** ප්‍රදානයෙහි ඇගයීම් කිරීමෙන් අනතුරුව යොමුකරන ලද අදහස් අනුව සංශෝධිත අවසන් වාර්තාව ලැබීමට නියමිතය.

ප්‍රදානයන් වෙනුවෙන් ලබාදෙන අවසන් වාර්තා සමාලෝචනය කිරීමට යැවීම ප්‍රමාද නොවන අතර ඇගයීම්කරුවන්ගේ විචාරක අදහස් මත ඇතැම් අවසන් වාර්තා සංශෝධනය කළ යුතු අතර එවැනි සංශෝධිත අවසන් වාර්තා නැවත ඇගයීමට ලක් කර ක්‍රියාකාරී කමිටු මගින් අවසන් නිර්දේශ ලබා ගත යුතුයි. ඇගයීම් වාර්තා සම්පූර්ණ කිරීම ප්‍රමාද වනුයේ මෙම හේතුව නිසාය.

කෙසේ වුවද විගණන වාර්තාවේ පෙන්වා ඇති කරුණු අනුව අවධානය යොමු කර ඉදිරියේදී අවශ්‍ය පියවර ගනු ලැබේ.

ආ) (i) උපකරණ මිළදී ගැනීම අරමුදල් අදාල ආයතනය වෙත ලබාදුන් දින සිට මාස 05ක් ඇතුලත දී සිදුවිය යුතු බව ප්‍රදාන ගිවිසුමේ 5 වන කොන්දේසියෙහි සඳහන් වේ. විගණන විමසුම අනුව උපකරණ මිළදී ගැනීමේ ප්‍රමාදයන් ගණනය කර ඇත්තේ උපකරණය ප්‍රදානය කල දින (Grant awarded date) සිට නිසා සැබෑ ප්‍රමාද කාලය ගණනය කළ යුත්තේ අරමුදල් අදාල ආයතනය වෙත ලබාදුන් දින සිට වේ. ඒ අනුව ප්‍රමාද කාලය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රදාන අංකය | මුදල් හුවමාරු වූ දිනය | උපකරණ මිළදී ගත් දිනය | විගණන විමසුම අනුව ප්‍රමාදය | සැබෑ ප්‍රමාදය |
|---|---|---|---|---|
| RG/2015/EQ/02 | 31.12.2015 | 14.06.2016 | වසරකි | දින 14 |
| RG/2015/EQ/03 | 31.12.2015 | 25.08.2016 | වසරක් සහ මාස 2 | මාස 3කි |
| RG/2015/EQ/08 | 31.12.2015 | 05.07.2016 | වසරක් සහ මාසයකි | මාසයක් සහ දින 5 කි |
| RG/2015/EQ/11 | 29.04.2016 | 31.11.2016 | මාස 04 කි | මාස 2 කි |
| RG/2015/EQ/12 | 31.12.2015 | 18.07.2016 | මාස 04 කි | මාසයක් සහ දින 18 |
| RG/2015/EQ/15 | 31.12.2015 | 29.06.2016 | මාස 03 කි | මාසයකි |

ඉතිරි උපකරණ ප්‍රදානයන් 07 සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රමාද වීම් සඳහා එකඟ වේ.

එසේම උපකරණ ප්‍රදානයන් සමීපව නිරීක්ෂණය කල අතර ප්‍රදාන ලාභීන්වෙත නිරන්තර සිහිකැඳවීම් යවන ලදී. ඒ අනුව ඔවුන් විසින් ප්‍රමාදයන් සඳහා හේතු ලෙස සැපයුම්කරුවන් හා නැව්ගත කිරීමේ ප්‍රමාදයන් දක්වා ඇත.

අදාල ප්‍රතිපාදන ප්‍රදානලාභීන්ගේ ආයතන වෙත ලබාදුන් පසු එම ආයතනයෙන් අදාල මිලදී ගැනීම් ක්‍රියාවලිය සම්පූර්ණ කර යුතු වේ. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) හා ප්‍රසම්පාදන ක්‍රියාවලි වලදී ඇතිවන ප්‍රමාදයන් ද , උපකරණ මිළදී ගැනීම් ප්‍රමාදවීමට හේතු වී ඇත.

මෙවැනි ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇතිවන ප්‍රමාදයන් සලකා ජාතික විද්‍යා පදනම, උප කළමණාකරණ මණ්ඩල කමිටුවේ (Board Sub-Committee) නිර්දේශය මත අරමුදල් හුවමාරු වූ දින සිට පර්යේෂණ උපකරණය මිල දී ගැනීම සඳහා නිර්දේශිත කාල සීමාව 2016 නොවැම්බර් 10 කළමණාකරන මණ්ඩල තීරණ මත මාස 06 දක්වා කාලය දිගු කල අතර එය 2016 ප්‍රදාන ගිවිසුමට ඇතුලත් කරන ලදී.

(ii) අනුමත ආකෘතියේ නොවන වාර්තාවන් අතරින් පහත ප්‍රදානයන්හි ලේඛණ යාවත්කාලීන කර ඇති අතර ඉතිරි වාර්තා මසක් ඇතුළත ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. (ඇමුණුම 12, පිටු 1-7)

**RG/2014/EQ/01, RG/2014/EQ/02, RG/2014/EQ/07, RG/2015/EQ/14, RG/2015/EQ/15**

කෙසේ වෙතත් උපකරණ ස්ථාපනයකර (Installation), අවසන් වන තුරු ද්‍රව්‍ය ලැබීම් වාර්තාව (GRN) නිකුත් නොකරයි. එවැනි අවස්ථා වලදී මිලදී ගෙන මසක් ඇතුලත GRN ලබා ගත නොහැකි වී ඇත.

(iii) RG/2014/EQ/05 - මෙම උපකරණය කොටස් 04 ක් ලෙස මිලදී ගෙන ඇත. එහි ප්‍රධාන කොටස් 2 සඳහා වගකීම් කාලයක් ඇත. Rotary Evaporator - අවුරුදු 01, Vacuum Pump - මාස 36 අනෙක් උපකරණ කොටස් 02 කුඩා අංග 02 ක් වන Vacuum Duct සහ Round Bottom Flasks වේ. මේවා සඳහා වගකීම් සහතික සාමාන්‍යයෙන් නිකුත් කරනු නොලැබේ

එසේම සැපයුම් කරුවන්ගෙන් සේවා / නඩත්තු ගිවිසුම ලබාගැනීමට පහත සඳහන් හේතු නිසා සමහර අවස්ථා වලදී නොහැකි වී ඇත.

1. දේශීය නියෝජිතයෙකු නොමැති වීම.
2. සැපයුම්කරු සේවා ගිවිසුමක් ලබාදීම සඳහා අමතර ගාස්තු ඉල්ලා සිටීම.
3. අමතර නිරන්තර නඩත්තුවක් උපකරණයට අවශ්‍ය නොවීම.

එම නිසා ප්‍රදාන ලාභීන් අමතර සේවා ගිවිසුම් ලබා නොගෙන, සැපයුම්කරු ලබා දෙන වගකීම් කාලයෙන් පමණක් සෑහීමට පත් වේ. මෙම වගකීම් කාලය බොහෝ විට අවුරුදු 01 කට සීමා වේ.

ඇ) තාක්ෂණ ප්‍රදානයන් ලබා දුන් පසු ප්‍රගතිය ඇගයීමට හා සමාලෝචනය කිරීමට ජාතික විද්‍යා පදනම සතුව සාර්ථක ක්‍රම වේදයක් ඇත. එම ක්‍රමවේදයට අනුව ව්‍යාපෘති ක්ෂේත්‍රවලට ගොස් ප්‍රගතිය අගයන අතර තාක්ෂණික හා මූල්‍ය ප්‍රගති වාර්තා මාස 6 කට වරක් ලබා ගනු ලැබේ. ඉහත නිරීක්ෂණයන්ගේ සඳහන් කර ඇති ප්‍රදාන අංකවලට අදාළව මූල්‍ය වාර්තා නිසි පරිදි ලබාගෙන ඇති අතර ඇගයීමද සිදු කර ඇත. එම තොරතුරු දාතම සහිතව ඇමුණුම 1 හි දක්වා ඇත. තවද, එක් එක් ප්‍රදානයන්ට අදාළව ලබාගත් වියදම් වාර්තාවලට අනුව සහ අප විසින් කරනු ලබන ප්‍රගතිය ඇගයීමට අනුව වියදම් ප්‍රමාණයද අමුණුමෙහි දක්වා ඇත. (ඇමුණුම *06*)

ඉහත සඳහන් ක්‍රමවේදයට අනුව නිසි වේලාවට තාක්ෂණික හා වියදම් ප්‍රගති වාර්තා ලබාගෙන ඇගයීම් සිදු කිරීමට ඉදිරියේදීද කටයුතු කරනු ලැබේ.

විගණන වාර්තාවේ සඳහන් ප්‍රදාන 06න් 04ක් සම්බන්ධයෙන් වාර්ෂික වියදම් වාර්තා ලබාගෙන ලෙජරය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. මෙම ව්‍යාපෘතින් සඳහා ලබාදුන් සම්පූර්ණ ප්‍රදානයම වියදම් වී ඇත. ඉතිරි ප්‍රදානයන් 2 හි අවසන් වාර්ෂික වියදම් වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇති අතර ඉතිරි ශේෂය ජා.වි. ප. වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. එම ශේෂයන් පහත පරිදි වෙනස් විය යුතුය. විස්තර පහත දැක්වේ.

| ප්‍රදාන අංකය | අවසාන ශේෂය |
|---|---|
| TG/2012/Tech-D/04 | 24,479.34 |
| TG/2012/Tech-D/10 | 535,283.40 |
| TG/2013/Tech-D/01 | NIL |
| TG/2013/Tech-D/05 | NIL |
| TG/2015/Tech-D/06 | NIL |
| TG/2015/Tech-D/09 | NIL |

ඈ) (i) (ii) (iii)

ජාතික විද්‍යා පදනම **Rain Water Harvest** ඒකකයක් නිර්මාණය කර ස්ථාපිත කිරීමට 2015 වර්ෂයේදී තීරණය කර ඒ සඳහා රු. 51,635/- ක අත්තිකාරම් මුදලක් 2016 නොවැම්බර් 04 දිනට ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත භාර දෙන ලදි.නමුත් 2016 වර්ෂය අවසානයේදී ආයතන පරිශ්‍රය වැඩි දියුණු කිරීමට කළමනාකාරීත්වය තීරණය කළ අතර මේ වන විට එම ව්‍යාපෘතියට අදාල මූලික කටයුතු ආරම්භව පවතින මෙම නව ව්‍යාපෘතිය නිසා ඉහත **Rain Water Harvesting** ඒකකය ස්ථාපිත කිරීමේ ස්ථානය හඳුනා ගැනිමට කල්ගත වන බැවින් මෙම මුදල් ජාතික විද්‍යා පදනම වෙත නැවත ලබා දෙන ලෙස ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉල්ලා ඇත.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සඳහන් මුදල් අත්තිකාරම් කමිටු රැස්වීම් සඳහා සහභාගීවන කමිටු සාමාජිකයන්ට ගෙවීම සඳහා හා ක්ෂේත්‍ර චාරිකාවල දී වියදම් සඳහා ලබා ගෙන ඇත. කමිටු සාමාජිකයන් තහවුරු කළ පරිදි කමිටු සඳහා සහභාගී නොවීම නිසා ඇස්තමේන්තු අනුව වියදම් නොවී ඇත.

එසේම ක්ෂේත්‍ර චාරිකාවල දී නවාතැන් සඳහා, වාහනයට ඉන්ධන සැපයීම සඳහා, හදිසි අනතුරු / රෝගාබාධ / වාහනයේ නඩත්තු සඳහා, බොහෝ දුර බැහැර ස්ථානවලට ගමන් කිරීමේදී පරිහරනයට සුදුසු වතුර / ආහාර ලබා ගැනීමේ ලබා ගැනීම සඳහා ජාතික විද්‍යා පදනමේ ගෙවීමේ පටිපාටිය අනුකූලව අත්තිකාරම් සඳහා ඇස්තමේන්තු සකසනු ලැබේ. එහෙත් විවිධ හේතු නිසා එම ඇස්තමේන්තු ගත වියදම් ඒ ආකාරයෙන්ම දැරීමට සිදු නොවේ. එබැවින් ඇස්තමේන්තු අනුව ලබා ගත් මුදල් හා වියදම් අතර වෙනසකම් සිදුව ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

අ) සඳහන් කර ඇති ප්‍රසම්පාදනයන් කාර්යයන් රු.මි.68.271 න් රු.මි.22.924 ක්‍රියාත්මක කර ඇති අතර ක්‍රියාත්මක කිරීමට නොහැකි ප්‍රසම්පාදනයන් සඳහා වු හේතු ඇමුණුම් 07 හි දක්වා ඇත.

### 5.2 අයවැය පාලනය

වර්ෂය තුළදී ආයතනයේ ප්‍රමුඛතාවයන් හා අවශ්‍යතාවයන්ගේ වෙනස් වීම් වලට අනුගත වන සේ අයවැය ලේඛනය සංශෝධනය කිරිමට සිදුවනු ඇත. එම නිසා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සහිතව එවැනි අයවැය සංශෝධනයන් සිදුකර ඇත.

අවසන් අයවැය ලේඛණයේ ප්‍රාග්ධන වියදම සහ සත්‍ය වියදම අතර විචල්‍යය අයිතම 4 ක් 24% සිට 60% දක්වා වු අතර අන් සියළු අගයන් 24% ට වඩා අඩු විය.එමෙන්ම පුනරාවර්තන වියදම් විචල්‍යය අයිතම 18 න් 25% සිට 80% දක්වා වු අතර මිලියන 2.8 ක් වටිනාකමක් ඇති අයිතම 6ක් වියදම් නොකර තිබුණි. අන් සියළු විචල්‍යයන් 25% කට අඩු විය.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

අ) විගණන නිරීක්ෂණය මගින් පෙන්වා දී ඇති කරුණු අනුව ජාතික විද්‍යා පදනමෙහි ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය ඇතුළත් 2016 වසර සඳහා වු ප්‍රගති වාර්තාවක් ලබා දෙනලදී. එසේම ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය පැහැදිලිව දක්වමින් ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීමට ඉදිරි වසරවලදී ද කටයුතු කරනු ඇත.

ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක නොකල කාර්යයන් හා පසුවට කල් දැමු කාර්යයන් සඳහා පැහැදිලි කිරීම් ඇමුණුම් 08 හි දක්වා ඇත.

## 6. පද්ධති හා පාලනයන්

| | | |
|---|---|---|
| අ) | මානව සම්පත් පාලනය | නිලධාරීන් බඳවා ගැනිමේ දි පලපුරුද්ද තහවුරු කරගැනීම් සඳහා අවශ්‍ය සහතික වල පිටපත් පුද්ගලික ලිපිගොනු වල ඇතුලත් කර ඇති අතර වෛද්‍ය වාර්තා ලබා දෙන ලෙස නැවත වාරයක් ලිපි නිකුත් කර ඇත. එමෙන්ම ප්‍රතිඥාව ලබා ගැනිමට දැනට කටයුතු කර ඇත. |
| ආ) | පර්යේෂණ ප්‍රදාන ලබාදීම,අධීක්ෂණය හා පාලනය | ගිවිසුම් ප්‍රකාරව මූල්‍ය වාර්තාවන් ලබා ගැනිම සඳහා පියවර ගෙන ඇති අතරම ප්‍රදාන ලෙජරය යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා අදාළ මාසය තුළ ලද වාර්තා එම මාසය තුළදීම යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ.<br><br>කෙසේ වෙතත් යාවත්කාලීන කර නොමැති ප්‍රදානයන් , ප්‍රදාන ලෙජරයේ යාවත්කාලීන කිරීමට සටහන් කර ගන්නා ලදී. |

සභාපතිනිය
ජාතික විද්‍යා පදනම

NATIONAL SCIENCE FOUNDATION
Statement of Changes in Net Assets/Equity
for the year ended 31st December 2016

| | Contributed Capital | Revaluation Reserve | Other Reserve | Documentation Fund | Research Fund | MAB Fund | Miscellaneous Fund | Scientific Reserve Fund | Forign Aid Fund | NSF Fund | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Balance as at 01.01.2016 | - | 422,548,735.64 | 560,974,852.00 | 1,955,791.06 | 16,391,243.67 | 1,829,977.19 | 1,021,847.75 | 6,784,183.70 | 8,088,147.10 | (44,162,983.34) | 975,431,794.77 |
| Changes in accounting Policy | - | - | - | (1,955,791.06) | (16,391,243.67) | (1,829,977.19) | (1,021,847.75) | (6,784,183.70) | (8,088,147.10) | 36,071,190.47 | - |
| Prior year adjustments | - | - | - | - | - | - | - | - | - | (2,816,275.24) | (2,816,275.24) |
| Restated balance as at 01.01.2016 | - | 422,548,735.64 | 560,974,852.00 | - | - | - | - | - | - | (10,908,068.11) | 972,615,519.53 |
| **Change in net asset/equity for 2016** | | | | | | | | | | | |
| Revaluation Reserve on Dispose Vehicles | - | (1,700,000.00) | - | - | - | - | - | - | - | - | (1,700,000.00) |
| Foreign operations | - | - | - | - | - | - | - | - | - | - | - |
| **Grants From Treasury** | | | | | | | | | | | |
| Capital | - | - | - | - | - | - | - | - | - | 229,462,229.14 | 229,462,229.14 |
| Recurrent | - | - | - | - | - | - | - | - | - | 113,249,500.00 | 113,249,500.00 |
| Other operations | - | - | - | - | - | - | - | - | - | 22,447,730.28 | 22,447,730.28 |
| **Expenditure during the year** | | | | | | | | | | | |
| Capital | - | - | - | - | - | - | - | - | - | (237,481,132.13) | (237,481,132.13) |
| Recurrent | - | - | - | - | - | - | - | - | - | (130,666,835.91) | (130,666,835.91) |
| **Total recognised revenue and expences for the period** | - | (1,700,000.00) | - | - | - | - | - | - | - | (2,988,508.62) | (4,688,508.62) |
| **Balance as at 31st December 2016** | - | 420,848,735.64 | 560,974,852.00 | - | - | - | - | - | - | (13,896,576.73) | 967,927,010.91 |

NATIONAL SCIENCE FOUNDATION
Statement of Changes in Net Assets/Equity
for the year ended 31st December 2016

Summery

| | Contributed Capital | Revaluation Reserve | Other Reserve | Other Capital Fund | NSF Fund | Total Accu .Fund | Total |
|---|---|---|---|---|---|---|---|
| Balance as at 01.01.2016 | - | 422,548,735.64 | 560,974,852.00 | 36,071,190.47 | (44,162,983.34) | (8,091,792.87) | 975,431,794.77 |
| Changes in accounting Policy | - | - | - | (36,071,190.47) | 36,071,190.47 | - | - |
| Prior year adjustments | - | - | - | | (2,816,275.24) | (2,816,275.24) | (2,816,275.24) |
| Restated balance | - | 422,548,735.64 | 560,974,852.00 | - | (10,908,068.11) | (10,908,068.11) | 972,615,519.53 |
| **Change in net asset/equity for 2016** | | | | | | | |
| Revaluation Reserve on Dispose Vehicles | - | (1,700,000.00) | - | - | - | - | (1,700,000.00) |
| Foreign operations | - | - | - | - | - | - | - |
| **Grants From Treasury** | | | | | | | |
| Capital | - | - | - | - | 229,462,229.14 | 229,462,229.14 | 229,462,229.14 |
| Recurrent | - | - | - | - | 113,249,500.00 | 113,249,500.00 | 113,249,500.00 |
| Other operations | - | - | - | - | 22,447,730.28 | 22,447,730.28 | 22,447,730.28 |
| **Expenditure during the year** | | | | | | | |
| Capital | - | - | - | - | (237,481,132.13) | (237,481,132.13) | (237,481,132.13) |
| Recurrent | - | - | - | - | (130,666,835.91) | (130,666,835.91) | (130,666,835.91) |
| **Total recognised revenue and expences for the period** | - | (1,700,000.00) | - | - | (2,988,508.62) | (2,988,508.62) | (4,688,508.62) |
| **Balance as at 31st December 2016** | - | 420,848,735.64 | 560,974,852.00 | - | (13,896,576.73) | (13,896,576.73) | 967,927,010.91 |

## 2014-2016 කාලය තුළ නිමකරන ලද තාක්ෂණ ප්‍රදානවල නිමැවුම්

| ප්‍රදාන අංකය | ව්‍යාපෘති මාතෘකාව | නිමැවුම |
|---|---|---|
| TG/2011/Tech-D/02 | සූර්ය බලශක්තියෙන් බලගන්වන ලද එසැවුමක් සහ උසුලාගෙන යා හැකි ආකාරයේ කිරි දොවන යන්ත්‍ර වැඩි දියුණු කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂා පුනරාරෝපිත විදුලි කෝෂ හෝ විද්‍යුතය හෝ මගින් ක්‍රියාකරවිය හැකි අතේ ගෙන යා හැකි ලීටර් 10ක ධාරිතාවයක් සහිත කිරි දොවන යන්ත්‍රය. විදුලි කෝෂය සූර්ය බලයෙන් ද ආරෝපණය කළ හැකිය. දේශීය කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට සහ බුරුළු ප්‍රදාහය පැතිරීම වළක්වා ගැනීමට මෙම යන්ත්‍රය ශ්‍රමක්ෂමතා විද්‍යානුකූලව වැඩි දියුණු කර තිබේ. | ආරම්භක සමාගමක් පිහිටුවන ලද අතර කුඩා පරිමාණයෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබේ. ප්‍රථමයෙන් යන්ත්‍ර තුනක් නිපදවන ලදී. මෙම යන්ත්‍ර පරීක්ෂාවට ලක් කරන ලද අතර මේ වන විට අලෙවියට තබා ඇත. ආනයනය කරන ලද, ඉහළ පිරිවැයක් සහිත යන්ත්‍ර සමග සසඳන විට දේශීය කිරි ගොවියන් හට දැරිය හැකි මිලකට ලබා ගත හැකි මෙම දේශීයව වැඩිදියුණු කරන ලද යන්ත්‍රය ඔවුනට වාසිදායක වනු ඇත. |
| TG/2011/Tech-D/03 | CoP සයුරු: ශ්‍රී ලංකා නාවුක හමුදාවේ ඉහළ නිලයක් සඳහා ත්‍රිමාන වෙරළබඩ නිරික්සුම් පද්ධතිය. වරාය නාවුක ගමනාගමන පාලනය සඳහා අවශ්‍ය කෙරෙන තීරණ ගැනීමේ හැකියාව ඉහළ නැංවිය හැකි වෙරළබඩ නිරික්සුම් පද්ධතියකි. | මෙම පද්ධතිය මිරිස්සේ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ භාවිතය සඳහා යොදවනු ලැබ තිබේ. |
| TG/2012/Tech-D/02 | ස්වභාවික රබර් කර්මාන්තය සඳහා භාවිත කිරීමට සොයා ගන්නා ලද ගෝලීය බඳුන පරිමාණනය කිරීම. | මෙම ප්‍රදානය යටතේ සංවර්ධනය කරන ලද කේන්ද්‍රාපසරික රබර් කිරි ගබඩා කිරීම පිණිස ලීටර් 22,000ක ධාරිතාවය ඇති ගෝලීය බඳුන වරකාපොළ ලලාන් රබර් කර්මාන්තශාලාවේ ස්ථාපිත කර තිබේ. නව සැලැස්ම, ගබඩාකිරීමේදී සහ පදම් කිරීමේ ටැංකිවල සිට කන්ටේනර්වලට මාරු කිරීමේදී ද්‍රව්‍ය නාස්තිය අඩු කරයි. මේ වන විට මෙම පද්ධතිය ලලාන් රබර් කර්මාන්තශාලාවේ ක්‍රියාත්මක තත්වයේ පවතී. ලලාන් කර්මාන්තශාලාවට අනුව, නිෂ්පාදනය කරන ලද කේන්ද්‍රාපසාරික වියලි රබර් කිරි ටොන් එකක් සඳහා ඉතිරි කෙරුණු පිරිවැය ශ්‍රී ලංකා රුපියල්වලින් පහත දැක්වේ.<br><br>කැටි ගැසුණු සහ ඉතිරි වූ රබර් = 121.08<br>ඇමෝනියා = 44.32<br>ශ්‍රමය = 3.33<br>මුළු ඉතිරි කිරීම් = 238.73 |
| TG/2012/Tech-D/03 | ස්පර්ශ තිර උපකරණවල නව්‍ය ප්‍රවේශය සහිත තාක්ෂණය. | නවීන ස්පර්ශ තිර උපකරණ සමග අන්තර්ක්‍රියා සිදු කිරීමට අන්ධ පරිශීලකයින්ට පහසුකම් සලසන මෘදුකාංග නිෂ්පාදනය "අයි-බ්‍රේලර් සටහන" ("iBrailler"). එහි, ක්‍රියාශීලී අතත්‍ය යතුරු පුවරුව, සෑම විටම පරිශීලකයාගේ ඇඟිලි තුඩු යටින් යතුරු පිහිටන බවට සහතික කරන අතර, පරිශීලකයාට බොත්තම් සොයා ගැනීම සඳහා ම ඇඟිලි චලනය කිරීමට අවශ්‍ය නොවනු ඇත. මෙය, මාර්ගගතව බාගත කළ හැකි වන ලෙස ඇපල් ඇප් ගබඩාවේ අන්තර්ගත කර තිබේ.<br><br>**<u>සමාජ ආර්ථික ප්‍රතිලාභ</u>**<br><br>මෙම නිෂ්පාදනය, අන්ධ පුද්ගලයින්ට ඉගෙනීමේ සහ තොරතුරු හුවමාරු කර ගැනීම පිණිස නවීන ස්පර්ශ තිර උපකරණ සමගම අන්තර්ක්‍රියා සිදු කිරීමේ හැකියාව ලබා දෙන වාතාවරණයක් නිර්මාණය කර තිබේ.<br><br>මෙකී නිෂ්පාදනය අලෙවි කිරීම මගින් උත්පාදනය කරනු ලැබූ ආදායම දළ වශයෙන් රු. මිලියන 19කි. |

| ප්‍රදාන අංකය | ව්‍යාපෘති මාතෘකාව | නිමැවුම |
|---|---|---|
| TG/2012/Tech-D/04 | ස්වභාවික රබර් නැනෝ සංයුතිය මගින් පුරවන ලද දෙමුහුම් නැනෝද්‍රව්‍ය මත පදනම් වූ ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් සැහැල්ලු බරැති කෘත්‍රිම පාදය. | වැඩි දියුණු කරන ලද ලක්ෂණ සහිත රබර් නැනෝ සංයුක්ත ද්‍රව්‍ය මත පදනම් වූ නව කෘත්‍රිම පාදයක්.<br><br>ආනයනය කරන ලද වැඩි වියදම් කෘත්‍රිම පාද සමග සසඳන විට දිගුකාලීන ආයුකාලය මෙහි විශේෂ ලක්ෂණය වේ. නැනෝ-සංයුක්ත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට සහ කෘත්‍රිම පාදය නිෂ්පාදනයට නව ක්‍රියාවලියක් සංවර්ධනය කරනු ලබ තිබේ. කැපී පෙනෙන ප්‍රතිඵල සහිත පරීක්ෂණ අත්හද බැලීම් සම ක්‍රියාකරුගේ (රාගම රණවිරු සෙවණ) පරිශ්‍රයේදී සිදු කරන ලදී.<br><br>**<u>සමාජ ආර්ථික ප්‍රතිලාභ</u>**<br><br>ආනයනය කරන ලද කෘත්‍රිම පාදය හා සසඳන විට වැඩි දියුණු කරන ලද කාර්යසාධනය, අඩු පිරිවැය සහ ඉහළ නංවන ලද කල්පැවැත්ම සහිත දේශීයව සංවර්ධනය කරන ලද කෘත්‍රිම පාදය මගින් රට තුළ විදේශ විනිමය ඉතිරි කරනු ලබයි. "රණවිරු සෙවණට" මේ පිළිබඳ දැනුම් - හැකියාව ගෙන යෑම සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. |
| TG/2012/Tech-D/07 | ගෘහස්ථ ආහාර නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට සහ වාණිජකරණය සඳහා ක්‍රමෝපාය සැකසීමට සරල කරන ලද ජලරෝපණ පද්ධතියේ සමාජ-ආර්ථික ප්‍රායෝගික බව තක්සේරු කිරීම. | නාගරික ප්‍රදේශවල ගෘහස්ථ ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට, වචන පෙට්ටි, අභ්‍යන්තර මාධ්‍ය සහ ජලරෝපණ පද්ධතිය කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල පාසල් (10), නිවාස (ස්ථාන 19ක) සහ රජයේ ආයතනවලට (08) හඳුන්වා දුනි. මෙම පද්ධතිය පරීක්ෂා කරන ලදුව, විවිධ එලවළු බෝග, වම්බටු, බණ්ඩක්කා, මිරිස් යනාදිය සඳහා සුදුසු බවට සනාථ කරන ලදී. නාගරික නිවාස වෙත මෙම පද්ධතිය ප්‍රචලිත කිරීම සඳහා වෙළඳ ක්‍රමෝපාය සකස් කරන ලදී. විවිධ පාරිභෝගිකයින් සඳහා දැනුම සහ තාක්ෂණය ලබා දීම පිණිස තාක්ෂණය ගෙනයෑමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. |
| TG/2012/Tech-D/09 | ශ්‍රී ලංකාවේ ගම්මානවල ළමුන්ගේ, ගර්භනී සහ කිරි දෙන මාතාවන්ගේ මන්ද පෝෂණය පිටු දැකීමට ස්පිරුලිනා ඇල්ගාව වගා කිරීම. | ටැංකිවල ස්පිරුලිනා ඇල්ගාව වගා කිරීමට, ආහාර අතිරේකයක් ලෙස භාවිත කිරීම පිණිස වියළීමට සහ කුඩුබවට පත් කිරීමට ශිල්ප ක්‍රම සංවර්ධනය කරන ලදී. කන්දෙකඩුව යුධ හමුද කඳවුරට මෙම තාක්ෂණය ලබා දීම සිදු කෙරුණි. |
| TG/2012/Tech-D/11 | කෝමාරිකා (*Aloe barbadensis Miller*) අන්තර්ගත "පිරිනැමීමට - සූදනම්" පානයක් සැකසීම (මහා පරිමාණ මට්ටමට නිෂ්පාදනය සංවර්ධනය කිරීමට). | කෝමාරිකා "පිරිනැමීමට - සූදනම්" පානය, වෙනත් වර්ගවල පාන වෙනුවට විකල්ප පානයක් ලෙස, සහ ශ්‍රී ලංකාවේ වසංගත තත්වයට පත් රෝගයක් වූ මධුමේහය රෝග යේ මූලික අවස්ථාවේ රෝගීන් සඳහා ආහාර අතිරේකයක් ලෙස සකස් කර ඇත. ප්‍රදානලාභියා, පේටන්ට් දෙකකට අයදුම් කර තිබේ. මෙම ව්‍යාපෘතිය දර්ශනපති (MPhil) උපාධියක් ප්‍රතිඵලය කරවිය: නිෂ්පාදනය වාණිජකරණය කිරීම පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ විද්‍යා කර්මාන්තශාලා අන්තර්ක්‍රියා කුටිය (SLIC) ඔස්සේ සිදු කෙරෙමින් පවතී. |
| TG/2012/Start up/01 | ගෘහස්ථ සහ වාණිජ ආහාර පිසීමේ කටයුතු සඳහා පිරිවැය-ඵලදායී, පරිසර හිතකර පිසින උදුනක් නිෂ්පාදනය කිරීම සහ අලෙවිකරණය. | ගෘහස්ථ සහ වාණිජ ආහාර පිසීමේ කටයුතු සඳහා පරිසර හිතකාමී පිසින උදුන් නිෂ්පාදනය කිරීමේ සහ අලෙවිකරණය සඳහා මූලාරම්භය සපයන ලද ව්‍යාපාරයකි. LP වායුව භාවිතය හා සසඳන විට බලශක්ති පිරිවැය 50%ක් දක්වා මෙම උදුන මගින් ඉතිරි කරනු ඇත. ආහාර පිසීමේ ක්‍රියාවලියේදී කිසිදු විෂ වායුවක් උත්පාදනය වන්නේ නැත. කුඹල් කර්මාන්තයේ සහ අඟුරු කර්මාන්තයේ යෙදෙන ග්‍රාමීය ප්‍රජාව මෙමගින් ප්‍රතිලාභ ලබනු ඇත. |

| | | |
|---|---|---|
| | | වර්තමානයේ, මසකට සාමාන්‍ය නිෂ්පාදනය පිසින උඳුන් 300ක පමණ වන්නාවූ ජීව්‍ය ව්‍යාපාරයක් ලෙස මෙන් ක්‍රියාත්මක වේ. මෙම නිෂ්පාදනය උතුරු - නැගෙනහිර පළාත්වල පවා ව්‍යාප්ත වී තිබේ.<br><br>සමාජ ආර්ථික ප්‍රතිලාභ<br><br>පුද්ගලයින් 06 දෙනෙකුට ඍජු රැකියා සපයනු ලැබේ.<br><br>පුද්ගලයින් 40කට වක්‍ර රැකියා සම්පාදනය කෙරේ. (ග්‍රාමීය කුඹල් කර්මාන්ත කරුවන්).<br><br>LPGවලින් මෙම අඟුරු පාදක කරගත් උඳුන්වලට මාරු වූ කුටුම්භවලට මාසිකව ඉතිරියක් ලැබීම.<br><br>ග්‍රාමීය ප්‍රදේශවල ජෛවස්කන්ධ දුම සමග බැඳුණු ශ්වසන පද්ධතිය හා සම්බන්ධ රෝගාබාධ ඇතිවීම අවම කිරීම. |

NTRP/2012/FS/PG-01/P-01
මෙම ව්‍යාපෘතිය මඟින් නිමකල ලද මෘදුකාංගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මුළු දිවයිනෙහිම ආහාර නිෂ්පාදනය ඇගයීමට හා කරුණු එක්රැස් කිරීමට යොදා ගැනීමට තීරණය කර තිබෙන අතර මෙම මෘදුකාංගය ගරු ජනාධිපතිතුමා විසින් දියත් කිරීමද සිදු කරන ලදී.

NTRP/2012/FS/PG-01/P-02
මෙම ව්‍යාපෘතිය මඟින් ගොවීන්ගෙන් බෝග වගාවන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීමට, තොරතුරු ගොවීන් හට ලබා දීමට, තොරතුරු බෙදා හැරීමට පරිඝනක යෙදුමක් නිර්මාණය කරන ලදී.

NTRP/2012/FS/PG-05/P-02
යාපනය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම පීඨයේ ආදර්ශ ගෙවතු වගා ගොවිපලක් මෙම ව්‍යාපෘතිය මඟින් පවත්වාගෙන යයි. එමෙන්ම උතුරු පළාතේ දිස්ත්‍රික්ක 5ක තෝරා ගත් ගොවීන් සමඟ ගෘහස්ථ ගෙවතු 12ක් පිහිටුවා ඇත. පුහුණු වැඩසටහන් පැවැත්වීමත් ජනමාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කිරීමත් සිදු කරන ලදී.

## ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සම්මාන සඳහා නිර්දේශිත අවසන් වාර්තා විමර්ශනය කිරීමට විමර්ශකයින් සඳහා නිර්ණායක

01. ව්‍යාපෘතියේ විද්‍යාත්මක කුශලතාවය.

02. කර්තව්‍යයේ බලපෑම:
    - i. සමවිමර්ශනයට ලක් වූ වාරසඟරා ප්‍රකාශනය.
    - ii. "සොයා ගැනීම" යොදාගත් අවස්ථා
    - iii. ලබාගත් පේටන්ට් (තිබේ නම්)
    - iv. රජයේ ප්‍රතිපත්ති සැකසීමේදී යොදගැනීම.

03. කර්තව්‍යයේ නවෝත්පාදනමය ස්වභාවය

04. කර්තව්‍ය මත විමර්ශකයේ සමස්ත අදහස අධ්‍යයනයේ විශිෂ්ටත්වය පිළිබඳ විමර්ශකයේ අදහසට හේතු වූ අවධානයට ලක් කළ යුතු ලක්‍ෂණ (ධන හෝ ඍණ) මතු කර දැක්වීමට මෙම කොටස් භාවිත කරන්න.

05. වෙනත් අදහස්

06. අ) මෙම අධ්‍යයනය

(i) ජාතික විද්‍යා පදනම් පර්යේෂණ සම්මානය

හෝ

(ii) "ප්‍රශංසාත්මක සහතිකයක් " හෝ සඳහා ඔබ නිර්දේශ කරන්නේ ද යන්න පිළිබඳ ඔබගේ අදහස කරුණාකර ලබා දෙන්න. **

ආ) මෙම අධ්‍යයනය ඉහත කිසිවෙක් සඳහා නිර්දේශ කිරීමට ඔබ අදහස් නොකරයි නම්, කරුණාකර ඒ සඳහා ඔබගේ හේතු ලබා දෙන්න.

** ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ව්‍යාපෘතියක් වුවද "ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මානයක් " සඳහා අවශ්‍ය කෙරෙන සම්මත තත්ව සඳහා ළඟාවී නොමැති නම්, එය "ප්‍රශංසාත්මක සහතිකයක් " සඳහා සලකා බැලිය හැකිය.

Issue:01/Rev:00/2014-08-21

Actions proposed to minimize delays in submission of Final Reports

1) Send reminders as follows from the date of completion of the grant.

   a) 01st Reminder (email to all the Investigators) - Two weeks before the end of the project period reminding when it is due to end and when the Final Report is due. Format (Already in practice) will also be sent.
   b) 02nd Reminder– 04 weeks after the due date of submission of final report. Letters sent to all Investigators reminding that the FR was due and not submitted yet and requesting them to submit within one month
   c) 03rd Reminder – 12 weeks after the due date of submission of final report. Letter sent reminding that the FR was due and not submitted yet and requesting them to submit within one month. Letter copied to Heads of the Departments of all Investigators.
   d) 04th Reminder (final) – 20 weeks (05 months from due date) after the due date of submission of final report. Letter sent (under registered post) reminding that the FR was due and not submitted yet and requesting them to submit within one month. Also mentioning that failure to do so will compel the NSF to terminate the grant and consider the grantee as 'defaulter' and if so, the grantees will not be eligible to seek any grants/awards/nominations (e.g : Travel, OSTP, IPSAT, Sponsorships, Page charges, SUSRED etc.) administered by the NSF for a minimum period of five years from such declaration. Letter copied to Heads, Deans and VCs/Heads of the Institutes of all Investigators.
   e) If FR is not submitted yet (ie 06 months from due date), a Board paper will be put up to terminate the grant and designate the grantee as 'defaulter'.

2) Revising period given to submit FRs

   An analysis is in progress to see the trend in submission of FRs before 2011 (06 months were given to submit FR) and since 2011 (03 months were given to submit FR).

3) A suitable penalty (to be decided) to be imposed on grantees who delay the submission of FR by more than 03 months, without valid justification (Item 1 c above).

- *The 09 months period (from completion of project period) was given to grantees considering the fact that sometimes there are financial constraints at the NSF causing delays in fund transfers and also understanding that there can be reasons such as delays in purchasing consumables, equipment etc.(beyond control of grantee). Also the grantees are mostly from Universities and sometimes they face difficulties in completing on due date due to their other commitments such as teaching and administrative work.*

| ප්‍රදාන අංකය, ව්‍යාපෘති කාලය සහ ව්‍යාපෘති ආරම්භක දිනය | මූල්‍ය වාර්තා ලබා ගැනීම හා ඇගයීම | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 වන වාර්තාව ලැබූ දිනය (1 වන මාස 6) | ඇගයීම සිදු කළ දිනය | 2 වන වාර්තාව ලැබූ දිනය (2 වන මාස 6) | ඇගයීම සිදු කළ දිනය | 3 වන වාර්තාව ලැබූ දිනය (3 වන මාස 6) | ඇගයීම සිදු කළ දිනය | 4 වන වාර්තාව ලැබූ දිනය (4 වන මාස 6) | ඇගයීම සිදු කළ දිනය | 5 වන වාර්තාව ලැබූ දිනය (5 වන මාස 6) | ඇගයීම සිදු කළ දිනය | ප්‍රදානය කළ ප්‍රමාණය (රුපියල්) | වියදම් කරන ලද ප්‍රමාණය (රුපියල්) |
| **TG/2012/Tech-D/10** මාස 18 2013/08/12 | 2014.02.24 | 2014.03.18 | 2014.11.07 | 2015.01.01 | 2016.02.17 (අවසන් වාර්තාව) | 2016.05.26 | ව්‍යාපෘති කාලය මාස 18 ක් නිසා අදාළ නොවේ. | | | | 771,000.84 | 235,717.44 |
| **TG/2012/Tech-D/04** අවුරුදු 02 2013/05/28 | 2013.12.09 | 2013.12.10 | 2014.07.15 | 2014.07.16 | 2015.01.27 | 2015.01.28 | 2015.05.06 | 2015.05.06 | 2015.12.30 (අවසන් වාර්තාව) | 2015.12.30 | 4,933,625 | 4,628,820.66 |
| **TG/2013/Tech-D/01** මාස 18 2[illegible]/04/03 | 2014.07.11 | 2014.11.20 | 2015.11.06 | 2015.11.12 | 2016.04.05 (අවසන් වාර්තාව) | 2016.04.22 | ව්‍යාපෘති කාලය මාස 18 ක් නිසා අදාළ නොවේ. | | | | 967,590 | 870,831.00 |
| **TG/2013/Tech-D/03** අවුරුදු 03 2014/04/03 | 2015.02.11 | 2015.04.02 | 2016.02.18 ප්‍රමාද වී ලැබුනු වාර්තාවකි | 2016.02.18 | 2016.02.18 ප්‍රමාද වී ලැබුනු වාර්තාවකි | 2016.02.18 | 2016.05.25 | 2016.06.09 | 2017.04.06 | ඇගයීම සිදු වෙමින් පවතියි | 595,990 | 227,369.00 |
| **TG/2013/Tech-D/05** මාස 12 2014/04/29 | 2014.12.17 | 2014.12.27 | 2015.12.07 (අවසන් වාර්තාව) | 2015.12.15 | ව්‍යාපෘති කාලය මාස 12 ක් නිසා අදාළ නොවේ. | | | | | | 1,703,320 | 1,532,988.00 |
| **TG/2013/Tech-D/11** අවුරුදු 03 2014/04/29 | 2015.01.16 | 2015.01.20 | 2015.11.12 | 2015.11.17 | 2015.12.16 | 2016.01.18 | 2016.04.27 | 2016.05.24 | 2017.04.11 | 2017.04.11 | 3,950,000 | 2,584,347.18 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **.., 2014/Tech-D/01**<br>අවුරුදු 02<br>2014/09/04 | 2015.04.25 | 2015.05.29 | 2015.11.20 | 2015.12.09 | 2016.04.04 | 2016.05.05 | ව්‍යාපෘති කාලය අවුරුදු දෙකක නිසා අදාළ . නොවේ. | | | | 3,215,340 | 3,188,166.06 |
| **TG/2014/Tech-D/02**<br>අවුරුදු 03<br>2014/08/28 | 2015.03.03 | 2015.03.19 | 2015.12.11 | 2016.01.15 | 2016.04.26 | 2016.05.04 | 2016.11.01 | 2016.11.29 | 2017.03.17 | 2017.03.30 | 2,304,000 | 1,616,788.24 |
| **TG/2014/Tech-D/03**<br>අවුරුදු 2 1/2<br>(අනුමත ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සමඟ)<br>2014/08/28 | 2015.01.19 | 2015.01.19 | 2015.09.15 | 2015.10.26 | 2016.02.03 | 2016.02.03 | 2016.08.24 | 2016.11.21 | | | 1,190,000 | 694,907.20 |
| **TG/2014/Tech-D/04**<br>අවුරුදු 03<br>- 5/05/27 | 2015.12.11 | 2016.02.24 | 2016.07.11 | 2016.10.12 | 2017.01.03 | 2017.01.23 | ව්‍යාපෘති කාලය ඇතුලත ලබා ගැනීමට නියමිතය. | | | | 5,552,019 | 5,516,537.82 |
| **TG/2014/Tech-D/06**<br>මාස 12<br>2015/05/13 | 2015.12.09 | 2016.02.24 | ව්‍යාපෘති කාලය මාස 12 නිසා අදාළ නොවේ. | | | | | | | | 2,692,000 | 1,578,957.38 |
| **TG/2014/Tech-D/07**<br>අවුරුදු 1 1/2<br>(අනුමත ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සමඟ)<br>17/07/2015 | 2016.02.08 | 2016.05.10 | 2016.11.09 | 2017.03.17 | අවසන් වාර්තාව ලබා ගැනීමට සිහි කැඳවීම් යවා ඇත. | ව්‍යාපෘති කාලය අවුරුදු 1 1/2 ක් නිසා අදාළ නොවේ. | | | | | 1,488,092.80 | 227,710.00 |
| **TG/2015/Tech-D/01**<br>මාස 20<br>2016/05/20 | 2017.01.16 | 2017.02.08 | ව්‍යාපෘතිය සිදු වෙමින් පවතියි | | | | | | | | 511,787 | 312,264.15 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **TG/2015/Tech-D/02**<br>අවුරුදු 01<br>2015/09/25 | 2016.05.23 | 2016.06.06 | 2017.01.19 (අවසන් වාර්තාව) | 2017.05.02 | ව්‍යාපෘති කාලය අවුරුදු 1 ක් නිසා අදාළ නොවේ. | 81,792.80 | 81,281.40 |
| **TG/2015/Tech-D/03**<br>අවුරුදු 02<br>2015/09/11 | 2016.03.17 | 2016.05.04 | 2016.09.08 | 2016.10.04 | ව්‍යාපෘතිය සිදු වෙමින් පවතියි | 4,876,892 | 3,718,023.50 |
| **TG/2015/Tech-D/04**<br>අවුරුදු 02<br>2015/09/25 | 2016.03.29 | 2016.05.09 | 2016.09.27 | 2016.11.02 | ව්‍යාපෘතිය සිදු වෙමින් පවතියි | 810,000 | 274,395.00 |
| **TG/2015/Tech-D/05**<br>මාස 18<br>2015/10/23 | 2016.05.24 | 2016.07.05 | 2016.12.05 | 2017.01.06 | ව්‍යාපෘතිය සිදු වෙමින් පවතියි | 3,541,590 | 1,747,246.75 |
| **TG/2015/Tech-D/06**<br>මාස 9<br>2015/09/02 | 2016.03.04 | 2016.03.04 | 2017.01.19 (අවසන් වාර්තාව) | | ව්‍යාපෘති කාලය මාස 9 ක් නිසා අදාළ නොවේ. | 246,300 | 246,300.00 |
| **TG/2015/Tech-D/08**<br>අවුරුදු 2<br>2015/11/03 | 2016.05.12 | 2016.05.12 | 2016.08.26 | 2016.09.27 | ව්‍යාපෘතිය සිදු වෙමින් පවතියි | 1,959,500 | 550,000.00 |
| **TG/2015/Tech-D/09**<br>මාස 09<br>2015/09/30 | 2016.05.13 | 2016.09.02 | 2016.07.25 (අවසන් වාර්තාව) | 2017.01.03 | ව්‍යාපෘති කාලය මාස 9 ක් නිසා අදාළ නොවේ. | 3,745,500 | 3,745,500.00 |
| **TG/2015/Tech-D/10**<br>මාස 10<br>2015/11/30 | 2016.08.01 | 2016.10.12 | අවසන් වාර්තාව ලබා ගැනීමට සිහි කැඳවීම් යවා ඇත. | | ව්‍යාපෘති කාලය මාස 10 ක් නිසා අදාළ නොවේ. | 1,981,175 | 1,735,931.79 |

2016 වර්ෂයේ ක්‍රියාත්මක නොකරන ලද ප්‍රසම්පාදන කාර්යයන්

01. Service and Goods for International Conference on transcending Knowledge Frontiers

මෙම සමුළුව පැවැත්වීම සඳහා කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය නොලැබීම නිසා ප්‍රසම්පාදනයන් අවශ්‍ය නොවුණි.

02. Data collection services of hired enumerators

අංශයෙහි සංශෝධිත අයවැය අනුව මෙවැනි සමීක්ෂණ ඉවත් කරන ලද නිසා අවශ්‍යතාවයක් මතු නොවීය.

03. Land & building improvements

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වසරේදී සංවෘත ලංසු කැඳවා එම මිල ගණන් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යවන ලදි. නමුත් එහිදී එම මිල ගණන් (BOQ) පිළිබඳව 'උපදේශක සේවා සපයනු ලබන මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ඇගයීම් කමිටුව එකඟතාවයකට පත් නොවීම නිසා එම ලංසුපත් ඇගයීම අවලංගු කරන ලදි. නමුත් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් නව උපදේශක සේවා සපයන ආයතනයක් තෝරා ගැනීම සඳහා උපදේශක සේවා සපයන ආයතනවලින් කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කර ඇත.

04. Repairs & Maintenance Works

ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍ර ලැබී ඇති පරිදි අදාල අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත.

05. S & T Award Ceremony

2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ පරිදි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටයින් ඇගයීමේ සම්මාන සඳහා අයදුම්පත් කැඳවනු ලැබ ඒවා ඇගයීමට ලක් කරන ලදී. එහිදී සම්මාන ලැබීමට ප්‍රශස්ත ලකුණු ලබාගැනීමට සමත් වූයේ එක් අයදුම්කරුවෙක් පමණි. එක් සම්මානලාභියෙක් වෙනුවෙන් අධික වියදමක් දරා සම්මාන උත්සවය පැවැත්වීම අර්ථ විරහිත නිසා සම්මාන උත්සවය පැවැත් නොවූ අතර සම්මානලාභියාට අදාළ සම්මානය ඉදිරි සම්මාන උත්සවයකදී ලබා දෙනු ඇත. ඒ අනුව මෙම ක්‍රියාකාරකම සඳහා වෙන් කළ මුදල් වියදම් නොවූ අතර, මෙය අපගේ පාලනයෙන් තොර වූ සාධකයක් නිසාවෙන් සිදුවිය.

06. Equipment Service Agreement

2016 වර්ෂය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයේ හා මුද්‍රණ යන්ත්‍රයේ නඩත්තු සේවා කටයුතු සඳහා අදාළ සැපයුම්කරු සමඟ සේවා ගිවිසුමට එළඹීමට සැලසුම් කරන ලදී. එහෙත් තිබුනු ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයට දෝෂයට ලක් වූ නිසා අළුතින් ඡායාපිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමට සිදුවිය. එම නිසා නඩත්තු සේවා කටයුතු සඳහා සැලසුම් කළ මුදල් වියදම් නොවුනි.

07. Science Research Project Competition (SRPC)

වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. නමුත් ප්‍රසම්පාදනය අවශ්‍ය නොවුනි.

08. S.L Science & Engineering Fair (SLSEF)

වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. නමුත් ප්‍රසම්පාදනය අවශ්‍ය නොවුනි.

09. Out Reach Programmes

මෙම වැඩසටහන් ජාතික විද්‍යා පදනමින් බැහැරව වෙනත් ස්ථානවල සංවිධානය කෙරෙන වැඩසටහන්ය. මේ යටතේ අන්තර් පාසල් විද්‍යා සමාජ තරඟාවලියට සහ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟයට අයත් වැඩසටහන් විවිධ ප්‍රදේශවලදී සංවිධානය කෙරුණි. නමුත් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුනි.

10. Telecasting of the MihimadaleProgramme

මිහිමඬල වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කිරීමේ කටයුතු අඛණ්ඩව මෙම වසර තුල ක්‍රියාත්මක කිරීම සිදු කෙරුණු අතර ඒවා රූපවාහිනී නාලිකා ඔස්සේ විකාශය කිරීම සිදුනොවීය. එනිසා විකාශය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුනි.

11. Other Activity identified by the two Committees of the Division

අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා ඉහත කමිටු දෙකෙහි සහයෝගය සහ උපදෙස් ලැබුනු අතර ඊට අමතරව ඒවා මඟින් වෙනත් කටයුතු (Other Activities ) හඳුනාගැනීමක් සිදුනොවිනි.

12. Scheme for funding Page Charges

මෙම වැඩසටහන 2016 ජනවාරි මසදී කළමණාකරන මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ජාතික විද්‍යා පදනමේ අන්තර්ජාල පිටුව (website) මඟින් හා විද්‍යා හා තාක්ෂණ කළමණාකරන තොරතුරු පද්ධතිය (STMIS) විද්‍යාඥයින් අතර ප්‍රසිද්ධියට පත් කල අතර 2016 තුලදී එක් අයදුම්පතක් පමණක් ලැබුණි.

13. Training Workshop and Seminars (0.4Mn) (NSLRC)

Sri Lanka scientific and Technical Network නැමති ජාලයේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරන ඉහත අංශය, එම ජාලයට සම්බන්ධ සියලුම සාමජිකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණෙන් පහත සඳහන් එක් දින සම්මන්ත්‍රණය 2016.10.06 වන දින ජාතික විද්‍යා පදනමෙහි ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

Seminar on Scientrometric Indicators, evaluation of research publications, individual scintist and research institution through Scopus.

ඉන්දියාවේ පිහිටුව ඇති Elsevier (Ltd) ආයතනයේ සේවයේ නියුතු විෂය සම්බන්ධ ප්‍රවීන සම්පත් දායකයකු මෙම සම්මන්ත්‍රණය මෙහෙයවන ලද අතර, එම සම්පත් දායකයාගෙ ගුවන් ගමන් ගාස්තු, මෙරට නැවතීමේ ගාස්තු, ගෞරව දීමනාව, සහභාගී වන්නන්ගේ දිවා ආහාරය සහ තේ පැන් සංග්‍රහ ආවරණය වන පරිදි රු.400,000/= පිරිවැයක් ඇස්තමේන්තුගතකර ප්‍රසම්පාදන කාර්යය ලැයිස්තුවට ඇතුලත් කරන ලදී.

එනමුත් සම්පත් දායකයාට අදාල ගුවන් ගමන් ගාස්තු හා මෙරට නැවතීමේ ගාස්තු දැරීම සඳහා Elsevier ආයතනය කැමති කරවා ගැනීමට හැකි වූ බැවින් රු. 36,765/= පමණ මුදලක් වැය කිරීමෙන් මෙම සම්මන්ත්‍රණය නිම කල හැකි විය.

14. Hosting Charges for SLJOL database

Sri Lanka Journal online (SLJOL) යනු එංගලන්තයේ INASP (International Network for Availability of Scientific Periodicals) ආයතනය සහ ජාතික විද්‍යා පදනම ඒකබද්ධව ක්‍රියාකරනු ලබන මාර්ගගත දත්ත පදනමකි. ශ්‍රී ලංකාවේ පළවන මනාලෙස විචාරයට ලක් වූ සඟරා සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණය ලබා දීම මෙහි මූලික අරමුණ වේ.මෙම දත්ත පදනමේ Hosting service provider ලෙස ක්‍රියා කරනු ලැබූ කැනඩාවේ PKP ආයතනය එම සේවය ලබා දීමෙන් ඉවත් වූ බැවින් එම සේවය අඛන්ඩව සාධාරණ ගාස්තුවකට ලබා ගැනීම සඳහා INASP ආයතනයේ පූර්ණ සහයෝගයෙන් එංගලන්තයේ Ubquity Press ආයතනය තෝරා ගන්නා ලදී. ඒ අනුව 2016 සැප්තැම්බර් 15 වන දින ජාතික විද්‍යා පදනම සහ Ubquity Press ආයතනය සමඟ එලඹුන ගිවිසුම අනුව Annual hosting ලෙස රු.373,655/=

මුදලක් 2016.10.24 දින ගෙවනු ලැබීය. මෙම ගාස්තුව ආවර්ණය කරනු ලබන සඟරා මත රඳා පවතින අතර ගිවිසුම් අත්සන් කරන තුරු එයට අදාල මුළු මුදල නිවැරදිව පුරෝකථනය කල නොහැකි බැවින් එය 0.5Mn ලෙස ප්‍රසම්පාදන ලැයිස්තුවට ඇතුල් කරන ලදී.

15.Workshops & Meetings

වැඩමුළු හා රැස්වීම් 08ක් 2016 වසර තුළදී පවත්වා ඇති අතර ඒ සඳහා අවශ්‍ය වූ ප්‍රසම්පාදනයන් සිදුකර ඇත.

16.Ussangoda geo-park nomination

මෙම ක්‍රියාකාරකම වෙනුවෙන් වැඩසටහන් 2016 වසර තුල ක්‍රියාත්මක නොවූ නිසා ප්‍රසම්පාදනයන් අවශ්‍ය නොවුනි.

17.Follow-up of periodic review (PR) process

සැලසුම් කල පරිදි ප්‍රසම්පාදනයන් අවශ්‍ය නොවුනි.

18.Seminar (MAB)

එක් වැඩමුළුවක් පැවැත්වූ අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රසම්පාදනයන් පමණක් සිදුවිය.

19. Updating the publication on “Natural Resources of Sri Lanka”

2016 වසර තුලදී ලංසු කැඳවීම සිදුකල ඇති අතර 2017 වසරේදී ප්‍රසම්පාදනයන් සිදුකිරීමට නියමිතය.

20. MAB publications

මෙම වැඩසටහන යටතේ ප්‍රකාශනයන් සඳහා ඉල්ලීම් නොවූ නිසා ප්‍රසම්පාදනයන් අවශ්‍ය නොවුනි.

21. Nomination of National BRs

සැලසුම් කල පරිදි ප්‍රසම්පාදනයන් අවශ්‍ය නොවුනි.

22. Firewall subscription renewal

2016 වසරේදී මෙය සිදුකර ඇත.

23. Concise oxford English Dictionary

අවශ්‍යතාවය මත 2016 වසරේදී මෙම ප්‍රසම්පාදනය සිදුනල නොහැකි වූ අතර එය 2017 වසරේදී මිලදී ගැනීමට අපේක්ෂිතය.

24. Office Consumables

අවශ්‍යතාවය පරිදි 2016 මිලදී ගැනීම් සිදුකර ඇත. ඒ සඳහා වෙන් කරන ලද සියලු ප්‍රතිපාදන වැය නොවුණි.

25. Journal database (3.00Mn)

2017 වර්ෂය මුල් කාර්තුවේදී නිකුත් වීමට නියමිත මනා ලෙස යාවත්කාලීන වූ scopus (abstract/ citation) දත්ත පදනම සඳහා වූ Annual renewal free - 2017 Elsevier ආයතනයට 2016 වර්ෂයේ දෙසැම්බර් මස ඉකුත්වීමට ප්‍රථම ගෙවීමේ අරමුණින් මෙම මුදල ප්‍රසම්පාදන ලැයිස්තුවට ඇතුල් කරන ලද්දේ සාමාන්‍යෙයන් පවත්වාගෙන යන ක්‍රමවේදයට අනුවය.

ශ්‍රී ලංකාවේ විද්‍යා තාක්ෂණ ප්‍රජාවට තමන්ගේ පර්යේෂණ ප්‍රතිදානය (Research outputs and citations) පිළිබඳ පූර්ණ විස්තරයක් ලබාගත හැකි මෙම මෙවලමට ලගාවිය හැක්කේ ජාතික විද්‍යා පදනම තුලින් පමණකි.

අදාල වාර්ෂික ගාස්තු ගෙවීම සඳහා පදනමේ කළමනාකාරීත්වයේ නිසි අවසරය ලැබුන ද නියමිත ඉන්වොයිසිය Elsevier ආයතනයෙන් 2016 දෙසැම්බර් 31ට පෙර නොලැබුන හොත් එම ගාස්තුව 2016 වර්ෂය නිමවීමට පෙර ගෙවිය නොහැකි විය.

එනමුත් සාමාන්‍යයෙන් වාර්ෂිකව ලබා ගන්නා අනෙකුත් තොරතුරු මූලාශ්‍ර වෙනුවෙන් පුරෝකථනය කරන ලද මුදලින් රු. 822,794/- වැය විය.

26. Book Reference Sources Special Collections (0.2 Mn)

ඇමරිකාවේ Cormell විශ්ව විද්‍යාලය නිකුත් කරන ඉහළ ගණයේ කෘෂිකාර්මික පර්යේෂණ පත්‍රිකාවල තොරතුරු අඩංගු දත්ත පදනමක් වන TEEAL (Digital Library of Agricultural Research) ලබා ගැනීම සඳහා අදාල ගාස්තු ගෙවීමට සහ පදනමේ විද්‍යාත්මක නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි පොත්, සංවෘත්ත තැටි ලබා ගැනීමට මෙම මුදල 2016 වර්ෂය සඳහා වෙන් කළ නමුත් Cornell විශ්ව විද්‍යාලය අදාල සංවෘත්ත තැටිය වෙනුවට 1993-2013 දක්වා යාවත්කාලීන කළ සියලු පර්යේෂණ විස්තර අඩංගු කුඩා පරිගණකයක් ගාස්තු අයකිරීමකින් තොරව ලබා දුන් හේතුවෙන් පූරෝකථනය කළ මුලු මුදලින් පොත් කිහිපයක් මිලදී ගැනීම සඳහා රු. 3,050/- ක් පමණ වැය විය.

27. PABX System

මේ සඳහා 2016 වර්ෂයේදී දෙවරක් සංවෘත ලංසු කැඳවීම් සිදු කර ඇති අතර ලංසු 03කට වඩා අඩු ප්‍රමාණයක් ලැබීම නිසා එම ලංසු අවලංගුකර පුවත්පත් දැන්වීමක් මගින් නැවතත් 2017 වසරේදී ලංසු කැඳවීම සිදු කර ඇත.

28. FM mice sound system

අංශයෙහි සංශෝධිත අයවැය අනුව සඳහන් කරන ලද භාණ්ඩ මිලදී නොගන්නා ලදි.

29. Replace obsolete network switches

2016 වසරේදී මෙය සිදුකර ඇත.

30. NVivo data Analyzing Package

අංශයෙහි සංශෝධිත අයවැය අනුව NVivo data Analyzing Package අවශ්‍ය වූ සමීක්ෂණ ඉවත් කරන ලද නිසා අවශ්‍යතාවයක් මතු නොවීය. අංශයෙහි සංශෝධිත අයවැය අනුව සඳහන් කරන ලද භාණ්ඩ මිලදී නොගන්නා ලදි.

31. Accounting Software Package

2017 වසරේදී මෙය සිදුකිරීමට කටයුතු යොදා ඇත.

32. Meeting management system & Grants management system

Meeting Management System

මෙකී පද්ධතිය හඳුන්වාදීමේ යෝජනාවේ මූලික අරමුණවූයේ ආයතනයේ කළමණාකාර මණ්ඩලයේ තොරතුරු වාර්තා කරණය පහසු කිරීම සහ විදිමත් කිරීමය. ආයතනයේ කළමනාකරණ රැස්වීම් වලදී මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්චාකර පසුව එම යෝජනාව ඉවත්කර ගන්නාලදී.

Grants Management System

මෙකී පද්ධතිය හඳුන්වාදීමේ යෝජනාවේ මූලික අරමුණවූයේ ආයතනයේ මූල්‍ය ප්‍රදාන ලබාදීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා ගතකිරීම පහසු කිරීම්යි. මෙකී ක්‍රියාවලිය ඉතා සංකීර්ණ සහ අවදානම් බැවින් නිසි අධ්‍යනයකින් පසුව සලකා බැලීම සඳහා 2017 වර්ෂය සඳහා ඇතුලත් කරනදී.

1. Operationalization of the National Bio Safety Frame work in collaboration with Ministry of Environment

මෙම ක්‍රියාකාරකම පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව ජාතික ජෛව සුරක්ෂිතතා ආකෘතිය යටතේ සිදු කිරීමට තීරණය කර තිබුනද, පරිසර අමාත්‍යාංශය මේ සඳහා විදේශීය ප්‍රතිපාදන අපේක්ෂාවෙන් පසු වූ බැවින් මෙම ක්‍රියාකාරකම 2016 දී සිදු කිරීමට නොහැකි විය.

2. SUSRED grant scheme

SUSRED ප්‍රතිපාදන වැඩසටහන සඳහා අදාල වූ අයදුම්පත් කැඳවීම, අයදුම්පත් ඇගයීම හා ත්‍යාග ප්‍රදානය කිරීමට සියළු කටයුතු 2016 දෙසැම්බර් මස සූදානම් කරන ලදී. කෙසේ වුවද විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කටයුතු අමාත්‍යවරයා හට ඒ සඳහා දිනයක් දෙසැම්බර් මස වෙන් කිරීමට නොහැකිවීම හේතුවෙන් එම උත්සවය 2017 ජනවාරි 31 වන දින පවත්වන ලදී..

3. Conduct state holder meetings brainstorming session and workshop etc.

2016 වසරේ ජුලි 7 හා 8 යන දෙදින ජාතික විද්‍යා පදනම මඟින් "NSF Research Summit 2016; Empowered by Research & Innovation" සමුළුව පවත්වන ලදී. මෙම සමුළුවේදී "ජාතික තේමා පර්යේෂණ වැඩසටහන" මඟින් ආමන්ත්‍රණය කිරීමට යෙදුනු තේමා, ආහාර සුරක්ෂිතතාව, දේශගුණික විපර්යාස, ස්වභාවික විපත් සහ ජල සුරක්ෂිතතාව, එක් එක් අංග යටතේ කථාබහට ලක් කරන ලදී. මෙම සමුළුවේදී මෙම තේමා වලට අදාල ප්‍රශ්න හා වෙනත් ගැටළු දීර්ඝ ලෙස සහ සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් කරන ලදී. මෙම හේතුවෙන් මේ සඳහා පාර්ශවකරුවන් හා තවත් සාකච්ඡාවක් 2016 වසරේදී වෙනමම නොපවත්වන ලදී. මෙම සමුළුවෙන් පසු ජාතික විද්‍යා පදනම මඟින් දේශගුණික විපර්යාස සහ ස්වභාවික විපත් වලට අදාල තේමා පත්‍රය සම්පූර්ණ කරන ලද අතර, එම තේමාවන් සඳහා පූර්ණ පර්යේෂණ යෝජනා කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කරන ලදී.

4. SPD Organizing training workshop on science communication for local scientist

වසර මුල අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා පමණක් වෙන් කරන ලද අතර ඉදිරි අයවැය සංශෝධනයේදී ප්‍රතිපාදන ලබාගැනීමේ අරමුණින් මෙම ක්‍රියාකාරකම ක්‍රියාකාරී සැලසුමෙන් (Action Plan) ඉවත් නොකෙරිනි. එහෙත් වසර මැද සිදු කරන ලද එම අයවැය සංශෝධනයේදීත් මෙම කටයුතු සඳහා ප්‍රතිපාදන නොලැබුනු බැවින් එය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුනි.

5. SPD Young Science Leaders Programme

මෙම වැඩසටහන සඳහා දීප ව්‍යාප්තව සිසුන් බඳවා ගැනීමට යෝජනා කරන ලදී. නමුත් කොළඹින් බැහැරව පැමිණෙන සිසුනට මෙම වැඩසටහනට සහභාගීවීමේදී ඇති වන ප්‍රායෝගික ගැටළු සහ ඔවුනට පහසුකම් සැලසීමේදී වැයවන මුදල සලකා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ක්‍රියාකාරී සහ ගණිත කමිටුවේ අනුදැනුම ඇතිව අත්හිටුවන ලදී.

6. SPD Conduct awareness campaign on Emerging Technologies

වසර මුල අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා පමණක් වෙන් කරන ලද අතර ඉදිරි අයවැය සංශෝධනයේදී ප්‍රතිපාදන ලබාගැනීමේ අරමුණින් මෙම ක්‍රියාකාරකම ක්‍රියාකාරී සැලසුමෙන් (Action Plan) ඉවත් නොකෙරිනි. එහෙත් වසර මැද සිදු කරන ලද එම අයවැය සංශෝධනයේදීත් මෙම කටයුතු සඳහා ප්‍රතිපාදන නොලැබුනු බැවින් එය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුනි

7. SPD Capacity building of Teachers on good laboratory Practices

මේ යටතේ සිදුකෙරුනේ රසායන විද්‍යාවල භෞතික විද්‍යාවල සත්ව විද්‍යාව සහ උද්භිත විද්‍යාව යන විෂයයන් යටතේ විද්‍යා ගුරුවරුන් සඳහා පුහුණු අත්පොත් එකකින් පිටපත් 450ක් බැගින් මුද්‍රණය කර අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දීමක් පමණි. මේවා මුද්‍රණය කරන ලද්දේ ජාතික විද්‍යා පදනමේ මුද්‍රණ අංශය මඟිනි. එනිසාල මෙම කර්තව්‍යය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොකෙරුණි.

**<u>සමාලෝචිත වර්ෂය තුළ සිදුනොකර පසුවට කල් දමා තිබුනු ක්‍රියාකාරකම් පහත පරිදි වේ:</u>**

1. SPD Vidya Ganitha Athwela

මෙම වැඩසටහනෙහි පසුගිය වසරවල කරන ලද ප්‍රතිඵල විද්‍යාල තාක්ෂණල ඉංජිනේරු සහ ගණිත ක්‍රියාකාරී කමිටුවෙහි උපදෙස් මත සමීක්ෂණයක් සිදු කිරීම මඟින් සමාලෝචනය කරන ලදි. එහිදී මෙම වැඩසටහන මඟින් ගණිතය සහ විද්‍යා විෂය සමත් වීම කෙරෙහි එතරම් බලපෑමක් කිරීමට හැකියාවක් නොමැතිබව හඳුනා ගන්නා ලදී. එම නිසා ඉහත කමිටුවේ නිර්දේශය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී.

2. Conducts need Assessment survey on capacity Building of scientists and administration in NRIS

සංශෝධිත අයවැය අනුව ව්‍යාපෘතිය ඉවත්කරන ලදි.

3. Study on to investigate the status of A/L Science Education in Sri Lanka

ප්‍රතිපාදන නොමැතිවීමත් ප්‍රමාණවත් පරිදි සේවක මණ්ඩලය නොසිටීමත් නිසා මෙම වැඩසටහන ක්‍රියාත්මක නොකෙරිනි.

4. Assessment of A/L student Project in meeting National Educational Objectives

ප්‍රතිපාදන නොමැතිවීමත් ප්‍රමාණවත් පරිදි සේවක මණ්ඩලය නොසිටීමත් නිසා මෙම වැඩසටහන ක්‍රියාත්මක නොකෙරිනි.

5. Innovation system study on Floriculture Industry in Sri Lanka

සංශෝධිත අයවැය අනුව ව්‍යාපෘතිය ඉවත්කරන ලදි.

6. Conduct survey to collect Information on patent holders of 2008-2012

සංශෝධිත අයවැය අනුව ව්‍යාපෘතිය ඉවත්කරන ලදි.

# ඇමුණුම්

## 2016 තුළ පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන

### කෘෂිකර්මය හා ආහාර විද්‍යා ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘති මාතෘකාව | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2016/AG/01<br>(වසර 3යි) | **ආචාර්ය ටී.එච්.පී.එස්. ප්‍රනාන්දු**<br>**ආචාර්ය කේ.වී.වී.එස්. කුඩලිගම**<br>**එම්.කේ.ආර්. සිල්වා මයා**<br>**ආචාර්ය පී. සෙනෙවිරත්න**<br>රබර් පර්යේෂණ ආයතනය, අගලවත්ත | සමෝධානිත රෝග කළමනාකරණ ක්‍රමෝපාය වැඩි දියුණු කිරීම පිණිස රබර්වල සුදුමුල් රෝගය සඳහා ජෛව විද්‍යාත්මක පාලනය පිළිබඳ විමර්ශනය | 4,244,232/- |
| RG/2016/AG/02<br>(වසර 2 1/2යි) | **ආචාර්ය ඉල්මි ජී.එන්. හේවාජුලිගේ (මිය)**<br>ආහාර තාක්‍ෂණ අංශය,<br>ITI<br>**ආචාර්ය චන්ද්‍රිකා නනායක්කාර**<br>ශාක විද්‍යා දෙපාර්තමේන්තුව<br>කොළඹ විශ්ව විද්‍යාලය<br>**ආචාර්ය ඩබ්:ඩබ්:පී. රොද්‍රිගු**<br>ජෛව තාක්‍ෂණ ඒකකය<br>**ඩී.යූ. රාජවර්ධන**<br>ආහාර තාක්‍ෂණ අංශය<br>ITI, කොළඹ 07 | තෝරාගත් ශ්‍රී ලාංකීය කිරි පට්ටිවලින් ලබාගත් ක්‍ෂුද්‍රශාකවල ජෛව විවිධත්වය සහ තාක්‍ෂණික විභවය | 2,000,500/- |
| RG/2016/AG/03<br>(වසර 3යි) | **ආචාර්ය ඩබ්:ඒ.එම්. දවුන්දසේකර**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>**ආචාර්ය එම්.වයි. උඩුගල ගනේහේනගේ**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | කෙසෙල්වල පශ්චාත් අස්වනු දිලීර ව්‍යාධිජනකයින්ට එදිරිව රෝග ප්‍රතිරෝධය ප්‍රේරණය කිරීමේදී ද්‍රාව්‍ය සිලිකෝන්වල සඵලතාවය. | 2,196,862/- |

### මූලික විද්‍යා ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘති මාතෘකාව | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2016/BS/01<br>(වසර 3යි) | **මහාචාර්ය අර්.එම්.ජී. රාජපක්‍ෂ**<br>**මහාචාර්ය පී.අර්.ඒ. කුමාර**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | අඳුරේදී සෘජු ආලෝකය සඳහා අධෝරක්ත කිරණ රැස්කිරීමට සහ ආලෝකය යටතේ දී මෙන්ම අඳුරේ දී ද විදුලිය උත්පාදනය කිරීමට සායම් - සංවේදීකෘත සූර්ය කෝෂ සැකසීමට උපකරණයක් ලෙස ෆෝටෝන උපරි අපවර්තනය. | 4,975,000/- |
| RG/2016/BS/02<br>(වසර 3යි) | **මහාචාර්ය අනුර වික්‍රමසිංහ**<br>**ආචාර්ය සුසන්ති ජයසිංහ**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | 3β-[a-L] (ඇරබිපයිරනොසිල්) ඔක්සි ඔලේන්-12-en-28-ඔයික් අම්ලයේ ජෛව විද්‍යාත්මක සක්‍රිය ස්වභාවික නිෂ්පාදන ගොනු සංශ්ලේෂණය. | 4,147,000/- |
| RG/2016/BS/03<br>(වසර 1 1/2 යි) | **ආචාර්ය තුසිත නන්ද**<br>විද්‍යා හා තාක්‍ෂණ දෙපාර්තමේන්තුව<br>ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය<br>**ආචාර්ය දිල්රු රත්නවීර**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br>**මහාචාර්ය ටෙරන්ස් කරුණාරත්න**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන පෙට්‍රොරසායනික පදනම් කරගත් ෆෝම් සඳහා ආදේශකයක් ලෙස ජෛව ස්කන්ධ (ලිග්නින්) පදනම් කර ගත් පොලියුරෙතීන් ෆෝම් සංශ්ලේෂණය සහ ව්‍යුහ ලක්‍ෂණ සහසම්බන්ධය විස්තර කිරීම. | 1,297,900/- |

| | | | |
|---|---|---|---|
| **RG/2016/BS/04**<br><br>(වසර 2යි) | **ආචාර්ය ඩබ්:එම්.සී.ටී. විජේකෝන්**<br>**මහාචාර්ය ජී.වයි. ජයසිංහ**<br>**මහාචාර්ය එස්.ඩී. වන්නිආරච්චි**<br>පාංශු විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>රුහුණු විශ්ව විද්‍යාලය | බලශක්ති කාර්යක්ෂම ජල පිරිපහාදුව සඳහා අතිධ්වනි තාක්ෂණය යොදා ගැනීම. | **2,199,100/-** |
| **RG/2016/BS/05**<br><br>(වසර 3යි) | **ආචාර්ය මෙත්තිකා විතාන හෙට්ටිආරච්චි (මිය)**<br>**ආචාර්ය ඉශානි රාගිකා පෙරේරා (මිය)**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | සායම් සංවේදීකෘත සූර්ය කෝෂ සඳහා අර්ධසන්නායක ද්‍රව්‍යයක් ලෙස ලෝහ කාබනික රාමුවක් සංවර්ධනය කිරීම. | **4,059,500/-** |

**ජෛව තාක්ෂණ විද්‍යා ක්‍රියාකාරී කමිටුව**

| **ප්‍රදාන අංකය හා කාල සීමාව** | **ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය** | **ව්‍යාපෘති මාතෘකාව** | **වෙන් කරන ලද මුළු මුදල (රු.)** |
|---|---|---|---|
| **RG/2016/BT/01**<br><br>(වසර 2යි) | **ආචාර්ය එස්. නිමාලි තරංගනී**<br>ජෛව තාක්ෂණය විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය<br>වයඹ විශ්ව විද්‍යාලය<br><br>**මහාචාර්ය ඩී.පී.එස්.ටී.ජී. අත්තනායක**<br>කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය<br>වයඹ විශ්ව විද්‍යාලය | *E. col:* වල *Geotrichum –candidum* වලින් අමු පිෂ්ටය ජලවිච්ඡේදනය කරන ඇමයිලේස් ජානය ප්‍රකාශ කිරීම. | **2,019,160/-** |
| **RG/2016/BT/02**<br><br>(වසර 2යි) | **මහාචාර්ය කමනි තෙන්නකෝන්**<br>ජෛව රසායන විද්‍යා අණුක ජෛව විද්‍යා සහ ජෛව තාක්ෂණය විද්‍යා ආයතනය<br>90, කුමාරතුංග මුනිදස මාවත,<br>කොළඹ 03 | පියයුරු පිළිකා සෛල මත *Campnosperma zelanica* වලින් එකලා කරන ලද නව සෛල නාශක සංයෝගවල භව්‍ය ප්‍රති-පිළිකාමය යාන්ත්‍රණය | **3,571,000/-** |
| **RG/2016/BT/03**<br><br>(වසර 2යි) | **ආචාර්ය ඒ. අරුල්කාන්තන්**<br>ජලජ සත්ව රෝග විනිශ්චය සහ පර්යේෂණ මධ්‍යස්ථානය (CAADDR)<br>පශු වෛද්‍ය ව්‍යාධිවේද දෙපාර්තමේන්තුව<br>පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br><br>**ආචාර්ය එස්.එස්.එස්.ද එස්. ජගෝද**<br>CAADDR<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | මිරිදිය අලංකරණ මත්ස්‍යයින්ගේ මයිකොබැක්ටීරියෝසිස් පිළිබඳ අධ්‍යයනය, අවදනම් සාධක සහ ශායනික ව්‍යාධිවේදී ලක්ෂණ හඳුනාගැනීම සහ ශීඝ්‍ර රෝග නිශ්චය ශිල්පක්‍රම සංවර්ධනය කිරීම. | **3,759,000/-** |
| **RG/2016/BT/04**<br><br>(වසර 3යි) | **මහාචාර්ය ආර්.එස්. දසනායක**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය<br><br>**මහාචාර්ය වයි.අයි.එන්.එස්. ගුණවර්ධන (මිය)**<br>අණුක වෛද්‍ය විද්‍යා ඒකකය<br>වෛද්‍ය පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | *Pichia pastoris* යීස්ට් ආකෘති පද්ධතියෙහි RNA මැදිහත්වීමේ මාර්ගයේ ට්‍රාන්ස්ජෙනික නැවත සකස් කිරීම. | **4,534,135/-** |

### ඉංජිනේරු විද්‍යා, ගෘහනිර්මාණ ශිල්ප හා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘති මාතෘකාව | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2016/ EA & ICT/01<br><br>(වසර 2යි) | **ආචාර්ය පී.එම්.ආර්.අයි. ගොඩලියද්ද**<br>**ආචාර්ය එම්.පී.බී. ඒකනායක**<br>**මහාචාර්ය ජේ.බී. ඒකනායක**<br>විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව<br>ඉංජිනේරු පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | නමය ඉල්ලුම් නිමායනය සහ කළමනාකරණය සඳහා ආගන්තුක නොවන භාර අධීක්ෂණය | 1,582,768/- |

### පරිසර සහ ජෛවතාක්‍ෂණ ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘති මාතෘකාව | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2016/EB/01<br><br>(වසර 2යි) | **ආචාර්ය සුමුදු සී.කේ. රුබසිංහ**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලාංකීය පත්‍රිය අක්මාශාක වල (ජුන්ගමන්නිඩේ) වර්ගීකරණය සහ ජෛව භූ විද්‍යාව | 2,295,425/- |
| RG/2016/EB/05<br><br>(වසර 2යි) | **ආචාර්ය ඩබ්.ඒ. ප්‍රියන්ත ද සිල්වා**<br>**මහාචාර්ය එස්.එච්.පී. පරාක්‍රම කරුණාරත්න**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලාංකාවේ තෙත් සහ වියළි කලාපවල තෝරාගත් ප්‍රදේශවල ගෙඹි-උප්ටන මදුරුවන්ගේ විශේෂ විවිධත්වය සහ විහව වාහක තත්ව | 1,420,620/- |
| RG/2016/EB/02<br><br>(වසර 3යි) | **ආචාර්ය සිසිර එදිරිවීර**<br>විද්‍යා හා තාක්‍ෂණ දෙපාර්තමේන්තුව<br>ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, බදුල්ල<br><br>**මහාචාර්ය බී.එම්.පී. සිංහ කුමාර**<br>වන විද්‍යා සහ පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ පහත් බිම් වර්ෂා වනාන්තරයක වසර 40ක කාලයක් තිස්සේ වෘක්ෂලතා ව්‍යුහය සහ භූමියෙන් - ඉහළ කාබන් ගතිකය අධ්‍යයනය කිරීම. | 1,995,000/- |
| RG/2016/EB/03<br><br>(වසර 2යි) | **ආචාර්ය පමෝද බී. රත්නවීර**<br>විද්‍යා හා තාක්‍ෂණ දෙපාර්තමේන්තුව<br>ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, බදුල්ල | තෝරාගත් *Cyperus* විශේෂයක අන්තශ්ශාකීය දිලීරවලින් ප්‍රතිබැක්ටීරියමය ඖෂධ නියමු සහ කෘමිනාශක කාරක | 2 370 000/- |
| RG/2016/EB/04<br><br>(වසර 3යි) | **ආචාර්ය එම්.එම්. පද්මලාල්**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | දේශිය බැක්ටීරියා මගින් පානිය ජලයේ පියොස්මින් සහ MIB අනාවරණය කර ගැනීම. | 3,864,219/- |

### සෞඛ්‍ය විද්‍යා ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘති මාතෘකාව | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2016/HS/01<br><br>(වසර 2යි) | **වෛද්‍ය ලෝචන සී. මැණික් ආරච්චි**<br>ඖෂධ දෙපාර්තමේන්තුව<br>සහ-සෞඛ්‍ය විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | පරිවෘත්තියෙහි පූර්ණ ස්වයංක්‍රිය රසායනික ව්‍යුහය හඳුනාගැනීම සඳහා මෘදුකාංග වේදිකාවක් සංවර්ධනය කිරීම. | 1,844,000/- |
| RG/2016/HS/02<br><br>(වසර 3යි) | **වෛද්‍ය ඒ.පී. ද සිල්වා**<br>**වෛද්‍ය රශාන් හනීෆා**<br>ජාතික දැඩි සත්කාර ප්‍රවීක්ෂණය<br>කාන්තා රෝහල, කාසල් වීදිය<br>කොළඹ 08 | මොණරාගල දිස්ත්‍රික් මහ රෝහල සඳහා පූර්ව අනතුරු ඇඟවීම් ලකුණු භාවිත කරමින් ශීඝ්‍ර ප්‍රතිචාර පද්ධතියක් (RSS) සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම සහ කාර්යක්‍ෂමතාවය තක්සේරු කිරීම. | 3,224,000/- |

| | | | |
|---|---|---|---|
| RG/2016/HS/03<br><br>(වසර 2 1/2 යි) | **වෛද්‍ය ඒ.පී. අත්තනායක**<br>**මහාචාර්ය කේ.ඒ.පී.ඩබ්: ජයතිලක**<br>ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br><br>**මහාචාර්ය අයි.කේ.බී. මුද්දුව**<br>ව්‍යාධිවේදී දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>රුහුණු විශ්ව විද්‍යාලය | රසායනිකව ප්‍රේරණය කරන ලද nephropathy සහිත මීයන්ට ඖෂධ ශාක සාරවල ආරක්ෂක බලපෑම්. | 1,545,000/- |
| RG/2016/HS/04<br><br>(වසර 3යි) | **වෛද්‍ය නිලූපා ආර්. අමරසිංහ**<br>ඖෂධ දෙපාර්තමේන්තුව<br>සම සෞඛ්‍ය විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | අල්ෂයිමර් රෝගය සඳහා විභව ව්‍යාප්තිය කාරකයක් ලෙස ශ්‍රී ලංකාවේ වවන කුළු බඩුවල ඇසිටයිල් කෝලීන් එස්ටරේස් නිශේධක ක්‍රියාව විමර්ශනය කිරීම. | 2,385,000/- |
| RG/2016/HS/05<br><br>(වසර 2යි) | **මහාචාර්ය නිලිකා මලවිගේ**<br>ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>**වෛද්‍ය ආනන්ද විජේවික්‍රම**<br>බෝවන රෝග රෝහල<br>ගොතටුව<br>අංගොඩ | උග්‍ර ඩෙංගු ආසාදනයෙහි ආරක්ෂාව හා සම්බන්ධ වූ ටී සෛල ප්‍රතිචාරවල ක්‍රියාකාරිත්වය සහ රූපාණු දර්ශය නිශ්චය කිරීම. | 6,105,000/- |

**සාගර සහ සාමුද්‍රික විද්‍යා ක්‍රියාකාරී කමිටුව**

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘති මාතෘකාව | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2016/OMR/01<br><br>(වසර 2යි) | **ආචාර්ය එම්.ඩී.එස්.ටී. ද ක්‍රෑස්**<br>ජල රෝපණ සහ ධීවර දෙපාර්තමේන්තුව<br>පශු සම්පත්, ධීවර සහ පෝෂණ පීඨය<br>ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය | තිරසර සම්පත් භාවිතය සඳහා නව දැනුම උත්පාදනය කිරීම: ශ්‍රී ලංකාවෙන් එපිට ජලයේ ලොඩියන් සම්පත | 3,121,168/- |

## 2016 තුළ නිම කරන ලද පර්යේෂණ ප්‍රදාන

### කෘෂිකර්ම සහ ආහාර විද්‍යා ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2010/AG/03<br>(වසර 3යි) | **ආචාර්ය ඩී.එස්.එම්. ද සිල්වා (මිය)**<br>**මහාචාර්ය එස්. විමලසේන (මිය)**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | කෘෂිකාර්මික බෝගවල සහ ශ්‍රී ලාංකීය ජනගහනයේ ආහාර වේල් තුළ අන්තර්ගත සෙලිනියම් ප්‍රමාණය. | 1,230,020/- |
| RG/2011/AG/02<br>(වසර 3යි) | **ආචාර්ය ජානකී ගුණරත්න**<br>ITI<br>බෞද්ධාලෝක මාවත<br>කොළඹ 07 | පටල පෙරණ තාක්‍ෂණය සහ සන්තති ආකෘතිකරණය භාවිත කර ජෛව ක්‍රියාකාරී සංඝටක පැහැදිලි කර ගැනීම, සාන්ද්‍රනය කිරීම, සහ වෙන්කර ගැනීම මගින් පලතුරු සහ එළවළුවලට වටිනාකම එක් කිරීම. | 1,920,000/- |
| RG/2011/AG/04<br>(වසර 3යි) | **මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්‍ෂ**<br>පාංශු විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේ වවන විදේශික එළවළු සඳහා ප්‍රයෝජනවත් *ආර්බස්කියුලර් මයිකොරයිස්* වෙන් කිරීම සහ තිරගැන්වීම හා විශාල පරිමාණ රෝපිත නිෂ්පාදනය කිරීම. | 1,364,700/- |
| RG/2012/AG/01<br>(වසර 3යි) | **මහාචාර්ය යු.එල්.බී. ජයසිංහ**<br>ස්වභාවික නිෂ්පාදන අංශය<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය | සමහර ජනප්‍රිය පලතුරුවල රසායන විද්‍යාව සහ ජෛව ක්‍රියාකාරිත්වය: සෞඛ්‍ය සහ කෘෂිකර්ම ක්‍ෂේත්‍රයන් හි විභව යොදගැනීම් අධ්‍යයනය කිරීම. | 2,300,964/- |
| RG/2012/AG/03<br>(වසර 2 මාස 6යි) | **ආචාර්ය ජේ.ඩබ්: දමුනුපොල (මිය)**<br>**ආචාර්ය ඩබ්:එ.එම්. දවුන්දසේකර**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br><br>**ආචාර්ය එස්.ඒ. ක්‍රිෂ්ණරාජා**<br>**ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර**<br>රාජකීය උද්භිද උද්‍යානය<br>පේරාදෙනිය | විවිධ රෝපණ මාධ්‍ය, ශාක වර්ධක හෝමෝන සහ පොහොර ප්‍රතිකාරවලට *Ophiopogon japonicus* වල (රිදී මකරා 'Silver dragon' හෝ මොන්ඩෝ තෘණ "Mondo grass') වර්ධක ප්‍රතිචාර | 1,651,720/- |
| RG/2012/AG/05<br>(වසර 2යි) | **ආචාර්ය ඩී.එල්.සී. කුමාරි ෆොන්සේකා**<br>**මහාචාර්ය එස්.එස්. සුබසිංහ**<br>බෝග විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>රුහුණු විශ්ව විද්‍යාලය<br><br>**ෂෙරොන් වීරසූරිය**<br>ශෂ්‍ය විද්‍යා සහ ශාක අභිජනන අංශය<br>කුරුඳු පර්යේෂණ ආයතනය<br>පළොල්පිටිය, තිහගොඩ. | එතැන්හි රෝපිත මගින් උසස් කුරුඳු (*Cinnamomum verum*Presl.) පෙළ මහාපරිමාණ නිෂ්පාදනය | 1,332,980/- |

### මූලික විද්‍යා ක්‍රියාකාරී කමිටුව

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2011/BS/04<br>(වසර 1 මාස 6යි) | **පශු වෛද්‍ය නිල්මිණී ජයසේන**<br>මූලික පශු වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව<br>පශු වෛද්‍ය විද්‍යා හා ඖෂධ විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්වවිද්‍යාලය | කවුරුන් කාට සවන් දේද? තොරතුරු පිළිබඳ දැනුවත් වීම සඳහා සුලබ පොල් ලේනුන් සහ කහ-හොටැති බැබිලරයන් අතර අන්තර් විශේෂයික සන්නිවේදනය. | 556,124/- |

| | | | |
|---|---|---|---|
| **RG/2011/BS/06**<br><br>(වසර 3යි) | **ආචාර්ය ප්‍රදීපිකා සපුතන්ත්‍රි**<br>ශාක විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය<br><br>**ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර**<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ITI බෞද්ධාලෝක මාවත<br>කොළඹ 7<br><br>**ආචාර්ය ශශේන්ද්‍ර හෙට්ටිආරච්චි**<br>ශාක විද්‍යා දෙපාර්තමේන්තුව<br>කොළඹ විශ්ව විද්‍යාලය | බ්‍රයෝෆයිටාවන්ගෙන් ජෛව ක්‍රියාකාරී ස්වභාවික ජෛවාර්ෂණ පාලිත සංයෝග විභාජනය සහ වෙන් කිරීම | **1,859,000/-** |
| **RG/2011/NANO/01**<br><br>(වසර 3යි) | **මහාචාර්ය එල්. කරුණානායක**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>**ආචාර්ය ශාන්ත අමරසිංහ**<br>SLINTEE<br><br>**මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br><br>**ආචාර්ය මසිලමානි කෝනේෂ්වරන්**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය | විශේෂ ලක්ෂණ දැක්වීමට නැනෝ අංශු සහිත ජලය පාදක කරගත් පාරජම්බුල කිරණ සප්‍රතිකාරක පොලියුරිතීන් ක්ෂීර ආලේපනය | **1,908,500/-** |
| **RG/2012/BS/01**<br><br>(වසර 3යි) | **ආචාර්ය එච්.කේ.ජේ. පෙරේරා**<br>ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br><br>**මහාචාර්ය යූ.එල්.බී. ජයසිංහ**<br>ස්වභාවික නිෂ්පාදන අංශය<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය<br>හන්තාන පාර, මහනුවර<br><br>**මහාචාර්ය ආර්. සිවකානේසන්**<br>ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලාංකීය ඖෂධ ශාක වලින් විභව ප්‍රතිමධුමේහ සංයෝග හඳුනාගැනීම සහ වෙන්කර ගැනීම | **1,306,000/-** |
| **RG/2012/BS/04**<br><br>(වසර 3යි) | **මහාචාර්ය එම්.ඒ.කේ.එල්. දිසානායක**<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය<br>හන්තාන පාර, මහනුවර<br><br>**ආචාර්ය ජී.කේ.ආර්. සේනාධීර**<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය<br>පොල්ගොල්ල, මහනුවර | **Cds/CdTe** සූර්ය කෝෂවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා කැඩ්මියම් සල්ෆයිඩ් (Cds) අර්ධ සන්නායක තුනී පටලවල වර්ධන ක්‍රියාවලිය ප්‍රශස්තකරණය කිරීම | **2,800,000/-** |
| **RG/2012/BS/05**<br><br>(වසර 3යි) | **මහාචාර්ය නාමල් ප්‍රියන්ත**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br>පේරාදෙනිය | තෝරාගත් ස්වභාවික ද්‍රව්‍ය මත කාර්මික දූෂක සංශෝෂණය විමර්ශනය කිරීම සහ කාර්මික අපවාහය සඳහා නියමු පරිමාණයේ ප්‍රතිකාරක පහසුකම සංවර්ධනය කිරීම | **2,710,895/-** |

**ජෛවතාක්ෂණ ක්‍රියාකාරී කමිටුව**

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2010/BT/04<br><br>(වසර 3යි) | **වෛද්‍ය සුලෝචනා විජේසුන්දර**<br>ජෛව රසායන විද්‍යා සහ අණුක ජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br><br>**ආචාර්ය වී. චන්ද්‍රසේකරන්**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>කොළඹ විශ්ව විද්‍යාලය | තිරිඟුවලින් සහල් සංවර්ධනය කිරීම අරබයා තිරිඟු ප්‍රෝටීන, ග්ලියඩින්, සහ ග්ලූටනින් සඳහා ජාත අඩංගු ප්‍රකාශන වාහක කැසට ගොඩනැගීම සහ විස්තර කිරීම | 2,607,456/- |
| RG/2011/BT/01<br><br>(වසර 3යි) | **ආචාර්ය දේවිකා ද එම්. කොස්තා**<br>කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ මිරිස්වල (*Capsicum annum L.*) වයිරස් සහ වයිරස් සමාන රෝග පාලනය කිරීම සඳහා හේතුකාරක අණුක තිරක පද්ධතියක් සංවර්ධනය කිරීම. | 3,581,997/- |
| RG/2011/BT/02<br><br>(වසර 3යි) | **ආචාර්ය එන්.එස්. කෝට්ටේ අරච්චි**<br>ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම සහ වැවිලි බෝග කළමනාකරණ පීඨය<br>වයඹ විශ්ව විද්‍යාලය<br><br>**ආචර්ය ගාමිනි සමරසිංහ**<br>ජෛව තාක්ෂණ ඒකකය, RRDI,<br>බතලේගොඩ | වී වල ලවණතා දැරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා අණුක සිතියම්කරණය | 1,519,000/- |
| RG/2011/BT/03<br><br>(වසර 3යි) | **මහාචාර්ය කමනි තෙන්නකෝන්**<br>ජෛව රසායන විද්‍යා අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණ විද්‍යා ආයතනය (IBMBB)<br><br>**ආචාර්ය ශ්‍යාමා ද සිල්වා**<br>ළමා රෝග දෙපාර්තමේන්තුව<br><br>**ආචාර්ය ෆයිස් මරික්කාර්**<br>IBMBB, කොළඹ විශ්ව විද්‍යාලය | වර්ධන හෝමෝන ඌනතාවය සහිත ශ්‍රී ලාංකික ළමුන් කැළකගේ වර්ධක හෝමෝනවල (GH) සහ වර්ධක හෝමෝන නිකුත් කිරීමේ හෝමෝන ප්‍රතිග්‍රාහකවල (GHRH-R) විකෘති සහ දම විචල්‍ය විස්තර කිරීම. | 2,997,926/- |
| RG/2011/BT/05<br><br>(වසර 3යි) | **ආචාර්ය රාධිකා සමරසේකර (මිය)**<br>ඖෂධ ශාක තාක්ෂණ අංශය<br>ITI, 363, බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07.<br><br>**ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන**<br>IBMBB, කොළඹ විශ්ව විද්‍යාලය | වී සහ එළවළු පළිබෝධ පාලනයට ඉවත දමන සහ පුළුල් ක්‍රියාකාරීත්වයක් සහිත *Bacillus thureugieusis* (*Bt*) ක්ෂුද්‍රජීවීමය පළිබෝධනාශකය සංවර්ධනය කිරීම. | 4,008,000/- |
| RG/2011/BT/06<br><br>(වසර 3යි) | **ආචාර්ය ශ්‍යාමා ආර්. විජේකෝන්**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, නාවල<br><br>**ඒ. එස්.කේ. අබේසේකර**<br>RRDI<br><br>**ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන**<br>IBMBB, කොළඹ විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ කුඹුරුවල හමුවන වල් වී ගහනයේ ජාන විවිධත්වය තක්සේරු කිරීම සහ සම්භව්‍ය සෙවීම. | 2,289,852/- |
| RG/2011/BT/10<br><br>(වසර 3යි) | **මහාචාර්ය වී.ඩී. සිල්වා**<br>ශාක විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය කොළඹ 03.<br><br>**එන්.පී.එස්. ද සිල්වා (මිය)**<br>RRDI | ද්විගුණ කළ ඒකගුණ නිෂ්පාදනය සඳහා දේශීය *Oryza sativa* subsp. උපවිශේෂය *Indica* (වී) ජාන ජ්ලාස්මය සමග පරාගධනි රෝපිතය. | 3,000,000/- |

| | | | |
|---|---|---|---|
| RG/2011/BT/11<br><br>(වසර 2යි) | **මහාචාර්ය එම්.බී.එස්. ආරියරත්න**<br>**ආචාර්ය බී.එම්.එස්. මුණසිංහ**<br>**ආචාර්ය එල්.පී. සම්පත් ලොකුගලප්පත්ති**<br>**ආචාර්ය අනුර පී. ජයසූරිය**<br>මූලික පශු වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව<br>පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | DNA පදනම් තාක්ෂණයන් භාවිත කරමින් ශ්‍රී ලාංකීය දේශීය එළුවන් (*Capra hircus*) ප්‍රවේණික විස්තර කිරීම. | 1,859,000/- |
| RG/2012/BT/01<br><br>(වසර 2යි) | **ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ**<br>කෘෂිජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ තෝරාගත් වී ප්‍රභේදවලින් විප්ලන ආතති ප්‍රතිචාරය හඳුනා ගැනීමේ ජීනෝමික සහ ප්‍රෝටියෝමිතික ප්‍රවේශ | 2,706,350/- |

**පරිසරය සහ ජෛව විවිධත්ව ක්‍රියාකාරී කමිටුව**

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2012/NRB/01<br><br>(වසර 3යි) | **මහාචාර්ය ඊ.ඩී. ද සිල්වා**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>කොළඹ විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවට ඒකදේශීය වෘක්ෂලතාදියෙහි අන්තශ් ශාකීය දිලීරවලින් ප්‍රති ක්ෂුද්‍රජීවීමය සංයෝග වෙන් කර ගැනීම. | 4,255,000/- |
| RG/2011/NRB/03<br><br>(වසර 3යි) | **මහාචාර්ය දීප්ති යකඳවල**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | *Nymphaea nouchali* Burm.f. පිළිබඳ වර්ගීකරණ අධ්‍යයන සහ අණුක දත්ත භාවිතයෙන් දෙමුහුන් ටැක්සා හඳුනාගැනීම. | 3,285,422/- |

**සෞඛ්‍ය විද්‍යා ක්‍රියාකාරී කමිටුව**

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2006/HS/05<br><br>(වසර 3යි) | **ආචාර්ය එම්.කේ. පද්මනාදන්**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br><br>**ආචාර්ය ජේ.පී. ජෙයදේවන්**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>යාපනය විශ්ව විද්‍යාලය, යාපනය | ඖෂධීය ශාකවලින් නව ප්‍රති-බැක්ටීරියාමය සහ ප්‍රතිඩිප්ටෙරාමය මූලික අණු වෙන් කර ගැනීම සහ විස්තර කිරීම. | 3,565,275/- |
| RG/2009/HS/01<br><br>(වසර 2යි) | **මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ**<br>පශුවෛද්‍ය ව්‍යාධිවේද දෙපාර්තමේන්තුව<br>පශුවෛද්‍ය සහ සත්ව විද්‍යා පීඨය<br><br>**වෛද්‍ය එස්.ඒ.එම්. කරුණාරත්න**<br>වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | විශේෂයන් හඳුනාගැනීම, නිශ්චය කිරීම, හා සංක්‍රමණයට විශේෂිත වූ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලාංකිකයින්ගේ රිකට්සියා ආසාදන පිළිබඳ ප්‍රාථමික විමර්ශනය සහ සංචය සත්ව අධ්‍යයන. | 2,185,000/- |
| RG/2011/HS/09<br><br>(වසර 2යි) | **වෛද්‍ය ශාමිනී ගුණවර්ධන**<br>**මහාචාර්ය නදීරා කරුණාවීර**<br>පරපෝෂී විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ තෝරාගත් ගහනයන් අතර ග්ලූකෝස් පොස්පේට් ඩිහයිඩ්‍රජන්ස් (G6PD) එන්සයිම ඌනතාවය නිවාරණය කිරීම. | 985,700/- |

| | | | |
|---|---|---|---|
| RG/2011/HS/11<br><br>(වසර 2යි) | **වෛද්‍ය සුලෝචනා විජේතුංග**<br>ව්‍යාධිවේදී දෙපාර්තමේන්තුව<br><br>**වෛද්‍ය කේ.බී. ගල්කැටිය**<br>ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | එන්ඩොස්කොපික පටක විශ්ලේෂක නිදර්ශක පටක විද්‍යාව මගින් *Helicobacter pylori* අනාවරණය කිරීම: අනාරිණ වේගය තක්සේරු කිරීම සහ ආශ්‍රිත ගැටලු විශ්ලේෂණය කිරීම. | 615,800/- |
| RG/2011/HS/17<br><br>(වසර 2යි) | **වෛද්‍ය ඩී.ඩබ්.එන්. දිසානායක**<br>**වෛද්‍ය පී.එම්.අතපත්තු**<br>කායික විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | දිගුකාලීන මෙට්ෆොමින් ප්‍රතිකාරය ලබාගන්නා රෝගීන්ගේ මධ්‍ය සහ පර්යන්ත ස්නායු කායික විද්‍යාත්මක පරාමිතික මත විටමින් B12 ඌනතාවයේ බලපෑම. | 883,800/- |
| RG/2011/HS/19<br><br>(වසර 3යි) | **ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති**<br>IBMBB<br><br>**මහාචාර්ය සේනක රාජපක්ෂ**<br>ශායනික වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br><br>**මහාචාර්ය සුනිල් ප්‍රේමවංශ**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය<br><br>**මහාචාර්ය ජනක ද සිල්වා**<br>වෛද්‍ය පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ලෙප්ටොස් පයිරෝසිස් රෝගීන්ගේ ප්‍රතිශක්තිකරණ ක්‍රම සහ ප්‍රතිශක්ති තත්වය සැසඳීම පිළිබඳ අධ්‍යයන. | 3,513,292/- |
| RG/2014/HS/07<br><br>(වසර 1 මාස 6යි) | **වෛද්‍ය එන්.එම්. කරුණෂී කේ. අරඹේපොල**<br>ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව<br><br>වෛද්‍ය එම්.ජී.බී. සේනානායක<br>ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | නිදන්ගත ආතතියෙහි පැවතීම සහ සමාජ තිරක හා කොළඹ දිස්ත්‍රික්කය තුළ වැඩිහිටියන් අතර තෝරාගත් මානසික ආබාධ සමග එහි ඇති සම්බන්ධය. | 862,680/- |

**විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ ක්‍රියාකාරී කමිටුව**

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2011/STP/02<br><br>(වසර 3යි මාස 7යි) | **මහාචාර්ය අජිත් ද අල්විස්**<br>රසායනික සහ සැකසුම් ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව<br>මොරටුව විශ්ව විද්‍යාලය | ශ්‍රී ලාංකීය ප්‍රවාහන අංශය සඳහා ජෛව ඉන්ධනවල දීර්ඝ කරන ලද විශ්ලේෂණය: තාක්ෂණ - ආර්ථික විද්‍යාව සහ කාබන් වෙළඳම සඳහා ජාතික අවස්ථාවන්. | 2,967,000/- |

**සමාජ විද්‍යා ක්‍රියාකාරී කමිටුව**

| ප්‍රදාන අංකය හා කාල සීමාව | ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය | ව්‍යාපෘතියේ නම | වෙන් කරන ලද මුළු මුදල (රු.) |
|---|---|---|---|
| RG/2014/SS/01<br><br>(වසර 2 1/2යි) | **ආචාර්ය ඒ. බාලසූරිය**<br>වෛද්‍ය පීඨය<br>ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | මා පිය කටයුතුවල කාර්යක්ෂමතාවය පිළිබඳ මැදිහත්වීමේ අධ්‍යයනයක්. | 992,320/- |
| RG/2015/SS/01<br><br>(වසර 1යි) | **ආචාර්ය එස්.එම්.පී. චන්ද්‍රා පද්මිණී**<br>කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | ශ්‍රී ලංකාවේ කාන්තා වගාකරුවන් සඳහා මල් වගා උපකාරක ජාල සංවර්ධනය කිරීම. | 1,315,750/- |

## පර්යේෂණ ප්‍රදාන වැඩසටහන - 2016 සාරාංශය

| | | කෘෂිකර්මය සහ ආහාර විද්‍යාව | මූලික විද්‍යා | ජෛව තාක්ෂණ විද්‍යාව සහ ජෛවාචාර ධර්ම | පරිසරය සහ ජෛව විවිධත්වය | ඉංජිනේරු විද්‍යා, ගෘහ නිර්මාණ ශිල්පය සහ තොරතුරු හා ICT | සෞඛ්‍ය විද්‍යා | දේශීය දැනුම් විද්‍යා | සමාජ විද්‍යා | විද්‍යා අධ්‍යාපනය | විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යයනය | සාගර විද්‍යාව සහ සමුද්‍ර විද්‍යා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 2016.12.31. වන විට ක්‍රියාත්මක තත්වයේ පැවති ප්‍රදාන සංඛ්‍යාව | 21 | 12 | 18 | 26 | 06 | 28 | 01 | 02 | - | - | 02 | 116 |
| 02 | 2016 දී ප්‍රදාන පිරිනැමීම සඳහා 2015 දී ලද අයදුම්පත | 20 | 27 | 10 | 15 | 04 | 19 | 01 | - | 03 | 02 | 03 | 104 |
| 03 | 2016 තුළ ලැබුණු අයදුම්පත් | 07 | 09 | 01 | 08 | 03 | 08 | - | 01 | - | - | - | 37* |
| 04 | පිරිනමන ලද ප්‍රදාන | 03 | 05 | 04 | 05 | 01 | 05 | - | - | - | - | 01 | 24 |
| 05 | නිම කරන ලද ප්‍රදාන | 06 | 06 | 09 | 02 | - | 07 | - | 02 | - | 01 | - | 33 |
| 06 | ඉවත් කරගන්නා ලද ප්‍රදාන | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 07 | නවතා දමන ලද ප්‍රදාන | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 08 | පත් කරන ලද/පත් කිරීමට නියමිත පර්යේෂණ ශිෂ්‍යයින් | 06 | 04 | 04 | 04 | 01 | 04 | - | - | - | - | 01 | 24 |
| 09 | පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ/ ලියාපදිංචි වීමට නියමිත පර්යේෂණ ශිෂ්‍යයින් | 03 | 04 | 03 | 03 | - | 02 | 01 | - | - | - | - | 16 |
| 10 | පත් කරන ලද/ පත් කිරීමට නියමිත තාක්ෂණ සහායකයින් | 02 | 01 | - | 01 | 02 | 06 | 01 | - | - | - | - | 13 |
| 11 | ලැබුණු පශ්චාත් උපාධි නිබන්ධන දර්ශනශූරි (PhD) | - | 01 | 01 | 01 | - | 02 | - | - | - | - | - | 05 |
| | දර්ශනපති (M.Phil) | 02 | 03 | 02 | 01 | - | 02 | - | - | - | - | - | 10 |
| | දර්ශන විශාරද (M.Sc) | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | MD | - | - | - | - | - | 01 | - | - | - | - | - | 01 |
| 12 | ප්‍රදානවලින් පැන නැගුණු ප්‍රකාශන (විදේශීය) සංඛ්‍යාව | 01 | 04 | 04 | 02 | 02 | 12 | - | 01 | - | - | - | 26 |
| 13 | ප්‍රදානවලින් පැන නැගුණු ප්‍රකාශන (දේශීය) සංඛ්‍යාව | 02 | - | 03 | 02 | 06 | - | - | 04 | - | 04 | - | 21 |
| 14 | සන්නිවේදන | 06 | 19 | 54 | 05 | 01 | 23 | 01 | 02 | - | - | 02 | 113 |

* සකස් කෙරෙමින් පවතී.

## 2016- ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික තේමාමූලික වැඩසටහනෙහි ක්‍රියාත්මක තත්වයේ පවතින ව්‍යාපෘති

| වැඩසටහන | ප්‍රදාන අංකය | ව්‍යාපෘති නියමුවා | මාතෘකාව |
|---|---|---|---|
| 01 | NTRP/2012/FS/PG-01/P-01 | **ආචාර්ය ආර්.එම්. හේරත්**<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකාවේ වෙබ් මූලික බෝග පුරෝකථන සිදු කිරීමේ පද්ධතිය සංවර්ධනය |
| | NTRP/2012/FS/PG-01/P-02 | **මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක**<br>කොළඹ විශ්ව විද්‍යාලය | අවශ්‍ය කෙරෙන තොරතුරු නිසි කලට ලබා දීම මගින් ජනතාවගේ වෙනස්වන ආහාර ඉල්ලුම සපුරාලීමට ගොවීන්ට හැකියාව ලාබා දෙන සමාජ ජීවන ජාලයක් සහ බෝග නිෂ්පාදනයෙහි ලා වඩා හොඳ අධීක්ෂණයක් සහ කළමනාකරණය. |
| 02 | NTRP/2013/FS/PG-02/P-01 | **මහාචාර්ය කේ.කේ.ඩී.එස්. රණවීර**<br>ආහාර විද්‍යා සහ තාක්‍ෂණ දෙපාර්තමේන්තුව<br>ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | තෝරාගත් පලතුරු සහ එළවළු ප්‍රභේද පහක පශ්චාත් අස්වනු හානි අවමකිරීමට නව ශිල්ප ක්‍රම යොදාගැනීම. |
| | NTRP/2013/FS/PG-02/P-02 | **ආචාර්ය එච්.එල්.ඩී. වීරහේවා**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | පූර්ව-අස්වනු තාක්‍ෂණයන් යොදාගැනීම තුළින් ආහාර සුරක්ෂිතතාව - පොටෑසියම් සහ සිලිකන් පසට යෙදීම මගින් නැවුම් නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීම. |
| 03 | NTRP/2012/FS/PG-03/P-01 | **ආචාර්ය ටී.බී. ආනන්ද ජයලාල්**<br>සෞඛ්‍ය අමාත්‍යංශය | ක්ෂුද්‍රජීව විද්‍යාත්මක ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ජාතික පද්ධතියක් ස්ථාපනය කිරීම. |
| 04 | NTRP/2012/FS/PG-04/P-01 | **මහාචාර්ය උදිත් කේ. ජයසිංහ මුදලිගේ**<br>කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව,<br>කෘෂිකර්ම සහ වැවිලි බෝග කළමනාකරණ පීඨය,<br>ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවයට බලපාන අභ්‍යන්තර සහ බාහිර ප්‍රතිපත්ති සහ ව්‍යවහාර තක්සේරු කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හඳුනාගැනීම. |
| | NTRP/2012/FS/PG-04/P-02 | **ආචාර්ය අතුල සේනාරත්න**<br>ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | ශ්‍රී ලංකාවේ තෝරාගත් බෝග සහ සත්ව නිෂ්පාදනවලට අදාළ සැපයුම සහ මිල හැසිරීම පිළිබඳ අධ්‍යයනයක්. |
| 05 | NTRP/2012/FS/PG-05/P-01 | **ආචාර්ය එස්. පද්මරාජා**<br>කෘෂි ඉංජිනේරු දෙපාර්තමේන්තුව,<br>කෘෂිකර්ම පීඨය,<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ දුගීබවින් පෙළෙන ප්‍රදේශ සඳහා ගෘහස්ථ ආහාර සුරක්ෂිතතා ආකෘති සංවර්ධනය කිරීම. |
| | NTRP/2012/FS/PG-05/P-02 | **මහාචාර්ය ජී. මිහුන්තන්**<br>කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව,<br>කෘෂිකර්ම පීඨය,<br>යාපනය විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ උතුරු කලාපයේ සම්පත් හිඟ පවුල්වල ගෘහස්ථ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව, ආර්ථික වර්ධනය සහ ජීවන වෘත්තිය ඉහල නැංවීමට තිරසර සමෝධානික ආහාර නිෂ්පාදන වැඩසටහනක් සංවර්ධනය කිරීම. |

## 2016 දී පිරිනමන ලද පර්යේෂණ උපකරණ ප්‍රදාන

| # | අයදුම්කරු/තනතුරු නාමය සහ ආයතනය | උපකරණ සඳහා වගකිවයුතු නිලධාරී | උපකරණය | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | **මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම**<br>පීඨාධිපති<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | **මහාචාර්ය ප්‍රීති උඩගම**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව,<br>කොළඹ විශ්ව විද්‍යාලය | පර්යේෂණාගාර පීඩන තාපකය | 741,813/- |
| 2 | **මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම**<br>පීඨාධිපති<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | **මහාචාර්ය ප්‍රීති උඩගම**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව,<br>කොළඹ විශ්ව විද්‍යාලය | අතිශය පහත් උෂ්ණත්ව අධිශීතකරණය (-86°C) | 1,332,000/- |
| 3 | **මහාචාර්ය කපිල සෙනෙවිරත්න**<br>පීඨාධිපති<br>විද්‍යා පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | **මහාචාර්ය කපිල සෙනෙවිරත්න**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව,<br>විද්‍යා පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | පරිගණකයක් හා මුද්‍රකයක් සහිත L1600000A පර්කින් එල්මර් වර්ණාවලි දෙක FTIR | 4,190,000/- |
| 4 | **මහාචාර්ය කපිල සෙනෙවිරත්න**<br>පීඨාධිපති<br>විද්‍යා පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | **එම්.එම්. ගුණවර්ධන මයා.**<br>ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව,<br>විද්‍යා පීඨය<br>කැලණිය විශ්ව විද්‍යාලය | නිර්වායු වර්ධක කුටීරය | 4,264,620/- |
| 5 | **පීඨාධිපති**<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | **ආචාර්ය සුරංග කොඩිතුවක්කු**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව,<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | අපවර්තිත ප්‍රතිදීපන අණ්වීක්ෂය | 4,588,330/- |
| 6 | **අධ්‍යක්ෂ**<br>තේ පර්යේෂණ ආයතනය<br>තලවකැලේ | **ආචාර්ය පී.එස්.එන්. බණ්ඩාර**<br>ශෂ්‍ය විද්‍යා අංශය<br>පහතරට ස්ථානය<br>ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය<br>රත්නපුර | පාංශු ශ්වසනය සමග ප්‍රභාසංස්ලේෂණ පද්ධති කුටීරය (සංයුක්ත සහ අතේ ගෙන යා හැකි) | 4,571,000/- |
| 7 | **පීඨාධිපති**<br>විද්‍යා පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය,<br>චෙන්කලඩි | **ආචාර්ය එම්. විනෝබාබා**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය | ඉයුඩුරෝ ටී එම් තිරස් ජෙල් පෙට්ටි | 166,500/- |
| 8 | **පීඨාධිපති**<br>විද්‍යා පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය,<br>චෙන්කලඩි | **ආචාර්ය එම්. විනෝබාබා**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය | ක්ෂුද්‍ර කේන්ද්‍රාපසාරකය | 271,950/- |
| 9 | **පීඨාධිපති**<br>විද්‍යා පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය,<br>චෙන්කලඩි | **ආචාර්ය එම්. විනෝබාබා**<br>සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය | ඉහළ කාර්යසාධන අනුක්‍රමණ තාප සයික්ලරය | 495,000/- |
| 10 | **පීඨාධිපති**<br>කලා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | **මහාචාර්ය පී. වික්‍රමගමගේ**<br>භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව<br>කලා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ෆ්‍රාරාන්ට්ස් විද්‍යාගාර සමතිව්‍ර චෙන්කුරුව | 5,000,000/- |
| 11 | **අධ්‍යක්ෂ**<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය<br>හන්තාන පාර, මහනුවර | **ආචාර්ය එන්.ඩී. සුබසිංහ**<br>භූ භෞතික විද්‍යා<br>දෙපාර්තමේන්තුව<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය<br>හන්තාන පාර, මහනුවර | ප්‍රෝටෝන නිරවද්‍ය මැග්නෙටෝමීටරය | 1,500,000/- |

| | | | | |
|---|---|---|---|---|
| 12 | **පීඨාධිපති**<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය,<br>කොළඹ 08 | **මහාචාර්ය කේ.පී.එස්. චන්දන ජයරත්න**<br>භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | වර්ණීය විකිරණ මානය | **2,100,000/-** |
| 13 | **පීඨාධිපති**<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය,<br>කොළඹ 08 | **වෛද්‍ය එනෝකා කොරෙයා**<br>ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | ජෛව ආරක්ෂක 2 මට්ටමේ ආරක්ෂක කැබිනෙට්ටුව | **1,148,184/-** |
| 14 | **පීඨාධිපති**<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | **මහාචාර්ය ඩබ්:ඒ.ජේ.එම්. කොස්තා**<br>බෝග විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ජල විභවමානය | **2,216,004/-** |
| 15 | **පීඨාධිපති**<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | **ආචාර්ය කේ.ඩබ්:එල්.කේ. වීරසිංහ**<br>බෝග විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | අතේ ගෙන යා හැකි ප්‍රභාසස්ලේෂණ මානය | **3,799,000/-** |
| 16 | **පීඨාධිපති**<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | **ආචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා**<br>උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | ශාක වර්ධක කුටීරය | **1,887,000/-** |
| 17 | **අධ්‍යක්ෂ**<br>පොල් පර්යේෂණ ආයතනය,<br>ලුණුවිල | **ආචාර්ය චන්දි යාලේගම**<br>පොල් සැකසුම් පර්යේෂණ අංශය,<br>පොල් පර්යේෂණ ආයතනය,<br>ලුණුවිල | මේද නිස්සාරකය (Soxhlet නිස්සාරකය) | **1,942,500/-** |
| 18 | **අධ්‍යක්ෂ**<br>පොල් පර්යේෂණ ආයතනය,<br>ලුණුවිල | **ආචාර්ය චන්දි යාලේගම**<br>පොල් සැකසුම් පර්යේෂණ අංශය,<br>පොල් පර්යේෂණ ආයතනය,<br>ලුණුවිල | වායු වර්ණලේඛය | **4,414, 086/-** |
| 19 | **අධ්‍යක්ෂ**<br>පොල් පර්යේෂණ ආයතනය,<br>ලුණුවිල | **ආචාර්ය ඒ.ඩී.එන්.ටී. කුමාර**<br>බෝග ආරක්ෂණ අංශය,<br>පොල් පර්යේෂණ ආයතනය,<br>ලුණුවිල | කෘෂි පර්යේෂණ සඳහා විද්‍යුත් භෞතිකවේදීය විද්‍යාගාර උපකරණ (GC EAD + SSR සැකැස්ම) | **5,000, 000/-** |
| 20 | **පීඨාධිපති**<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය,<br>කොළඹ 08 | **මහාචාර්ය මංගල ගුණතිලක**<br>කායික විද්‍යා දෙපාර්තමේන්තුව<br>වෛද්‍ය පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය | අතිශය අඩු උෂ්ණත්ව අධි-ශීතකරණය | **2,553,000/-** |
| 21 | **පීඨාධිපති**<br>රසායන විද්‍යා කොලීජිය,<br>ලංකා රසායන විද්‍යා ආයතනය,<br>341/221,<br>කෝට්ටේ පාර, වැලිකඩ,<br>රාජගිරිය | **මහාචාර්ය කේ.ඒ.එස්. පතිරත්න**<br>රසායන විද්‍යා කොලීජිය,<br>ලංකා රසායන විද්‍යා ආයතනය,<br>341/221,<br>කෝට්ටේ පාර, වැලිකඩ,<br>රාජගිරිය | ක්ෂුද්‍ර තරංග පීරකය | **2,025,464/-** |
| 22 | **පීඨාධිපති**<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය,<br>පේරාදෙනිය | **මහාචාර්ය දේවිකා එම්. ද කොස්තා**<br>කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | අතිශය අඩු උෂ්ණත්ව අධි-ශීතකරණය – 860C | **1,578,087/-** |
| 23 | **පීඨාධිපති**<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br>පේරාදෙනිය | **ආචාර්ය චාමරා ජයසුන්දර**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | අධෝරක්ත කිරණ දෘශ්‍ය වර්ණාවලීමානය | **2,850,000/-** |

| | | | | |
|---|---|---|---|---|
| 24 | **පීඨාධිපති**<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය<br>පේරාදෙනිය | **මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ**<br>රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>විද්‍යා පීඨය<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | 930 සංයුක්ත 1C සුනම්‍යකය | **5,000,000/-** |
| 25 | **පීඨාධිපති**<br>සිවිල් ඉංජිනේරු පීඨය<br>මොරටුව විශ්ව විද්‍යාලය<br>මොරටුව | **නිලන්ති ගුණතිලක මිය**<br>පරිසරික ඉංජිනේරු<br>පර්යේෂණාගාරය,<br>සිවිල් ඉංජිනේරු විද්‍යා<br>දෙපාර්තමේන්තුව<br>මොරටුව විශ්ව විද්‍යාලය | රික්ත පෙරණ පද්ධතිය (Vac - Elute manifold) | **866,910/-** |
| 26 | **පීඨාධිපති**<br>සිවිල් ඉංජිනේරු පීඨය<br>මොරටුව විශ්ව විද්‍යාලය<br>මොරටුව | **නිලන්ති ගුණතිලක මිය**<br>පරිසරික ඉංජිනේරු<br>පර්යේෂණාගාරය,<br>ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව<br>මොරටුව විශ්ව විද්‍යාලය | භුමි වාෂ්පීකාරකය | **1,063,635/-** |
| 27 | **පීඨාධිපති**<br>සිවිල් ඉංජිනේරු පීඨය<br>මොරටුව විශ්ව විද්‍යාලය<br>මොරටුව | **නිලන්ති ගුණතිලක මිය**<br>පරිසරික ඉංජිනේරු<br>පර්යේෂණාගාරය,<br>සිවිල් ඉංජිනේරු විද්‍යා<br>දෙපාර්තමේන්තුව<br>මොරටුව විශ්ව විද්‍යාලය | විශ්ලේෂණ තුලාව | **4,247,235/-** |

**මුළු එකතුව** : රු. 69,812,318 /-

## 2016 දී පිරිනමන ලද පර්යේෂණ උපකරණ සඳහා අමතර කොටස් ප්‍රදාන

| # | අයදුම්කරු /තනතුර සහ අයතනය | අමතර කොටස | ඇස්තමේන්තුගත පිරිවැය (රු) | උප එකතුව (රු.) |
|---|---|---|---|---|
| 1. | **ආචාර්ය පුලනි ලැනරෝල්**<br>ජෛව රසායන විද්‍යා සහ අණුක ජෛව විද්‍යා දෙපාර්තමේන්තුව,<br>වෛද්‍ය පීඨය,<br>කොළඹ විශ්ව විද්‍යාලය | **<u>උපකරණය – HPLC</u>**<br>228-35281-91 Plunger holder assay (2 Qty)<br>228-35146 Seal 42455 (2 Qty)<br>228-34016-02 Deuterium lamp<br>L6585-05 80+/10V (1 Qty)<br>Deuterium Lamp, L6380 80V (1 Qty)<br>Halogen Lamp NA55917 12V (1 Qty) | 139,708.80<br>39,372.48<br>139,708.80<br><br>78,321.60<br>12,700.80 | **409,812.48** |
| 2. | **ආචාර්ය නන්ද ගුණවර්ධන**<br>අධ්‍යක්ෂ,<br>ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය,<br>පේරාදෙනිය විශ්ව විද්‍යාලය | **<u>උපකරණය - පරිලෝකන ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂය (SEM)</u>**<br>Filaments (50 Qty)<br>Stage O-ring (03 Qty)<br>Gun O-ring (03 Qty)<br>Aperture O-ring (03 Qty)<br>Aperture 20 micron 2MM Platinum (02 Qty)<br>Aperture 30 micron 2MM Platinum (02 Qty)<br>100μm Platinum VP Aperture<br>Vat (11%) | 237,550.00<br>52,311.00<br>28,197.00<br>24,228.00<br>63,400.00<br>63,400.00<br>55,460.00<br>57,700.06 | **582,246.06** |
| 3. | **මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න**<br>පීඨාධිපති,<br>විද්‍යා පීඨය,<br>කැලණිය විශ්ව විද්‍යාලය | **<u>උපකරණය - භුමි වාෂ්පීකාරකය (මොඩල අංකය : HS – 2005V)</u>**<br>රික්ත පොම්පය (ඒකක 1යි)<br>වැට් (11%) | 185,000.00<br>20,350.00 | **205,350.00** |

| # | අයදුම්කරු /තනතුර සහ අයතනය | අමතර කොටස | ඇස්තමේන්තුගත පිරිවැය (රු) | උප එකතුව (රු.) |
|---|---|---|---|---|
| 4. | **මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න**<br>පීඨාධිපති,<br>විද්‍යා පීඨය,<br>කැලණිය විශ්ව විද්‍යාලය | **උපකරණය - ඇජිලන්ට් 1100 ද්‍රව වර්ණලේඛ පද්ධතිය chromatographic system**<br>Stator Face assy for 5063 – 6502 valve : 1 unit (model No.0100 – 1859 )<br>Stator for G1328A manual injector : 1 unit (Model No. 0100 – 1860)<br>Bearing Ring : 1 qty<br>SEAl, ISOLATION : 1 unit (Model No. 1535 – 4046)<br>Vat (11%) | 49,060.00<br>130,480.00<br>3,730.00<br>5,460.00<br>20,760.30 | **209,490.30** |
